205 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 205 - இல. 12
**Volume 205- No. 12**

**2011 දෙසැම්බර් 15 වන බ්‍රහස්පතින්දා**
2011 டிசம்பர் 15, வியாழக்கிழமை
**Thursday, 15th December, 2011**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2012- [දහනවවැනි වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 114, 306, 307 (ප්‍රවාහන); ශීර්ෂය 119 (විදුලිබල හා බලශක්ති)] - කාරක සභාවේදී සලකා බලන ලදී.

**මෝටර් වාහන පනත:**
නියෝග

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත:**
නියෝග

**පරමාණුක ශක්ති අධිකාරිය:**
වාර්ෂික වාර්තාව (2008)

**කල් තැබීමේ යෝජනාව:**
එළවලු ප්‍රවාහනයේදී ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012 - [ஒதுக்கப்பட்ட பத்தொன்பதாம் நாள்]:**
[தலைப்புகள் 114, 306, 307 (போக்குவரத்து); தலைப்பு 119 (மின்வலு, எரிசக்தி)] - குழுவில் ஆராயப்பட்டது.

**மோட்டார் வாகனச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**இலங்கை நிலைபெறுதகு வலு அதிகாரசபைச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**அணுசக்தி அதிகாரசபை:**
வருடாந்த அறிக்கை (2008)

**ஒத்திவைப்புப் பிரேரணை:**
மரக்கறிகளை ஏற்றிச்செல்வதற்கு பிளாஸ்டிக் கூடைகளின் பயன்பாடு

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2012 - [Nineteenth Allotted Day]
Considered in Committee - [Heads 114, 306, 307 (Transport); Head 119 (Power and Energy)]

MOTOR TRAFFIC ACT:
Regulations

SRI LANKA SUSTAINABLE ENERGY AUTHORITY ACT:
Regulations

ATOMIC ENERGY AUTHORITY:
Annual Report (2008)

ADJOURNMENT MOTION:
Use of Plastic Containers in Transportation of Vegetables

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 දෙසැම්බර් 15 වන බ්‍රහස්පතින්දා***
*2011 டிசம்பர் 15, வியாழக்கிழமை*
*Thursday, 15th December, 2011*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2010 වර්ෂය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඩලස් අලහප්පෙරුම මහතා - පැමිණ නැත.
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නාලන්ද, උඩුදෙනිය, අංක ජී.30 දරන ස්ථානයෙහි පදිංචි එච්.බී. සුනිල් ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතලේ, මඩවල උල්පත, මැදිරොද අංක 36 දරන ස්ථානයෙහි පදිංචි ජී.ජී.පී. බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ආබාධිත රණවිරුවන්ට සේවා විශ්‍රාම වැටුප : කඩිනම් කිරීම
### அங்கவீனமுற்ற படை வீரர்களுக்கு சேவை ஓய்வூதியம்: துரிதப்படுத்தல்
### SERVICE PENSION TO DISABLED WAR HEROES: EXPEDITION

1335/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) පසු ගිය යුද සමයේදී උතුර නැඟෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක රාජකාරියේ නිරතව සිටි හමුදා රණවිරුවන් විශාල කැප කිරීමක් සිදු කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත තත්ත්වයට පත්වීම නිසා වර්ෂ 12 ක සේවා කාලයක් සම්පූර්ණ වීමට පෙර වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගොස් සිටින, දුබලතා විශ්‍රාම වැටුප් පමණක් ලබන රණවිරුවන්ට ද වර්ෂ දොළහකට වැඩි සේවා කාලයක් ඇති රණවිරුවන්ට මෙන්ම විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමුකර වර්ෂ දෙකක් ගතවී ඇති බවත්;

(ii) මේ දක්වා එය ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) දුබලතා විශ්‍රාම වැටුප් ලබන රණවිරුවන්ට සේවා විශ්‍රාම වැටුප ගෙවීම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) කඩිනමින් එම සේවා විශ්‍රාම වැටුප් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගත වන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மதஅலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) கடந்த யுத்த காலத்தில் வடக்கு, கிழக்கில் இராணுவ நடவடிக்கையில் ஈடுபட்டிருந்த இராணுவ வீரர்கள் பெரும் அர்ப்பணிப்புச் செய்தனர் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) இராணுவ நடவடிக்கையில் ஈடுபட்டிருந்தபோது அங்கவீனம் அடைந்ததனால் 12 வருட சேவை காலம் பூர்த்தி அடைவதற்கு முன்னர் மருத்துவ காரணங்களினால் ஓய்வுபெற்றுள்ள, அங்க வீனத்துக்கான ஓய்வூதியத்தை மாத்திரம் பெறு கின்ற இராணுவத்தினருக்கும் 12 வருடத் துக்கு மேற்பட்ட சேவைக்காலத்தை கொண்ட இராணு வத்தினருக்குப் போன்று ஓய்வூதியம் செலுத்து வதற்குத் தேவையான நடவடிக்கைகள் மேற் கொள்ளப்பட்டு ஓய்வூதிய திணைக்களத்துக்கு

[ගරු බුද්ධික පතිරණ මහතා]

ஆற்றுப்படுத்தப்பட்டு இரண்டு வருடங்கள் ஆகின்றன என்பதையும்;

(ii) இதுவரை அது நடைமுறைப்படுத்தப்படவில்லை என்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) அங்கவீனம் அடைந்ததற்கான ஓய்வூதியம் பெறுகின்ற படை வீரர்களுக்கு சேவை ஓய்வூதியம் செலுத்துவதை நடைமுறைப்படுத்துவதில் தாமதம் ஏற்படுவதற்கான காரணம் என்ன;

(ii) அந்த சேவை ஓய்வூதியத்தை துரிதமாக வழங்க நடவடிக்கை எடுப்பாரா;

(iii) அவ்வாறெனின் அதற்கு எவ்வளவு காலம் எடுக்கும்

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he admit that war heroes of the armed forces who were engaged in operational duties in the North and East during the period of war made an immense sacrifice?

(b) Is he aware that-

(i) two years have lapsed since action was taken to grant a pension, as paid to war heroes who have completed a period of service of more than 12 years, also for war heroes who only receive disability pension, having retired on medical grounds before the completion of a period of service of 12 years, upon being disabled while engaged in operational duties and the matter was referred to the Pensions Department; and

(ii) it was not been implemented up to now?

(c) Will he state-

(i) the reasons for the delay in implementing the payment of the service pension to war heroes who receive disability pension;

(ii) whether action will be taken forthwith to grant the aforesaid service pension; and

(iii) if so, the period of time taken for same?

(d) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) ඔව්.

(ආ) (i) එවැනි යෝජනාවක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කර නොමැත.

(ii) අදාළ නොවේ.

(ඇ) (i) දුබලතා විශ්‍රාම වැටුපක් ලබන රණ විරුවන් හට ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් සේවා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි.

(ii) දුබලතා විශ්‍රාම වැටුපක් ලබන රණ විරුවන් හට ඔවුන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු එම දුබලතා විශ්‍රාම වැටුප සේවා විශ්‍රාම වැටුපක් බවට පරිවර්තනය කර ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(iii) අවුරුදු 55 සම්පූර්ණ වන අවසාන දිනයේ දී රණවිරුවා ලබන අවසාන වැටුප පදනම් කර ගෙන ඉහත කී (ඇ) (ii)හි සඳහන් පරිදි දුබලතා විශ්‍රාම වැටුප සේවා විශ්‍රාම වැටුපක් ලෙස සංශෝධනය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර, එම දෙපාර්තමේන්තු අනුමැතියෙන් පසු රණවිරුවා අයත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගෙවීම කෙරෙනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම අද අහන්නේ එක ප්‍රශ්නයයි. අතුරු ප්‍රශ්නත් දෙකයි අහන්න බලාපොරොත්තු වන්නේ. ඒ නිසා මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය පොඩ්ඩක් දීර්ඝයි. ඒ ගැන මට සමාවන්න.

ගරු ඇමතිතුමනි, රණවිරුවන් විශාල පිරිසක් එවපු ලිපි ගණනාවක් මා ළඟ තිබෙනවා. අවශ්‍ය නම් ඒවා දෙන්න පුළුවන්. ඒ අය කියන්නේ 1981 දී නිකුත් කරන ලද වයස අවුරුදු 50 - 60 සීමාව පිළිබඳ චක්‍රලේඛයක් නිසාය මේ අයට මේ ගැටලුව ඇති වෙලා තිබෙන්නේ කියලායි. ඔබතුමාට මේකට සාධාරණ උත්තරයක් දෙන්න බැරි බව මම දන්නවා. නමුත් ඔබතුමා මේ ගැන අවධානය යොමු කරවන්න. අවුරුදු 22ක සේවා කාලයෙන් පසුව විශ්‍රාම යන කොට 2009.05.19 දිනය -මිනීමරු ප්‍රභාකරන් මැරුණු දිනය- පදනම් කර ගෙන ඒ මොහොත වන විට යුද හමුදාවේ පුහුණු වන සහ සේවය කරන හැමට සියයට 85ක විශ්‍රාම වැටුපක් දුන්නා කියලා කියනවා. ඉන් පසුව අවුරුදු 22ක සේවා කාලයක් සම්පූර්ණ වෙලා සේවයෙන් විශ්‍රාම යන කොට වෛද්‍ය මණ්ඩල නිර්දේශ අනුව ප්‍රභාකරන් මැරුණු දිනයට ප්‍රථමයෙන් ලැබුණු දේ ඉන් පසුව ලැබෙන්නේ නැහැයි කියලා කියනවා. ඒ ගොල්ලන් කියන්නේ 2009.05.19 වන දිනයෙන් පස්සේ විශ්‍රාම යන, හැබැයි යුද්ධයේ දී ආබාධිත තත්ත්වයට පත් වුණු අයටත් සාධාරණව දුබලතා විශ්‍රාම වැටුප ලබා දෙන්න කියලායි. හැබැයි මේක හිර වෙලා තිබෙන්නේ 1981 නිකුත් කළ වයස අවුරුදු 50-60 සීමාව පිළිබඳ චක්‍ර ලේඛනය නිසාය කියලා කියනවා. ඒ නිසා මේ ගැන පොඩ්ඩක් අවධානය යොමු කරලා කටයුතු කරන්න පුළුවන්ද ගරු ඇමතිතුමනි?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අපේ රජය තරම් රණවිරුවන් වෙනුවෙන් සිය යුතුකම් හා වගකීම් ඉටු කරපු වෙනත් රජයක් නැහැ. සෑම විටම රණවිරුවන්ගේ ප්‍රශ්න පිළිබඳව ඉතාම අවධානයෙන් හා සානුකම්පිතව බැලීමට අතිගරු ජනාධිපතිතුමාත්

අපේ රජයත් කටයුතු කරනවා. ඒ නිසා ඔබතුමා යොමු කරන ප්‍රශ්නය මම අදාළ අංශවලට යොමු කරන්නම්.

ඒ වාගේම ඔබතුමා මීළඟ උපදේශක කාරක සභාවට ඇවිල්ලා ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළොත් ඒක වඩාත් පහසුවෙයි, ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳීම සඳහා. බොහොම ස්තුතියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කළ යුතුව තිබෙන තවත් කාරණයක් තිබෙනවා. වෛද්‍ය මණ්ඩලය මේ ආබාධිත සෙබළුන්ගේ ශරීර ක්‍රියාකාරිත්වය සියයට 60 හෝ ඊට පහළ යයි නිර්දේශ කරලා ඒ අයට මේ දුබලතා විශ්‍රාම වැටුපක් ගෙවන්න නිර්දේශ කරපු ඇතැම් අවස්ථාවලදීත් ඒ අදාළ මුදල් ගෙවීම සිදු නොවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා වෛද්‍ය මණ්ඩලය මඟින් ශරීර ක්‍රියාකාරිත්වය සියයට 60කට වඩා අඩුය කියලා නිර්දේශ කරපු ආබාධිත සෙබළුන්ටත් මේ විශ්‍රාම වැටුප ලබා දීම සඳහා කටයුතු කරනවාද? ඒ වාගේම ඒ කාරණයේ දීත් අර 1981 දී නිකුත් කළ 50-60 සීමාව පිළිබඳ චක්‍රලේඛය හරස් වනවා නම් අදාළ සංශෝධන කරන්න කටයුතු කරනවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මෙම විශ්‍රාම වැටුප ගෙවීමේ දී යම් යම් නිර්ණායකයන් අපි සකස් කරලා තිබෙනවා. ඒ නිර්ණායකයන් අපට එකවරම වෙනස් කිරීමට අපහසු වෙයි. මොකද, ඒ හා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සේවකයන්ගේ නිර්ණායකයන් පිළිබඳවත් සැලකිල්ලට ගත යුතු වනවා. ඒ නිසා ඔබතුමා කියන කාරණය අපට විශේෂයෙන්ම උපදේශක කාරක සභාවේ දී සාකච්ඡා කරලා යම් විශේෂයක් කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා කෙටියෙන් තුන්වන අතුරු ප්‍රශ්නයකුත් අහන්නම්, ඒ කියපු දෙවැනි කාරණයෙන් පැන නඟින දෙයක් සම්බන්ධයෙන්. කරුණාකරලා රාජ්‍ය සේවකයන්ට වඩා මේ හමුදා සෙබළුන් සම්බන්ධයෙන්, විශේෂයෙන්ම මිනිමරු ප්‍රභාකරන් මරලා දමනකන් ඒ සේවය කරපු රණවිරුවන් සම්බන්ධයෙන් සුවිශේෂීව සලකා බලා, ඒ ආබාධිත සෙබළුන් වෙනුවෙන් මීට වඩා වැඩි බරක් තබන්න කියලා මා ඉල්ලීමක් කරනවා. මා හිතන හැටියට රාජ්‍ය සේවයේ විතරක් නොවෙයි, සමස්ත රටේ ජනතාවම ඒ කාරණයේ දී විරුද්ධ වන එකක් නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

හොඳයි, අපි බලමු. වෘත්තීය සමිතිවල සහ මේ රාජ්‍ය සේවකයන්ගේ හැසිරීම් පිළිබඳව අපට අත් දැකීම් තිබෙනවා. එක් අංශයකට යම් ප්‍රතිලාභයක් දුන්නාම එයින් මතු වන ගැටලු පිළිබඳව අපට අත් දැකීම් තිබෙනවා. ඒවාත් සලකා බලා, ගැටුම්කාරී තත්ත්වයක් අනෙකුත් අංශවල සිදු නොවන පරිදි රණ විරුවන්ට විශේෂයෙන් සැලකීමයි අපේ ප්‍රතිපත්තිය.

## සියලුම පළාත් සඳහා ක්‍රීඩාංගණ : විස්තර
## மாகாணங்களுக்கான விளையாட்டரங்குகள் : விபரம்
## STADIUMS FOR ALL PROVINCES: DETAILS

1598/'11

4. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් නවය ආවරණය වන පරිදි ක්‍රීඩාංගණ නවයක් නවීකරණය කිරීමට හෝ අලුතින් ඉදි කිරීමට සැලසුම් කර තිබේද;

(ii) ඒ සඳහා තෝරා ගත් පැරණි ක්‍රීඩාංගණ හෝ නව ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් ක්‍රීඩාංගනය සඳහා දැනට පවතින බිම් ප්‍රමාණයට අමතරව අලුතින් ලබා ගැනීමට තීරණය කර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) ක්‍රීඩාංගණ නවීකරණය සඳහා රජයට අයත් නොවන පුද්ගලික ඉඩම් ලබා ගන්නේ නම්, අදාළ ඉඩම් හිමියන්ගේ නම් සහ ඔවුන්ගෙන් ලබා ගන්නා ඉඩම් කොටස්වල තක්සේරු වටිනාකම් කවරේද;

(iii) එම ඉඩම් ලබා දීම සඳහා ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන නීත්‍යානුකූල ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் ஒன்பது மாகாணங்களையும் உள்ளடக்கும் விதத்தில் ஒன்பது விளையாட்டரங் குகளை நவீனமயப்படுத்துவதற்கு அல்லது புதி தாக நிர்மாணிப்பதற்கு திட்டமிடப் பட்டுள்ளதா என்பதையும்;

(ii) அதற்கென தெரிவு செய்யப்பட்டுள்ள பழைய விளையாட்டரங்குகள் அல்லது புதிய இடங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி ஒவ்வொரு விளையாட்டரங்கிற்காகவும் ஏற்கெனவே உள்ள நிலப்பரப்பிற்கு மேலதிக மாக புதிதாகப் பெற்றுக்கொள்ளத் தீர்மானித் துள்ள காணிகளின் அளவுகள் ஏக்கர்களில் வெற்வேறாக யாதென்பதைம்;

(ii) விளையாட்டரங்குகளை நவீனமயப்படுத்து வதற்காக அரசுக்குச் சொந்தமில்லாத தனியார் காணிகள் பெறப்படுமாயின், சம்பந்தப்பட்ட காணி உரிமையாளர்களின் பெயர்கள் மற்றும் அவர்களிடமிருந்து பெறப்படும் காணித்துண்டு களின் விலைமதிப்பீட்டுப் பெறுமதி யாதென்ப தையும்;

(iii) அந்தக் காணிகளை வழங்குவதற்காக இவர்க ளின் சம்மதத்தைத் தெரிவிக்கும் சட்டரீதியான ஆவணங்களை சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Sports:

(a) Will he state-

(i) whether plans have been made to modernize or build nine stadiums to cover the nine provinces of Sri Lanka ; and

(ii) the old stadiums or the new sites selected for this purpose?

(b) Will he inform this House-

(i) of the extent of land decided to be newly acquired for each of those stadiums in addition to the existing land area, separately, in acres;

(ii) of the names of the relevant land owners and the assessed value of the plots of land obtained from them, if privately owned lands are to be acquired for modernization of stadiums ; and

(iii) whether legal documents expressing the consent of those owners to provide that land, will be submitted?

(c) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) ඔව්.

(ii)

| පළාත | ක්‍රීඩා පිටියේ නම |
|---|---|
| උතුරු මැද | අනුරාධපුර මහජන ක්‍රීඩාංගණය |
| උතුර | කිලිනොච්චිය මහජන ක්‍රීඩාංගණය |
| ඌව | වින්සන්ට් ඩයස් ක්‍රීඩාංගණය, බදුල්ල |
| මධ්‍යම | දිගන මහජන ක්‍රීඩාංගණය, මහනුවර |
| නැඟෙනහිර | මැකෙයිසර් ක්‍රීඩාංගණය, ත්‍රිකුණාමලය |
| වයඹ | වෙලගෙදර ක්‍රීඩාංගණය, කුරුණෑගල |
| සබරගමුව | රත්නපුර පොදු ක්‍රීඩාංගණය |
| දකුණ | සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය, හම්බන්තොට |
| බස්නාහිර | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය, කොළඹ |

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, දැනට පවතින බිම් ප්‍රමාණයට අමතරව අලුතින් ඉඩම් ලබා ගැනීමට තීරණය කරලා නැද්ද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

නැහැ. තිබෙන ක්‍රීඩා පිටි තමයි නවීකරණය කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, සබරගමුව පළාතේ දැනට රත්නපුර පොදු ක්‍රීඩාංගණය තිබුණත් එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා, ඉඩ මදිකම නිසා. දැනට ඉඩමක් අත් පත් කර ගන්න කටයුතු කරමින් යනවා. තවම ඒ යෝජනාව සම්බන්ධයෙන් අවසන් තීරණයකට ඇවිල්ලා නැහැ. ලබන අවුරුද්දේ තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, කුරුණෑගල වෙලගෙදර ක්‍රීඩාංගණය සම්බන්ධවත් තිබෙන්නේ ඒ තත්ත්වයමද? නැත්නම් ආපසු වෙනත්-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමනි, වෙලගෙදර ක්‍රීඩාංගණයටත් ඔබතුමා කිව්ව ආකාරයට අපට යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා, වෙනත් ස්ථානයක ඉදි කරන්නය කියලා. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අවුරුද්දේ අනුරාධපුරය, කිලිනොච්චිය, මහනුවර සහ බදුල්ල ක්‍රීඩාංගණ හතරේ වැඩ කටයුතු ආරම්භ කළා. ලබන වර්ෂයේ - 2012- තමයි අනෙක් හතර පටන් ගන්නේ. දැන් වෙලගෙදර ක්‍රීඩාංගණය සහ රත්නපුර පොදු ක්‍රීඩාංගණය පිළිබඳ යෝජනා දෙකක් ඇවිල්ලා තිබෙනවා. වෙලගෙදර ක්‍රීඩාංගණය දැනට තිබෙන නිසා අලුතින් ක්‍රීඩාංගණයක් හැදුවොත් හොඳයි කියලා යෝජනාව තිබෙනවා. හැබැයි ඒ පිළිබඳ ඉඩමක් නැති ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ ගැන දැනට සාකච්ඡා කෙරෙමින් යනවා.

## විදේශ තෙල් සමාගම් : විස්තර
## வெளிநாட்டுப் பெற்றோலியக் கம்பனிகள்: விபரம்
## FOREIGN OIL COMPANIES : DETAILS

1669/'11

6. **ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரி. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ විදේශ තෙල් සමාගම් කවරේද;

(ii) එම සමාගම් අයිති රටවල් කවරේද;

(iii) එම විදේශ තෙල් සමාගම් ක්‍රියාත්මකව තිබීම නිසා මෙරටට සිදුවූ බලපෑම් කවරේද;

(iv) එම සමාගම් ජනසතු කරනු ලැබූ වර්ෂය කවරේද;

(v) ඒ සඳහා ක්‍රියා කරන ලද රජය කවරේද;

(vi) තෙල් සමාගම් ජනසතු කිරීම නිසා මෙරටට ඇති වූ විදේශීය බලපෑම් කවරේද;

(vii) එම බලපෑම් සමනය කිරීම සඳහා එවකට පැවති රජය ක්‍රියා කරන ලද ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில், வாணிப அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுதந்திரத்திற்குப் பின்னர் இலங்கையில் இயங்கி வந்த வெளிநாட்டுப் பெற்றோலியக் கம்பனிகள் யாவையென்பதையும்;

(ii) அக்கம்பனிகள் எந்த நாடுகளுக்கு சொந்த மானவை என்பதையும்;

(iii) மேற்படி வெளிநாட்டுப் பெற்றோலியக் கம்ப னிகள் இயங்கிவந்தமையின் காணமாக இந் நாட்டுக்கு ஏற்பட்ட தாக்கங்கள் யாவையென் பதையும்;

(iv) இக்கம்பனிகள் எந்த ஆண்டில் அரசுடைமை யாக்கப் பட்டன என்பதையும்;

(v) இதன் பொருட்டுச் செயலாற்றிய அரசாங்கம் யாதென்பதையும்;

(vi) பெற்றோலியக் கம்பனிகள் அரசுடைமையாக்கப் பட்டதனால் நாட்டுக்கு ஏற்பட்ட வெளிநாட்டுத் தாக்கங்கள் யாவை என்பதையும்;

(vii) மேற்படி தாக்கங்களைத் தணிப்பதற்காக அப் போதைய அரசாங்கம் செயலாற்றிய விதம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Petroleum Industries:

(a) Will he inform this House of-

(i) the foreign oil companies that were operative within Sri Lanka after gaining independence ;

(ii) the countries to which the said companies belonged ;

(iii) the impact made on our country as a result of those foreign oil companies being operative ;

(iv) the year in which those companies were nationalized ;

(v) the government which took action in that respect ;

(vi) any foreign pressure exerted on our country as a result of the nationalization of oil companies ; and

(vii) the manner in which the then government acted to mitigate such pressure?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ෂෙල් සමාගම
එසෝ සමාගම
කැල්ටෙක්ස් සමාගම

(ii) ෂෙල් සමාගම - නෙදර්ලන්තය
එසෝ සමාගම - ඇමෙරිකාව
කැල්ටෙක්ස් සමාගම - ඇමෙරිකාව

(iii) පාරිභෝගිකයනට වාසි ගෙන දෙන ආකාරයෙන් තෙල් ආනයනය සඳහා යහපත් කොන්දේසි ලබා දෙන ලෙස රජය කළ ඉල්ලීමට තෙල් සමාගම්වලට යහපත් ප්‍රතිචාර දැක්වීමට නොහැකි විය.

(iv) 1964 වර්ෂය.

(v) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය.

(vi) ප්‍රධාන ලෙස මෙය අහිතකර ආකාරයෙන් බලපෑ රටවල් ශ්‍රී ලංකාවට බලපෑම් කිරීමටත්, ශ්‍රී ලංකාව ඔවුන්ගේ නාමාවලියෙන් බැහැර කිරීමටත් කටයුතු කරන ලදී. සෝවියට් සංගමය, මහජන රුමේනියානු ජනරජය සහ එක්සත් අරාබි ජනරජය අප වෙනුවෙන් ඉදිරිපත් වූ අතර ජනසතු කිරීමෙන් පසු අපට ඛනිජ තෙල් සපයන්නන්ගේ ආරම්භකරුවන් ඔවුන් විය.

(vii) ඉන් පසුව රජය, සෝවියට් සංගමය, මහජන රුමේනියානු ජනරජය, එක්සත් අරාබි ජනරජය (UAR) සහ ඉරාකය (ඇස්පොල්ට් සඳහා) සමඟ ද්විපාර්ශ්වික එකඟතාවලට ඇතුළු විය. සියලුම මිල දී ගැනීම් රජය එම රටවල් සමඟ ඇති කර ගත් ද්විපාර්ශ්වික එකඟතා මත සිදු විය.

(ආ) පැන නොනඟී.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. දැන් මේ තෙල් සමාගම් ජනසතු කළායින් අනතුරුව මෑත කාලයේ නැවතත් තෙල් සමාගම් ඇති කරලා තිබෙනවා, Indian Oil Corporation නමින්. එය ආරම්භ කළ වකවානුව කුමක්ද යන්න දැන ගන්න කැමැතියි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු මන්ත්‍රීතුමනි, මට ඒ පිළිබඳව මතකයෙන් කියන්න පුළුවන්කමක් නැහැ. අදාළ ඇමතිතුමා නම් ඒ පිළිබඳව දන්නවා ඇති. අපි ඒ ගැනත් සොයා බලමු.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

හොඳයි.

## අපොස සාමාන්‍ය පෙළ විභාගය : ලකුණු සීමාවන්
## க.பொ.த சாதாரண தரப் பரீட்சை : புள்ளிகளின் வரையறை
## GCE ORDINARY LEVEL EXAMINATION : CUT-OFF MARKS

1701/'11

**7.** **ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අපොස සාමාන්‍ය පෙළ විභාගයේදී ඇගයීමට ලක් වන විෂයන් කවරේද;

(ii) එම එක් එක් විෂයන් සඳහා දෙනු ලබන සාමාර්ථයන් වර්ග කවරේද;

(iii) පසු ගිය වර්ෂ පහ තුළ එම විභාගයේ එක් එක් විෂයය සඳහා ඉහත සඳහන් සාමාර්ථයන් ලබා දීමේදී පදනම් කර ගත් ලකුණු සීමාවන් කවරේද;

(iv) පසු ගිය වර්ෂ පහ තුළ එම විභාගයේ ඒ ඒ විෂයන් සඳහා ලබා ගත් එක් එක් සාමාර්ථයන් සංඛ්‍යාව හා ප්‍රතිශතයන් වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) க.பொ.த சாதாரண தரப் பரீட்சையின்போது மதிப்பீட்டுக்கு உள்ளாக்கப்படும் பாடங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு பாடங்களுக்கும் வழங்கப் படும் சித்திகளின் வகைகள் யாவையென் பதையும்;

(iii) கடந்த ஐந்து வருட காலப் பகுதியில் மேற்படி பரீட்சையின் ஒவ்வொரு பாடத்திற்கும் மேற்குறித்த சித்திகள் வழங்கப்படும்போது அடிப் படையாகக் கொள்ளப்பட்ட புள்ளிகளின் வரை யறைகள் யாவையென்பதையும்;

(iv) கடந்த ஐந்து வருட காலப் பகுதியில் மேற்படி பரீட்சையின் ஒவ்வொரு பாடத்திற்கும் பெறப் பட்ட ஒவ்வொரு சித்திகளின் எண்ணிக்கை மற்றும் சதவீதங்கள் வருடாந்த அடிப்படையில் தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) of the subjects that are tested at the G.C.E (O/L) examination;

(ii) of the grades awarded for each of those subjects;

(iii) of the cut-off marks used as the basis for awarding the above mentioned grades for each of those subjects at the aforesaid examination during the period of past five years; and

(iv) separately of the number of each grades obtained for each of those subjects at the aforesaid examination and their percentages during the period of past five years on yearly basis?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඇමුණුම 01හි දක්වා ඇත.

(ii) A - Distinction - විශිෂ්ට සම්මාන
B - Very Good Pass - අධි සම්මාන
C - Credit Pass - සම්මාන
S - Ordinary Pass - සාමාන්‍ය සාමාර්ථය
W - Weak - දුර්වල

(iii)

| | | |
|---|---|---|
| A | - | 75 - 100 |
| B | - | 65 - 74 |
| C | - | 50 - 64 |
| S | - | 35 - 49 |
| W | - | 0 - 34 |

(iv) ඇමුණුම 02හි දක්වා ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள் :*
*Annexes tabled:*

ඇමුණුම 01

**අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඇගයීමට ලක්වන විෂයන්**

| විෂය අංකය | විෂයයන් |
|---|---|
| (11) | බුද්ධ ධර්මය |
| (12) | ශෛවනෙරි |
| (14) | කතෝලික ධර්මය |
| (15) | ක්‍රිස්තියානි ධර්මය |
| (16) | ඉස්ලාම් |
| (21) | සිංහල භාෂාව හා සාහිත්‍ය |
| (22) | දෙමළ භාෂාව හා සාහිත්‍ය |
| (31) | ඉංග්‍රීසි |
| (32) | ගණිතය |
| (33) | ඉතිහාසය |
| (34) | විද්‍යාව |
| (40) | සංගීතය (පෙරදිග) |
| (41) | සංගීතය (අපරදිග) |
| (42) | සංගීතය (කර්ණාටක) |
| (43) | චිත්‍ර |
| (44) | නැටුම් (දේශීය) |
| (45) | නැටුම් (භාරතීය) |
| (46) | ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය |
| (47) | සිංහල සාහිත්‍ය රසාස්වාදය |
| (48) | දෙමළ සාහිත්‍ය රසාස්වාදය |
| (49) | අරාබි සාහිත්‍ය රසාස්වාදය |
| (50) | නාට්‍ය හා රංග කලාව (සිංහල) |
| (51) | නාට්‍ය හා රංග කලාව (දෙමළ) |
| (52) | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) |
| (60) | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය |
| (61) | භූගෝල විද්‍යාව |
| (62) | පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජාපාලනය |
| (63) | ව්‍යවසායකත්ව අධ්‍යනය |
| (64) | දෙවන භාෂාව - සිංහල |

(65) දෙවන භාෂාව - දෙමළ
(66) පාලි
(67) සංස්කෘත
(68) ප්‍රංශ
(69) ජර්මන්
(70) හින්දි
(71) ජපන්
(72) අරාබි
(80) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
(81) කෘෂි හා ආහාර තාක්ෂණය
(82) ධීවර හා ආහාර තාක්ෂණය
(83) නිර්මාණකරණය හා තාක්ෂණවේදය
(84) ශිල්ප කලා
(85) ගෘහ ආර්ථික විද්‍යාව
(86) සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
(87) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
(92) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (සිංහල)
(93) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (දෙමළ)
(94) විද්‍යුත් ලේඛනකරණය හා ලඝුලේඛනය (ඉංග්‍රීසි)

ඇමුණුම - 02

## අ.පො.ස. (සා.පෙළ) - 2006
## මුල් අයදුම්කරුවන්ගේ සාධනය

| විෂයය | පෙනී සිටි සංඛ්‍යාව | A | % | B | % | C | % | S | % | A+B+C+S | % | W | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11. බුද්ධ ධර්මය | 231,335 | 63,280 | 27.35 | 32,127 | 13.89 | 52,061 | 22.50 | 46,158 | 19.95 | 193,626 | 83.70 | 37,709 | 16.30 |
| 12. ශෛව ධර්මය | 35,787 | 7,532 | 21.05 | 4,820 | 13.47 | 9,476 | 26.48 | 9,364 | 26.17 | 31,192 | 87.16 | 4,595 | 12.84 |
| 13. හින්දු ධර්මය | 68 | 5 | 7.35 | 10 | 14.71 | 17 | 25.00 | 16 | 23.53 | 48 | 70.59 | 20 | 29.41 |
| 14. ක්‍රිස්තු ධර්මය (රෝමානු කතෝලික) | 19,305 | 5,544 | 28.72 | 4,492 | 23.27 | 5,624 | 29.13 | 2,902 | 15.03 | 18,562 | 96.15 | 743 | 3.85 |
| 15. ක්‍රිස්තු ධර්මය(රෝමානු කතෝලික නොවන) | 3,192 | 731 | 22.90 | 650 | 20.36 | 909 | 28.48 | 616 | 19.30 | 2,906 | 91.04 | 286 | 8.96 |
| 16. ඉස්ලාම් | 27,680 | 5,398 | 19.50 | 4,129 | 14.92 | 7,502 | 27.10 | 6,981 | 25.22 | 24,010 | 86.74 | 3,670 | 13.26 |
| 21. සිංහල භාෂාව හා සාහිත්‍යය | 252,978 | 26,102 | 10.32 | 30,915 | 12.22 | 78,636 | 31.08 | 68,122 | 26.93 | 203,775 | 80.55 | 49,203 | 19.45 |
| 22. දෙමළ භාෂාව හා සාහිත්‍යය | 69,150 | 8,287 | 11.98 | 9,849 | 14.24 | 20,991 | 30.36 | 18,658 | 26.98 | 57,785 | 83.56 | 11,365 | 16.44 |
| 31. ඉංග්‍රීසි | 406,500 | 30,027 | 7.39 | 16,815 | 4.14 | 36,186 | 8.90 | 80,997 | 19.93 | 164,025 | 40.35 | 242,475 | 59.65 |
| 32. ගණිතය | 369,354 | 23,433 | 6.34 | 17,104 | 4.63 | 38,338 | 10.38 | 76,668 | 20.76 | 155,543 | 42.11 | 213,811 | 57.89 |
| 34. විද්‍යාව හා තාක්ෂණවේදය | 322,482 | 14,697 | 4.56 | 17,855 | 5.54 | 42,676 | 13.23 | 68,328 | 21.19 | 143,556 | 44.52 | 178,926 | 55.48 |
| 35. ඉදිකිරීම් තාක්ෂණය | 343 | 32 | 9.33 | 44 | 12.83 | 77 | 22.45 | 117 | 34.11 | 270 | 78.72 | 73 | 21.28 |
| 36. විදුලිය හා ඉලෙක්ට්‍රොනික ශිල්ප ක්‍රම | 146 | 4 | 2.74 | 7 | 4.79 | 30 | 20.55 | 50 | 34.25 | 91 | 62.33 | 55 | 37.67 |
| 37. යාන්ත්‍රණ හා යාන්ත්‍රික ශිල්ප ක්‍රම | 123 | 7 | 5.69 | 15 | 12.20 | 37 | 30.08 | 43 | 34.96 | 102 | 82.93 | 21 | 17.07 |
| 38. ගෙවතු සංවර්ධනය පිළිබඳ ශිල්ප ක්‍රම | 428 | 83 | 19.39 | 85 | 19.86 | 138 | 32.24 | 83 | 19.39 | 389 | 90.89 | 39 | 9.11 |
| 39. විසිතුරු නිර්මාණ පිළිබඳ ශිල්ප ක්‍රම | 217 | 81 | 37.33 | 49 | 22.58 | 52 | 23.96 | 28 | 12.90 | 210 | 96.77 | 7 | 3.23 |
| 40. ආහාර සැකසීම හා ඇඳුම් නිර්මාණ පිළිබඳ ශිල්ප ක්‍රම | 421 | 20 | 4.75 | 62 | 14.73 | 167 | 39.67 | 129 | 30.64 | 378 | 89.79 | 43 | 10.21 |
| සමාජ අධ්‍යයනය හා ඉතිහාසය | 318,879 | 31,118 | 9.76 | 33,966 | 10.65 | 78,899 | 24.74 | 98,600 | 30.92 | 242,583 | 76.07 | 76,296 | 23.93 |
| ඉංග්‍රීසි සාහිත්‍ය | 18,083 | 1,258 | 6.96 | 2,126 | 11.76 | 4,294 | 23.75 | 4,734 | 26.18 | 12,412 | 68.64 | 5,671 | 31.36 |
| 47. සිංහල සාහිත්‍ය | 72,076 | 7,418 | 10.29 | 7,307 | 10.14 | 14,259 | 19.78 | 16,215 | 22.50 | 45,199 | 62.71 | 26,877 | 37.29 |
| 48. දෙමළ සාහිත්‍ය | 39,899 | 3,423 | 8.58 | 3,386 | 8.49 | 6,616 | 16.58 | 8,497 | 21.30 | 21,922 | 54.94 | 17,977 | 45.06 |
| 49. අරාබි සාහිත්‍ය | 622 | 139 | 22.35 | 122 | 19.61 | 163 | 26.21 | 146 | 23.47 | 570 | 91.64 | 52 | 8.36 |
| 50. චිත්‍ර | 133,777 | 3,118 | 2.33 | 4,676 | 3.50 | 16,686 | 12.47 | 47,457 | 35.47 | 71,937 | 53.77 | 61,840 | 46.23 |
| 52. නර්තනය (සිංහල) | 60,860 | 8,847 | 14.54 | 8,268 | 13.59 | 14,937 | 24.54 | 18,183 | 29.88 | 50,235 | 82.54 | 10,625 | 17.46 |
| 53. නැටුම් (භරත) | 3,190 | 513 | 16.08 | 306 | 9.59 | 532 | 16.68 | 1,012 | 31.72 | 2,363 | 74.08 | 827 | 25.92 |
| 54. සංගීතය (සිංහල) | 59,513 | 4,713 | 7.92 | 4,074 | 6.85 | 9,989 | 16.78 | 17,682 | 29.71 | 36,458 | 61.26 | 23,055 | 38.74 |
| 55. සංගීතය (කර්නාටක) | 15,085 | 1,868 | 12.38 | 1,117 | 7.40 | 2,465 | 16.34 | 3,855 | 25.56 | 9,305 | 61.68 | 5,780 | 38.32 |
| 56. සංගීතය (බටහිර) | 2,145 | 958 | 44.66 | 429 | 20.00 | 303 | 14.13 | 206 | 9.60 | 1,896 | 88.39 | 249 | 11.61 |
| 57. නාට්‍යකරණය හා රංග කලාව | 14,158 | 3,624 | 25.60 | 3,165 | 22.35 | 3,994 | 28.21 | 2,658 | 18.77 | 13,441 | 94.94 | 717 | 5.06 |
| 61. පාලි | 825 | 89 | 10.79 | 120 | 14.55 | 223 | 27.03 | 242 | 29.33 | 674 | 81.70 | 151 | 18.30 |
| 62. සංස්කෘත | 486 | 29 | 5.97 | 29 | 5.97 | 66 | 13.58 | 114 | 23.46 | 238 | 48.97 | 248 | 51.03 |
| 63. අරාබි | 1,615 | 535 | 33.13 | 163 | 10.09 | 206 | 12.76 | 336 | 20.80 | 1,240 | 76.78 | 375 | 23.22 |
| 64. දෙවන බස - සිංහල | 16,974 | 388 | 2.29 | 846 | 4.98 | 2,645 | 15.58 | 4,481 | 26.40 | 8,360 | 49.25 | 8,614 | 50.75 |
| 65. දෙවන බස - දෙමළ | 4,221 | 157 | 3.72 | 207 | 4.90 | 608 | 14.40 | 1,098 | 26.01 | 2,070 | 49.04 | 2,151 | 50.96 |
| 68. ප්‍රංශ | 689 | 31 | 4.50 | 45 | 6.53 | 116 | 16.84 | 162 | 23.51 | 354 | 51.38 | 335 | 48.62 |
| 69. මැලේ | 3 | 2 | 66.67 | 1 | 33.33 | - | - | - | - | 3 | 100.00 | - | - |
| 70. ඉතිහාසය | 85,507 | 3,376 | 3.95 | 4,781 | 5.59 | 13,601 | 15.91 | 26,413 | 30.89 | 48,171 | 56.34 | 37,336 | 43.66 |
| 71. භූගෝල විද්‍යාව | 86,374 | 2,985 | 3.46 | 4,496 | 5.21 | 14,742 | 17.07 | 29,286 | 33.91 | 51,509 | 59.63 | 34,865 | 40.37 |
| 72. සංවර්ධන අධ්‍යයනය | 43,436 | 5,719 | 13.17 | 7,661 | 17.64 | 13,614 | 31.34 | 11,120 | 25.60 | 38,114 | 87.75 | 5,322 | 12.25 |
| 73. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | 215,258 | 35,320 | 16.41 | 40,626 | 18.87 | 72,780 | 33.81 | 48,905 | 22.72 | 197,631 | 91.81 | 17,627 | 8.19 |
| හින්දි | 149 | 46 | 30.87 | 21 | 14.09 | 34 | 22.82 | 23 | 15.44 | 124 | 83.22 | 25 | 16.78 |
| ජපන් | 958 | 277 | 28.91 | 84 | 8.77 | 103 | 10.75 | 117 | 12.21 | 581 | 60.65 | 377 | 39.35 |

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. පසු ගිය අවුරුදු පහ තුළ ගණිතය සඳහා සාමාර්ථයන් ලබා දීපු පිළිවෙළ ඔබතුමාගේ වාර්තාවෙන් පොඩ්ඩක් කියවන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා කියන්නේ ඇමුණුම 02 ගැනද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
(අ) (iii)ට අදාළ පිළිතුර ගැනයි අහන්නේ.

(iii) පසු ගිය වර්ෂ පහ තුළ එම විභාගයේ එක් එක් විෂයය සඳහා ඉහත සඳහන් සාමාර්ථයන් ලබා දීමේදී පදනම් කර ගත් ලකුණු සීමාවන් කවරේද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
එක් එක් වර්ෂය සඳහාද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒක දිග වාර්තාවක්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගණිතය සඳහා කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒ ප්‍රතිශතයද සංඛ්‍යාවද කියන්න ඕනෑ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. ඔබතුමා ඉස්සෙල්ලා කිව්වා, එක් එක් විෂයන්ට මේ මේ ලකුණු මට්ටම අනුව තමයි සාමාර්ථයන් ලබා දුන්නේ කියා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවර හෝ වර්ෂයක පදනම් වූ ලකුණු සංඛ්‍යාවට වඩා වෙනසක් කර තිබෙන බව ඒ වාර්තාවේ සඳහන් වී තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගණිතය "ඒ" සාමාර්ථය දීලා තිබෙනවා, -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ඒ ලකුණු ලබා දීමේදී තිබෙන පදනම් වෙනස් කර තිබෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඇමුණුම් අංක 02 ගැන ද ඔබතුමා අහන්නේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නියෝජ්‍ය ඇමතිතුමාගෙන් කෙළින්ම මම මෙහෙම අහන්නම්. ඔබතුමාට හරි ලෙහෙසියි. පසු ගිය වසරේ ගණිතය සඳහා "එස්" සාමාර්ථය ලබා දීමේදී -ඔබතුමා කිව්වා, "එස්" සාමාර්ථයක් ලබා දෙන්නේ ලකුණු 35 සිට 49 දක්වා කියා. ඒ ලකුණු මට්ටම ගන්නා අයට "එස්" සාමාර්ථයක් දෙනවා කියා.- ලකුණු 35ට වඩා අඩු යම් සංඛ්‍යාවක් නිර්දේශ කරන ලද්දේද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමා, මෙහි ඒ පිළිබඳ වාර්තාව නැහැ. තමුන්නාන්සේ ඒ පිළිබඳව වෙනම ප්‍රශ්නයක් ඇහුවොත්-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. ඒ ප්‍රශ්නය මෙහි තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ ප්‍රශ්නයේ එය තිබෙනවා. මෙහෙමයි කියන්නේ-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේ කියන්නේ කීවෙනි ප්‍රශ්නයද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
(අ) (iii) ප්‍රශ්නයේ මෙහෙම තිබෙනවා:

"පසු ගිය වර්ෂ පහ තුළ එම විභාගයේ එක් එක් විෂයය සඳහා ඉහත සඳහන් සාමාර්ථයන් ලබාදීමේදී පදනම් කරගත් ලකුණු සීමාවන් කවරේද;"

මම අහනවා, පසු ගිය වර්ෂ පහ තුළ එක් එක් විෂයයන් සඳහා පදනම් කර ගත් ලකුණු සීමාවන් කවරේද කියා. ආයෙත් ඇහුවත් මේ ප්‍රශ්නයම තමයි අහන්න වෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙනවා. ඒක ඇත්ත. ඒක මම පිළිගන්නවා. නමුත් පසු ගිය වර්ෂ පහ පිළිබඳව මේ උත්තරයේ නැහැ. ඕනෑ නම් ඔබතුමාට මේ උත්තරය පරීක්ෂා කරන්න පුළුවන්. මොකක් හෝ අතපසු වීමකින් එය ඇතුළත් වෙලා නැහැ. එය මමත් පරීක්ෂා කළා; උසස් අධ්‍යාපන ඇමතිතුමාත් පරීක්ෂා කළා. අපි එය ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පිළිතුර දැන් සභාගත කර තිබෙන්නේ. ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නය ගැන නැවත බලා පිළිතුරක් ඉදිරිපත් කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමායි, උසස් අධ්‍යාපන ඇමතිතුමායි දෙන්නාම පරීක්ෂා කරපු නිසා එය නැහැයි කියන එක පිළිගන්න පුළුවන්. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ලකුණු 35ට වඩා අඩු සීමාවකින් "S" සාමාර්ථයක් ලබා දීම සඳහා තීරණයක් අරන් තිබුණාද කියලා. අවම අවබෝධයෙන් හෝ කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සමහර අවස්ථාවල මෙහෙම-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක තමයි ගරු කථානායකතුමනි, දැන ගන්න ඕනෑ ප්‍රශ්නය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ලකුණු 35ට අඩුවෙන්-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැන් ගරු කථානායකතුමනි, අපට ලැබී තිබෙන තොරතුරු අනුව - ඒකයි මම එතුමාගෙන් පිළිතුර අපේක්ෂා කළේ.- අපේ රටේ අපොස සාමාන්‍ය පෙළ සමත් වීමේ ප්‍රතිශතය සියයට 48කට සියයට 50කට ආසන්න ප්‍රමාණයක තමයි තිබුණේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් ගිය වසර සාමාන්‍ය පෙළ සමත් වීමේ ප්‍රතිශතය යම් සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වී තිබුණා. ඒ වැඩි වී තිබෙන්නේ ගරු කථානායකතුමනි, ඒ දරුවන් ලබා ගන්නා ලද අධ්‍යාපන කුසලතා මට්ටම නිසා නොවෙයි. කුසලතාව මනින ලකුණු මට්ටම පහත හෙළීම නිසායි. ඒක අරුම පුදුම වැඩක් නේ. දරුවන්ගේ අධ්‍යාපනයේ මට්ටම වැඩි කරලා තමයි, ඔවුන්ගේ කුසලතාව, පරිසාධන මට්ටම වැඩි කරලා තමයි, -පරිසාධන මට්ටම මනින නිර්ණායකයන් වැඩි කරලා තමයි- ඔවුන් මැනිය යුතුව තිබුණේ. හැබැයි තමුන්නාන්සේලා කරලා තිබෙන දේ තමයි පරිසාධන ලකුණු මට්ටම අඩු කිරීම. ලකුණු මට්ටම අඩු කරලා කියනවා ළමයි වැඩියෙන් පාස් වෙලා කියලා. ඒක මේ රටේ අධ්‍යාපනයට කරන විශාල, බරපතළම හානියක් ගරු කථානායකතුමනි. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඇතුළත් කරලා තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේ පස්සේ කියන්න කෝ. තමුන්නාන්සේගේ ප්‍රශ්නය මට පැහැදිලියි. මම උත්තර දෙනකම් පොඩ්ඩක් ඉන්න පුළුවන්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි. කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, සමහර අවස්ථාවල මුළු රටේම මතයක් ආවාම විභාග දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. මෙතුමා කියන විධියට මහාචාර්යවරුන්ගේ, ආචාර්යවරුන්ගේ ඔළුවේ තිබෙන මහා ප්‍රබල ගණිත ගැටලු, ගණිත ප්‍රශ්න පත්‍රයට දාන්න ඕනෑ; ළමයි අමාරුවේ දාන්න ඕනෑ; ළමයි අසමත් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, විභාග දෙපාර්තමේන්තුව තිබෙන්නේ ඒ කාරණාව සඳහා නොවෙයි. විභාග දෙපාර්තමේන්තුව තිබෙන්නේ දරුවන්ගේ බුද්ධිය මනින්න.

ගණිත ගැටලු විසඳීමේ හැකියාව පිළිබඳ යම් කිසි මිනුම් දණ්ඩක් තමයි විභාග ප්‍රශ්න පත්‍රය කියන්නේ. ඒ සඳහා යම් අවස්ථාවක සමාජ මතයක් ආවොත්, -පසු ගිය කාලයේ විද්‍යා ප්‍රශ්න පත්‍රය ගැන හැමෝම කථා කරලා කිව්වා, මේ ප්‍රශ්න පත්‍රය බොහොම බරපතළයි කියලා- එවැනි අවස්ථාවල විභාග දෙපාර්තමේන්තුව තීරණය කරනවා ලකුණු මට්ටම යම් කිසි පල්ලෙහා මට්ටමකට ගෙනැල්ලා හෝ ඒ දරුවන්ගේ බුද්ධිය පිළිබඳව සාධනීයව කල්පනා කරලා ඔවුන්ව ඉදිරියට රැගෙන යාමට; උසස් අධ්‍යාපනය සඳහා ඔවුන් සුදුස්සන් බවට පත් කිරීමට. ඒක නිසා මේක නමාශීලී කාර්යයක්. මේක කළු ගල වාගේ එක තැන තියපු, දරුවන්ගේ ඔළුවට අත අරින එකක් නොවෙයි. විභාග කියන එක එහෙම දෙයක් නොවිය යුතුයි කියන කාරණාව අධ්‍යාපන විශේෂඥයෝ කල්පනා කරලා තිබෙනවා ගරු කථානායකතුමනි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නයට එතුමාගේ පිළිතුර දීර්ඝයි. මම දැන් ඔබතුමාගෙන් දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්නම් කෝ. දැන් ඔබතුමා කියන එක ඇත්ත.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
දැන් ඔබතුමා ප්‍රශ්න තුනක් අහලා ඉවරයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, තව එකක් මම කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවසාන ප්‍රශ්නය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ ගරු කථානායකතුමනි, මම ඉස්සර වෙලා ඇහුවේ පිළිතුර ගැන නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එතුමා කිව්වා මේ තිබෙන අඩු පාඩුව උසස් අධ්‍යාපන ඇමතිතුමාත් කියපු නිසා පිළිගන්නවා කියලා. ඒ නිසා මම හිතනවා එතුමාගේ අනික් ප්‍රශ්නවලට මම උත්තර දිය යුතු නැහැ කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙතුමා කලබල වෙනවා නේ ගරු කථානායකතුමනි. මේ පෙන්නුම් කරමින් තිබෙන්නේ "එස්" සමාර්ථයක් හරියට ලබා දුන්නේ නැති වුණාම වෙන දේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පොඩ්ඩක් ඉන්නකෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරියට "එස්" සමාර්ථයක් ලබා දෙනවා නම් නියෝජ්‍ය ඇමතිතුමා මෙහෙම හැසිරෙන්න විධියකුත් නැහැ. හරියට සමාර්ථය තිබෙනවා නම් මේ ප්‍රශ්නය එන්නේ නැහැ. අඩු සමාර්ථ ලබා දුන්නාම පැන නඟින ගැටලුවක් ඔය තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පොඩ්ඩක් ඉන්න. වැදගත් කාරණාවක් මෙතුමා මතු කරන්නේ. පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න මට ඉඩ දෙන්න. ඔබතුමා කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. "එස්" සමාර්ථය හරියට දීලා නැති නිසායි මේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය සරලව අහන්න, පටලවන්නේ නැතිව.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි, මම අහන්නම්.

ගරු කථානායකතුමනි, එතුමා කියන එක මම පිළිගන්නවා. ඒ කියන්නේ ප්‍රශ්න පත්‍රයක් සංකීර්ණ වුණාට පසුව පරිසාධන ලකුණු මට්ටම පහළ හෙළීමක් කරනවා. හැබැයි ගරු කථානායකතුමනි, ගිය වර්ෂයේ සිදු වී තිබෙන්නේ ඒක නොවෙයි. ගරු කථානායකතුමනි, ගිය වර්ෂයේ සිදු වී තිබෙන්නේ සාමාන්‍ය ලෙස පිළිගන්නා ලද ප්‍රශ්න පත්‍රවල පවා-අමාරු හෝ සංකීර්ණ හෝ ප්‍රශ්න පත්‍ර නොවෙයි- සමත් කිරීමේ ලකුණු මට්ටම පහළ හෙළා තිබීම. සමත් කිරීමේ ලකුණු මට්ටම පහළ හෙළලා, වැඩි ළමයි පිරිසක් අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වුණාය කියලා උදම් අනනවා. ඒක වැරැදියි. කළ යුතුව තිබෙන්නේ ඒ දරුවන්ගේ සැබෑ හැකියාව මැනීමට සමත් වෙන පරිසාධන මට්ටමක් නම් කිරීමයි. ගරු කථානායකතුමනි, මගේ ළඟ තිබෙන තොරතුරු මට නිවැරැදි නැහැ. ඒකයි මම එතුමාගෙන් ඒ ගැන ඇහුවේ. ගණිතයට "එස්" සමාර්ථය දීලා තිබෙන්නේ ලකුණු 17න්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ලකුණු කීයෙන්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලකුණු 17න්. ඒක එහෙම නොවෙයි නම් කියන්න. ඒක තමයි මම ඔබතුමාගෙන් ඇහුවේ. එයට පිළිතුරු ලබා දීලා නැහැ. අපට ලැබී තිබෙන තොරතුරු අනුවයි මා එහෙම කියන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසාම තමයි මම ඇහුවේ ලකුණු මට්ටම කීයද කියලා. ගරු කථානායකතුමනි, ගෙදර ඉන්න දරුවා-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගර කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ඒකට හරියට පිළිතුර ලබා දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එවැනි යම් කිසි අඩු පාඩු සිදු වෙලා තිබෙනවා නම්, අපි ඒ ගැන හොයලා බලලා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්නම්. මෙතුමා මේ පිට කරන්නේ හුළං නේ. නමුත් අපි කථා කරන්නේ වග කීමෙන්. එතුමා හුළං පිට කරන්නේ. එතුමා කටින් වචන පිට කරනවා. තමුන්නාන්සේ කටින් වචන පිට කරනවා. අපි වග කීමෙන් කථා කරනවා. ගරු කථානායකතුමනි, මේ රටේ විභාග දෙපාර්තමේන්තුවෙන් යම් අඩු පාඩුවක් වෙලා තිබෙනවා නම් අපි හොයලා බලලා ඒකට පිළිතුරු දෙන්නම්. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එවැනි දෙයක් සිදු වෙලාද කියලා සොයා බලනවා කියනවා.

දැන් දෙවන වටය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අර පිළිතුර අඩු කොටසට හෙට මට පිළිතුරු දෙන්න කියන්නකෝ. ඒ කොටසට පිළිතුරු දෙන්නකෝ. එතකොට බලා ගන්න පුළුවන්. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 1. ගරු රවි කරුණානායක මහතා.

## විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ගොඩනැඟිලි සහ වාහන : කුලිය/බද්ද
## மின்வலு, எரிசக்தி அமைச்சின் கட்டிடங்கள் மற்றும் வாகனங்கள்: வாடகை /குத்தகை
BUILDINGS AND VEHICLES FOR MINISTRY OF POWER AND ENERGY : RENT/LEASE

1311/ '11

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මඟින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැඟිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැඟිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැඟිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබා ගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබා ගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළැඹි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

යන්න විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010, 2011 ஆகிய வருடங்களில்,

(i) மின்வலு, எரிசக்தி அமைச்சுக்கு உரித்தல்லாத கட்டிடங்களை வாடகைக்கு அல்லது குத்தகைக் குப் பெற்றுக்கொள்வதற்கான மொத்த செல வினத்தையும்;

(ii) வாடகை அல்லது குத்தகைக்குப் பெற்றுக்கொள் ளப்பட்ட கட்டிடங்களின் சதுர அடிக்கான வாடகைப் பெறுமதியையும்;

(iii) இக் கட்டிடங்களுக்கான குத்தகைக்காலத்தையும்

அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(ஆ) மின்வலு, எரிசக்தி அமைச்சு தொடர்பாக மேற்படி வருடங்களில்,

(i) அமைச்சுடன் தொடர்புடைய ஏதாவது அமைப்பு களுக்கு உரித்தில்லாத வாகனங்களை வாட கைக்கு அல்லது குத்தகைக்குப் பெற்றுக்கொள் வதற்குச் செலவுசெய்த மொத்தப்பணத்தையும்;

(ii) சொந்தமாக உள்ள வாகனங்களின் மொத்த எண்ணிக்கையையும்;

(iii) ஏனைய வெளிவள சேவைகள் யாவை என்பதையும்;

(iv) மேற்கூறப்பட்ட வெளிவள சேவைகளுக்கு ஏற்பட்ட செலவினத்தையும்;

(v) வெளிவள அடிப்படையில் ஒப்பந்தம் செய்யப் பட்ட நபர்களின் எண்ணிக்கையையும்;

(vi) பணியாட்களின் மொத்த எண்ணிக்கையையும்

அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he state for years 2010 and 2011 separately-

(i) the total cost for renting or leasing of buildings which are not owned by the Ministry of Power and Energy;

(ii) the square footage rate of rented or leased buildings; and

(iii) the leasing period of the buildings?

(b) Will he also state in relation to the Ministry of Power and Energy for aforesaid years separately-

(i) the total money spent on hiring or leasing of vehicles which do not belong to any of the Ministry related entities;

(ii) the total number of vehicles owned;

(iii) the names of the other outsourced services;

(iv) the cost incurred in outsourced services mentioned above:

(v) the number of people who have been contracted on outsourced basis; and

(c) the total staff strength?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)

ගරු කථානායකතුමනි. ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ)

(i)

| වර්ෂය | පිරිවැය රු. | වැට් 12% රහිතව | වැට් 12% සහිතව | මුළු පිරිවැය රු. |
|---|---|---|---|---|
| 2010 | 16,130,644.00 | - | - | 16,130,644.00 |
| 2011 | 14,087,446.56 | 8,065,332.00 (ජනවාරි-ජූනි) | 6,022,114.56 (ජූලි-ඔක්තෝම්බර්) | 14,087,446.56 |

(ii)

| වර්ෂය | පිරිවැය රු. | වැට් 12% රහිතව | වැට් 12% සහිතව |
|---|---|---|---|
| 2010 | 67.89 | 67.89 | - |
| 2011 | 76.04 | 67.89 (ජනවාරි-ජූනි) | 76.04 (ජූලි-ඔක්තෝම්බර්) |

(iii) අවුරුදු 05 යි (මාස 60)

(ආ) (i) 2010 වසර සඳහා කිසිදු වාහනයක් කුලියට හෝ බද්දට ගෙන නොමැත.
2011 වසර සඳහා වාහන කුලියට ගැනීමට වැය කළ මුළු මුදල රු. 1,282,952.00 කි.

(ii)

| වර්ෂය | අමාත්‍යාංශය සතු වාහන | කුලියට ලබා ගත් වාහන | මුළු වාහන සංඛ්‍යාව |
|---|---|---|---|
| 2010 | 52 | නැත | 52 |
| 2011 | 55 | 04 | 59 |

(iii) පවිත්‍රතා සේවාව
ගොඩනැගිලි පරිශ්‍රය අලංකරණය සඳහා සේවාව

(iv) පවිත්‍රතා සේවාව සඳහා පිරිවැය (වර්ෂයකට) - රු 1,028,160.00
ගොඩනැගිලි පරිශ්‍රය අලංකරණය සඳහා පිරිවැය (වර්ෂයකට) - රු. 91,800.00

(v) අදාල නොවේ

(vi)

| සමස්ත කාර්ය මණ්ඩලය | 2010.12.31දිනට | 2011.12.01 දිනට |
|---|---|---|
| අමාත්‍ය කාර්ය මණ්ඩලය | 38 | 36 |
| අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය | 90 | 105 |
| එකතුව | 128 | 140 |

(ඇ) පැන නොනගී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නයට ලැබී තිබෙන උත්තරය සම්බන්ධයෙන් මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වර්ග අඩි කීයක් ගත්තාද කියලා ඔබතුමා කිව්වේ නැහැ.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

වර්ග අඩි සංඛ්‍යාව මෙතැන සඳහන් කරලා නැහැ. මොකද, වර්ග අඩියක් කොපමණ මුදලක් වෙනවාද කියලා තමයි අහලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කමක් නැහැ. නමුත් 2010 දී රුපියල් 67ට තිබුණු එක රුපියල් 76 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ එක්කෝ රුපියලේ අගය අඩු වුණා; නැත්නම් උද්ධමනය නිසා වැඩි කර තිබෙනවා. ඒ විධියට සියයට 15කින් වැඩි කර තිබෙනවා. වැඩ කරන සේවකයන්ගේ පඩියත් සියයට 35කින් වැඩි කරන්න ඕනෑ කියලා අවුරුදු දෙකක් තිස්සේ සටන් කරලා තිබෙනවා. ඒ පඩි ගෙවීම කරලා තිබෙනවාද? [බාධා කිරීමක්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ප්‍රශ්නයට කිසිම සම්බන්ධයක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා අහලා තිබෙන්නේ වියදම සම්බන්ධයෙන්.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

අපි වෘත්තීය සමිති සමඟ මේ වෙන කොට සාකච්ඡා කරමින් යනවා. අපේ ජනාධිපතිතුමාත් අමාත්‍යාංශයේ වෘත්තීය සමිති සියල්ලත් එක්ක සාකච්ඡා කරලා යම් කිසි සහනයක් ඉදිරි කාලය තුළදී ලබා දෙන්න කටයුතු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ සහනය ලබා දෙන්නේ,- [බාධා කිරීමක්] නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කියනවා, "දෙක" කියලා. හරි, දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පෙරවරු 10.00ට තවත් විනාඩි 5යි තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දෙවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ මෙකයි. තමුන්ට ඕනෑ තරම් ගොඩනැගිලි තියා ගෙන පිටස්තර අයගෙන්

[ගරු රවි කරුණානායක මහතා]

ගොඩනැඟිලි ගත්තාම ඒ සඳහා යන වියදම දරන්න වෙන්නේත් පාරිභෝගිකයන්ටයි. [බාධා කිරීමක්] මම තවම ප්‍රශ්නය ඇහුවේ නැහැ. ඇමතිතුමා වගකීමකින් කිව්වා, වැඩි කරන්නේ නැහැයි කියලා. නමුත් සියයට 20කින් විතර වැඩි කරනවා කියලා දැන් හෙළිදරව් කරලා තිබෙනවා. මේ විධියට විදුලි බිල වැඩි කරන්නේ පාරිභෝගිකයාගෙන් මේ වාගේ අකාර්යක්ෂම දේවල් සිදු කිරීමටද?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
අපි ගොඩනැඟිලි කුලියට නොගෙන, කිහිප ස්ථානයකම අපේම ගොඩනැඟිලි ඉදි කරන්නට මේ වෙන කොටත් අවශ්‍ය කටයුතු කරලා දැන් වැඩ ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමාගේ සමාගමට අයත් ගොඩනැඟිලි සඳහාත් වන බදු මුදල් වර්ෂයක් පාසා වැඩි වෙනවා ඇති කියලා මම හිතනවා. ඒ ගැන මොකද කියන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැඩියෙන් වැඩි වෙනවා.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
ඔව්. වැඩියෙන් වැඩි වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නියෝජ්‍ය ඇමතිතුමා, වෙනස තමයි අපි වැදි බණ කියන්නේ නැහැ. අපි කියන දේ කරන පුද්ගලයන් වශයෙනුත් ව්‍යාපාර ලෝකයේ වැඩ කරන්නේ කොහොමද කියලා දන්නවා. අපට ඒ වාගේ දේවල් කරන්න අවශ්‍යතාවක් නැහැ. නමුත් විදුලි බිල අඩු කරනවාය කියපු මහින්ද චින්තනය විදුලි බිල අඩු කරන්නේ කවදාද කියලා කරුණාකරලා අපට කියන්න.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
පැහැදිලිවම අපි අලුතින් විදුලි බලාගාර,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අලුත් නොවෙයි, අඩු කරනවාද, නැද්ද?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
අපි අලුතින් විදුලි බලාගාර ක්‍රියාත්මක කරලා විදුලිය උත්පාදනය කරන්න කටයුතු කරනවා. ඒ තුළින් අපි අඩු මුදලට විදුලිය උත්පාදනය කරන්න මේ වෙන කොට විවිධ වැඩ පිළිවෙළවල් සහ පරීක්ෂණ කටයුතු කර ගෙන යනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
2080, 2090 කියලා කියයි. එහෙම නොවෙයි.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
නැහැ, අපට එච්චර කාලයක් යන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද බඩගින්නේ ඉන්න කෙනාට හෙට වෙනකල් ඉන්න බැහැ නේ බුරියානි එකක් කන්න.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
තව අවුරුදු 3ක්, 4ක් වාගේ කාලයක් ඇතුළත පැහැදිලිවම අපි විදුලි බිල අඩු කරන්න කටයුතු කරනවා. ඔබතුමන්ලාගේ කාලයේ විදුලිය කප්පාදු කළා. අපේ කාලයේ විදුලි කප්පාදු කරයි කියලා ඔබතුමන්ලා බලාගෙන හිටියා. නමුත් අපි ඒක කළේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි බලන්න, විදුලි බිල වැඩි වුණාම ඒක හෙණයක් නොවෙයිද? දැන් බලන්න, ඊයේ ප්ලාස්ටික් කුඩ නිසා ඇති වුණු තත්ත්වය.

## පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ උපදේශකයන් : විස්තර

### பாராளுமன்ற அலுவல்கள் அமைச்சின் ஆலோசகர்கள்: விபரம்

### ADVISERS UNDER MINISTRY OF PARLIAMENTARY AFFAIRS : DETAILS

1484/'11

**3. ගරු රවි කරුණානායක මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Ajith Kumara)
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பாராளுமன்ற அலுவல்கள் அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்குச் செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காகச் செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங்கப்படும் எனின், ஒவ்வொரு ஆலோச கருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப் பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப்பன வுத் தொகை தனித்தனியாக எவ்வளவென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Parliamentary Affairs :

(a) Will she state-

(i) the number of advisers who serve in the Ministry of Parliamentary Affairs at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will she inform this House-

(i) of the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles; and

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will she state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them; and

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 01යි. (එක් අයෙක් පමණි)

(ii) ඩී.කේ.ආර්. වීරසේකර මහතා

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකි.

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු ඉටු කිරීමේදී ගරු ඇමතිතුමියට සහාය වීම.

(iii)

| | |
|---|---|
| වැටුප | රු.30,000/= |
| ප්‍රවාහන දීමනාව | රු.30,000/= |
| ඉන්ධන දීමනාව | රු.16,440/= |

(iv) සියලු දීමනාවල එකතුව රු.76,440/=

(ආ) (i) ලබා දී නැත.

(ii) ඉහත (අ) (iii) හි දැක්වේ.

(ඇ) (i) කාර්යාල දුරකථන පහසුකම් ලබා දී ඇත.

(ii) ගෙවනු නොලැබේ.

(ඈ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 5-1661/'11-(1), ගරු ඊ. සරවනපවන් මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු ඊ. සරවනපවන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 12,13 සහ 14 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු, විසර්ජන පනත් කෙටුම්පත, 2012, කාරක සභා අවස්ථාව.

## විසර්ජන පනත් කෙටුම්පත, 2012
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
## APPROPRIATION BILL, 2012

***කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-***
***[ප්‍රගතිය: දෙසැම්බර් 14]***
***[කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.-*
*[தேர்ச்சி : டிசம்பர் 14 ]*
*[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]*

*Considered further in Committee -*
*[Progress: 14th December ]*
*[MR. SPEAKER in the Chair.]*

**114 වන ශීර්ෂය.- ප්‍රවාහන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 119,910,000

**தலைப்பு 114.- போக்குவரத்து அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 119,910,000

HEAD 114. - MINISTER OF TRANSPORT

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 119,910,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ශීර්ෂ අංක 114, 306, සහ 307 සලකා බැලීම පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා. ශීර්ෂ 119 සලකා බැලීම අපර භාග 1.00 සිට අපර භාග 6.00 දක්වා. විවාදය ආරම්භ කරන්නේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[පූ. භා. 10.01]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු සභාපතිතුමනි, "2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තුවලට හා ආයතනවලට අදාළ අංක 114, 306 සහ 307 දරන වැය ශීර්ෂයන්ගෙන් එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, ප්‍රවාහන අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා කරන වෙලාවේ ප්‍රවාහන ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ.

එතුමා හිටියා නම් හොඳයි. මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන රෝහණ දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ගමනාගමනය ගැන කතා කරද්දී, ආසියාවේ සංවර්ධනය වන රටක් වශයෙන් අපේ රටේ යටිතල පහසුකම්වල විශාල සංවර්ධනයක් අත්‍යවශ්‍යයි. ගරු සභාපතිතුමනි, විෂය භාර ඇමතිතුමා අද එනවාද දන්නෙත් නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තමුන්නාන්සේ කතාව කර ගෙන යන්න. නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. ඔබතුමා කතාව කරගෙන යන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇහුවා වාගේ -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට නියමිත කාලය නිකම් අපරාදේ ගෙවීගෙන යනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතුමාගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කතා කරද්දී ලකුණු 40ට අඩු ප්‍රමාණයක් තමයි - 'එප් සාමාර්ථයක් තමයි- එතුමාට හම්බ වෙන්නේ. කෙසේ වෙතත් යටිතල පහසුකම් සංවර්ධනයෙන් තමයි අපට ගමනාගමනය දියුණු කරන්න හැකියාව ලැබෙන්නේ.

ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළව පාරවල් සම්බන්ධයෙන් කතා කරනකොට අපි දැක්කා වර්තමානයේ අධිවේගී මාර්ගයක් ඉදි කර තිබෙන බව. අපි සන්තෝෂයි අධිවේගී මාර්ගයක් ඉදි වෙලා ඒ මගින් ජනතාවට පහසුකම් ලැබීම ගැන. හැබැයි අධිවේගී මාර්ගයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. වියදම් කරන මුදල් ප්‍රමාණය අනුව බලනකොට එහි ධාවන පථය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මේ අධිවේගී මාර්ගයේදී යම්කිසි අවස්ථාවකදී අනතුරක් සිදුවුවහොත් වාහනයක් නවත්වා දොරක් අරින්න බැහැ. අධිවේගී මාර්ගයේ ධාවන පථය අසලින්ම පිහිටන, වාහනයක් අබලන් වූ අවස්ථාවකදී නවත්වන ඒ ස්ථානය "shoulder" කියායි හඳුන්වන්නේ. ඒක මේ අධිවේගී මාර්ගයේ පවතින විශාල අඩු පාඩුවක්. ඉතින් අපි මේ ආණ්ඩුවේ අඩු පාඩු පෙන්වා දෙනකොට, මේ වාගේ විශාල ආයෝජන කරනකොට ආණ්ඩුව මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ.

අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් කථා කරන විට දැනටමත් අනතුරු සියයකට වැඩිය සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අනතුරට ලක් වුණු වාහනයක් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය ගැන පැහැදිලි ක්‍රියා පටිපාටියක් ඉදිරිපත් වෙලා නැහැ. වගකිවයුතු ආණ්ඩුවක් ලෙස කටයුතු කරනකොට ප්‍රවාහනයට අදාළව පාරවල් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අපි මීට වඩා -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*
*Whereupon MR. SPEAKER left the Chair, and MR.* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ගමනාගමනය ගැන කථා කරන කොට කියන්න තිබෙන්නේ එන්න එන්නම මේ ආයතන පිරිහී යන තත්ත්වයක් අපට දකින්න ලැබෙන බවයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Yes, what is your point of Order?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Hon. Minister in charge of the subject is not in the House. As the Opposition, we do not want to spoil the opportunity of the Government but the Hon. Minister is not here. We are not calling for a Quorum but we warn the Government: do not let this happen again.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member that is not a point of Order. Hon. Senasinghe, you may continue please.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස් රථ ප්‍රවාහන සේවය ගත්තාම ඒ සඳහා ආණ්ඩුවේ මැදිහත් වීම වැඩි වශයෙන් අවශ්‍යයි. 2010 වර්ෂය ගත්තාම ලංකාවේ පෞද්ගලික බස් රථ සේවය සියයට 44ක් වශයෙනුත් රාජ්‍ය බස් රථ සේවය සියයට 20ක් වශයෙනුත්, දුම්රිය සේවය සියයට 5ක් වශයෙනුත් තමයි තිබුණේ. ඒ අනුව බලන විට රාජ්‍ය බස් රථ සේවාව සහ දුම්රිය සේවය සියයට 25ක වාගේ ඉතා අඩු ප්‍රමාණයකින් තමයි ප්‍රවාහනයට දායක වන්නේ. ඒ විතරක් නොවෙයි, [බාධා කිරීමක්] අහගන්න කෝ, අහගන්න කෝ.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ඔබතුමා අසත්‍ය කියන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අසත්‍ය කියන්නේ කොහේද, ඔබතුමා කෑ ගහන්නේ නැතිව පොඩ්ඩක් අහගන්නකෝ. ඉඳ ගෙන ඉන්නකෝ. [බාධා කිරීමක්] කරදර කරන්නේ නැතිව පොඩ්ඩක් ඉඳ ගෙන ඉන්න කෝ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "ගෙන යන" කථා තමයි හැමදාම අපට ඇහෙන්නේ. මේ ආණ්ඩුවේ තිබෙන විශේෂ කාර්ය භාරය මේක තමයි. "අපි ගෙන යනවා, ඉදිරියේ දී ගෙන යනවා" කියනවා. අවුරුදු 17ක් ආණ්ඩු කරනවා. ගෙන ගිය දෙයක් නම් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. "කටින් බතල කොළ හිටවනවා" විතරයි මේ ආණ්ඩුව කරන්නේ. මේවා අහගෙන හිටියා නම් ඔබතුමන්ලාට තේරෙයි.

සීටීබී එකේ අවුරුද්දකට පාඩුව රුපියල් මිලියන 3,979යි. මේ රාජ්‍ය සේවයේ දූෂණය. අමාත්‍ය මණ්ඩලයේ දූෂණය ගැන කථා කරන්න කලින් රාජ්‍ය සේවයේ දූෂණය ක්‍රියාත්මක වන්නේ මේ ආකාරයටයි කියන එක කියන්න ඕනෑ. මෙතුමන්ලා මේවාට උල්පන්දම් දෙනවා. මොකද, රාජ්‍ය සේවකයා හොරකම් කරන කොට තමයි, ඒ ආකාරයේ දූෂණ සිදු වන විට තමයි තමන්ට හොරකම් කරන්න පුළුවන් වන්නේ. ලොකු ගණනක් ගහගන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආකාරයට railway එකේ පාඩුව රුපියල් මිලියන 1,553යි. මේ රටට සේවය කරන්න පුළුවන්

[ගරු සුජීව සේනසිංහ මහතා]

ආයතන දෙකක්. නමුත් කළමනාකරණය හරි නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ පාඩු ලබන ආයතනවල සේවක ප්‍රමාණය එන්න එන්න වැඩි වනවා. බස් රථ ප්‍රමාණය අඩු වනවා. දුම්රිය මාර්ග හැදෙන්නේ නැහැ. එන්ජින් ගෙන්වනවා; පෙට්ටි ගෙන්වනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2009 දී ශ්‍රී ලංගම බස් රථ ප්‍රමාණය 4,482යි. නමුත් එය 2011 දී 4,307කට අඩුවෙලා යනවා. සේවක සංඛ්‍යාව 2008 දී 34,074යි. 2009 දී 35,895යි. මේකද ඔබතුමන්ලා ඔය කියන ඉදිරි අනාගතයේ වර්ධනය? දේශපාලනය, දූෂණය ඉහ වහා ගිය මේ දෙපාර්තමේන්තු ඉතා සුළු ප්‍රමාණයකට හම්බ කර ගන්න රටේ ජනතාව එන්න එන්නම දුක් විඳින්නට ඕනෑ බව මේකෙන්ම පෙනෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි විශේෂයෙන්ම මේ සේවකයන්ව බඳවා ගත්තාට කමක් නැහැ, හරියාකාර වැටුපක් ගෙවනවා නම්, අර්ථ සාධක ගෙවනවා නම්, පාරිතෝෂික ගෙවනවා නම්, -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Senasinghe, you have only one more minute.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I just started.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
What can I do?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I just started.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You were given 15 minutes. Fourteen minutes are over now and only one more minute is left.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I have eight minutes. I started at -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You started at 10 o'clock.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
So it is only 10 minutes then. It is 10.10 now. It is very clear. I started at 10.00 and it is 10.10 now.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
You started at 10 o'clock.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Yes, that is right. But, the time is 10.10 now.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
All right. I will give you two or three minutes more.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I got 17 minutes. I started at 10.00 and it is 10.10 now. The clock is in front of me.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔබතුමා කථා කරන්නේ නැහැ නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කථා කරන්නේ කොහොමද නවත්වනකොට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර්ථ සාධක අරමුදල් විශාල ප්‍රමාණයක් සම්බන්ධව ජනාධිපතිතුමාටත් සමස්ත ලංකා සේවක සංගමය කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. එහි සඳහන් වනවා, "2012 අය වැය ලේඛනය මඟින් ශ්‍රී ලංගමයට වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම තුළින් ශ්‍රී ලංගම ඇතුළු සේවකයන් බලවත් අසීරුතාවකට පත් වී ඇති බැවින් මූල්‍ය ප්‍රතිපාදන වැඩි කරන ලෙස ඉල්ලා සිටිමි." කියලා. මෙහිදී අවම වැටුප සම්බන්ධයෙන්ද ඔවුන් සඳහන් කරලා තිබෙනවා, රුපියල් 11,730ක අවම වැටුපක් ලැබෙන්නට තිබෙද්දී එතුමන්ලාට ලැබෙන්නේ රුපියල් 8,430ක වැටුප් ප්‍රමාණයක් කියලා. විශේෂයෙන්ම අර්ථ සාධක අරමුදල සම්බන්ධ Committee එක ගැන විශාල දූෂණයක් ඉදිරිපත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එහි සඳහන් වනවා, එම කොමිටියට ඇතුළත් විය යුතු එම නිලධාරින් දෙදෙනාගෙන් මණ්ඩලයට අයිති නැති, විශ්‍රාම යවපු විජේසිරි සිල්වා නැමැති හිටපු ප්‍රධාන ගිණුම් නිලධාරියාව ආපසු අරගෙන, ගණකාධිකාරි සහ ප්‍රධාන කළමනාකරු නිලවලින් ඉවත් කරලා සහ මාරු කරලා තිබෙනවා කියලා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ අනුව බස් මිලදී ගැනීම සඳහා අර්ථ සාධක අරමුදල පාවිච්චි කිරීමට අමාත්‍යාංශයේ මැදිහත්වීමක් වාගේම උවමනාවක් තිබෙන බව පෙනී යනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පාරිතෝෂික මුදල් ගෙවලා නැහැ. විශාල ප්‍රමාණයක් ඉන්නවා පාරිතෝෂික සම්බන්ධයෙන් නඩු දමලා. ඒ මුදල් ප්‍රමාණය ගෙවන්න කිසිම උවමනාවක් ආණ්ඩුවට නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ජනාධිපතිතුමා අය වැයේදී ප්‍රකාශ කර තිබෙනවා, බස් විශාල සංඛ්‍යාවක් මිලදී ගන්නවා කියලා. හැබැයි මේ අර්ථ සාධක අරමුදල මේ සඳහා පාවිච්චි නොකළ යුතුයි. විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය ජනාධිපතිතුමාට ඉදිරිපත් කරපු ලියුමේ මෙසේ සඳහන් වනවා:

"2012 අය වැය ලේඛනය තුළින් ශ්‍රී ලංගමය ශක්තිමත් කිරීමටත් ශ්‍රී ලංගම සේවකයින්ගේ ප්‍රශ්න විසඳීමටත් මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙනු ඇතැයි සමස්ත ශ්‍රී ලංගම සේවකයින් බලාපොරොත්තු ඇතිකර ගෙන සිටිමුත් ශ්‍රී ලංගමයට මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය ප්‍රමාණය වෙන් නොකිරීම තුළින් එම සියලු බලාපොරොත්තු සුනුවිසුනු වී ලංගම සේවකයින් බලවත් අසීරු තත්ත්වයකට පත්වී ඇත.

2005 මහින්ද චින්තනයෙන් පොරොන්දු වූ පරිදි, එම පොතේ 56 පිටුවේ "වසර 3ක් තුළ බස් රථ 5000ක් අලුතින් ලබා දෙමින් ශ්‍රී ලංගමය ශක්තිමත් කරන්නෙමි" යනුවෙන් වූ පොරොන්දුව තවමත් ඉටුකර නොමැති අතර 2012 අය වැය තුළින් අලුත් පොරොන්දු ඉදිරිපත් කර ඇත. 2012 අය වැය තුළින් ශ්‍රී ලංගමය ශක්තිමත් කිරීමට නම් කළ යුතුව තිබුණේ 2005 මහින්ද චින්තනය මඟින් පොරොන්දු වී මෙතෙක් ලබා නොදුන් අලුත් බස් රථ 2737ක් අලුතින් ලබා ගැනීමට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම ය."

හැබැයි මේක වෙලා නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඊළඟට එම ලියුමේ මෙසේ සඳහන් වනවා :

"නමුත් එම පෙරොන්දුව අමතක කර ලාභදායි නොවන මාර්ග සේවාවන් සඳහා මිලියන රුපියල් 3170ක මුදලක් ද අලුත් බස් රථ සහ එන්ජින් ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 880ක මුදලක් ද කුඩා බස් රථ 200ක් ලබා දීමට රුපියල් මිලියන 500ක මුදලක් ද වෙන් කර ඇත. 2005 මහින්ද චින්තනයෙන් පොරොන්දුවී මෙතෙක් ලබා නොදුන් ඉතිරි 2737 ලබා දීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර 2012 ලබා දීමට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් යාන්තමින් හෝ ශ්‍රී ලංගමය පවත්වාගෙන යා හැකිය."

මේ ආකාරයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව පොරොන්දු ගොඩක් දෙනවා. හැබැයි මේ ගමනාගමනය නංවන්නවත් එය සංවර්ධනය කරන්නවත් කටයුතු කරන්නේ නැහැ. කළමනාකරණය ගැන අපි සෑහීමට පත් වෙන්නේ නැහැ. එන්න එන්නම මේක පාඩු ලබනවා. එන්න එන්නම විනාශයට පත් වෙනවා. ඒ මඟින් සුළු පිරිසක් ආදායම් ලබා ගන්නවා. තවත් පිරිසක් ටෙන්ඩර් දමලා විශාල ආදායමක් උපයා ගන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගමනාගමනය වැටෙනවා කියන්නේ රටේ සංවර්ධනය වැටෙනවා කියන එකයි. අද විශාල වශයෙන් බස් ගෙනෙනවා; එන්ජින් ගෙනෙනවා; ඒ වාගේම පෙට්ටි ගෙනෙනවා. හැබැයි යන්න රේල් පාරවල් නැහැ. මේ වන කොට ගාල්ලේ ඉඳලා එන රේල් පාරක් ගලවලා ආපසු හදනවා. මං තීරු දෙකක් හදන්න පුළුවන්, ඒ රේල් පාර අලුත්වැඩියා කළා නම්. හැබැයි එසේ නොකර මුදල් වංචා කිරීම සඳහා, ඒ තිබුණු එක රේල් තීරුවක් ගලවලා ඒක උඩින් අලුත් එකක් හදනවා. හම්බන්තොටට, කතරගමට රේල් පාරවල් හදනවා කිව්වත් ඒ සම්බන්ධයෙන් කථාව පමණයි. මෙතුමන්ලා කියන්නේ, "ඉදිරි අනාගතයේ හදනවා" කියලායි. ඒ සම්බන්ධයෙන් අපි දකින අනාගතයක් පේන්න නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, මේ විශාල දූෂණය නවත්වලා, ආණ්ඩුවේ කරන දූෂණය නවත්වලා, අමාත්‍ය මණ්ඩලයෙන් කරන දූෂණය නවත්වලා ජනතාව ගැන විනාඩියකට හිතලා කටයුතු කරන්නය කියලා.

දේශපාලනයට එන්න කලින් සාමාන්‍ය ජනතාව එක්ක කටයුතු කරන කොට ඔබතුමන්ලාගේ හදවතේ තෙතමනය තිබුණා. හැබැයි, ඔබතුමන්ලා ආණ්ඩුවට ආවාට පස්සේ මේවා අමතක වනවා. මතක් වන්නේ තමන්ගේ බඩ වියත රැක ගැනීම පමණයි. එපමණක් නොවෙයි. පරම්පරා ගණනකට හම්බ කිරීම පමණයි තමන්ට වුවමනා වන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපි ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලාට පොඩි හෝ තෙතමනයක් තිබෙනවා නම් ජනතාව වෙනුවෙන් තමන්ගේ සේවය කැප කරන්නය කියලා. පොඩ්ඩක් හම්බ කර ගත්තාට කමක් නැහැ. හැබැයි හම්බ කර ගැනීමට ප්‍රමුඛස්ථානය දෙන්න එපා. තමන්ගේ ජීවිතය තව අවුරුදු 30ක්, අවුරුදු 40ක් තිබේවි. එම නිසා ඉදිරි අනාගතයේදී හෝ ඒ සහයෝගය ජනතාවට ලබා දෙන්නය කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ. භා. 10.14]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මා සන්තෝෂ වනවා, අද දවසේ අය වැය විවාදයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන මේ වෙලාවේ ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන. ඒ වාගේම මා මුලින්ම කියන්න ඕනෑ, මේ පිළිබඳව ඉතාමත් වැදගත් දත්ත සහ තොරතුරු කිහිපයක් මා රැගෙන ආ බව. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මේ සභාව නොමඟ යැවීම සඳහා හැම දාම වාදනය කරන එතුමාගේ තැටිය අද දවසේත් වාදනය කරපු බව කියන්න ඕනෑ. මොකද, එතුමා හැම දාම දූෂණය, වංචාව ගැන තමයි කථා කරන්නේ. අපි ඉස්සෙල්ලා එතුමාට කියා දෙන්න ඕනෑ, ලංගම විනාශ කළේ කවුද කියන එක.

රුපියල් කෝටි හයසිය පණහක් වටිනා ලංගම 1991 දී රුපියල් කෝටි තුනහමාරකට රවි වෙත්තසිංහට දුන්නේ කවුද කියලා තමුන්නාන්සේගේ දකුණු පැත්ත බලලා අහගන්න. තමුන්නාන්සේ ඒ කාලයේ සිටියේ නැහැ. තමුන්නාන්සේලා ජනතා සන්තක ප්‍රවාහන සේවය කියලා මොනවාද කළේ? 60,000ක් හිටපු ලංගම සේවක සංඛ්‍යාව 35,000ට බැස්සුවේ තමුන්නාන්සේලායි. ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේලාට සදාචාරාත්මක අයිතියක් නැහැ, මේ ගැන කථා කරන්න. තමුන්නාන්සේ නොදන්නා දේවල් ගැන කථා කරන්නත් එපා. [බාධා කිරීමක්] අපට කනගාටුයි. කිරි සප්පයන් වාගේ නොදන්නා දේවල් ගැන අහගත්ත දේවල් ගැන එකම තැටිය හැම දාම වාදනය කරනවා. ඒ පිළිබඳව අපි කනගාටු වනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - [බාධා කිරීම්] සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. මට මගේ වේලාව ලබා දෙන්න කටයුතු කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා. එතුමා හැම දාම රට නොමඟ යවන්න, මේ සභාව නොමඟ යවන්න කටයුතු කරනවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ රටේ ලංගම, දුම්රිය ඇතුළු ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීමට 2012 වර්ෂය සඳහා රුපියල් මිලියන 41,850ක් වෙන් කරලා තිබෙනවා. අපි ඉතාම පැහැදිලිව - [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා, මට කරදර කරන්න එපා. පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේ ඉඳ ගන්න. රුපියල් මිලියන 41,850ක් වෙන් කරලා තිබෙනවා. මම හිතන්නේ මෑත යුගයේ මේ රටේ- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ප්‍රාග්ධන වියදම්?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

මම සියලු වියදම් ඔබතුමාට කියන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම අහන්නේ ප්‍රාග්ධන වියදම්- [බාධා කිරීමක්]

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ප්‍රාග්ධන වියදම් ඇතුළු සියලුම වියදම් මම කියන්නම්. අද රුපියල් මිලියන 41,850ක් වෙන් කරලා තිබෙනවා මේ ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා. මේ රටේ ප්‍රවාහන පද්ධතිය වෙනුවෙන් එවැනි වෙන් කිරීමක් මෑත යුගයේ යම් කිසි රජයක් කළා නම් ඒ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය කියන එක අපි ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම රටක ජීවය වෙන්නේ ප්‍රවාහන පද්ධතියයි. මම හිතන්නේ අපි රට හැටියට ශරීරයක් ගත්තොත් ඒ ශරීරයේ තිබෙන නහර වැල්, ස්නායු පද්ධතිය අධිවේගී මාර්ග වෙන්න පුළුවන්, මහා මාර්ග වෙන්න පුළුවන්, "ඒ" ශ්‍රේණියේ මාර්ග වෙන්න පුළුවන්, "බී" ශ්‍රේණියේ මාර්ග වෙන්න පුළුවන්, ග්‍රාමීය මාර්ග වෙන්න පුළුවන්. ශරීරයේ නහර වැල්, ස්නායු පද්ධතිය ඔස්සේ නිරන්තරයෙන් ලේ ගමන් කරනවා වාගේම ඒ හැම මාර්ගයක් තුළම පැය 24 පුරාම ප්‍රවාහන පද්ධතිය ක්‍රියාත්මක වෙනවා නම් අපි කල්පනා කරන්නේ අපේ ශරීරය හා සමානව ඒ රට අකර්මණ්‍ය නොවී ඉස්සරහට යනවා කියන එකයි. අද මේ රටේ අධිවේගී මාර්ගයේ ඉඳලා ගමේ තිබෙන කුඩාම මාර්ගය දක්වා ප්‍රවාහන ක්ෂේත්‍රය ඉතාම හොඳින් පවත්වා ගෙන යන්න අපේ රජය කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කථා කළා අධිවේගී මාර්ග ගැන. විශේෂයෙන්ම අපි මේ වෙලාවේ එතුමාට මේ කාරණය ප්‍රකාශ කරන්න ඕනෑ. අපි දැක්කා ඉන්දියාවේ අධිවේගී මාර්ග හදපු වෙලාවේ ඒ අධිවේගී මාර්ගයට හුරු වෙන්න ඒ රටේ ජනතාවට අවුරුදු 3ක කාලයක් ගිය බව. අපට මේක අලුත් දෙයක්. අද අධිවේගී මාර්ගය පාවිච්චි කරන, ඒ අධිවේගී මාර්ගයේ ඉස්සරහම යන කෙනා දෙපැත්ත බලා ගෙන යන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ මට කරදර කරන්න එපා. තමුන්නාන්සේට අවස්ථාවක් දුන්නා නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මගේ වෙලාව දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා කියන එක මම පිළිගන්නවා. නමුත් අනතුරක් වුණාම කාර් එක නවත්වලා දොර අරින්න බැහැ නේ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඒකට තමයි services තිබෙන්නේ. ඒ සඳහා පොලීසිය ඇති කරලා, ඒ අනතුරු වන දේවල් ගෙනි යන්න සේවාවන් ඇති කරලා තිබෙන්නේ. අධිවේගී මාර්ගයේ වාහන හදන්නේ නැහැ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. අධිවේගී මාර්ගයේ garage නැහැ. ඒ අවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යන්න සුදුසු ස්ථාන තිබෙනවා. ඔබතුමාගේ නොදන්නාකම ගැන මට කනගාටුයි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා අධිවේගී මාර්ගයේ තව පාරක් ගිහිල්ලා බලලා එන්න කියලා. බලලා නොවෙයි ඒ අධිවේගී මාර්ගය හරහා එන්න. ඇවිල්ලා මට කථා කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගේ නොදන්නාකම ගැන මට කනගාටුයි. මේ 21 වන සියවසේ ලෝකයේ අපි ඉන්නේ කොතැනද, අපි යන්නේ කොතැනටද, අධිවේගී මාර්ග අපිට අවශ්‍යද, නැද්ද කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. මම හිතන්නේ රටක සංවර්ධනය ගැන කල්පනා කළාම ඒ රටේ ප්‍රවාහන පද්ධතිය තමයි ඉතාම වැදගත් වෙන්නේ කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට අරමුණක් තිබෙනවා. අපට යම්කිසි බලාපොරොත්තුවක් තිබෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ විශේෂයෙන් ශ්‍රී ලංගම, දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ලක්දිව ඉංජිනේරු සමාගම වාගේම ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය යන ආයතන පහ හරහා අපි අපේ සේවාවන් ලබා දෙනවා. විශේෂයෙන්ම අපි ලෝකයත් එක්ක බද්ධ වෙලා තමයි මේ රටේ ප්‍රවාහන පද්ධතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙන්නේ. අපි දකිනවා පාරිසරික තිරසාර ප්‍රවාහන පද්ධතියකට -EST - Environment Sustainable Transport එකකට- අද අපේ රට ගමන් ගන්නා බව. විශේෂයෙන් අපි කියන්න ඕනෑ, Bangkok Declaration එකට අනුව අපේ රටේ ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතු කරමින් තිබෙන බව.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා safe කියන න්‍යාය යටතේ සුරක්ෂිත ආරක්ෂාකාරී නිරුපද්‍රිත ගමනාගමනයක් ක්‍රියාත්මක කරන්න කටයුතු සලසා තිබෙනවා. ඒ වාගේම ආරක්ෂිත - secure- සහ සුරක්ෂිත විශ්වාසදායක ක්‍රමයට ගමනාගමනය ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම ඉක්මන්- quick- සහ ශීඝ්‍ර ගමනාගමන සේවයක් ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම විශ්වාසනීය - reliable- සහ මනා ගුණයෙන් යුතු ගමනාගමන පද්ධතියක් ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම මිල අඩු - affordable- සාධාරණ මිලක් සහිත ගමනාගමන ක්‍රමයක් මේ රට තුළ ක්‍රියාත්මක කරන්න, ඒ වාගේම කාර්යක්ෂම - efficient- සහ දක්ෂ ඉතාම නම්‍යශීලී, සුමට ගමනාගමන පද්ධතියක් ක්‍රියාත්මක කරන්න Bangkok Declaration එක අනුව අපේ රජය අවශ්‍ය කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් ජනතාව කේන්ද්‍රගත වුණු පරිසර හිතකාමී සහ තිරසාර වූ ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම තමයි අපේ අරමුණ කර ගෙන තිබෙන්නේ.

මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ලංගම සේවක සංඛ්‍යාව ගැන කිව්වා. 60,000ක් වුණු සේවක සංඛ්‍යාව 35,000ට බැස්සුවේ එක්සත් ජාතික පක්ෂ රජයයි. ඒක අපිට අමතක කරන්න බැහැ. ජනතාවටත් ඒවා අමතක කරන්න බැහැ. රුපියල් කෝටි ගණනක් වටිනා වේරහැර ආයතනය වෙත්තසිංහට කෝටි තුනහමාරකට දුන්නෙත් එක්සත් ජාතික පක්ෂ රජයයි. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ තමයි මේ රටේ ජනතා සන්තක ප්‍රවාහන සේවය විනාශ කර දැම්මේ. පෞද්ගලික ප්‍රවාහන සේවයට අපි අකැමැති නැහැ. නියෝජ්‍ය ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් කියන්න ඕනෑ, අද ශ්‍රී ලංගම බස් රථ 5,200ක් සහ පෞද්ගලික බස් රථ 19,000ක් මේ රට තුළ ක්‍රියාත්මක වනවාය කියා. ඒ වාගේම දුම්රිය ප්‍රවාහන සේවයෙන් සියයට 6කට වැඩි මහ ජනතාවකට, රාජ්‍ය සේවකයින්ට ගමනාගමන පහසුකම් සපයන බව කියන්නට ඕනෑ.

වෙනත් වාහනත් ඒ වාගේමයි. පාසල් බස් රථ වෙන්න පුළුවන්; ලොරි වෙන්න පුළුවන්; ට්‍රැක්ටර් වෙන්න පුළුවන්; කාර් වෙන්න පුළුවන් මේ ආදී වශයෙන් ඒ සියල්ල උපයෝගී කර ගෙන අපි ඒ කටයුත්ත ක්‍රියාත්මක කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ශ්‍රී ලංගමයේ බස් රථ 5,200ක පාසල් දරුවෝ සියයට 23ක් යනවා. පාසල් දරුවන්ට සම්පූර්ණ ගමන් ගාස්තුවෙන් සියයට 10ක වටිනාකමකට season ticket එක අරගෙන යන්න පුළුවන්. ඒ කියන්නේ මාසයකට දවස් දෙකක ගමන් ගාස්තුව හා සමාන මුදලකට season ticket එකක් අරගෙන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මේ රටේ පාසල් දරුවන්ට මාසයටම යන්න පුළුවන් විධියට පාසල් බස් සේවාව සලසනවා, ඔවුන්ට මධ්‍ය මහා විද්‍යාලයට එන්න; නගරයට එන්න; පාසලට එන්න. ඔවුන් ඉගෙන ගත්තාම, ඔවුන් දිසාපතිවරුන් වුණාම, ඔවුන් වෛද්‍යවරුන් වුණාම, ඔවුන් නීතිඥවරුන් වුණාම ලංගම පාඩු ලබනවායි කියලා ඔබට තක්සේරු කරන්න බැහැ. ඒ වාගේ ආධ්‍යාත්මික සර්ව සාධාරණ සේවයක් ලංගමින් සලසනවා. ඔබතුමාට නොවෙන්නට පුළුවන්, හැබැයි ගමේ ඉන්න දරුවන්ට

අධ්‍යාපනය ලබලා මේ රටේ දිසාපතිවරුන් වෙන්න, මේ රටේ ගුරුවරුන් වෙන්න, මේ රටේ විදුහල්පතිවරුන් වෙන්න, ජාත්‍යන්තරයට ගිහිල්ලා රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් අපව නියෝජනය කරන්න ලැබෙන්නේ ගමේ සිට season ticket එක අරගෙන ඒ දරුවන්ට අධ්‍යාපනය ලබන්න එන්න හැකිකම ලැබෙන නිසායි. ඒ නිසා සුජීව සේනසිංහ මන්ත්‍රීතුමන්ලා ඒක අමතක කරන්න එපා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ විවාදයේදී දුම්රිය මාර්ග ගැන කථා කළා. අද කතරගම දුම්රිය මාර්ගය සංවර්ධනය කරන්න, මාතර-බෙලිඅත්ත දුම්රිය මාර්ගය සංවර්ධනය කරන්න, ඒ වාගේම සුජීව සේනසිංහ මන්ත්‍රීතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ මේ රටේ කොටසක් බෙදලා වෙන් කර දීලා තිබුණු උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ දුම්රිය මාර්ගය නැවත සංවර්ධනය කරන්න කටයුතු කර ගෙන යනවා. අද කාණ්ඩිකුලම් ගැන, යාපනය ගැන, මඩකලපුව ගැන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට කථා කරන්න පුළුවන් කමක් නැහැ. ඔබතුමන්ලා ඒ කාලයේ මේ රටෙන් භාගයක් විකුණපු අය. අද කොහොමද තමුන්නාන්සේලා මේ ගැන කථා කරන්නේ? තමුන්නාන්සේලා මේ රට විකුණුවා; මේ රට බන්දේසියක තියලා භාර දුන්නා. අන්න ඒ රටේ තමයි අද අධිවේගී මාර්ග හැදෙන්නේ; දුම්රිය මාර්ග හැදෙන්නේ; අද ඒ ප්‍රදේශ සංවර්ධනය වන්නේ. අද වවුනියාවේ සිට ඕමන්තෙට, කාණ්ඩිකුලම්වලට දුම්රිය මාර්ග හදනවා, යාපනය දක්වා දුම්රිය මාර්ගය ගෙනි යන්න. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තව අවුරුදු දෙකක් ඇතුළත යාපනයට දුම්රිය සේවය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට ඒ ගැන කථා කරන්න අයිතියක් නැහැ. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, දුම්රියත් විනාශ කළේ මෙතුමන්ලායි කියලා.

දුම්රිය දෙපාර්තමේන්තුවේ 35,000ක සේවක සංඛ්‍යාවක් සිටියා. එය සේවකයන් 14,000ට බැස්සුවා. අද ඒ දුම්රිය සේවය ගොඩ ගන්න වෙලා තිබෙන්නේ, අලුතින් දුම්රිය මැදිරි ගෙනෙන්න වෙලා තිබෙන්නේ, දුම්රිය එන්ජින් ගෙනෙන්න වෙලා තිබෙන්නේ අපේ රජයටයි. මෙතුමන්ලා කරපු පව් ඔක්කොම දැන් කර ගහන්න වෙලා තිබෙන්නේ අපේ රජයටයි. හැබැයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ පව්වලට කර ගහලා හරි මේ රට ගොඩ ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

අපි තමුන්නාන්සේලාට ඉතාම පැහැදිලි ලෙස කියන්න ඕනෑ, අපේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ගැන. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අද මාර්ග අනතුරු ගැන කථා කළා. ඉන්දියාව අධිවේගී මාර්ග හැදුවා. අධිවේගී මාර්ග හදලා ඉන්දියාවට අවුරුදු තුනක් ගියා, ඒ ජනතාව අධිවේගී මාර්ගයට සාමාන්‍ය ලෙස හුරුපුරුදු වන්න; අනතුරු සංඛ්‍යාව සාමාන්‍ය වෙන්න. ඉන්දියාවේ විතරක් නොවෙයි යුරෝපයේත් එහෙමයි. අපි ජපානයට ගිහිල්ලා තිබෙනවා; ලෝකයේ බොහෝ තැන්වලට ගිහිල්ලා තිබෙනවා. ඒ හැම රටකම අධිවේගී මාර්ග හදන කොට ඒවාට පුරුදු වෙන්න සාමාන්‍ය කාලයක් ගත වෙනවා. ඒ අවශ්‍ය ගුණාත්මක භාවය - quality එක- සහිතව මාර්ග පද්ධතිය හරිගස්වන්නට කාලයක් ගත වෙනවා. ලෝකයේ ජනතාව එක පාරට ඒවාට පුරුදු වුණේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා ඒ ගැන කනගාටු වෙන්න එපා.

අපි විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි අලුත් ක්‍රමවේදයන් -මාර්ග අනතුරු අඩු කිරීමේ ක්‍රමවේදයන්, ඒ වාගේම ගමනාගමනය වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයන්- වැඩිදියුණු කරන්න අවශ්‍ය කටයුතු මේ වෙලාවේ කරනවා. විශේෂයෙන් පසු ගිය අවුරුද්දේ පමණක් accidents 20,713ක් වෙලා තිබෙනවා. ඒ accidents ප්‍රමාණය 2012 වන විට යම් ආකාරයකින් අඩු කරන්නට අපි බලාපොරොත්තු වුණා. අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම තුළ සහ ඒ සඳහා නව ක්‍රමවේදයන් හඳුන්වා දීම තුළයි. අපි අලුත් ක්‍රමවේදයන්, දැනුවත් කිරීමේ වැඩසටහන් - awareness programmes - අපේ ප්‍රවාහන අමාත්‍යාංශය හරහා අද ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපි කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. අද මේ රටේ මේ වන විට වාහන 4,433,968ක් තිබෙනවා. ඒවා motorcycles වෙන්න පුළුවන්; බස් වෙන්න පුළුවන්; ට්‍රැක්ටර් වෙන්න පුළුවන්. නමුත් රටේ ජනගහනය ලක්ෂ 200යි. ඒ ලක්ෂ 200ක ජනගහනයට වාහන 4,433,968ක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කියන්නේ මේ රටේ ජනතාවගෙන් පහෙන් එක්කෙනෙකුට අද වාහනයක් තිබෙනවාය කියන එකයි. ඒක මෝටර්සයිකලයක් වෙන්න පුළුවන්; බස් එකක් වෙන්න පුළුවන්; කාර් එකක් වෙන්න පුළුවන්. එහෙම නම් අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කරන විධියට අපේ රටේ ජනතාවගේ අවශ්‍යතාවන්, වුවමනාවන් ඉටු වෙනවා. අපේ දරුවන්ගේ පාසල් යන බස් රථ සේවය වාගේ දේවල් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ අද අපේ රට තුළ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්-[බාධා කිරීමක්] තමුන්නාන්සේ මට නිදහසේ කථා කරන්න දෙන්න. [බාධා කිරීමක්] ඔබතුමා බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් වශයෙන් මම ඒ දේ බලාපොරොත්තු වෙනවා. අපට මේ අය වැය විවාදයේදී වැදගත් දේවල් කථා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අද ඒ වැඩ පිළිවෙළ අපි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හරහා ගෙන යනවා. ඒ වාගේම අපි ක්‍රියාත්මක කරනවා GPS - Global Positioning System - එක. ඒක අද අපේ රට තුළ ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් අපි කියන්න ඕනෑ මුහුදුබඩ දුම්රිය මාර්ගය, ඒ වාගේම මාතර-බෙලිඅත්ත දුම්රිය මාර්ගය ගැන. දුම්රිය එන්ජින් කට්ටල ගේන්න අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අද රාජ්‍ය සේවකයෝ season ticket එක අර ගෙන දුම්රියෙන් රාජකාරියට එනවා. බස් රථ ගෙන්වීමේදී අය කරන වැට් බද්ද මේ අය වැය ලේඛනයෙන් ඉවත් කිරීම තුළින් මේ ක්ෂේත්‍රයට අලුතෙන් කෙනෙකුට පිවිසෙන්න පුළුවන්කම තිබෙනවා. දැන් අලුතින් බස් එකක් ගන්න ගියාම ඒකේ වැට් බද්ද ඉවත් කරන්න අප කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ලොරි රථ සහ ටිපර් රථවල වැට් බද්ද සහ තීරු බද්ද - ටැක්ස් එක- අයින් කර තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ කාලයේ ටැක්ස් ගැහුවා. ඒ කිසිම සහනයක් දුන්නේ නැහැ. අද ඒවා ඉවත් කරලා ඒ අයට අප සහන සලසා තිබෙනවා. ලොරි, බස් සඳහා ගන්නා ටයර්වල තීරු බද්ද සියයට 50කින් අඩු කරන්න කටයුතු කර තිබෙනවා. මේ තුළින් ඔවුන් උනන්දු වෙනවා. ව්‍යාපාරිකයෝ උනන්දු වෙනවා. මඟී බස් සේවය සඳහා උනන්දු වෙන යම් කෙනෙක් ඉන්නවා නම් ඔහුට ඒ සඳහා පෙළඹෙන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. [බාධා කිරීමක්] මෙතුමන්ලා හැම වෙලාවේම කියන්නේ පෞද්ගලික අංශය මේකෙන් අයින් කර දමලා කටයුතු කරන්න කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප ඉතා පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. විශේෂයෙන් අපේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් ගැන අප කථා කළා. මහින්ද චින්තනයේ අප කිව්වා ප්‍රවාහනය පිළිබඳ තිරසාර ජාතික ප්‍රතිපත්තියක් ගොඩනැඟීමට කටයුතු කරනවා කියලා. ඒ වාගේම 2011 දී ආරක්ෂක ප්‍රවාහන පද්ධතියක් -road safety system එකක්- අලුත් න්‍යාය පත්‍රයක් අප ඉදිරිපත් කළා. මීට මාස කීපයකට පෙර අතිගරු ජනාධිපතිතුමාට අප ඒ ගැන කිව්වා. මේ රටේ ඉන්න උගතුන්, බුද්ධිමතුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, මහාචාර්යවරුන් පමණක් නොවෙයි පාරේ යන මඟියා, ගොවියා, කම්කරුවා යන මේ සියලු දෙනාම එකතු වෙලා අප අලුත් ප්‍රතිපත්තියක් හැදුවා, ඉදිරි අවුරුදු 10 තුළ දී අප කොහොමද මේ රටේ ප්‍රවාහන පද්ධතිය දියුණු කරන්න ඕනෑ කියලා. ඒ සෑම

[ගරු රෝහණ දිසානායක මහතා]

ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ප්‍රවාහන පද්ධතිය දියුණු කරන්න, ඒ වාගේම අලුත් තාක්ෂණය මේ රටට ගේන්න අප කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉදිරි කාලයේ - 2012 දී- අප ක්‍රියාත්මක කරනවා එක කාඩ් එකක් අරගෙන කෝච්චියේ යන්න, ඒ වාගේම බස් එකේ යන්න, වාහනය ගිහිල්ලා park කරන්න පුළුවන් ක්‍රමයක්. ඒ වාගේ අලුත් systems, නව තාක්ෂණය මේ රටේ ප්‍රවාහන පද්ධතියට එකතු කර ගන්න අප කටයුතු කරනවා.

අපේ කුමාර වෙල්ගම ඇමතිතුමාට අද ඉතාමත්ම හදිසි කරදරයක් නිසා නියමිත වෙලාවට පැමිණෙන්න අපහසු වෙලා එතුමා මට මේ අවස්ථාවට සහභාගි වෙන්න කිව්වා. එතුමා තව මොහොතකින් මේ ගරු සභාවට පැමිණේවි. ඒක එතුමාගේ දුර්වලකමක් නොවෙයි. කෙනෙකුට ඕනෑම වෙලාවක යම් කිසි ප්‍රශ්නයක් එන්න පුළුවන්. එතුමාට අද කළුතර ඉඳලා එන කොට යම් කිසි ගැටලුවකට මුහුණ දෙන්න සිදු වුණා. එතුමා මේ රටේ හිටපු ප්‍රායෝගික ඇමතිවරයෙක් වශයෙන් කෝච්චි station එකට ගිහිල්ලා, ඒ වාගේම බස් නැවතුම් පොළට ගිහිල්ලා, බස් එකෙන් ගිහිල්ලා අද මේ ප්‍රවාහන පද්ධතිය දියුණු කරන්න කටයුතු කරනවා. ඒ නිසා තමුන්නාන්සේලා මොනවා කථා කළත්, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය මේ අය වැය ලේඛනයට අනුව සහ ජනතාව බලාපොරොත්තු වෙන විධියට, රටේ හැමෝටම සන්තෝෂ වෙන්න පුළුවන් විධියට මේ ප්‍රවාහන පද්ධතිය දියුණු කරනවා කියන එක මා මේ අවස්ථාවේදී කියනවා. තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය ඒ සඳහා ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමා ඇතුළු එම අමාත්‍යාංශයේ සියලුම නිලධාරි මහත්වරුන්ට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

[පූ. භා. 10.32]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් අද ප්‍රවාහන අමාත්‍යාංශය වැනි වැදගත් අමාත්‍යාංශයක් ගැන කථා කරනකොට ඒ විෂය භාර අමාත්‍යතුමා මෙම ගරු සභාවේ නොසිටීම ගැන මම විශේෂයෙන් කනගාටු වෙනවා. මොකද, ඔය අමාත්‍යාංශවල නියෝජ්‍ය ඇමතිවරු හිටියාට, වෙනත් අධීක්ෂණ ඇමතිවරු හිටියාට තීරණ ගැනීමේ හැකියාව තිබෙන්නේ ගරු ඇමතිතුමාටයි. මෙවැනි අමාත්‍යාංශයක වැය ශීර්ෂ ගැන කථා කරනකොට විෂය භාර ඇමතිතුමා මෙහි නොසිටීම ගැන අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එත් එක්කම අප ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කරද්දී මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය ගැන අපට සෑහීමකට පත් වන්නට පුළුවන් ද කියන එක මා මේ අවස්ථාවේදී අහන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ-පෙරේදා විශේෂයෙන්ම ගොවීන්ගේ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් ශෝචනීය තත්ත්වයක් ඇති වුණා. අපේ හිටපු ගරු අග්‍රාමාත්‍යතුමා අප ගරු කරන අමාත්‍යවරයෙක්. අත් දැකීම් බහුල කෙනෙක් හැටියට එතුමා දන්නවා, මේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ කොයි තරම් දුරට වටිනාකමක් තිබෙනවා ද කියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රජය අනවශ්‍ය ප්‍රශ්නයකට අත ගැසුවා. ගොවීන් තමන්ගේ නිෂ්පාදන ටික වෙළෙඳ පොළට ගෙනාවේ කාටවත් කරදරයක් ඇතිව නොවෙයි.

මේ රටේ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා. පාඩු ලබන ආයතන හතළිස් ගණනක්, පණස් ගණනක් තිබෙනවා. කෝප් වාර්තාවේ පෙන්වා දුන්නා, මේ රටේ පාඩු ලබන ආයතන ගැන. එහෙම ආයතන තිබෙද්දී මා ඔබතුමාට මතක් කරන්නේ, ගොවියාගේ නිෂ්පාදනය ප්‍රවාහනය කරන්න අත ගැහුවාය කියන එකයි. ඒ ගැන මේ කොයි චින්තනයකවත් තිබුණේ නැහැ. මහින්ද චින්තනයේ තිබුණා නම් අප පිළිගන්නවා, ඒකත් මේ චින්තනයේ වැඩක්ය කියා. එහෙම චින්තනයේ තිබුණේත් නැහැ. මාතලේ දිස්ත්‍රික්කයේ ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇමතිතුමා කියා තිබෙනවා අප දැක්කා, මේ එක එක්කෙනාගේ පෞද්ගලික අවශ්‍යතාවන් අනුව කුඩ දාලා මේ ගොවියෝ සම්පූර්ණයෙන්ම අමාරුවේ දැම්මාය කියා. අපේ හිටපු අගමැතිතුමනි, ඔබතුමාට කියන්නට ඕනෑ, මේ දවස් දෙක තුනට කෝටි 13ක් පාඩුයි කියන එක. ඊයේ කොළඹ මහ රෝහලේ ලෙඩුන්ට කෑම දීමේ ප්‍රශ්නයක් තිබුණා. ඒ අයට කෑම දෙන්නට විධියක් නැහැ; එළවලු නැහැ. ඒ වාගේම යුද්ධ හමුදා කඳවුරුවලට කෑම දෙන්නට විධියක් නැහැ. ඒ වාගේම මේ රටේ හෝටල්වල ඊයේ කෑම දීමේ ප්‍රශ්නයක් තිබුණා. සමහර එළවලු කිලෝ එක රුපියල් තුන්සියයයි; හාර සියයයි; රුපියල් දාහ දක්වා වැඩි වී තිබෙනවා. තව දවස් තුනක් හතරක් යන තුරු මේ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වෙනවා. මම කියන්නේ මෙහෙම තීන්දු ගන්නකොට ටිකක් කල්පනා කරන්න ඕනෑ කියලායි. ප්ලාස්ටික් කුඩ ගොවියාගේ ඇඟේ ගහන්න කල්පනා කළා. මේ කාගේ වුවමනාවට ද? ඊට පස්සේ දැන් කියනවා-

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඒක ඉවරයි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මම කියන්නම් ඉවර වෙච්ච හැටි. මාසයකට කල් ගත්තා විතරයි. ඇමතිවරයා බොහොම තදින්ම කිව්වා, මේ තීරණය අකුලා ගන්නේ නැහැ කියලා. අපේ ඒකනායක ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමන්ලා දන්නවා ගොවියාගේ ප්‍රශ්නය මොකක්ද කියලා. සමහර කැබිනට් ඇමතිතුමන්ලා ඒ ගැන ප්‍රකාශ කළා. එළවලු ප්‍රවාහනය කරන කොට ඒ එළවලු තැළෙනවා නම් ඒකට කුඩ-

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! There is a point of Order being raised by Hon. Rohana Dissanayake.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද Adjournment Debate එක දීලා තිබෙන්නේ ඒ සම්බන්ධව කථා කරන්නයි. එතකොට ඒ සම්බන්ධව කථා කරන්න පුළුවන්.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
හරි, හරි. මේක ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳ විවාදය. එළවලු ප්‍රවාහනය -

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කරන කොට එතුමා එළවලු ගැන කථා කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. P. Harrison, you try and stick to the subject matter.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේ වාගේ මෝඩ තීන්දු ගන්නා ඇමතිවරු ඉන්න කොට කොහොමද ඉදිරියේදී මහින්ද චින්තනය ක්‍රියාත්මක කරන්නේ? කුඩ පෙරළලා, බාල්දි පෙරළලා මේ විධියට ගොවි ජනතාව අමාරුවේ දමන්න එපා කියන එක අපි කියනවා. ඒ අයගේ ප්‍රවාහන කටයුතු ඒ අයට නිදහසේ කර ගන්න දෙන්න. අද පලතුරු ටික ඔක්කෝම නරක් වෙනවා. ඒවාට කාබයිඩ් ගහලා; කන්න විධියක් නැහැ. ආණ්ඩුව විධියට ඒ ප්‍රශ්නවලට මැදිහත් වෙන්න. ඒ විතරක් නොවෙයි. පාඩු ලබන ආයතන තවත් තිබෙනවා. ඒවා ගොඩ ගන්න මහන්සි වෙන්න රජයක් හැටියට. ගොවියාගේ ප්‍රශ්නවලට ඇඟිලි ගහලා, ඒ අය බොහොම අමාරුවෙන් මහන්සියෙන් කරන වැඩ කටයුත්තට අත ගහලා ඒ අයගේ කටයුතු අවුල් කරන්න එපා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමන්ලා ආසියාවේ ආශ්චර්යය ගැන කථා කළා; දුම්රිය මාර්ග ගැන කථා කළා. නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාම ප්‍රශ්නයකට උත්තරය වශයෙන් කියලා තිබෙනවා දුම්රිය හරස් මාර්ග 924න් 724ක්ම තවම අනාරක්ෂිතයි කියලා! [බාධා කිරීම්] දුම්රිය මාර්ග 724ක්ම තවම අනාරක්ෂිතයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්රිය මාර්ගයකට උණ බම්බුවක් දා ගන්න බැරි ආණ්ඩුව කොහොමද මේ රට ආශ්චර්යය වෙත ගෙන යන්නේ? මේ නියෝජ්‍ය ඇමතිවරයා කියනවා, දුම්රිය මාර්ග 724ක් අනාරක්ෂිතයි කියලා. ආණ්ඩුවට බැහැ රේල් පාරටඋණ බම්බුවක් දා ගන්න. නමුත් අපි ආශ්චර්යයට යන්න යනවා. මේ නියෝජ්‍ය ඇමතිවරයාම කියනවා, අවුරුද්දකට 30 දෙනෙක් කෝච්චිවල හැපිලා මැරෙනවා, දුම්රිය අනතුරුවලින් 90 දෙනෙක් අත පය කඩා ගෙන තුවාල වෙනවා කියනවා. නියෝජ්‍ය අමාත්‍යතුමනි, ප්‍රවාහනය ගැන කථා කරද්දී මම අහනවා තමුන්නාන්සේගෙන්, "මේ ආශ්චර්යයද?" කියලා. අපි කොහේටද මේ යන්නේ?

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මා තමුන්නාන්සේට තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. [බාධා කිරීම්] අද කොටුව දුම්රිය පොළට ගිහිල්ලා බලන්න. කොටුව දුම්රිය පොළේ වැසිකිළියකට නහයක් තියා ගෙන යන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඇයි බැරි?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඇයි බැරි කියලා අහනවා. ඔබතුමා ගිහිල්ලා බලන්න. තමුන්නාන්සේ සොයා බලන්න ඒක. ඒ විතරක් නොවෙයි, අඩු ගණනේ කෝච්චියේ යන මිනිහෙක් ටිකට් එකක් ගන්න යන පෝලිමේ තිබෙන ඇඳි වැටවල් ටික තිබෙනවාද කියලා දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාගෙන් අහන්න. ඒ විතරක්ද? වැහි දවසට කොටුව දුම්රිය පොළ හරක් ගාලක් වාගේ තෙමෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ඔබතුමා කෝච්චියේ යනවාද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මම කෝච්චියේ යන මිනිහෙක්. මම කෝච්චියේ ගිහිල්ලා තිබෙනවා. ඔබතුමා චෙක් කරලා බලන්න. මම කොච්චියේ ගිය නිසා තමයි මේවා කියන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කවදාද අන්තිමට ගියේ?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
අන්තිමට ගිය දවසද? ගිය සතියේ ඉරිදා. Check කරලා බලන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආසියාවේ ආශ්චර්යය ගැන කථා කරන කොට අපි ඉස්සෙල්ලාම බලන්න ඕනෑ මේ පහසුකම් ගැන. මම පසු ගිය අය වැය විවාදයේදීත් කිව්වා, දුම්රිය මාර්ග දෙපැත්තේ තිබෙන යකඩ ටික එකතු කරන්න කියලා. ඔබතුමා ගිහිල්ලා බලන්න. ඒවා අද සීසීකඩ දාලා තිබෙනවා. ඒවායින් හරි ප්‍රයෝජනයක් අරගෙන නැහැ.

ඒ විතරක් නොවෙයි, අගනුවර ඉඩම්වලින් තුනෙන් එකක් තිබෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවට. අද ඒවා පෞද්ගලික ප්‍රයෝජනයට එක එක්කෙනා අල්ලා ගෙන ඉන්නවා. ඒවායින් හරි ආදායමක් රටට එන්නේ නැහැ. ඒවායින් හරි ආදායමක් ආණ්ඩුවට එන්නේ නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේට යෝජනා කරනවා, ඒවායින් හරි ප්‍රයෝජනයක් අරගෙන මේ රටට වැඩක් වන විධියේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න කියලා. ගරු ඇමතිතුමා නැති වුණත්, නියෝජ්‍ය ඇමතිතුමා මේ කාරණය එතුමාට මතක් කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්රිය සේවාවේ සිද්ධ වෙලා තිබෙන වංචා දූෂණ ගැන කිව්වොත් ඒවායේ කෙළවරක් නැහැ, අපේ හිටපු අගමැතිතුමනි. ඒක මම තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි. ඉන්දියන් දුම්රිය බලවේග කට්ටල ගෙනාවා. ලංකාවේ දුම්රිය රියැදුරෝ ඒවා සේරම වර්ජනය කළා. ඒ අය කිව්වා, ඒවායේ brake නැහැ, ඒවායේ හොඳ ආරක්ෂක තත්ත්වයක් නැහැ, ඒ නිසා කරුණාකරලා ඒ දුම්රිය දුවන එක නවත්වන්න කියලා. ඒ අය එහෙම කියලා තියෙද්දීත් ඒවා ධාවනය කරලා අලව්වේදී මහා විනාශයක් සිදු වුණා. ඒකෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට රුපියල් කෝටි ගණනක් පාඩු වුණා; අපට නැති වුණා. ඒ වාගේම දුම්රිය රියැදුරන්ගේ ජීවිත නැති වුණා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කරන කොට 1990 දී තිබුණු එක්සත් ජාතික පක්ෂ රජයට චෝදනා කළා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, please wind up now.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මට තව කාලය තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Give him two more minutes from the Opposition's time.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
එක්සත් ජාතික පක්ෂය වැරැදි කරලා තිබුණා නම් ඒවා අපි පිළිගන්න ලෑස්තියි. ඒ ගැන ජනතාව අපට තීන්දුවක් දුන්නා. හැබැයි, අවුරුදු 17ක් රට පාලනය කළ එක්සත් ජාතික පක්ෂයට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. වැරැදි වුණා නම් තමුන්නාන්සේලා ඒවා නිවැරදි කරන්න. මේ සේවාව අලුතින් ගෙන යන්න වැඩ පිළිවෙළක් හදන්න තමයි ජනතාව තමුන්නාන්සේලාට බලය දුන්නේ. අවුරුදු 17කට පස්සේත්, අදත් ඒ වැරැදිම කිය කියා ඉන්නවා නම් මොකක්ද ඒකේ තේරුම?

ගරු ඩීව් ගුණසේකර ඇමතිතුමාත් මෙතැන ඉන්නවා. එතුමා කෝප් වාර්තාවෙන් කියලා තිබෙන්නේ නාස්තිය, දූෂණය ගැන. කෝප් කමිටුවේ සභාපතිවරයා හැටියට එතුමා හය නැතුව හොඳ වාර්තාවක් දීලා තිබෙනවා. ඒ ආයතනවල හරි පරිපාලනයක් නැහැ. ඒකයි, ඒ ආයතන පාඩු ලබලා තිබෙන හේතුව. මේ වැරදි අරයාගේ පිට පටවලා, මෙයාගේ පිට පටවලා ගැලවීමක් වෙන්න බැහැ. ඒක නිසා කරුණාකරලා ඒ ආයතනවල කාර්යක්ෂමතාව ඇති කරන්න; හොඳ පරිපාලනයක් ඇති කරන්න. නමුත් කොහොමද හොඳ පරිපාලනයක් ඇති කරන්නේ, මේ අය වැය කාරක සභා අවස්ථාවේදී අදාළ ඇමතිවරයා පාර්ලිමේන්තුවට එන්නේ නැතිව-

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
එතුමාට හදිසි කරදරයක් වෙලා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
එහෙම කරදරයක් වෙලා කියන්න පුළුවන්. හිටපු අගමැතිතුමා මෙතැනට ඇවිල්ලා ඉන්නවා. කැබිනට් මණ්ඩලයේ කීප දෙනෙකු මෙතැනට ඇවිල්ලා ඉන්නවා. අදාළ ඇමතිවරයා කාරක සභාවට එන්නේ නැතුව කොහොමද මේ අඩු පාඩු පෙන්වලා දෙන්නේ? මේක ආණ්ඩුවේ ප්‍රශ්නයක්ද? අපි ඒක දන්නේ නැහැ. කරුණාකරලා තමුන්නාන්සේලා මේවාට උත්තර දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගමනාගමනය ගැන කිව්වා. අපි දන්නවා, කොහොමද අද ගමනාගමනය තිබෙන්නේ කියලා. මම ඒ ගැන පෞද්ගලිකව දන්නවා. විශේෂයෙන්ම ලංගම ගැන කථා කරන කොට, අද ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවලට ගිහිල්ලා බලන්න මොකක්ද වෙන්නේ කියලා. ඒ ආයතනවල එක්කෝ කාඩ් ගහනවා. නැත්නම් හැන්දෑ වෙන කොට අරක්කු බොනවා. එහෙමත් නැත්නම් නිලධාරින් වෙන වෙන වැඩ කටයුතුවල යෙදිලා ඉන්නවා. කිසිම පරිපාලනයක් නැහැ. මෙවැනි තත්ත්වයක් තියා ගෙන හැම දාම ගමනාගමන මණ්ඩලයට පාඩුයි කියනවා. ඉතින් මොකක්ද ඒකට තිබෙන ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහෙම ගිහිල්ලා නම් ආසියාවේ ආශ්චර්යයට ප්‍රවාහන අමාත්‍යාංශයට යන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අවසන් කරන්නම්. මේ කාරක සභා අවස්ථාවට අඩුම ගණනේ අදාළ ඇමතිවරයා ගෙන්වන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ. භා. 10.43]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සතුටු වෙනවා, ජනාධිපතිතුමා මෙම අමාත්‍යාංශය ගරු කුමාර වෙල්ගම ඇමතිතුමාට ලබා දීම ගැන. එතුමා බොහොම දක්ෂ ඇමතිවරයෙක්. එතුමා ලොකු ඕනෑකමකින් මේ ප්‍රවාහන සේවය ජනතා සේවයක් හැටියට කරගෙන යන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1959 දී බණ්ඩාරනායක අගමැතිතුමා එදා බස් ව්‍යාපාරය ජනතා සේවයක් බවට පත් කළා. අද කවුරු මොනවා කිව්වත් ඒක නැහැ කියලා කියන්න විපක්ෂයට බැහැ. බණ්ඩාරනායක අගමැතිතුමා එදා ප්‍රවාහන සේවාව ජනසතු කරලා මෙරට සාමාන්‍ය ගොවියාගේ, කම්කරුවාගේ දරුවාට පාසලට යන්න ඒ අවස්ථාව ලබා දුන්න නිසා, අද ඒ අයට ඉහළ තත්ත්වයකට එන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. අපිත් අරනායක වාගේ පැත්තක ඉඳලා, season ticket එකෙන් මහනුවර ධර්මරාජ විද්‍යාලයට ගියා. ඒ නිසා අපි ලංගමයේ වටිනාකම දන්නවා. එදා ඒ අයිතිය අපට තිබුණා නම් හෙට දවසේ අනික් දරුවන්ටත් ඒ අයිතිය තිබෙන්න ඕනෑ. නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එහෙම නොවෙයි.

ගරු හැරිසන් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩු ගමනාගමන මණ්ඩලය අහෝසි කරන්න විවිධ යෝජනා ගෙනාවා; කෑලිවලට කඩා දැම්මා. නමුත් එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය යටතේ -මේ රජය යටතේ- ලංකා ගමනාගමන මණ්ඩලය අහෝසි කරන්නට නොව, එය ඉදිරියට අරගෙන යන්න කටයුතු කරනවා. මේක ප්‍රවාහන සේවාවක්. කොයි රටක වුණත් ප්‍රවාහන සේවාවක් ලාබ ලබන තත්ත්වය බොහොම අඩුයි. යුරෝපය, නවසීලන්තය වාගේ රටවල මහා භාණ්ඩාගාරයෙන් ප්‍රවාහන සේවාවට සියයට 34ක් ගෙවනවා. සමහර රටවල සියයට 45ක් ගෙවනවා. ඇයි, එහෙම ගෙවන්නේ? ජාතික ප්‍රවාහන සේවය ජනතාවගේ ප්‍රවාහන සේවයක් නිසයි. මම හිතන්නේ ලංගමයට වැඩිය බස් රථ සංඛ්‍යාවක් - බස් රථ 19,000කට වැඩි සංඛ්‍යාවක්- පෞද්ගලික අංශයට තිබෙනවා කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෞද්ගලික අංශයට බස් රථ 19,000ක් තිබෙනවා. නමුත් ඒවායින් සෙනඟ අදින්නේ ලාබ

ලබන උදේ වෙලාවේ විතරයි. මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන සේවකයන් වෙන්න පුළුවන්, රජයේ සේවකයන් වෙන්න පුළුවන් හවස ගෙදර යන වෙලාවට මේ 19,000ක බස් රථ සංඛ්‍යාවේ සෙනඟ අදින්නේ ලංගමයයි. බස් රථ 19,000ක යන ජනතාවක් ගෙවල්වලට අරගෙන යන්නේ, රජයේ සේවකයන් ගෙවල්වලට අරගෙන යන්නේ අපේ රටේ ලංගම සේවාව මඟිනුයි. තෙල් සංස්ථාවෙන් තෙල් ටික අඩුවට දීලා, එහෙම නැත්නම් ණයට දීලා, මහා භාණ්ඩාගාරයෙන් මුදල් දීලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ලංගමය පවත්වාගෙන යන්නේ අහිංසක ජනතාවට මේ සේවාව අවශ්‍ය නිසයි. එහෙම නැත්නම් යූඑන්පී ආණ්ඩුව කළා වාගේ මේක විකුණා දමන්න, කෑලිවලට කඩා දමන්න පුළුවන්. නමුත් එවැනි දෙයක් කරලා නැහැ.

COPE වාර්තාවේ කියා තිබෙන්නේ මෙහි මුදල් තත්ත්වය ගැනයි. ආදායම ඉහළ ගොස් ඇතත් වියදම ටිකක් වැඩි වුණු නිසා තමයි ලංගමය පාඩු ලබන්නේ කියා එහි කියා තිබෙනවා. ඊළඟට රියැදුරන් සහ කොන්දොස්තරවරුන් සීමාවකින් තොරව නිවාඩු යාම ගැනත් COPE වාර්තාවේ කියා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඒ ගැනත් මතක් කරන්න ඕනෑ. රැකියාව කරනවා නම්, වග කීමක් තිබෙනවා. අපි දන්නවා වරු බස් සේවය -හවසට යන බස් එක- තමයි රජයේ සේවකයන් යන බස් එක. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, හවසට මේක check කරන්න ඕනෑ. මොකද, සමහර කොන්දොස්තරවරු, රියැදුරු මහත්වරු උදේට වැඩ කරලා, හවසට නිවාඩු දමලා යනවා. එතකොට මොකද වෙන්නේ? එතකොට three-wheeler එකක් හයර් කරගෙන තමයි රජයේ සේවකයාට ගෙදර යන්න වෙන්නේ. ඒකට ඒ අයට ලොකු ගණනක් ගෙවන්න වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ඒ ගැනත් අධීක්ෂණයක් කරන්න ඕනෑ. COPE වාර්තාවේ කියා තිබෙනවා, ලංගමයට කොච්චර අය වෙන්න තිබෙනවාද කියලා. විශේෂ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් ඩිපෝ පහකට රුපියල් ලක්ෂ 113ක් අය වෙන්න තිබෙනවාය කියා COPE වාර්තාවේ කියා තිබෙනවා. ඒ වාගේම සරණාගතයින් ප්‍රවාහනය වෙනුවෙන් අය විය යුතු මුදල ලක්ෂ 1,480ක් වෙනවා. මේවා පොඩ්ඩ සේවාවන් නොවෙයි. COPE වාර්තාවේ තමයි මෙහෙම කියා තිබෙන්නේ. පාඩු වුණත්, මේක වසා දමන්නය කියා COPE වාර්තාවේ කියා නැහැ. ආදායම වැඩි වෙලා තිබෙනවා. ණය ප්‍රමාණයක් අය වෙන්න තිබෙනවා. එහෙම නම් ලංගමය කියන්නේ ජනතාවට බරක් වන සේවාවක් නොවෙයි. ලංගමය කියන්නේ ජනතාවට ඉතා ඉහළ සේවාවක් සපයන ආයතනයක්ය කියන එක අප කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අද වනකොට ධාවනය වන බස් රථ සංඛ්‍යාවත් වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද කුලී පදනම මත පුංචි බස් රථ ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මොකද, ගමට පොඩි බස් රථ අවශ්‍යයි. දොර දෙකේ බස් රථ වාගේම ගමේ ප්‍රවාහනය සේවා සඳහා පුංචි බස් රථ අවශ්‍ය වෙනවා. ඒ බස් රථ ලබා දෙන්නට අද අලුත් වැඩසටහනක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. රජයට බරක් වෙන්නේ නැතිව ඩිපෝවේ බර දරාගෙන, කටයුතු කර ගෙන යන්නට අද අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ වාගේම 2009 දී දිනක ආදායම රුපියල් මිලියන 34ක් වුණා. 2011 වනකොට ඒක මිලියන 42ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අන්දමට ආදායම වැඩි වෙලා තිබෙන එක ගැන අපට සතුටු වෙන්න පුළුවන්. COPE වාර්තාවේ තිබෙන ආදායම වැඩිය කියන එක මේ ඉලක්කයන් අනුව අපට කියන්න පුළුවන්. ඒ වාගේම 2007 දී දිනකට ධාවනය කළ කිලෝ මීටර් ප්‍රමාණය 835,313ක් වුණා. 2011 වනකොට ඒක 931,754ක් වෙලා තිබෙනවා. එතකොට ආදායම වැඩි වෙලා තිබෙන බව පෙනෙනවා. එහෙම නම් ආදායම වැඩි වුණාය කියන එක නිවැරදියි. මොකද, ආදායම වැඩි වෙන්න නම් ධාවනය කරන කිලෝමීටර් ප්‍රමාණය වැඩි වෙන්න ඕනෑ. ධාවනය කරන බස් රථ සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ. ඒ දෙකම කරලා තිබෙනවා. ඒ වාගේම 2007 දී දිනකට රුපියල් මිලියන 29,300ක් ලාබ ලබා තිබෙනවා. අද වනකොට ඒක මිලියන 41,290 දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඒ කියන්නේ දෙගුණයකට වැඩි ප්‍රමාණයකින් ලංගමයේ ආදායම වැඩි කර ගෙන තිබෙනවා.

ඊළඟට, වාර ප්‍රවේශ පත්‍ර ගැනත් කියන්න ඕනෑ. මේක වැදගත් වනවා. මේවා තමයි මේ ආයතන පාඩු ලබන්න හේතු වන දේවල් කියලා කියන්න පුළුවන්. අද පාසල් දරුවන් වෙනුවෙන්, රජයේ සේවකයන් වෙනුවෙන් දිනකට වාර ප්‍රවේශ පත්‍ර -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! I wish to announce that this House cordially welcomes the Parliamentary Delegation from China led by Her Excellency, Madam Zhang Meiying, Vice-Chairperson of the National Committee of the Chinese People's Political Consultative Conference of the People's Republic of China, now present at the Speaker's Gallery.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ලංගමය පාසල් දරුවන්ගේ වාර ප්‍රවේශ පත්‍රය වෙනුවෙන් සියයට 50ක බරක් දරනවා. ඒකෙන් සියයට 35ක් විතරයි ආණ්ඩුවෙන් ගෙවන්නේ. අය කරන්නේ සියයට 10යි. ඒකෙන් වැඩි බරක් දරන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයයි. අද හතළිස් ලක්ෂයක් පමණ වන පාසල් දරුවන්ගෙන් වැඩි ප්‍රමාණයකට; බස් රථවලින් යන දරුවන්ට ලංගමය නිසා සෙතක් සැලසිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, වාර ප්‍රවේශ පත්‍රයට රජයේ සේවකයන්ගෙන් අය කරන්නේ සියයට 35යි. එහෙම නම් ඒ ඉතිරි පාඩුවත් ලංගමය දරනවා. ලංගමය පාඩු ලබනවා කියලා කෑ ගහනවා. ඒ විධියට පාඩු ලබන්නේ ඇයි? පාඩු ලබන්නේ ජනතාවට සේවයක් කරලායි. ඒ වාගේම සේවකයෝ 34,000ක් විතර ඉන්නවා. ගමේ මනුස්සයෙක් ඩ්‍රයිවර් කෙනෙක්, කොන්දොස්තර කෙනෙක් විධියට මේ ආයතනයට දමා ගන්න අපට පුළුවන්. ඒකත් වැදගත්. මොකද හේතුව, සේවා නියුක්තිය ගත්තාම ඒක අවශ්‍යයි. ගමේ ඉන්න සාමාන්‍ය රියදුරකුට, ඒ වාගේම සාමාන්‍ය පෙළ සමත් කෙනකුට රක්ෂාවක් ලබා ගන්න තිබෙන ආයතනය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයයි.

ඒක ඇති කළේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුව කාලයේයි. අපට සන්තෝෂයි. මොකද හේතුව, මෙවැනි ආයතන පිහිටවපු නිසා ලංකාවේ ආර්ථිකයේ බර ඇද ගෙන යන්න පුළුවන් ශක්තියක් මේ ප්‍රවාහන ක්ෂේත්‍රයට ලැබී තිබෙන නිසා. පෞද්ගලික අංශය, ඩීසල් ලීටරයක මිල රුපියලයකින් වැඩි වෙන කොට මෙන්න බස් ගාස්තු වැඩි කරන්න යෝජනා කරනවා. නමුත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය එහෙම නොවෙයි. ඒ අය ආණ්ඩුවට අභියෝග කරන්නේ නැහැ. ජනතාවගේ පැත්තෙන් අභියෝග කරන්නේ නැහැ. යම් ප්‍රමාණයකින් ඩීසල් මිල ඉහළ ගියත් පොදුවේ රාජ්‍ය ආයතනයක් හැටියට ඒ බර දරා ගෙන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වනවා. ඔබතුමා බලන්න, පසු ගිය කාල වකවානුවේ ඩීසල් මිල පොඩි ගණනකින් ඉහළ යන කොට පෞද්ගලික බස් රථ සංගමය කෑ ගැහුවා, බස් ගාස්තු වැඩි කරන්න ඕනෑය කියලා. බස් ගාස්තු වැඩි කරන්නය කියලා රජයට බලපෑම් කරනවා. ප්‍රවාහන අමාත්‍යාංශයට බලපෑම් කරනවා.

අද ලංගමය තිබෙන නිසා තමයි, පෞද්ගලික බස් රථ සේවයේ බස් 19,000ක් තිබුණත් කේවල් කරන්න පුළුවන්කම ලැබිලා

[ගරු ලලිත් දිසානායක මහතා]

තිබෙන්නේ. මඟියාට සාධාරණ ගාස්තුවක් ගෙවලා ගමන් කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ ලංගමය තිබෙන නිසායි. ලංගම නැති වුණොත්, 1958ට කලින් තිබුණා වාගේ ඒකාධිපති පාලන ක්‍රමයක් ඇති වනවා. ප්‍රවාහන ක්ෂේත්‍රය කොල්ල කන තත්ත්වයක් ඇති වනවා. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පාඩු ලබනවාය කිව්වත්, ආදායම් වැඩි වෙලා තිබෙනවා, නමුත් වියදම් වැඩි නිසා තමයි මේ ආයතනය අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ කියලා කෝප් වාර්තාවෙන් කියනවා. නමුත් ණය පැත්තෙන් බැලුවාම ලංගමයට ගොඩක් ණය අය වන්න තිබෙනවා.

අවසාන වශයෙන් මම දුම්රිය සේවාව ගැනත් කියන්නට ඕනෑ. කවුරු මොනවා කිව්වත් අද උතුර දක්වා යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාටත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් අද උතුර දක්වා යන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ මේ දුම්රිය සේවාව ආරම්භ වෙලා තිබෙන නිසයි. ඒ සම්බන්ධයෙන් අපි අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද තමුන්නාන්සේට උතුර දක්වා යන්න පුළුවන්. එදා යන්න බැහැ. 2005 බලයට පත් වුණු අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය නැති කරලා අද තමුන්නාන්සේට යාපනය දක්වා දුම්රියෙන් යන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. අද දුම්රියේ යන මඟීන් සංඛ්‍යාව 3,50,000යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මඟීන් 3,50,000ක් ගිහිල්ලා දුම්රිය වාගේ ප්‍රවාහන සේවාවක් ලාභ ලබන්න බැහැ. ඒ නිසා කරන්න තිබෙන්නේ දුම්රියේ ගමන් කරන මඟීන් සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ එකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මොන තර්ක දැම්මත් දුම්රිය මඟීන් සංඛ්‍යාව වැඩි කරන්නේ නැතිව අපට ලාභ ලබන්න බැහැ.

මම අවසාන වශයෙන් තවත් කරුණක් කියන්න ඕනෑ. අද ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 2,056 දක්වා වැඩි වෙලා තිබෙනවා. තව අවුරුදු දෙකකින් තුනකින් ඒක ඇමෙරිකානු ඩොලර් 4,000 වන විට හොඳ සේවාවක් ලබා දෙන්න ලංගමට පුළුවන්. අද washing machine එකක්, - රෙදි සෝදන යන්ත්‍රයක්,- ශීතකරණයක් නැති ගෙදරක් නැහැ. TV එකක් නැති ගෙදරක් නැහැ. Mobile phone එකක් පාවිච්චි කරන්නේ නැති කෙනෙක් නැහැ. එහෙම නම් ඉදිරි අනාගතයේ දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000ක් වන විට අපේ ජනතාව කැමැති වන්නේ AC දාපු බස් එකක යන්නයි. [බාධා කිරීම්]

ඔන්න එන්නේ නැහැයි කියාපු ගරු ප්‍රවාහන ඇමතිතුමා දැන් එනවා. තමුන්නාන්සේලා කෑ ගැහුවා, ඇමතිතුමා නැහැයි කියලා. එතුමාට මොකක් හරි කරදරයක්, ප්‍රශ්නයක් ඇති වන්න ඇති. ඇමතිතුමා නැහැයි කිව්වා. දැන් ඇමතිතුමා ඇවිල්ලා ඉන්නවා. අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාට කථා කරන්න පුළුවන්. ඒ නිසා හොඳ ඇමතිවරයෙක් යටතේ ප්‍රවාහනය ගැන-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Now, wind up please.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[மு. ப. 10.54]

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, போக்குவரத்து அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்ற இவ்வேளையில், போக்கு வரத்து அமைச்சர் அவர்கள் தற்பொழுதுதான் இந்த மன்றுக்குள் வருகை தந்திருக்கின்றார். எனக்கு முதலில் பேசியவர்களின் கருத்துக்களுக்கு அல்லது கேள்விகளுக்கு அவர் எந்தவகையில் பதிலளிக்கப்போகின்றார் என்று எமக்குப் புரியவில்லை. இருந்தாலும் நான் வடக்கு, கிழக்கைப் பற்றிப் பேசிக்கொண்டிருக்கின்ற நேரத்திலாவது அமைச்சர் அவர்கள் வருகைதந்திருப்பதையிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். வடக்கு, கிழக்கின் பொதுப் போக்குவரத்து வசதிகளை ஆராய்ந்து பார்க்கின்றகால், கடந்த 30 ஆண்டு காலமாக நடைபெற்ற யுத்தத்தின் காரணமாக அங்கு போக்குவரத்தில் சீர்குலைவு ஏற்பட்டிருப்பதைக் காணமுடியும். அங்கு சில பாதைகள் திருத்தப்பட்டும் பல பாதைகள் திருத்தப்படாமலும் காட்சியளிக்கின்றன. புகையிரத சேவையை எடுத்துக் கொண்டால், வடக்குக்கான புகையிரத சேவை முற்றுப்பெறாமல் இடையில் நிற்கின்ற ஒரு பரிதாபநிலையில் காணப்படுகின்றது. கிழக்கில் மட்டக்களப்பு ரயில் பாதை நல்ல நிலையில் இல்லை என்பதும் அமைச்சர் அவர்களுக்குத் தெரியும் என்று நான் நினைக்கின்றேன். வெள்ளம் வரும் காலங்களிலே அந்தப் பாதையில் புகையிரத சேவையை நிறுத்தவேண்டி இருக்கின்றது. காரணம், அங்கு மன்னம்பிட்டியிலே பிரிட்டிஷ் காலத்தில் கட்டப்பட்டவையாக இருக்கின்ற ரயில் பாலங்கள் சீராகத் திருத்தப்படாமையாகும். பொதுவாக கிழக்கில் வெள்ளம் ஏற்படும் காலங்களில் மட்டக்களப்புக்கான வீதிப் போக்குவரத்து மற்றும் ரயில் போக்குவரத்து பாதிக்கப்படுகின்றது. இதனால் கொழும்பி லிருந்து மட்டக்களப்புக்கும் மற்றும் அம்பாறையின் சில பகுதிகளுக்கும் செல்ல வேண்டிய மக்கள் பல கிலோமீற்றர் தூரம் அம்பாறை வழியாகப் பிரயாணம் செய்ய வேண்டிய துர்ப்பாக்கிய நிலை இருக்கின்றது. ஆகவே, மட்டக்களப்பு ரயில் பாதையில், மன்னம்பிட்டியில் இருக்கின்ற ஏறக்குறைய பத்துப் பாலங்களையும் திருத்துவதன்மூலம் வெள்ளப்பெருக் குள்ள காலங்களிலும் அங்கு ரயில் சேவையை நடத்த முடியும். ஆகவே, அந்தப் பாலங்களைத் திருத்தியமைக்க அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்று விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரம், மட்டக்களப்பு ரயில் சேவையில் ஈடுபடும் ரயில் எஞ்ஜினுடன் எவ்வளவோ காலத்துக்கு முந்திய பழைய பெட்டிகளே இணைக்கப்பட்டுப் பயன்படுத்தப்படுகின்றன. எம்மைப் பொறுத்தளவிலே இது ஏன் என்பது புரியாத புதிராகவே இருக்கின்றது. மழைக்காலங்களில் அந்த ரயிலின் First-Class berth இல் மழைநீர் ஒழுக்கு ஏற்பட்டு வெள்ளம் தேங்கி நிற்கின்றது. இதனால் மழைக்காலங்களில் முதலாம் வகுப்பு berth இல் பெரும்பாலானவர்கள் பயணம் செய்வதில்லை. நான்கூட இந்தக் கஷ்டத்தை அனுபவித் திருக்கின்றேன். ஆகவே, அந்த ரயிலில் புதிய First-Class பெட்டிகளைப் பொருத்துவதற்கு நீங்கள் தீர்மானம் எடுக்க வேண்டும். அதேநேரம், அந்த ரயிலில் இரண்டாம் வகுப்பு berth பெட்டிகள் இணைக்கப்படுவதில்லை. அடுத்து, தற்போது மட்டக்களப்பு வரை மட்டும்தான் ரயில் சேவை இடம்பெறுகின்றது என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்! ஆனால், மட்டக்களப்புக்கு அப்பால் பொத்துவில், அம்பாறை, அக்கரைப்பற்று, கல்முனை போன்ற நகரங்களுக்குச் செல்கின்ற மக்களும் இந்த ரயிலில்தான் பிரயாணம்

செய்கின்றார்கள். இதன்காரணமாக, இப்புகையிரதத்தில் பிரயாணம் செய்வதற்காக மக்கள் எப்பொழுதும் அடிபிடிப் பட்டே ticket எடுக்கவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அதுமட்டுமல்ல, பிரயாணம் செய்வதற்குப் பத்து நாட்களுக்கு முன்பே ticket ஐ book பண்ணவேண்டிய நிலைமை காணப்படுகின்றது. எனவே, இந்த ரயிலினுடைய புகையிரதப் பெட்டிகளைச் சீர்செய்வதுடன், அதற்குப் பொருத்தப்பட்டிருக்கின்ற எஞ்ஜினுக்குப் பதிலாகப் புதிய எஞ்ஜினை இணைக்கவேண்டிய அவசியமும் இருக்கின்றது. இத்தகைய பிரச்சினைகளால் தற்பொழுது அப்பகுதியில் சேவையில் ஈடுபடுகின்ற சொகுசு பஸ்களை மக்கள் நாடுகின்ற நிலை ஏற்பட்டு வருகின்றது. ஏனெனில், இவை 6-7 மணித்தியாலங்களுக்குள் கொழும்பிலிருந்து மட்டக்களப்புக்கும் மட்டக்களப்பிலிருந்து கொழும்புக்கும் பயணிக்கின்றன. இதேபயணத்தை ஒருவர் ரயிலில் சென்றால், கிட்டத்தட்ட 12 மணித்தியாலங்கள் எடுக்கின்றன. இவ்வளவு நேரம் எடுப்பதற்குக் காரணம், express train - கடுகதிப் புகையிரதம் - என்றுசொல்லப்படுகின்ற அது, எல்லாப் புகையிரத நிலையங்களிலும் தரித்துச் செல்வதுதான். இவ்வாறான ஒரு புகையிரதத்துக்கு ஏன் நாங்கள் 'கடுகதிப் புகையிரதம்' என்று சொல்லவேண்டும்? சாதாரண புகையிரத வண்டியென்று சொல்லலாமே! இதற்கு கடுகதி என்று சொல்வதன் அர்த்தம் என்ன? என்று கேட்க விரும்புகின்றேன். எனவே, கொழும்பிலிருந்து - மட்டக்களப்பு வரையிலுள்ள எல்லாப் புகையிரத நிலையங்களிலும் தரிக்காமல், குறிப்பிடத்தக்க - மட்டுப்படுத்தப்பட்ட - புகையிரத நிலையங்களில் மட்டும் தரிப்பதன்மூலம் இந்தப் பயண நேர விரயத்தைத் தவிர்க்கலாம் என்று நான் நினைக்கின்றேன். இப்புகையிரதத்தில் படுக்கைப்பெட்டி ஒன்றுதான் இருக்கின்றது. அதிலும் 4 cabinகள் மட்டும்தான் இருக்கின்றன. தற்பொழுது, அரச சேவையிலுள்ள பெரும்பாலானவர்களுக்கு First-Class warrant வழங்கப்படுகின்றது. இதனால், First-Class ticketஐப் பெறுவதற்காக மக்கள் முண்டியடித்துக் கொள்கின்றார்கள். எனவே, இதற்கு இன்னும் பல First-Class பெட்டிகளையும் இரண்டாம் வகுப்புப் படுக்கைப் பெட்டிகளையும் இணைப் பதோடு, sleeperettes - உறங்கலிருக்கைகளையும் அதிகரிப் பதன்மூலம் தீர்வுகாணலாம்; நல்ல வருவாயையும் தேடிக் கொள்ளலாம்.

தற்பொழுது, தனியார் பஸ் சேவையில் ஈடுபடுத்தப் பட்டிருக்கின்ற நல்ல சொகுசான பஸ்கள்தான் வருமானத்தை உழைத்துக்கொண்டிருக்கின்றன. எனவே, அரசாங்கம் நல்ல வருமானத்தை ஈட்டவேண்டுமாக இருந்தால், புகையிரதப் பெட்டிகளிலும் கொஞ்சம் சொகுசை ஏற்படுத்தவேண்டும். இது மக்களுக்கு வசதியாகவும் அவர்களைக் கவரக்கூடியதாகவும் இருக்குமென்று நான் நினைக்கின்றேன். இன்று பஸ் சேவையைப் பொறுத்தவரையில், வடக்குக் கிழக்கு மாகாணங் களில் அதிகமாக இலங்கை போக்குவரத்துச் சபைக்குச் சொந்தமான பஸ்கள் சேவையில் ஈடுபடுகின்றனவா, அல்லது தனியாருக்குச் சொந்தமான பஸ்கள் சேவையில் ஈடுபடுகின் றனவா? என்று அங்கலாய்க்கக் கூடிய அளவுக்குப் பிரத்தியேக பஸ்கள்தான் அதிகமாகச் சேவையில் ஈடுபடுகின்றன. நாங்கள் அங்கு CTB bus களை அரிதாகவே காண்கின்றோம். இலங்கைப் போக்குவரத்துச் சபையின் தற்போதைய தலைவர் திரு. பந்துசேன அவர்கள் எனக்கு மிகவும் பரிச்சயமானவர். அவர், "நான் தலைவராக வந்ததன் பின்னர், இலங்கைப் போக்குவரத்துச் சபையானது கூடுதலான வருமானத்தைப் பெறுகின்றது" என்று என்னிடம் கூறினார். நான் அதற்காக அவருக்கு நன்றி தெரிவித்தேன். இச்சபை பெறுகின்ற வருமானத்தை மேலும் அதிகரிக்கவேண்டுமென்றால், நாங்கள் போக்குவரத்துச் சபையின் பஸ் சேவையைப் பலப்படுத்த வேண்டும்; சீராக்கவேண்டும். ஏனென்றால் வடக்கு, கிழக்கைப் பொறுத்தவரையிலே கடந்த முப்பது வருட காலமாகப் புரையோடிப்போயிருந்த யுத்தத்தினால் அங்குள்ள பாதைகள் யாவும் பராமரிப்பின்றிச் சீரழிந்திருக்கின்றன. இத்தகைய நிலைமையில் அங்கு இன்று சீரான பஸ் சேவையைப் பெறமுடியவில்லை. பஸ் சேவை இடம்பெறாததற்கான காரணத்தைக் கேட்டால், "பாதை சரியில்லை" எனச் சாலை முகாமையாளர்கள் எங்களுக்குக் கருத்துத் தெரிவிக்கின் றார்கள். இந்நிலைமையினால் நாங்கள் ஒழுங்கான பஸ் சேவையைப் பெறுவதில்லை. உதாரணமாக மட்டக்களப்பு மாவட்டத்தின் மீளக்குடியமர்த்தப்பட்டுள்ள பிரதேசங்களிலே முன்னைய நாட்களில் பல பஸ் சேவைகள் இருந்தன. ஆனால், இன்று அச்சேவைகள் யாவும் நிறுத்தப்பட்டுள்ளன. காரணம் இன்று அச்சாலைகளில் ஓடுவதற்குத் தேவையான அளவு பஸ் வண்டிகள் இல்லை; வீதிகளும் புனரமைக்கப்படவில்லை. கொழும்பு - மட்டக்களப்பு பிரதான வீதி புனரமைக்கப் பட்டாலும் மட்டக்களப்பிலுள்ள படுவான்கரைப் பிரதேசத் திலுள்ள அத்தனை வீதிகளும் இன்றுவரையில் சரிவரப் புனரமைக்கப்படாததன் காரணமாக இலங்கைப் போக்கு வரத்துச் சபையின் சாலை முகாமையாளர்கள் அந்த வீதிகளிலே பஸ்களை ஓடச்செய்வதற்கு அஞ்சுகின்றார்கள். காரணம், ஒரு நாளைக்கு அந்த வீதியிலே ஓடுகின்ற பஸ் பத்து நாட்கள் garage இலே நிற்கவேண்டிய நிலைமை ஏற்படுவதாகும். அந்தளவுக்கு மட்டக்களப்பு மாவட்ட பஸ் சாலைகளிலுள்ள mechanical division யாவும் ஆமை வேகத்திலேயே இயங்குகின்றன. எனவே, ஒவ்வொரு சாலையிலும் mechanical division சீராக இயங்கினால், மிக விரைவிலேயே பஸ்ஸைச் சீராக்கி பஸ் சேவையை சிறப்புற நடத்த முடியும். எனவே, இவ்விடயத்தை எமது அன்புக்குரிய தலைவர் பந்துசேன அவர்கள் கருத்திற்கொள்ள வேண்டுமென இச்சபையினூடாகக் கேட்டுக்கொள்கின்றேன்.

எமது மாவட்டத்தையும் வடக்கு, கிழக்கு மாகாணங்களி லுள்ள ஏனைய பகுதிகளினதும் நிலைமையைப் பார்க்கும் பொழுது அங்கு இலங்கைப் போக்குவரத்துச் சபையின் பஸ் சேவைகளின் நிலைமை மிகவும் பரிதாபகரமாக இருக்கின்றது. அங்கே கட்டையில் ஏற்றிவைக்கப்பட வேண்டிய பஸ்கள் - மிகப் பழைய பஸ்கள் மட்டும் இருக்கின்றனவேயொழிய, சேவையில் ஈடுபடுத்துவதற்குரிய புதிய பஸ்கள் இல்லை. ஆகவே, ஏனைய பிரதேசங்களிலுள்ள பாதைகளில் புதிய பஸ்களைச் சேவையில் ஈடுபடுத்துவதைப் போன்று, வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள சாலைகளுக்கும் சில புதிய பஸ்களையாவது வழங்கிச் சேவையில் ஈடுபடுத்துவதன்மூலம் அந்தப் பிரதேசத்திலுள்ள மக்களும் இலங்கை அரசாங்கத்தின் சார்பிலே ஓடுகின்ற இ.போ.ச. பஸ்வண்டிகளிலே இலகுவான முறையில் பிரயாணத்தை அனுபவிக்க முடியும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[පූ.භා. 11.07]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රවාහන විෂයය අද සාකච්ඡාවට ගන්නා අවස්ථාවේදී විශේෂයෙන්ම කිව යුතුයි, රටේ සමස්ත ක්‍රියාකාරිත්වය දියත් වන්නේ ප්‍රවාහන සේවය මත බව. එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මෙහි දැඩි අඩු පාඩුකම් මේ ගරු සභාවේ හෙළි කළා. එහි යම් යම් කාරණාවලට අපි එකඟතාව පළ කළ යුතුයි. අද මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ ප්‍රවාහන සේවය සාර්ථක ගමනක් යමින් තිබෙනවා.

[ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2011 වර්ෂයේදී ප්‍රවාහන සේවය වෙනුවෙන් ක්‍රියාත්මක කරපු නව වැඩසටහන් මොනවාද කියා අපි හැරිලා බලමු. මා විශ්වාස කරනවා 2011 වර්ෂයේදී දුම්රිය සේවය වාගේම ලංගම බස් රථ සේවය, පෞද්ගලික බස් රථ සේවය කියන කාරණා තුනට අදාළව ප්‍රවාහන ක්ෂේත්‍රයේ සැලකිය යුතු ජයග්‍රහණ අපි ලබා ගත්තා කියලා. පෞද්ගලික ප්‍රවාහන සේවය සම්බන්ධයෙන් මේ පසු ගිය අවුරුද්ද තුළ අලුත් අමාත්‍යාංශයකුත් බිහි වුණා.

ප්‍රවාහන අමාත්‍යාංශය භාර අපේ ගරු ඇමතිතුමා ප්‍රවාහනය ශක්තිමත් කරන්න 2011 වර්ෂය තුළ කාරණා රාශියක් ඉටු කර ජයග්‍රහණ ලබා තිබෙනවා. විශේෂයෙන් අපේ ගම්වල ඉන්න දුප්පත් අම්මා තාත්තාගේ දරුවන්ට පාසලට යන්න, රජයේ සේවකයාට කාර්යාලයට යන්න ඉටු කළ මෙහෙවර සම්බන්ධයෙන් අපි ශ්‍රී ලංගමයට ස්තුතිවන්ත වන්න ඕනෑ; අපේ කෘතවේදීත්වය පළ කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැයෙන් ලංගම ශක්තිමත් කරන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කර දුන්නා. "බී" මාදිලියේ නව බස් රථ 200ක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කර තිබෙනවා. රුපියල් මිලියන 100ක් යොදවා ධාවනයෙන් ඉවත්ව ඇති බස් රථ 690ක සුළු හා මධ්‍ය පරිමාණ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරලා තිබෙනවා. බඳු සහන යටතේ අමතර කොටස් මිලදී ගැනීමටත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම බඳු සහන යටතේ ටයර් හා ටියුබ් මිලදී ගැනීමට රුපියල් මිලියන 200ක් වියදම් කරලා සැලකිය යුතු ජයග්‍රහණ ලබා තිබෙනවා. ඒ වාගේම ගෙවීමේ පදනම මත බැටරි මිලදී ගෙන තිබෙනවා. රජයට බරක් නොවී, භාණ්ඩාගාරයට බරක් නොවී "බී" මාදිලියේ බස් රථ 500ක් මිලට ගැනීම සාර්ථකව ජයග්‍රහණය කරලා තිබෙනවා. දඹුල්ල ඩිපෝවේ ඉන්ධන නිකුත් කිරීමේ නව පොම්පාගාරයක් විවෘත කර තිබෙනවා. ගෙවීමේ පදනම මත ලබා ගත් බස් රථ 500 යොදා ගනිමින් දැනට දුර ගමන් සේවා තර කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම විශේෂයෙන් සැලකිය යුතු කාරණයක් වනවා.

තොරතුරු තාක්ෂණය අනුව සංඛ්‍යා ලේඛන පරිගණකගත කිරීම සාර්ථක ලෙස ජයග්‍රහණය කර තිබෙනවා. පෙර දවසේ ආදායම, මුළු රටේම ඩිපෝවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් දත්ත ලබා ගැනීමට පුළුවන්කම තිබෙනවා. ඒ මඟින් යම් අඩු පාඩුවක් සිදු වී තිබෙනවා නම් අවශ්‍ය පහසුකම් සපයා නිවැරදි කිරීම් කරන්න අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. නව ටිකට් යන්ත්‍ර භාවිතය පුළුල් කිරීම සතුටුදායක මට්ටමින් ක්‍රියාත්මක කර සියයට 40ක ජයග්‍රහණයක් ලබා තිබෙනවා. මොණරාගල පැවැත්වූ දැයට කිරුළ වැඩසටහනට සමගාමීව නව බස් රථ සේවාවන් 7ක්, සිසු සැරිය සේවාවන් 19ක්, නිසි සැරිය සේවාවන් 17ක් ආරම්භ කිරීමත් අපි ලබාපු ජයග්‍රහණ වනවා. කොළඹ හා ප්‍රධාන නගර ආවරණය වන පරිදි, සුව පහසුව උපරිම අයුරින් සැලසෙන සුඛෝපභෝගී මගී බස් රථ සේවාව යටතේ දැනට බස් රථ දෙකක් ධාවනය කිරීමට කටයුතු ආරම්භ කරලා තිබෙනවා. කොළඹ නගරය ආවරණය වන පරිදි සුඛෝපභෝගී බස් රථ 25ක් ධාවනය කරවීමට කටයුතු සැලැස්වීම විශේෂ කාරණයක්.

කොළඹ නගරය ජාත්‍යන්තර නගරයක් විධියට අලංකාර වනකොට ඒ නගරයට ගැළපෙන බස් රථ සේවයක් සඳහා ශ්‍රී ලංගම සූදානම් වීම පිළිබඳව අපේ ස්තුතිය, ගෞරවය පුද කරන්නට ඕනෑ. ඒ වාගේම ඩිපෝ හැටියට ගත්තාම හොරොව්පතාන, කිලිනොච්චිය, මුලතිව් යන ඩිපෝ නඩත්තු කිරීම සුවිශේෂී කාරණා හැටියට අපි දකින්නට ඕනෑ. සැබැවින්ම ප්‍රවාහනය සම්බන්ධයෙන් කථා කරද්දි අපට ශ්‍රී ලංගම අමතක කරන්නට බැහැ. පානදුර ඩිපෝවේ ඉංජිනේරු අංශය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීම, මහරගම ඩිපෝවට අයත් ඉඩම වටා ආරක්ෂක වැට ඉදිකිරීම ආදී කටයුතු කර තිබෙනවා. ශ්‍රී ලංගම ජයග්‍රහණය සඳහා ගිය ආකාරය පිළිබඳව කාරණා කිහිපයක් පමණයි මා ඒ කිව්වේ.

ශ්‍රී ලංගම බස් රථ භාරදහස් පන්සියය ඉක්මවනකොට පෞද්ගලික බස් රථ දහනව දාහක් දැනට ධාවනයට යොදවා තිබෙනවා. අපට තිබෙන්නේ තරගයක් නොවෙයි. ශ්‍රී ලංගමයට තව බස් රථ 2,000ක් 2012-2013 වර්ෂවලදී ධාවනයට එක් කිරීමට බලාපොරොත්තු වනවා. ඒ තුළින් අපේ රටේ කම්කරුවාට, ගොවියාට තමන්ගේ කටයුතු සඳහා යන්නට, ඔවුන්ගේ දරුවන්ට අධ්‍යාපන කටයුතු සඳහා යන්නට, රාජ්‍ය සේවකයාට තම කටයුතු කර ගෙන යාමට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න හැකි වෙනවා. ඒ නිසා ශ්‍රී ලංගම සඳහා බස් රථ ප්‍රමාණය ලබන වසරේ තවත් 2,000කින් වැඩි කිරීම ලබන වසරේ අප ලබන ජයග්‍රහණයක්. අප ඒ සඳහා යන්න කැප විය යුතුයි. විශේෂයෙන්ම මා සිහිපත් කරන්නට ඕනෑ, දැනට කාල සටහන්වල තිබෙන අඩු පාඩු අපි නිරවුල් කර ගන්නට ඕනෑය කියන එක. දුර ගමන් සේවා ආරම්භ කිරීමත් සමඟ කාල සටහන්වල ගමන් සේවා පිළිබඳ සුළු පටලැවිලි ඇති වෙලා තිබෙනවා. ඒවා නිරවුල් කර දෙන්න විශේෂඥ සහාය, පළපුරුදු නිලධාරින්ගේ සහාය, ජාතික ප්‍රවාහන කොමිසමට අවශ්‍ය වනවා. ජාතික ප්‍රවාහන කොමිසම මීට වඩා ශක්තිමත්ව ලංගම සහ පෞද්ගලික බස් රථ පරිපාලනය සිදු කළ යුතුයි කියන එකයි මගේ විශ්වාසය.

පෞද්ගලික බස් රථ සේවය ශක්තිමත් කරන්නට ලංකා පෞද්ගලික බස් රථ සේවක සංගම් ඒකාබද්ධව විවිධ මත ප්‍රකාශ කරනවා. එක පුද්ගලයෙක් සභාපති වෙච්ච සංගමයක් තමයි ලංකා පෞද්ගලික බස් රථ සංගමය. රටේ සමස්ත පෞද්ගලික බස් රථ ඒක රාශි කරලා, ප්‍රවාහන සේවයේ දිස්ත්‍රික් මට්ටමේ සමිති සමාගම් බිහි කරලා, නව සම්මේලනයක් විධියට සමස්ත ලංකා සම්මේලනයක් පත් කළ යුතුයි කියන එකයි මගේ විශ්වාසය. පෞද්ගලික බස් රථ හිමියන් නිවැරදිව ඒක රාශි කරලා ප්‍රවාහන ඇමතිතුමාගේ යටතට ඒ සියලු දෙනාවම පත් කර ගන්න පෞද්ගලික ප්‍රවාහනය භාර අමාත්‍යතුමා කටයුතු කළ යුතුයි කියන එකයි මගේ විශ්වාසය. එහෙම නැතිව කළු කඩ කාරයෙකුගේ, බස් රථයක් දෙකක් තිබෙන පුද්ගලයෙකුගේ යටතේ පෞද්ගලික බස් රථ සේවයේ නිවේදන නිකුත් කිරීම, ඉල්ලීම් ඉදිරිපත් කිරීම ඉතාම නුසුදුසු කාරණයක් විධියට මා දකිනවා. දිස්ත්‍රික්ක මට්ටමෙන් බස් රථ සමාගම් ඒක රාශි කරලා, සමස්ත ලංකා සම්මේලනයක් බිහි කළ යුතුය කියන එකයි මගේ විශ්වාසය.

ගුණාත්මක ප්‍රවාහනයක් කියන කාරණය මා අනෙක් කාරණය විධියට දකිනවා. ගුණාත්මක ප්‍රවාහනයක් අපේ රටේ තවමත් ක්‍රියාත්මක වන්නේ නැහැ. බස් එකකට නැඟුණාම හතර පස් දෙනෙක් එක්කෙනෙකුගේ තුනටිය උඩ නැඟලා, ඇඟ පත රිදි රිදී ගිහිල්ලා බැහැලා කාර්යාලයට යන යුගයක් තවමත් අපට තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ඒක එතැනින් එහාට ගෙන ගිය ගුණාත්මක සේවයක් බවට පත් කර ගන්න අප කැප විය යුතුයි කියන කාරණය මා සිහිපත් කරනවා. ඉදිරි කාලය පොදු ප්‍රවාහනයේ ස්වර්ණමය යුගය ලෙස සලකමින් මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය සැබෑවක් බවට පත් කරමින් දුම්රිය හා බස්රිය ධාවනය නිසි මඟට ගෙන ඒම සඳහා රජය ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව නව බලවේග කට්ටල 15ක්, මඟී ප්‍රවාහන මැදිරි 100ක් යෙදවීමෙන්ද, දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය තුළින්ද දුම්රිය අංශය වැඩිදියුණු කර තිබෙනවා. දුම්රිය සේවය වැඩිදියුණු කරන්නට ඔබතුමා ගත්තා වූ උත්සාහයට ස්තුතිය පුද කරමින්, ගරු ඇමතිතුමාට ඉදිරි වර්ෂය ජයග්‍රාහී ප්‍රවාහන සේවයක් බිහි කරන්නට හැකියාව ශක්තිය ලැබේවායි අපේක්ෂා කරමින් මා සමුගන්නවා.

[පූ. භා. 11.17]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රවාහන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ විවාදයේ දී කරුණු කිහිපයක්

ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. කොහොමත් අපේ රටේ දුම්රියත් ප්‍රමාදයි; බස් රථයත් ප්‍රමාදයි. අද ඇමතිතුමාත් ප්‍රමාදයි.

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
දැන් අපි ඒවා හදා ගෙන යනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක තමයි. අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන ගැටලුව අද අපේ අමාත්‍යතුමා ඉතා මැනවින් පාර්ලිමේන්තුවේදී පෙන්නුම් කරනු ලැබුවා. කොහොම වුණත් -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පවුලට බබා හම්බ වෙන්න ඉස්පිරිතාලෙට එක්ක ගෙන ගියා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිතුමා එහෙම කියනවා. ඒක මා දන්නේ නැහැ. ඒ ගැන කථා කරන්න අවශ්‍ය නැහැයි කියලායි මා හිතන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මා කිව්වේ මට සිද්ධ වෙච්ච එකයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරියටම මොකක්ද, සිද්ධ වුණේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පවුලට ළමයා හම්බ වෙන්න ඉස්පිරිතාලෙට එක්ක ගෙන ගියා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා කියන ඒවාට යස පිළිතුරු ලබා දෙන්න පුළුවන්. හැබැයි ගැලරියේ පාසල් දරුවන් ඉන්න නිසා ඒක කරන්න බැහැ. එම නිසා ඒ පිළිබඳව අපි වෙනම විවාදයක් කරමු.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පවුලට ළමයකු හම්බ වනවාය කිව්ව එක වැරැදිද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇත්තමද ඔය?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඇත්තම තමයි කියන්නේ. මා වාගේ සද්දන්ත පුද්ගලයකුට ඒක බැරි නම් වෙන මොනවා - [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සද්දන්ත පුරුෂයාගේ ඒ වැඩ වාගේම අනික් වැඩ ගැනත් අපි අද ටිකක් කථා කරන්න ඕනෑ. මීට කලින් අපි මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරලා තිබෙනවා, "උතුරු - මීතුරු" ව්‍යාපෘතිය පිළිබඳවත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳවත්. ඒවාට නිසි පිළිතුරු තවම ලැබිලා නැහැ. ඒ වාගේම චීනයෙන් දුම්රිය පෙට්ටි ආනයනය කිරීමේදී ලැබුණාය කියන කොමිස් මුදල මත පදනම්ව ගොඩ නඟනවා යයි කිවූ මඟී නිවස්නය පිළිබඳවත් මා අහන්න ඕනෑ. අඩුම තරමේ ඒ මඟී නිවස්නේ අත්තිවාරමවත් දමා තිබෙනවාය කියා ප්‍රවාහන අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබෙන ඔබතුමාගේ මේ වාර්තා පොතේ සඳහන් වෙලා තිබේද කියලා මා බැලුවා. මීට කලින් ආරම්භ කරනවාය කියපු ඒවා එකක්වත් මේ වාර්තාවේ සඳහන් වන්නේ නැහැ. IIFA එකට ඔබතුමා විවෘත කළා, - [බාධා කිරීමක්] ඇමතිතුමාගේ කථාවේදී පැහැදිලි කරන්න. මට විනාඩි 10යි තිබෙන්නේ. මීට කලින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඕක මම කියපු කථාවක්ද? මම ද කිව්වේ?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රවාහන ඇමති.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මා ප්‍රවාහන ඇමති කුමාර වෙල්ගම. ඒක මා කියපු කථාවක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හිටපු ඇමති ඩලස් අලහප්පෙරුම.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක එතුමාගෙන් අහගන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක නේ. දැන් මෙක මරු ආණ්ඩුවක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා කියපු ඒවා ඩලස් අලහප්පෙරුම ඇමතිතුමාගෙන් අහන්න ලු. කුමාර වෙල්ගම ඇමතිතුමා කියපු ඒවා කුමාර වෙල්ගම ඇමතිතුමාගෙන් අහන්න ලු. තව දවසකින් තව ඇමතිවරයකු ආපුවහම ඒවා අපට එතුමාගෙන් අහන්න කියාවි. මේක හරි අපූරු ආණ්ඩුවක් නේ. ආණ්ඩුවක් අමාත්‍යාංශයට වග කියන්න ඕනෑ. ඒකට ඉන්නවා, කැබිනට් මණ්ඩලයක්. ඒක කැබිනට් මණ්ඩලය ගත්ත සාමූහික තීරණයක්. ඒ තීරණය පිළිබඳව වග කියන්න ඕනෑ. මඟ හරින කොට අර ඇමති කිව්වා, මේ ඇමති කිව්වා කියලා මොකක්ද මේ කරන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් "උතුරු-මීතුරු" ව්‍යාපෘතිය පටන් ගත්තා. ඒකට මුදල් එකතු කළා. සිල්බර කොට ගන්නවාය කිව්වා, stations හදනවාය කිව්වා, stations හදන්න සල්ලි එකතු කරනවාය කිව්වා, රේල් පීලි ගෙනෙනවාය කිව්වා. අන්තිමට ඒ

[ගරු අනුර දිසානායක මහතා]

ඔක්කොම එකතු කරලා ඉන්දියාවට දුන්නා. දැන් ඒ ව්‍යාපෘතියට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඒවා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. සාමාන්‍ය දරුවන්ගෙන් කැටවලට සල්ලි එකතු කරලා ගත්තා. රාජ්‍ය ආයතනවල නිලධාරින්ගේ දවසක පඩිය කපා ගත්තා. දුම්රිය ස්ථාන සම්පූර්ණයෙන් හදන්න සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල භාර ගත්තාය කිව්වා. මෙහෙම ව්‍යාපෘති හැදුවා. දැන් ඒ ජනතාව දීපු සල්ලිත් නැහැ; රේල් පාරත් නැහැ. තමුන්නාන්සේ ඇවිල්ලා ඒ ඔක්කොම ඉන්දියාවට දුන්නා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මීට කලින් විවෘත කළා, "IIFA" කියලා දුම්රිය සේවයක්. IIFA උළෙලට සුඛෝපභෝගී කෝච්චියක් දැම්මා. මා දැක්කා, ඇමතිතුමායි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමායි ගිහිල්ලා පීත්ත පටිය දෙපැත්තෙන් කපලා එක විට ඇතුළු වනවා. දැන් ඒ කෝච්චියට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කටුනායක තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක කටුනායක තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඒක තිබෙන්නේ airport එකේ. දුම්රිය තිබෙන්න ඕනෑ, දුම්රිය station එකේ. දැන් station එකේ ඒ කෝච්චිය නැහැ. දැන් ඒක Airport එකේ තිබෙනවා. උඩින් යන්නද? දැන් ඒ කෝච්චිය ධාවනය කරන්නේත් නැහැ. මීට කලින් කණ්ඩායමක් එකතු වෙලා අවට සිරි නරඹමින් දුම්රියේ යන්න අවස්ථාවක් මේ රටේ ජනතාවට තිබුණා. තමුන්නාන්සේලා කුලියක් ගන්නවාය කියලා ඒ දුම්රිය SriLankan Airlines එකට දීලා තිබෙනවා. දැන් කුලියත් නැහැ; දුම්රියත් නැහැ. ඒ දුම්රිය අන්තිමට ධාවනය කළේ කවදාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කුලිය හම්බ වනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කුලිය හම්බ වනවා. හැබැයි ධාවනය කරන්නේ නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක මට වැඩක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වැඩක් නැහැයි කියන්නේ මොකක්ද, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? කෝච්චි ධාවනය කරන්නේ නැති එක එතුමාට වැඩක් නැහැයි ලු. කෝච්චිය ධාවනය වන්නේ නැති එක එතුමාගේ වැඩක් නොවෙයි. කෝච්චිය තිබෙනවා. කෝච්චියෙන් සල්ලි හම්බ වන්නේ නැහැ. [බාධා කිරීමක්]

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. තමුන්නාන්සේ දන්නවා, කොළඹ සිට මහනුවර දක්වා නගරාන්තර දුම්රිය සේවයක් තිබුණු බව. දවසට යන ගමන් වාර දෙකයි, එන ගමන් වාර දෙකයි. ඔක්කොම ගමන් වාර හතරක් තිබෙනවා. දැන් ඒකට අලුතින් පෙට්ටියක් සවි කළා නේ. ඒ පෙට්ටිය සවි කළේ කවුද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෙට්ටියක් සවි කළා, පෞද්ගලික සමාගමක්. තමුන්නාන්සේට ඒ පෙට්ටිය දුන්නේ කවුද? එය දුම්රිය දෙපාර්තමේන්තුව සතුව තිබුණු දුම්රිය පෙට්ටියක්. ඒක අලුත්වැඩියා කරලා සමාගමට දුන්නා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
පට්ටපල් අසත්‍ය කියන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අලුත්වැඩියා කරපු එකට සමාගම රුපියල් ලක්ෂ 25ක් තමයි දුන්නේ. [බාධා කිරීමක්] අලුත්වැඩියා කරපු එකට රුපියල් ලක්ෂ 25යි ගත්තේ. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති දුම්රියේ අමුණා ගෙන යනවා, සමාගමක පෙට්ටියක්. ඒ සමාගම මගීන්ගෙන් මුදල් අය කරනවා. සමාගම අය කරන්නේ කීයද? [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඇමතිතුමා එළිපිට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරනවා. ඒවා හෙළි වෙන කොට දඟලනවා. [බාධා කිරීම්] අර, හැම එකකටම තප්පුලන මන්ත්‍රීවරයෙක් ඉන්නවා පිටි පස්සේ. වාඩි වෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ මොකක්ද? නගරාන්තර දුම්රිය සේවයට හයි කළා පෙට්ටියක්. ඒ පෙට්ටියේ යන මගියකුගෙන් කීයක් ගන්නවාද? ඒ පෙට්ටියේ යන මගියකුගෙන් රුපියල් 1,500ක් ගන්නවා. දුම්රිය දෙපාර්තමේන්තුවට ඒකෙන් කීයද ගෙවන්නේ? [බාධා කිරීම්] දුම්රිය පෙට්ටියේ යන මගියකුගෙන් රුපියල් 1,500ක් අය කරලා දුම්රිය දෙපාර්තමේන්තුවට ඒකෙන් ලැබෙන්නේ රුපියල් 360යි. සමාගම ගන්නවා ඉතුරු සල්ලි ටික.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොකක්ද මේ කළේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති වෙලා තිබුණු පරණ කෝච්චි පෙට්ටියක් තමයි අලුත්වැඩියා කරලා-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ දුම්රිය, බස් ඔක්කෝම ගිනි තිබ්බා ජේවීපීකාරයෝ. ඒවාට වන්දි ගෙවන්න කියන්න, නැවත ගෙනෙන්න ඒ බස් ටික.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

That is not a point of Order. Hon. Anura Dissanayake, you carry on.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් හරිද? දැන් හොඳයිද ඔබතුමාට. දැන් සතුටුද? එහෙම නම් වාඩි වෙන්න කෝ කරුණාකරලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයිතිව තිබෙන නගරාන්තර දුම්රිය සේවයට පෞද්ගලික සමාගමක දුම්රිය පෙට්ටියක් හයි කරනවා. ඒ පෙට්ටිය දෙන්නේත් දුම්රිය දෙපාර්තමේන්තුවෙන්. රුපියල් ලක්ෂ 25ක් දුන්නා ඒ පෙට්ටිය අලුත්වැඩියා කළාට. සාමාන්‍යයෙන් ඒ පෙට්ටියේ වටිනාකම රුපියල් ලක්ෂ 250යි. ඒක ටොන් 30ක් බරයි. ඒක පරණ යකඩවලට වික්කත් රුපියල් ලක්ෂ 12ක් ලැබෙනවා. [බාධා කිරීම්] දැන් ඒ පෙට්ටිය අමුණලා දුම්රිය යනවා මහනුවරට. මහනුවරට යන කොට එක මගියකුගෙන් ගන්නවා රුපියල් 1,500ක්. ඒකෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන්නේ රුපියල් 360යි. දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඒ පෙට්ටියේ ගහලා තිබෙනවා ඒ සමාගමේ නම. ඒ පෙට්ටියේ යන මගියකුගෙන් ගන්නවා රුපියල් 1,500ක්. ඒකෙන් රුපියල් 360යි දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන්නේ. තමුන්නාන්සේලාගේ කෝච්චි දුවන්නේ එහෙමද?

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "Earl's Court" එකට අයිති, -මොන Earlද දන්නේ නැහැ- "රජ දහන" කියලා දුම්රියක් පෙට්ටියක් තිබෙනවා. මොන Earlද? මේවා නිකම් ඇම්ණෙන පෙට්ටි නොවෙයි. ආණ්ඩුවලට පනින කොට ඇම්ණෙන පෙට්ටි. එහෙම පෙට්ටියක් තිබෙනවා "Earl's Court" එකට අයිති "රජ දහන" කියලා. ඒක අමුණලා තිබෙන්නේ නගරාන්තර දුම්රියට. ඒ පෙට්ටිය අමුණලා තිබෙන්නේ "Earl's Court" කාරයා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකේ කොළඹ ඉඳන් මහනුවරට ටිකට් එකක් රුපියල් 850යි. දුම්රිය දෙපාර්තමේන්තුවට ඒකෙන් ලැබෙන්නේ රුපියල් 360යි. [බාධා කිරීම්] දුම්රිය දෙපාර්තමේන්තුව කාගේවත් පෙට්ටි අදිනවා සල්ලි නැතුව.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒක ඔබතුමා හරියට appreciate කරලා නැහැ. ඒක හොඳයි නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

තමුන්නාන්සේලා මොකක්ද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලාට අයිති දුම්රියේ පෞද්ගලික අංශයේ පෙට්ටියක් අමුණලා රුපියල් 1,500ක් මගියකුගෙන් ගන්නවා. ඒකෙන් රුපියල් 360ක් තමුන්නාන්සේලා ගන්නවා. හරිද ඒක? ඒකද appreciate කරන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒ පෙට්ටිය හැදුවේ ඒ ගොල්ලන්. අපි නොවෙයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒක තමුන්නාන්සේලාගේ දුම්රිය දෙපාර්තමේන්තුවේ පෙට්ටියක්. ඒක හැදුවේ දුම්රිය දෙපාර්තමේන්තුවෙන්. ඒ වියදම ගියා රුපියල් ලක්ෂ 25ක්. අඩුම තරමින් දුම්රිය පෙට්ටියක් වටිනවා රුපියල් ලක්ෂ 250ක්. රුපියල් ලක්ෂ 250ක් වටිනා දුම්රිය පෙට්ටිය රුපියල් ලක්ෂ 25ට දුන්නේ. ඊර්ෂ්‍යාවට නොවෙයි මේ කියන්නේ. කොමිස් ගැහුවේ එහෙමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් 1,500ක් වන ටිකට් එකෙන් රුපියල් 360ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන කොට ඉතුරු රුපියල් 1,140න් ඊට අදාළ නිලධාරින්ට සහ ඇමතිවරයාට කීයක් එනවාද කියලා දැන ගන්න කැමැතියි. කරුණාකරලා ඒක කියන්න. මගියා ගමන් කරන වාර ගණනට ඇමතිට සල්ලි එන්න හදපු ව්‍යාපෘති මේවා. ඒ ව්‍යාපෘති ගැන කථා කරන කොට තමයි දඟලන්නේ. දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති කෝච්චියේ පෞද්ගලික අංශයේ පෙට්ටි අමුණලා, මගීන්ගෙන් සල්ලි අරගෙන, දුම්රිය දෙපාර්තමේන්තුවට සොච්චමක් දීලා ඇමතිවරයාගේයි, මුදලාලිලාගේයි නඩත්තු වියදම් දරන වැඩක් මේක. ඒකද තමුන්නාන්සේ හොඳයි කියන්නේ? ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Member, now please wind up.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම අවසන් කරන්නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා තමයි මෙතුමා කලබල වෙන්නේ. ඒක ගැන කථා කරන කොටම උඩ පනිනවා. දැන් අපූරුවට හිටියා. ඒ අපූරුවට හිටිය ඇමතිවරයාට "රජ දහන" කෝච්චි පෙට්ටිය ගැන කථා කරන කොට, "Earl's Court" එක ගැන කථා කරන කොට පුටුවේ වාඩි වෙලා ඉන්න බැහැ, දඟලන්න පටන් ගන්නවා. මොකද ඒ? හෙළිදරව් වෙන්න පටන් ගන්න නිසා කරුණු ටික.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මගී ප්‍රවාහනය උදෙසා විශාල කාර්ය භාරයක් කරනවා. ඒවා විනාශයට පත් කරන තීන්දු තීරණ තමයි ගන්නේ. රේල් පාර හදන්න දුන්නා ඉන්දියාවට; දුම්රිය පෙට්ටි දීලා තිබෙනවා පෞද්ගලික අංශයට; දැන් සාකච්ඡා කර ගෙන යනවා දුම්රිය පාර නඩත්තු කරන්නත් පෞද්ගලික අංශයට පවරන්න. මේ විධියට සියල්ල විකුණමින් යන ගමනකට අවතීර්ණ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඇමතිවරයා මේ ගනු ලබන ක්‍රියා මාර්ග අපේ රටේ මගී සේවයට හෝ දුම්රිය සේවයට හෝ හිතකර එකක් නොවෙයි. කරලා තිබෙන දේ තමයි මේවා විනාශකාරී මාවතකට ඇදලා දාලා තිබෙන එක. කොමිස් මත යැපෙන, හොරකම් මත යැපෙන, තමන්ගේ මඩි තර කර ගන්නා ව්‍යාපෘතියකට අද දුම්රිය දෙපාර්තමේන්තුවත්, ශ්‍රීලංගමයත් පාවිච්චි කරනවා. ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ විරෝධය ප්‍රකාශ කරමින් මම නතර වෙනවා.

[පූ. භා. 11.27]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටක සංවර්ධනයටත් රටේ ජනතාවටත් බෙහෙවින් බලපාන වැදගත් අමාත්‍යාංශයක් ගැන බොහොම සුළු වෙලාවක් ඇතුළත කථා කරන්නයි මට සිද්ධ වෙලා තිබෙන්නේ. සමහර අමාත්‍යාංශවලට ඇමතිවරු පත් කරපු

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විධිය බලන විට, මේ අමාත්‍යාංශයට ඇමතිවරයා පත් කරපු විධිය ගැන නම් විරුද්ධ පක්ෂයේ අපිට සතුටු වන්න පුළුවන්. මොකද, වෙල්ගමලා ප්‍රවාහනයටත්, ප්‍රවාහනය වෙල්ගමලාටත් බැඳුණු එකක් කියලා මා හොඳින් දන්නා නිසා. ඒත් අද රටේ ප්‍රවාහන ආයතන ජනතාවගේ ආර්ථිකයට දැඩි ලෙස බලපා තිබෙනවා වාගේම, ජනතාවගේ ජීවිත පවා නැති කරන ආයතන බවට පත් වෙමින් තිබෙන බව දිනපතා මාධ්‍ය වාර්තාවලින් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කවුරුත් දන්නවා, මුල්ම යුගවල අපේ ජනතාව ප්‍රවාහන කටයුතු කළේ අතුරු පාරවල, අඩි පාරවල ගමන් කරමින් බව. ඊට පසු කාලයක සත්තු පිටේ බඩු ප්‍රවාහනය කරන්න පටන් ගත්තා. තව ටිකක් කල් යනකොට දෝලාවෙන්, බර කරත්තවලින් ප්‍රවාහන කටයුතු කෙරුණා. එදා වාගේම අදත් පුෂ් බයිසිකල් යොදා ගෙන ප්‍රවාහන කටයුතු කෙරෙනවා. ඒ විධියට ටිකෙන් ටික මෝටර් රථ යුගයට ඇවිත්, අපේ රට යටත් විජිතයක්ව තිබුණු කාලයේ 1857 දී දුම්රිය සේවයකුත් පටන් ගත්තා.

දුම්රියසේවය ප්‍රධාන අරමුණු කීපයක් ඇතුවයි පටන් ගත්තේ. ඒ තමයි විශ්වාසය, කාර්යක්ෂමතාව, කලට වේලාවට කටයුතු කිරීම. හැබැයි, ලාභය කියන එකත් අද දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙවර පොතේ සඳහන් වනවා. මා හිතන හැටියට මේ වන විට දුම්රිය සේවය පටන් ගෙන අවුරුදු 150කට වැඩියි. රජය කොයි විධියට මොන කතන්දර කිව්වත් තවමත් දුම්රිය සේවයෙන් මගීන් ගමන් කරන්නේ සියයට 10ක් 12ක් වාගේ අඩු ප්‍රමාණයක්. ඒ තුළින් පෙනෙනවා, දුම්රිය සේවයෙන් ජනතාවට සැලසෙන සේවය මොන තරම් අඩු මට්ටමක තිබෙනවාද කියන එක. අඩුම මුදලකින් භාණ්ඩ ප්‍රවාහනය කරන්නත් දුම්රිය සේවයෙන් පුළුවන්. නමුත් මේ වන විට දුම්රිය දිනෙන් දිනම භාණ්ඩ ප්‍රවාහනයෙන් ඈත් වෙමින් තිබෙන බවකුත් දකින්න තිබෙනවා. විශේෂයෙන්ම මගී සේවයේදී, මගීන් දුම්රියෙන් ඈත් වීමට හේතුවක් වෙලා තිබෙනවා, අඩු කාලයකින් විශ්වාසනීය දුම්රිය ගමනක් යන්නට නොලැබීම. ඒ වාගේම අවශ්‍ය ප්‍රමාණයට දුම්රිය එන්ජින් සහ මැදිරි නැති වීම.

ඇත්ත වශයෙන්ම දුම්රිය සේවය සෘජුවම මේ රටේ සංවර්ධනයට බෙහෙවින්ම බලපාන දෙයක්. රටේ ජනතාවගේ ජීවන බර අඩු කරන්න ප්‍රබල දායකත්වයක් මේ දුම්රිය සේවයෙන් ලබා දෙන්න පුළුවන්. නිදහසින් පස්සේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු තමයි දුම්රිය මාර්ග ඇති කරන්න කටයුතු ආරම්භ කළේ. ඒ වාගේම නව දුම්රිය ස්ථාන රාශියක් ස්ථානගත කළා. කැලණිවැලි දුම්රිය මාර්ගයේ ගිය දුම්රියට එදා පුංචි කෝච්චිය කියලා තමයි කිව්වේ. ඒක අවිස්සාවේල්ල දක්වා සාමාන්‍ය දුම්රිය සේවයක් බවට පත් කළා. පාසල් දරුවන්ට, රැකියාවලට, වෙළෙඳාම්වලට යන අයට ඒකෙන් විශාල ප්‍රයෝජනයක් අත් වුණා. ඒ වාගේම අපේ ආණ්ඩු කාලයේ අනුරාධපුරයේ ඉඳලා මිහින්තලය දක්වා දුම්රිය සේවාව වැඩිදියුණු කළා. එදා එක්සත් ජාතික පක්ෂය රටේ ආර්ථික සංවර්ධනය ඇති කරනවා වගේම, සංස්කෘතික නවෝදයක් ඇති කරන්න දේශීය සංචාරකයන්ට සිද්ධස්ථාන වැඳ පුදා ගන්න පුළුවන් විධියට දුම්රිය සේවය වැඩිදියුණු කරන්න කල්පනා කළා.

ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ සැලසුම් කළා, මාතර ඉඳලා කතරගම දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කරන්න. නමුත් තවමත් කතරගම දක්වා දුම්රිය ගමනාගමනය කරන්න බැරි වෙලා තිබෙනවා. ඒක කළොත් විශාල සේවයක් මේ රටටත් විශේෂයෙන්ම දකුණේ දියුණුවටත් ඉටු වනවා. දකුණෙන් පාලකයෙක් බිහි වෙලා අවුරුදු හයක් වෙලාත් තවම ඒක කරන්න බැරි වුණා. හැබැයි, ගිනි පොලියට ණය අරගෙන උපදින්න ඉන්න දරුවෝත් රුපියල් ලක්ෂ ගණනක ණයකාරයෝ කරලා, අසාර්ථක ව්‍යාපෘතිවලට මුදල් යොදවන එක නම් තවම දකින්න තිබෙනවා. මාතර ඉඳලා කතරගම දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කිරීම ගැන ඔබතුමා උනන්දුවක් දක්වා ඒ වැඩ කඩිනම් කළොත් ඒක රටේ සංවර්ධනයට විශාල පිටුවහලක් වෙයි. ඔබතුමා ප්‍රවාහන ඇමතිවරයා ලෙස බොහොම අවබෝධයකින් යුතුව වැඩ කරන කෙනකු ලෙස දකින නිසායි මා මේ කාරණා ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ කථා කරන්නේ.

පසු ගිය කාලයකදී ප්‍රවාහනය කතන්දරවලට විතරක් සීමා වෙලා තිබුණා. විපක්ෂයේ ඡන්ද ප්‍රතිඵල ගැන, ඉලක්කම් හරඹ ගැන, වචන හරඹ ගැන, ඒ වාගේම සංවර්ධනයේ මවා පෑමක් විතරක් ප්‍රවාහන අමාත්‍යාංශය තුළ අපි දැක්කා. ඒ කාලයේ දුම්රිය එන්ජින් ගෙනාවාම ඒක දුම්රිය පෙට්ටියට අමුණන්න බැහැ. දුම්රිය පෙට්ටි ගෙනාවාම එන්ජින් එකට අමුණන්න බැහැ. එළ හරකායි, මී හරකායි වාගේ වැඩ තමයි අපි ඒ කාලයේ දැක්කේ. සමහර වෙලාවට දුම්රිය මැදිරි දිග වැඩි නිසා සමහර දුම්රිය ස්ථානවලදී මඟීන්ට ඒවාට නඟින්නට බහින්නට පවා අපහසු වුණා. නියමිත ප්‍රමිතියට දුම්රිය සංඥා පද්ධතිය ක්‍රියාත්මක නොවීම් එහෙම නිතර නිතර දැක්කා. අලුත් රේල් පීලි යොදා නොගැනීම නිසා ගමන් අඩාළ වන ඒවා, අනතුරු ඇති වන ඒවා අපට දිගටම දකින්නට ලැබුණා. අලව්ව, දුම්රිය අනතුර සිදු වුණු වෙලාවේ ෆයිබර්වලින් හදපු දුම්රිය එන්ජින් ගෙනාපු කතන්දරයක් එළියට ආවා. එවැනි අවස්ථාවලදී ඔබතුමා බොහොම ක්‍රියාශීලී අමාත්‍යවරයෙක් විධියට කඩිසරව ඉදිරිපත් වුණු හැටි අපි දැක්කා. ඔබතුමාත් මාධ්‍යයට කිව්වා, "මේවා ෆයිබර්වලින් හදපු එන්ජින් බව මම පිළිගන්නවා." කියලා. "හැබැයි මගේ කාලයේ ගෙනාපු ඒවා නොවෙයි" කියලාත් ඔබතුමා කිව්වා. බාල පෙට්‍රල් ගනුදෙනුව වාගේ ගනුදෙනු මේවායේ සිද්ධ වුණාය කියන එක පොඩි දරුවකුට වුණත් ඒත්තු යනවා. අමාත්‍යතුමනි, ඔබතුමාගේ කාලයේ මේවා නොගෙනාවා වුණත්, ක්‍රියාවෙන් වැඩ පෙන්වන ඇමතිවරයකුගේ කාලයේද, වචනවලින් විතරක් වැඩ පෙන්වපු ඇමතිවරයකුගේ කාලයේද ගෙනාවේ කියන එක ජනතාවට අදාළ නැහැ. මේ දූෂණ පිළිබඳව ජනතාව ලොකු කල්පනාවකින් ඉන්නවා.

දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයන් ගැන කථා කරන කොට, මා සුවිශේෂී ස්තුතියක් ගෞරවයක් ඔවුන් වෙත පිරිනමනවා. මොකද, සුනාමි අවස්ථාවේදී ඒ අය දක්වපු දැඩි කැපවීමත්, ඒ වාගේම විනාශ වෙච්ච දුම්රිය මාර්ග පද්ධතිය විශ්වකර්ම විධියට කෙටි කාලයකින් අඩු වියදමකින් සම්පූර්ණයෙන්ම සකස් කර නිම කිරීමත් නිසා. නමුත් අපි කනගාටු වනවා, ක්‍රියාවෙන් ඒ තරම් දක්ෂ විධියට වැඩ පෙන්වපු සේවක පිරිසක් සිටියදී දකුණේ දුම්රිය මාර්ගය වේගවත් කරන්න ක්‍රියා කරන වෙලාවේ කෝටි ගණනක මුදලක් විදේශිකයන්ට ලබා දෙන්න තමුන්නාන්සේලා කටයුතු කිරීම ගැන. ඒ නිසා දුම්රිය සේවය ගැන අපට සතුටට පත් වන්න බැහැ.

මේ රටේ මගී ප්‍රවාහනයෙන් සියයට 80ක්ම කරන්නේ බස් රථවලින්. එයින් තුනෙන් දෙකක්ම පෞද්ගලික බස් රථ. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සේවය සපයන්නේ මඟීන්ගෙන් සියයට 20ක විතර පිරිසකට විතරයි.

එදා 1977 අපේ ආණ්ඩුව බලයට එන කොට CTB බස් විතරයි තිබුණේ. අපට මතකයි, කන්තෝරු යන මිනිසුන්, පාසල් යන දරුවන් footboard එකේ එල්ලිලා ගිය හැටි. යූඑන්පී ආණ්ඩුව ඇවිත් ටික කලක් යන කොට private bus සේවාව ඇති කළා. ටාටා බස්, රෝසා බස්, ඉසුසු බස්, ලේලන්ඩ් බස්, intercity බස්, AC බස් මේවා අපේ ශබ්දකෝෂයට එන්න පටන් ගත්තා.

මේ පරිවර්තනය 1977 ඇති කළා. [බාධා කිරීමක්] මට තව විනාඩි දෙකක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. 1977ට ඉස්සෙල්ලා අපේ ගම්වල ඒ තරම් වාහන දකින්නට තිබුණේ නැහැ. 1977 පරිවර්තනය හරහා මේ රටේ ප්‍රවාහනයේ දැවැන්ත පරිවර්තනයක් ඇති වුණා. HiAce, LiteAce සැරිසරන්න පටන් ගත්තා, motorcycles එන්න පටන් ගත්තා. අපේ පළාත්වල

pushbike එකේ මාළු පෙට්ටිය බැඳ ගෙන ආපු මාළු මුදලාලි motorcycle එකේ මාළු පෙට්ටිය බැඳ ගෙන ඇවිල්ලා horn එක ගහලා මාළු විකුණනවා. Pushbike එකේ දළු ගෝනිය බැඳ ගෙන ආපු කෙනා motorcycle එකේ - C90යේ - දළු ගෝනිය බැඳ ගෙන එන්න පටන් ගත්තා. ඒ වාගේම three-wheelers ආවා. කරත්තවල දළු ගෙනාපු උදවිය, වැලි ගඩොල් ගෙනාපු උදවිය canter trucks වල ඒවා ගෙනෙන්න පටන් ගත්තා. ඒ පරිවර්තනය යූඑන්පී ආණ්ඩුව ඇවිත් ටික කලකින් උදා වුණා. මම හිතන හැටියට සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමාටවත් ඒක නැහැයි කියලා කියන්න බැහැ.

මම හිතන හැටියට දැන් වෙන කොට private bus 19,000ක් විතර තිබෙනවා. 2009 වාර්තාවලට අනුව ඊට සාපේක්ෂව CTB බස් තිබුණේ හාරදහස් තුන්සියයක් වාගේ ගණනක්. එදා අපි පෞද්ගලික බස් සේවාව ඇති කරපු එක අද මඟී ප්‍රවාහන සේවාවට මොන තරම් ඉවහල් වනවාද කියන එක ඔබතුමන්ලාට පෙනෙන්නට තිබෙනවා. Private busවලට, පිරිසිදුකම ගැන නොයෙක් ඒවා ගැන විවිධ චෝදනා නඟනවා. නමුත් ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා, ඒ සේවය ලබා දෙන්න. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, SLTB එක, දුම්රිය දෙපාර්තමේන්තුව වාගේ අනෙකුත් රාජ්‍ය ආයතනත් අද නාස්තිය, දූෂණය, අකාර්යක්ෂමතාව නිසා ඉතාම පාඩු ලබන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

බස් රථයකට සේවකයන් අට දෙනෙක් විතර ඉන්නවාලු. ඉතින් කොහොමද, SLTB එක ගොඩගන්නේ? SLTB එකේ සේවකයෝ කියන විධියට ඔවුන්ට නියමිත දිනයට විතරක් නොවෙයි, නියමිත මාසයටවත් වැටුප් ලැබෙන්නේ නැති අවස්ථාවල් අද වන කොට දකින්නට තිබෙනවා. ඉතින් අමාත්‍යතුමාට සිද්ධ වෙනවා, මේවා ගැන ක්‍රියා කරන්න. අපේ මඟී ප්‍රවාහන සේවය ගැන අසල්වැසි ඉන්දියාවෙන් හොඳ ආදර්ශ ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඔවුන්ගේ මඟී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහනය බහුලව සිද්ධ වෙන්නේ දුම්රියෙන්. ඒ නිසා ජනතාවගේ ජීවන බර අඩු කරන්න, රට සංවර්ධන ඉලක්ක කරා යන්න අවශ්‍ය දුම්රිය සේවය දියුණු කරන්න ඉන්දියාවෙන් අපට හොඳ ආදර්ශ ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කොච්චර ප්‍රායෝගික වුණත් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලට නිසි වැඩ පිළිවෙළක් යොදන්න තවම බැරි වෙලා තිබෙනවා. මට මතකයි ප්‍රේමදාස ජනාධිපතිතුමා සිටි කාලයේ අහුන්ගල්ලේ, -අපේ ගාලු දිස්ත්‍රික්කයේ- පාසල් බස් රථයක් දුම්රියක ගැටිලා පාසල් දරුවෝ කිරි කොක්කු රෑනක් වාගේ එක තැන මිය ගියා. ප්‍රේමදාස ජනාධිපතිතුමා ප්‍රායෝගික නායකයෙක් විධියට ඉතාම ක්ෂණික පියවරක් ගත්තා, උණ බම්බු ගේට්ටු දාන්න. අද වන විට ඒ උණ බම්බු ගේට්ටු ඇත්තෙත් නැහැ, මොනම බම්බුවක්වත් ඇත්තේ නැහැ. හැමදාම වාගේ අපි TV එකෙන් දකිනවා, දුම්රිය අනතුරුවලින් අච්චර මැරුණාය, මෙච්චර මැරුණාය කියනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, please wind up now.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම මේ අන්තිම තත්පරයේ මේ කාරණය කියන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මම නියෝජනය කරන ඇල්පිටිය ප්‍රදේශයේ ඇල්පිටිය ඩිපෝව ඉස්සර ලංකාවේ පළමුවෙනි හෝ දෙවෙනි හෝ තුන්වෙනි තැනට තිබුණු ඩිපෝවක්. අද එහි ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. බස් එක තිබෙන විට ටයර් එක නැහැ. ටයර් එකේ හුළං යන විට පරණ බස් එකකින් අරගෙන දානවා. මෙකේ පැලැස්තර අලවන ක්‍රමයක් තිබෙන්නේ. ඒ වාගේම නගරයේ ඉතාම වටිනා භූමි භාගයක්, විශාල අක්කර ප්‍රමාණයක් ඒ ඩිපෝ එකට තිබෙනවා. ඒක නඩත්තු කරන්න බැරිව මරුදූවෝ බෝ වෙලා, විශාල ප්‍රශ්න තිබෙනවා. හිටපු ඇමතිතුමා එහි ගොස් තිබෙනවා. ඒක වචන හරඹයක් විතරයි. සේවකයෝත් කියනවා, මොකුත් වුණේ නැහැයි කියලා; ලස්සන වචන ටිකක් කථා කළා, හොඳ කථාවක් ඇහුවා කියලා. හැබැයි මම හිතනවා ඔබතුමා බස් එකේ එන්ජිම, ගියර් පෙට්ටිය, දුනු සෙට් එක අලගිය තැන, මුල ගිය තැන දන්න කෙනෙක් නිසා යම් දෙයක් කරයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[පූ. භා. 11.38]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම ස්තුතියක් කරලා කථාව පටන් ගත්තොත් හොඳයි කියලා මා හිතනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක හොඳයි. කලකින් නේ එහෙම හම්බ වෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු ඇමතිතුමා ඇත්ත කථා කරනවා. හංගලා කථා කරන්නෙත් නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
වහලා ගහන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වහලා ගහන්නේ නැහැ අපි. එළිපිට ගහන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා ] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා බොහොම ආඩම්බරයෙන් අපි අහන ප්‍රශ්නවලට පිළිතුරු දීලා, අපි එක්ක කථා බහ කරලා පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා වන

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

පිළිවෙළට කටයුතු කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව මා තමුන්නාන්සේට මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. තමුන්නාන්සේට දීලා තිබෙන්නේ එක්කෝ ඉඳපන් නැත්නම් නැති වෙයන් කියන අමාත්‍යාංශයක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක පිළිගන්නවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Sri Lanka Railways කියපුවාම, දුම්රිය කියපුවාම කරන්නම බැරි වැඩක්. මම දන්නේ නැහැ තමුන්නාන්සේ කොහොම කරන්න හදනවාද කියලා. CTB එක ගැන එක්තරා ප්‍රමාණයකට අපිට හිතන්න පුළුවන් තමුන්නාන්සේ නිසා. මහින්ද චින්තනය නිසා නොවෙයි, තමුන්නාන්සේගේ චින්තනය නිසා. මොකද, තමුන්නාන්සේට ඒ පිළිබඳව හොඳ අත් දැකීමක් තිබෙනවා, පළ පුරුද්දක් තිබෙනවා. කැපවීමක් තිබෙනවා.

අනෙක් කාරණය තමයි තමුන්නාන්සේට දෙන්න තිබුණ අමාත්‍යාංශයක් කඩලා අද වෙනත් තැනකට දීලා තිබෙනවා කියන එක. වැඩ කරන්න පුළුවන්, දක්ෂ, දැනුමක් තිබෙන තමුන්නාන්සේට ඒවා නොදී කඩ කඩ, කඩ කඩ දීලා තිබෙනවා. මේක තමයි මහින්ද චින්තනය. වැඩ කරන්න පුළුවන් ඇමතිවරුන්ට වැඩ කරන්න දෙන්නේ නැහැ. මේ එකක් නොවෙයි. අපි ඔබතුමා කථා කරන විට දැක්කා මීට ඉස්සෙල්ලා හිටපු තමුන්නාන්සේලාගේ ඇමතිතුමන්ලා කළ ක්‍රියා පිළිබඳව තමුන්නාන්සේ වගකීම භාර ගන්නේ නැහැයි කියනවා. මම කියන්නේ ඒක හරි. නමුත් රජයේ ඇමතිවරයෙක් හැටියට ඒක හරි නැහැ. ඒ වගකීම තමුන්නාන්සේ භාර ගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ මෙහෙම සිද්ධීන් කිහිපයක් ඇති වුණා, ඇමතිතුමනි. ධීවර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන කථා කරන විට මේ පාර්ලිමේන්තුව තුළ තමුන්නාන්සේලාගේ -සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිවරයාත් ඒ වාගේම ෆීලික්ස් පෙරේරා ඇමතිවරයාත්-එකඟත්වයක් නැහැයි කියන එක බොහොම පැහැදිලිව ප්‍රකාශ වුණා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)
ඒ ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මම හිතනවා ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණය නම්, කැබිනට් එකේදී ඕනෑ දෙයක් කියන්න පුළුවන් කියලා. මෙහාට ආවාට පස්සේ ආණ්ඩුවේ කොටස්කාරයෙක් හැටියට එහෙම කියන්න බැහැ. ඒක තමයි ඇත්ත. තමුන්නාන්සේ ඒක දන්නවා නේ. දැන් තමුන්නාන්සේ විහිළුවට එහෙම කිව්වාට, තමුන්නාන්සේ ඇත්ත දන්නවා.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි ප්‍රවාහනයටත් සම්බන්ධයි, තමුන්නාන්සේටත් සම්බන්ධයි මේ එළවලු ප්‍රශ්නය. අර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා ඒක සම්බන්ධ නැහැයි කියලා. මම දන්නේ නැහැ එතුමා එහෙම කිව්වේ කොහොමද කියලා. එළවලු ප්‍රවාහනය කිරීම ගැන නොවෙයි දැන් කථා කරන්නේ. මම කථා කරන්නේ මේ කාරණය ගැනයි. මේ වැඩ පිළිවෙළේදී කැබිනට් මණ්ඩලයේ ඉන්න ඇමතිවරු එළියට ඇවිල්ලා මොනවාද කියන්නේ?

මම කථා කළාට පස්සේ, ඇමතිවරු දෙන්නෙක් මට කිව්වා තමුන්නාන්සේ කිව්වේ ඇත්ත, අපට ඕක කියා ගන්න බැරිවයි ඉන්නේ කියලා. කවුද ඒ තීරණය ගත්තේ? එළවලු කූඩවලින් ගේන්න ඕනෑය කියන එක, මහින්ද චින්තනයද? ඒක කියන්නේ නැහැ දැන්. නීති ගෙනැල්ලා මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න දීලා අවසානය වෙනකම් ජනාධිපතිතුමා ඉන්නවා. මහ ජනතාවට මේවා ඔරොත්තු නොදෙන කොට, එක එක ඇමතිවරු ගිහිල්ලා කයිවාරු ගහන කොට අවසානයේ අන්න ජනාධිපතිතුමා කැඳවලා ඒක නිවැරැදි කරනවා. ඒ කියන්නේ ඇමතිවරයා වැරැදියි.

මෙවැනි තත්ත්වයකින් යන කොට ගමනාගමනය පිළිබඳව - විශේෂයෙන්ම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය සේවය පිළිබඳව - කථා කරන කොට මා විශ්වාස කරන්නේ මෙහි ඉන්න සේවකයන්ගේ කිසි වරදක් නැහැ කියලායි. අඩු පාඩුකම් තිබෙනවා. අපේ ඇමතිවරු, මන්ත්‍රීවරු සමාජය දිහා බැලුවාම පෙනේවි, වැඩි පිරිසක් කැපවීමෙන් වැඩ කරන අයයි කියලා. ඔක්කොම එක වාගේ නොවෙයි නේ. කැපවීමෙන් වැඩ කරන්න බැරි ඇයි? ඒ ගොල්ලන්ට ලැබිය යුතු ඒ වේතනය වෙලාවට ලැබෙන්නෙත් නැහැ. අනික් එක ඒ වේතනය මදි. දුම්රිය සේවයටත් එහෙමයි; CTB එකටත් එහෙමයි. දුම්රිය engine ඩ්‍රයිවර් මහත්වරුන්ගේ -පුහුණු අයගේ- හිඟයක් තිබෙනවාද? තිබෙනවා නම් ඒ කොච්චරද? විශාල හිඟයක්, මා දන්නා පිළිවෙළට. ඇයි දැන් ඒකට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකරන්නේ? ඒ අය අරගෙන පුහුණු කරලා, යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකරන්නේ ඇයි? එහෙම හිඟයක් තිබෙනවා නම් මේ දුම්රිය දුවවන්නේ කවුද? මේ ප්‍රශ්නය එනවා. ගරු ඇමතිතුමනි, ඔය පීලි පනින එක, හයියෙන් යන එක, වංගුවේදී යන්න ඕනෑ කොහොමද කියන එක, colour lights පිළිබඳ ප්‍රශ්න ඇති වන්නේ මේ වාගේ මූලික දේවල්වලදී. අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඉතා දක්ෂ සේවකයෝ පිරිසක් තමයි තමුන්නාන්සේට ඉන්නේ. දුම්රියේ වැඩ කරනවා කිව්වාම, පාරවල් හදනවා කිව්වාම මා හිතන හැටියට ඔවුන් අව්වේ වේලි වේලි ඉන්නවා, වෙලාවක් නැහැ. ඒ ගොල්ලන්ට මුදල් හම්බ වෙනවා ඇති. නමුත් ඒ අය හොඳ කැපවීමකින් වැඩ කරන්න පුළුවන් පිරිසක්. CTB එකේත් එහෙමයි. ඒ පිරිස ශක්තිමත් කරලා, ධෛර්යවත් කරලා තමන්ගේ පවුල ජීවත් වෙන තත්ත්වයට නොගත්තොත් මේ සේවය ක්‍රියාත්මක කරන්න බැහැ. ඒක එක කාරණයක්.

ගරු ඇමතිතුමනි, ඉස්සර අප දුම්රියට කිව්වේ, "අඟුරු කකා වතුර බිබී දුවන යකඩ යකා" කියලායි. එහෙම නේ කිව්වේ. ඒක ඇත්ත. අපේ ආර්ථිකයේ ඉන්න, අද වගකිව යුතු ඇමතිවරු කීප දෙනෙක් කියලා තිබෙනවා, මේ රටට භයානක ප්‍රතිඵල ගෙන දෙන ආයතන කීපයක් තිබෙනවා, එකක් දුම්රිය කියලා. මේක කොච්චර දුරට ඇත්තද කියලා මම දන්නේ නැහැ. නමුත් ඒක ඇත්ත. 1994 ඉඳලා මේ ආණ්ඩුව තිබෙනවා. ඒ මැද්දේ අපි හිටියේ අවුරුදු දෙකයි, තුනයි. තමුන්නාන්සේලාගේ කාල පරිච්ඡේදය තුළ මේ දුම්රිය සේවය ලෝකයේ අනික් රටවල තිබෙන තත්ත්වයට දියුණු කරන්නට යම් කිසි සැලැස්මක් තමුන්නාන්සේ අතේ දැන් තිබෙනවාද? මම කියන්නේ මේ කාලයේ නොවෙයි, අර ඉස්සරත් එක්ක. අප දන්නවා එක්තරා කාලයක engines ගෙනාපු බව. නමුත් දුවන්න බැහැ. පෙට්ටි ගෙනාවා. අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒවා දුවන්න බැහැ. මම බැලුවා, තමුන්නාන්සේගේ කාල පරිච්ඡේදයේ කොහොමද කියලා. තමුන්නාන්සේ අපට දීලා තිබෙන ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ මේ පොත බැලුවාම එහෙම සහතිකයක් අපට එන්නේ නැහැ. ආණ්ඩුව ඕනෑ එකක් වෙච්චාවේ. දුම්රිය සේවය අවශ්‍යයි.

දුප්පත් මිනිසුන්ගේ ගමන් මාර්ගයක් දුම්රිය. දුම්රිය සේවය අවුරුදු පහකින්වත් හරියට සකස් කරන්න ඕනෑ කරන වැඩ පිළිවෙළක් තිබෙනවා නම් අපි කථා කරමු. ඒක අර එළවලු කුඩ වාගේ නොවෙයි. අපි කථා කරමු. කථා කරලා අපි උදවු දෙන්නම්. කොතැන හරි දේශපාලනයට යට වෙච්ච වරදක් තිබෙන බව පිළිගන්න ඕනෑ. අපට මේ ආයතනය දියුණු කරන්න මුදල් නැත්නම් එහෙනම් වෙන කාගෙන් හරි ගන්න වෙනවා. අර හම්බන්තොට වරායට මෙච්චර ණයක් ගන්න කොට ඇයි තමුන්නාන්සේට සේවය කරන්න තිබෙන මේ දුම්රිය සේවය හරියට සකස් කර ගන්න එකඟතාවක් ඇති කර ගන්න බැරි?

චීනයත් එක්ක, ඉන්දියාවත් එක්ක ඇයි එකඟතාවයක් ඇති කර ගන්නට බැරි? ඒ ඉඩ තමුන්නාන්සේට ලබා ගන්නට අප උදව් කරන්නට ලැහැස්තියි. පුද්ගලික ප්‍රවාහන සේවා ඇමතිතුමාත් මෙතැන ඉන්නවා. වෙන වැය ශීර්ෂයක් යටතේ ඒ අංශය ගන්න වෙන්නේ. එතුමා මහන්සිවෙලා බොහොම හොඳට උනන්දුවෙන් වැඩ කරනවා. මේ Cabinet එකේ ඉන්න තමුන්නාන්සේලාගේ මැති ඇමතිවරු කිහිප දෙනෙක් ඉතාම හොඳයි. අප ඒක කියන්නට ඕනෑ. හැබැයි, වැඩ කරන්නට දෙන්නේ නැහැ. ඒකත් කියන්නට ඕනෑ. මුළු ආණ්ඩුවම හසුරුවන්නේ, මේ අමාත්‍යාංශ ඔක්කොම හසුරුවන්නේ එක්කෙනෙක්. මම නම නොකිව්වාට තමුන්නාන්සේලා දන්නවා. එළියේදී අප එක්ක කියනවා. මම ඒක මෙතැන කියා භේද ඇති කරන්නට යන්නේ නැහැ. ඒ කෙනා තමුන්නාන්සේලාට වැඩ කරන්නට දෙන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, පුංචිනිලමේ ඇමතිතුමා මොකුත් කිව්වාට කමක් නැහැ. අනෙක් අය එහෙම කියනකොට අපට අමාරුයි. [බාධා කිරීම්] හැබැයි, ඔය දෙන්නාම මේ පැත්තේ හිටපු අය. [බාධා කිරීම්] ඔය දෙන්නාම මේ පැත්තේ හිටපු අය. තාවකාලිකව ඔය පැත්තට ගිහිල්ලා තමයි ඕක කියන්නේ. තාවකාලිකව ගිහිල්ලා. [බාධා කිරීම්] වැදගත් දෙයක් කථා කරනකොට තොප්පිය ගලවා කථා කරන්න. [බාධා කිරීම්] වැදගත් දෙයක්. [බාධා කිරීම්] තමුන්නාන්සේගේ තොප්පිය නම් මට දාන්න එපා. [බාධා කිරීම්] තමුන්නාන්සේ බැලුවා ජනාධිපතිතුමාටත් තොප්පිය දාන්න. දැන් ඒකෙනුත් සවුත්තු වෙලා ඉන්නේ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉඳ ගන්න, වැදගත් දෙයක් කථා කරනකොට. මගේත් තොප්පියක් තිබෙනවා. මම ඒක ගෙනාවේ නැහැ. ඉතින් ඇයි මේ කලබල වෙන්නේ? [බාධා කිරීම්] අපහාස නිකම් ගන්න යනවා නේ. [බාධා කිරීම්] මම තමුන්නාන්සේගේ තොප්පිය ගැන කිව්වේ නැහැ. මෙහෙ තොප්පි දාන කී දෙනෙක් ඉන්නවා ද? අපිත් තොප්පි දානවා. අපි කොළපාට තොප්පියක් දානවා. තමුන්නාන්සේ ඒක ගලවා ගිහින් දැන් රතු පාට තොප්පියක් දා ගෙන ඉන්නවා. වෙනස ඕකයි. එදා කොළපාට තොප්පිය අද තමුන්නාන්සේ රතු පාට කර තිබෙනවා. වෙනස ඕකයි. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පටන් ගත්ත පෞද්ගලික ප්‍රවාහන සේවය අලුත් ප්‍රතිපත්තියක්, දර්ශනයක්, වැඩ පිළිවෙළක් ඇතිව සකස් කරන්න අපට තිබෙනවා. ඒ සම්බන්ධව වැඩ කටයුතු බලන පුද්ගලික ප්‍රවාහන සේවා ඇමතිතුමා දැන් මෙතැන ඉන්නවා. පෞද්ගලික බස් රථ සම්බන්ධයෙන් මුදල් ප්‍රශ්නයක්, සේවක ප්‍රශ්නයක්, එහෙම නැත්නම් බරපතළ ප්‍රශ්නයක් තමුන්නාන්සේලාට - ආණ්ඩුවට- නැහැ. පෞද්ගලික බස් රථ විසි දාහක් විතර තිබෙනවා. ඒකෙන් කරන්නේ ජනතාව ප්‍රවාහනය කිරීම. ඒ සඳහා Treasury එකෙන් සල්ලි ඉල්ලන්නේත් නැහැ; වෙන කොහෙන් හෝ සල්ලි ඉල්ලන්නේත් නැහැ. පෞද්ගලික බස් රථ විසි දාහක් විතර තිබෙනවා. CTB එක සම්බන්ධව බැලුවොත් එයට විශාල වශයෙන් භාණ්ඩාගාරයෙන් මුදල් දෙනවා. ඒ සඳහා මුදල් දිය යුතුව තිබෙනවා. නැත්නම් ඒක ගෙන යන්නට බැහැ. ඒකත් සේවයක් හැටියට කෙරෙනවා. අප ඒකත් පිළිගන්නවා. කළ යුතු දෙයක්. නමුත් මේ දෙක සංසන්දනය කර බැලුවොත්, මඟී ප්‍රවාහනයේදී මේ කොටස් දෙක දිහා බැලුවොත්, රජයට බරපතළ ප්‍රශ්නයක් නැතිව බස් රථ විසි දාහක් විතර මේ රටේ ප්‍රවාහනය කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ඒ ප්‍රතිපත්තිය නිසායි කියන එක තමුන්නාන්සේ පිළිගන්නට ඕනෑ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මට කොච්චර විනාඩි ගණනක් තිබුණා ද?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
විනාඩි 14යි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මා විනාඩි 14ක් ගත්තා ද? බාධා කිරීම්වලදී ගරු අස්වර් මන්ත්‍රීතුමාත් ගත්තා නේ. මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න. එසේ නම් වැඩි දුර කථා කරන්නේ නැහැ.

මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ ප්‍රතිපත්තිමය වෙනසක් කරන්න කියායි. මම කියන්නේ නැහැ, CTB එක නැති කරන්නට කියා; පෞද්ගලික බස් වැඩි කරන්නට කියා, දුම්රිය දෙපාර්තමේන්තුව ඔහොමම තියා ගන්නට කියා. මම එහෙම කියන්නේ නැහැ. රාජ්‍ය අංශයත් අවශ්‍යයි; පෞද්ගලික අංශයත් අවශ්‍යයි. රජයේ දායකත්වය අඩුවෙන් දීලා මීට වඩා හොඳ, සේවකයන්ට වාසිදායක, ගමන් කරන මඟීන්ට වාසිදායක ප්‍රවාහන සේවයක් ආරම්භ කරන්නට අප ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස් තීන්දුවලට යා යුතුයි. එතකොට අපට සිද්ධ වෙයි, අපේ ප්‍රතිපත්ති සමහර ඒවා වෙනස් කරන්න. තමුන්නාන්සේලාට සිද්ධ වෙයි තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති වෙනස් කරන්න. මට වෙලාව නැති නිසා කෙටියෙන් කියන්නේ. තමුන්නාන්සේ කියා තිබෙනවා, 'රාජ්‍ය අංශය ශක්තිමත් කරන්න' කියා. නැහැ. එහෙම වන්න බැහැ.

රාජ්‍ය අංශයට වඩා අද ශක්තිමත්ව තිබෙන්නේ පෞද්ගලික අංශය යි. එහෙම නම් ඒක තවත් දියුණු කරනවාද, ඒක ශක්තිමත් කරනවාද, ඒකට තවත් රජයේ මුදල් දෙනවාද ආදිය සම්බන්ධයෙන් තමුන්නාන්සේ ප්‍රතිපත්තිමය තීරණ ගන්න ගරු ඇමතිතුමනි. මා තමුන්නාන්සේට සුභ පැතුවා වාගේම, හොඳ ඇමතිවරයකු හැටියට, ඇත්ත කියන ඇමතිවරයකු හැටියට යම්කිසි ප්‍රශ්නයක් ඇහුවොත්, 'මම හෙට ගිහිල්ලා බලලා ඇවිල්ලා උත්තර දෙන්නම්' කියන්නේ නැති ඇමතිවරයකු හැටියට කටයුතු කරන තමුන්නාන්සේට අපේ ගෞරවය පුද කරමින්, මේ රටේ මඟී ජනතාවට සහ මේ ආයතනවල වැඩ කරන සේවකයන්ට මනුස්සයන් විධියට ජීවත් වෙන්න පුළුවන් ශක්තිමත් ආර්ථිකයක් හදලා දෙන්න තමුන්නාන්සේට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ. ප. 11.53]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)
கௌரவ தவிசாளர் அவர்களே, போக்குவரத்து அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில், வட

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

மாகாணத்தினுடைய போக்குவரத்துச் சம்பந்தமான சில விடயங்களை இந்த அவையின் கவனத்துக்குக் கொண்டு வரலாம் என்று நினைக்கின்றேன். இன்று அங்கு புகையிரதப் போக்குவரத்துச் சேவை இல்லாத ஒரு சூழல் காணப்படு கின்றது. அதனை ஏற்படுத்துவதற்காகப் பல முன்னெடுப் புக்கள் அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்டு வருகின்ற இவ்வேளையில், அங்குள்ள மக்கள் முழுமையாக பஸ் போக்கு வரத்துச் சேவையையே நம்பி இருக்கின்றார்கள். எனவே, அங்குள்ள மக்களுக்கு பஸ் போக்குவரத்துச் சேவையை முழுமையாக வழங்கக்கூடியவகையில், அதனை மீளக்கட்டி யமைக்கவேண்டிய பொறுப்பு இன்றைய அரசுக்கு உண்டு. இலங்கைப் போக்குவரத்துச் சபையின் வட பிராந்திய சபையினுடைய நிருவாகத்தின்கீழ் ஐந்து 'டிப்போ'க்கள் இருக்கின்றன. யுத்தத்துக்குப் பின்னர், இவற்றை மீளமைப்பதற்கு அரசாங்கம் பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு வந்தாலும்கூட, அவற்றை முழுமைப்படுத்த வேண்டியதன் அவசியத்தை அங்கு மக்கள் வலியுறுத்தி நிற்கின்றார்கள். குறிப்பாக, இந்த 'டிப்போ'க்களுக்கு பஸ்களின் தேவை அதிகமாக இருக்கின்ற காரணத்தினால், புதிதாக இவற்றுக்குப் பல பஸ் வண்டிகளை வழங்க வேண்டியுள்ளது. அதில், கிளிநொச்சி 'டிப்போ'வுக்கு 18 பஸ்களும் முல்லைத்தீவு 'டிப்போ'வுக்கு 35 பஸ்களும் தேவையென இனங்காணப் பட்டுள்ளது. இந்த மாவட்டங்களிலுள்ள கிராமப் புறங்களுக்கு பஸ் போக்குவரத்துச் சேவை இல்லாத காரணத்தினால், அங்குள்ள மக்கள் நீண்டதூரப் பயணங்களைச் சைக்கிள் களிலும் கால்நடையாகவும் செல்லவேண்டிய ஒரு துர்ப்பாக்கிய சூழலிலே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். எனவே, இந்தக் குறையைத் தீர்க்கவேண்டிய பொறுப்பு இலங்கைப் போக்குவரத்துச் சபைக்குண்டு.

கௌரவ தவிசாளர் அவர்களே, இன்று வட பிராந்திய போக்குவரத்துச் சபையானது இலாபமீட்டும் நிலையில் இல்லை. ஏனெனில், நாட்டில் இடம்பெற்ற நீண்டகால யுத்தம் இச்சபையினை மிகமோசமாகப் பாதித்திருக்கின்றது. இதற்குச் சொந்தமான பஸ்கள் எல்லாம் யுத்தத் தேவைகளுக்காகத் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தினால் கடத்தப்பட்டு, அழிக்கப்பட்டிருக்கின்றன. இதன்காரணமாக அவர்கள் குறைந்த வளங்களைப் பயன்படுத்தி, மக்களுக்கு நிறைந்த சேவையை வழங்கவேண்டிய ஒரு சூழலில் இருக்கின்றார்கள். எனவே, அரசானது இச்சபைக்கு அதிகமாக மானியங்களையும் உதவிகளையும் வழங்குவதினூடாகவே இச்சபையை இலாப மீட்டும் நிறுவனமாக மாற்றமுடியும் என்ற கருத்தை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். அதுமட்டுமல்ல, அங்குள்ள ஏராளமான பஸ் வண்டிகள் பழுதடைந்து, இயங்க முடியாத நிலையில் கட்டையில் ஏற்றப்பட்டிருக்கின்றன. ஆகவே, அந்த bus களைப் பூரணமாகத் திருத்துவதற்கு உரிய ஏற்பாடுகள் செய்து கொடுக்கப்பட வேண்டும். அங்கு சாரதிகள், நடத்துனர்கள் மற்றும் engineering section இல் வேலைசெய்ப வர்களின் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். இதன்மூலமே அங்கு இலங்கைப் போக்குவரத்துச் சபையின் சேவையைத் திறம்படச் செய்ய முடியும்.

அடுத்ததாக, கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்ட 'டிப்போ'க்களுக்கெனக் கட்டடங்கள் நிறுவப்படவேண்டியதன் அவசியத்தையும் நான் இங்கு வலியுறுத்துகின்றேன். கிட்டத்தட்ட இருபத்தைந்து வருடங்களுக்கு முன்பு கிளிநொச்சி மாவட்டத்தில் நடத்தப்பட்ட பஸ் சேவைக்கான routeகள் இப்பொழுது அதிகரிக்கப்பட்டுள்ளன. அதன் காரணமாக அப்பிரதேசத்துக்கு அதிகளவிலான பஸ்களை வழங்க வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களிடம் வலியுறுத்த விரும்புகின்றேன். கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களிலே புதிதாகச் சாரதி அனுமதிப்பத்திரங்களைப் பெறுவதற்காகப் பலர் காத்திருக்கின்றார்கள். இன்றைய காலகட்டத்தில் யாழ். மாவட்டத்திலுள்ள சாரதி அனுமதிப்பத்திரம் வழங்கும் அலுவலகம்தான் கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களிலும் தனது நடமாடும் சேவையை நடத்துகிறது. எனவே, அப்பிரதேசங்களிலுள்ள மக்களுக்கு அந்தந்த மாவட்டங்களிலேயே சாரதி அனுமதிப்பத்திரத்தை வழங்குவதற்கான ஏற்பாடுகளை மாண்புமிகு அமைச்சர் அவர்கள் விரைந்துசெய்வார் என்ற நம்பிக்கையை நான் இங்கு வெளிப்படுத்துவதுடன், இதற்குரிய ஆளணி வெற்றிடங்களை நிரப்புவதற்கும் அவர்களுக்கான பயிற்சிகளை வழங்குவதற்கும் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனவும் இங்கு வலியுறுத்துகின்றேன்.

தனியார் bus போக்குவரத்து சம்பந்தமாக நான் இந்த அவையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். இன்று தூர இடங்களுக்கான தனியார் bus போக்குவரத்துச் சேவை உட்பட அம்மாவட்டங்களுக்குள் நடத்தப்படும் குறுகிய சேவையும் மிகவும் மோசமான நிலையிலேயே நடத்தப்படுகிறது. ஏனெ னில் இன்றைய சூழலைப் பயன்படுத்தி அங்குள்ள வழித் தடங்களில் போக்குவரத்து பஸ் சேவையை நடத்துவோரில் அநேகமான தனியார் உரிய அனுமதிப்பத்திரம் பெறாமலேயே பஸ் சேவையில் ஈடுபட்டுக்கொண்டிருக்கிறார்கள். இதனால் மக்கள் பலவிதமான அசௌகரியங்களையும் ஆபத்துக் களையும் எதிர்கொள்ளுகின்றார்கள். குறிப்பாக யாழ்ப்பாணத் துக்கும் கொழும்புக்கும் இடையில் அல்லது யாழ்ப்பாணத் துக்கும் ஏனைய மாவட்டங்களுக்கும் இடையில் நீண்டதூர சேவையில் ஈடுபடும் தனியார் பஸ்களின் உரிமையாளர்களில் அநேகமானவர்கள் உரிய அனுமதிப்பத்திரம் பெறாமலேயே அங்குள்ள போக்குவரத்துப் பொலிஸார் சிலரது ஒத்துழைப் புடன் சட்டவிதிகளுக்கு முரணாகச் செயற்பட்டுக் கொண்டிருக்கிறார்கள். இதன் காரணமாகத் தினமும் ஏ-9 பாதையில் அவர்கள் வாகனங்களை அதிவேகமாகச் செலுத்தி விபத்துக்களையும் உயிரிழப்புக்களையும் ஏற்படுத்தும் நிலைமைகளை நாம் பத்திரிகைகள் வாயிலாக அறிகிறோம். எனவே, கௌரவ அமைச்சர் அவர்கள் நீண்டதூர பஸ் போக்கு வரத்து உட்பட உள்ளூர் தனியார் பஸ் போக்குவரத்துக்கும் முறையான அனுமதிப்பத்திரங்களை வழங்கும் நடவடிக்கை யைத் துரிதப்படுத்த வேண்டும். இதனூடாக இந்தப் பிரச்சினைகளைக் கட்டுப்படுத்தக்கூடியதாக இருப்பதோடு, முறையான அனுமதிப்பத்திரம் பெறாமல் சேவையில் ஈடுபடும் பஸ் உரிமையாளர்கள்மீது கடுமையான நடவடிக்கை எடுப்பதற்கும் இலகுவாக இருக்கும். இது தொடர்பில் போக்குவரத்துப் பொலிசாருக்கு உரிய அறிவுறுத்தல்களை வழங்கி, அதனை நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதையும் நான் இச்சபையிலே வலியுறுத்த விரும்புகின்றேன்.

வட மாகாணத்துக்கான புகையிரத சேவையைத் துரிதப் படுத்த வேண்டியதன் அவசியத்தையும் நான் இங்கு கூறவேண்டும். வவுனியாவிலிருந்து ஓமந்தை வரையும் பூர்த்தியாக்கப்பட்டுள்ள வட பகுதிக்கான புகையிரதப் பாதையை, அங்கிருந்து பளை வரைக்குமான கிட்டத்தட்ட 96 கிலோமீற்றர் தூரமும் பளையிலிருந்து காங்கேசன்துறை வரைக்குமான 56 கிலோமீற்றர் தூரமும் நிர்மாணிக்க வேண்டியுள்ளது. இது மிகவும் பாரிய வேலைத்திட்டமாக இருந்துள்ளபோதிலும் அதனை மிகவும் துரிதகதியில் செயற்படுத்துவதற்குப் போக்குவரத்து அமைச்சு உரிய நடவடிக்கை எடுக்க வேண்டும் என்பதையும் நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். யாழ்ப்பாணத்துக்கான

புகையிரத சேவை நடத்தப்படும் பட்சத்தில் அங்குள்ள மக்களின் தென்பகுதிக்கான போக்குவரத்துப் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வு கிட்டுவதுடன், அவர்கள் உச்சப் பயனையும் அடைவார்கள். ஏனெனில், இன்று மிகவும் அசௌகரியங்களுக்கு மத்தியிலேயே தனியார் மற்றும் இலங்கைப் போக்குவரத்துச் சபை பஸ்களில் அவர்கள் நீண்டதூரப் பயணங்களைச் செய்யவேண்டிய கட்டாயத்தில் இருக்கிறார்கள். அந்த வகையில், இந்த பஸ் சேவைகளை மேலும் விஸ்தரிப்பதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டியதும் மிக அவசியமாக இருக்கிறது. குறிப்பாக, பின்தங்கிய வன்னிப்பகுதிப் பிரதேசங்களில் உள்ள பாடசாலை மாணவர்கள், அரச ஊழியர்கள், பொது மக்கள் இந்த தனியார் மற்றும் இலங்கைப் போக்குவரத்துச் சபையின் சேவைகளையே முழுமையாக நம்பியிருப்பதால், செயலிழந்து போயிருக்கின்ற அந்தச் சேவைகளை மீண்டும் புத்துயிரூட்டுவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கையெடுக்க வேண்டும். அங்கு மேலதிக பஸ் வண்டிகளின் தேவை மிக மிக அவசியமாக இருக்கிறது. மிகவும் பழைய, பழுதடைந்த நிலையிலிருக்கும் பஸ்களைத்தான் சேவையில் ஈடுபடுத்தவேண்டியிருக்கின்றது. இதனால் அந்த பஸ்கள் அடிக்கடி பழுதடைந்து மக்களுக்கு அசௌகரியத்தை ஏற்படுத்தும் நிலைமைகளை அன்றாடம் நாங்கள் அவதானிக்கிறோம். எனவே, புதிய பஸ்களைக் கொள்வனவு செய்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் அங்குள்ள போக்குவரத்துச் சபையினருக்கு ஒத்துழைப்பு வழங்க வேண்டும். ஏனெனில், கொடுக்கப்படும் advance பணத்தின்மூலம் lease க்கு புதிய பஸ் வண்டிகளைக் கொள்வனவு செய்யும் நிலையில் அந்த 'டிப்போ'க்கள் இல்லை. ஆகவே, மானிய அடிப்படையில் அவர்களுக்கு பஸ்களைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அந்த 'டிப்போ'க்களின் தேவைகளை நீங்கள் பூர்த்தி செய்து கொடுத்தால், எதிர்காலத்தில் இலாபமீட்டும் சபைகளாக அவைகளை மாற்ற முடியும் என்ற நம்பிக்கையை நான் இங்கு வெளிப்படுத்துகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, புதிதாக அரசு கொள்வனவு செய்யவிருக்கும் சிறிய வகை பஸ்களில் ஒரு தொகுதியை வட மாகாண போக்குவரத்துச் சபை 'டிப்போ'க்களுக்கு வழங்கி, அதன்மூலம் மீள்குடியேற்றம் செய்யப்பட்டுள்ள பகுதிகளுக்கான போக்குவரத்துச் சேவைகளை வழங்குவதற்குரிய நடவடிக்கையை நீங்கள் எடுக்கவேண்டும். இறுதியாக, போக்குவரத்து மற்றும் தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சுக்களுக்குரிய கௌரவ அமைச்சர்கள் எமது வட மாகாண போக்குவரத்துச் சேவையில் சிறந்த செயற்பாடுகளை எதிர்காலத்தில் முன்னெடுப்பார்களென்ற நம்பிக்கையை இங்கு வெளிப்படுத்தி, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

[අ.භා. 12.04]

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

Hon. Chairman, අද පැවැත්වෙන, Transport Ministry එකේ Debate එකේදී කථා කරන්න මම බොහොම කැමැතියි. Ministersලා දෙදෙනාම දැන් මෙතැන ඉන්නවා. අද Transport Minister එනකොට පරක්කු වුණා. Eleven o'clock තමයි Minister ආවේ. අද Ministerට traffic ද; නැත්නම් engine upset ද දන්නේ නැහැ. මම දැක්කා, Minister Land Cruiser එකේ තමයි ආවේ. මොකක්ද ප්‍රශ්නය?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මගේ පවුලගේ engine එක up set වෙලා.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

Thirty yearsවලින් පස්සෙයි Northවල transport එකේ development start කළේ. ඒ හින්දා හරියට ඒ ගැන හොයලා බලන්න ඕනෑ. මොකද, vehicles - buses - නැහැ, staff නැහැ. පරණ බස් තමයි දුවන්නේ. අවුරුදු 15කට ඉස්සර වෙලා දුවපු බස් තමයි තවම දුවන්නේ. බලන්න ඕනෑ, school ළමයි, teachersලා ඒ වාගේම Government staff -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

මෙතුමිය කොළඹ ඉන්නේ ගරු ඇමතිතුමා.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

නැහැ, නැහැ. Government staff එකේ, private staff එකේ අය යනවා. [බාධා කිරීම්] ඒ අය යන කොට පරක්කු වෙනවා. ඇත්තටම ඒ බස්වලට නඟින්න අමාරුයි. [බාධා කිරීම්] හරි, හරි. [බාධා කිරීම්] පොඩ්ඩක් අහ ගන්න කෝ. මම කථා කළාට පස්සේ කථා කරමු. අහ ගන්න කෝ. මට පොඩි වෙලාවක් තමයි තිබෙන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඔබතුමිය කථා කරන කොට මට හරි ආසයි.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

ඒක තමයි මම සිංහලෙන් කථා කරන්නේ. නැත්නම් Tamilවලින් කථා කරනවා නේ. ඔබතුමා අහ ගන්න. මේ ඇත්තම කථාව. අවුරුදු 15කට ඉස්සර වෙලා දුවපු බස් තමයි තවම දුවන්නේ. Buses 100ක් විතර ඕනෑ. දැනට 55ක් තිබෙනවා. මේ බස් හැම එකකම engine trouble. අනෙක් එක, ඒවායේ parts හරියට නැහැ. සමහරු බස් තියෙද්දීත් පයින් යනවා. මම ඇහුවා, "ඇයි පයින් යන්නේ, බස් යද්දීත්?" කියලා. බස් එකේ නඟින්න බැහැ, බස් එක sure නැහැ, බස් එකෙන් school එකට යන්න බැහැ, වැඩට යන්න බැහැ, ගිහිල්ලා එන්න පුළුවන්ද කියලා හරියට දන්නේ නැහැ කියලා අපේ කට්ටිය කියනවා. හම්බන්තොට නම් buses ගොඩක් දුවවනවා. [බාධා කිරීම්] ඒ වාගේ same service ගෙන යන්න ඕනෑ Jaffna area එකේත්. හම්බන්තොට no displaced persons. Displaced personsලා ඉන්නේ Jaffna, Mullaitivu and Kilinochchiවල.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඔය ඉරිසියාව. ඔය ඉරිසියාවට කියන්නේ. [බාධා කිරීම්]

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

නැහැ, අවුලක් නැහැ. හම්බන්තොට වාගේම මගේ දිස්ත්‍රික්කයත් develop කරන්න තමයි මම බලන්නේ; මම බලාපොරොත්තුව ඉන්නේ. හම්බන්තොටටත් support එක දෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම permit කීයක් දුන්නාද බස් දුවන්න? ඒකත් කියන්න. ඔබතුමියගේයි මගේයි friendship එකට, මම bus permit කීයක් ඔබතුමියට දුන්නාද?

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
පනස් -[බාධා කිරීම්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ආ, ඒක නේ කියන්නේ. ඒකත් කියන්න කෝ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
අනේ, එතුමියට කථා කරන්න දෙන්න කෝ ඇමතිතුමා.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
Immediately, 120 buses release කරන්න ඕනෑ Jaffna area එකට. [බාධා කිරීම්] ඒකට කමක් නැහැ. ඒක ප්‍රශ්නයක් නැහැ. ඔක්කෝම කට්ටිය business නේ කරන්නේ. බැසිල් ඇමතිතුමා business කරනවා. ඒක බලන්න කෝ. ඒ අය මට උදව් කරනවා. [බාධා කිරීමක්] ඒක ප්‍රශ්නයක් නැහැ. Private buses ගොඩක් දුවනවා, route permits නැහැ. ඔබතුමන්ලා ඉස්සෙල්ලාම route permits release කරන්න ඕනෑ. ඊට පස්සේ තමයි ඒ අයට බස් දුවවන්න කියන්න ඕනෑ. Route permits දුන්නේ නැහැ. ඒ බස් ඔක්කොම පාරේ තිබෙනවා. ඒ ගොල්ලන් ඒ බස් අරගෙන තිබෙන්නේ own capitalවලින් නොවෙයි. බැංකුවෙන් loan අරගෙන තමයි බස් ගන්නේ. Route permits දුන්නේ නැති නිසා බස් දුවවන්නේ නැතුව නවත්වලා තිබෙනවා. බැංකු ණය ගත්ත අයට ඒ ණය monthly settle කරන්න බැහැ. තවම private bus ownersලා ඉන්නවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් ප්‍රයිවට් බස් නෝනා කෙනෙක්. මාත් ප්‍රයිවට් බස් මහත්මයෙක්. අපි දෙන්නා ඇත්ත කථා කරන්න ඕනෑ. මතුගමින් යාපනයට දුවවන බස් එක දවසකට රුපියල් 65,000ක් හොයනවා. ඔබතුමියගේ බස් එකෙන් හොයන ගණන කියන්න කෝ.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
මට බස් නැහැ නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම කියන්නේ මගේ බස්වලින් හොයන ගණන.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
මට තිබෙන්නේ නැව්. මට buses නැහැ. නැව් තමයි අපි දුවවන්නේ. අපට තිබෙන බස් free දුවවන්නේ. [බාධා කිරීමක්] හරි, හරි. ඔබතුමන්ලා කවදාද route permits release කරන්නේ? පාසල් ළමයාට, teachersලාට, වැඩ කරන අයට යන්න routesවල buses හරියට නැහැ කිව්වා. ඒවායේ වැඩ කරන්න driversලා, අනෙක් staff එක නැහැ, කොන්දොස්තරලා නැහැ, engineersලා නැහැ, වැඩ කරන්න mechanicsලා නැහැ. අනිත් එක තමයි ඩිපෝ එකේ facilities මොකුත්ම නැහැ කියන එක. මම ගිහිල්ලා බැලුවා. Jaffna ඩිපෝවටත් ගියා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමිය යාපනයට ගියාද?

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
අයියෝ! මම Jaffna තමයි ඉන්නේ. යන්නත් ඕනෑ නැහැ, ඉන්නත් ඕනෑ නැහැ, කියන්නත් ඕනෑ නැහැ. අපට over the phone ඔක්කෝම කරන්න පුළුවන්. අපි Jaffna තමයි ඉන්නේ. මගේ දිස්ත්‍රික්කය Jaffna. [බාධා කිරීමක්] බැසිල් ඇමතිතුමා මෙහේ හිටියාට එහේ වැඩ ඔක්කෝම කරනවා නේ. එතුමා Jaffna යනවා; Trincomalee යනවා; Batticaloa යනවා. [බාධා කිරීමක්] ඒවා නිකම් වහලා තියන්න බැහැ නේ. ගෙවල් තිබුණාට ඒවා නිකම් වහලා තියන්න බැහැ නේ, එතකොට ඒවා loss වෙනවා නේ. Buses නැති නිසා depots ඔක්කෝටම loss වෙනවා නේ.

අපිට මහේස්වරන්ව already lost. ඒ වාගේ දිගටම loss කරන්න බැහැ නේ. ඒක නිසා rent out කළා. ඒක වැරැද්ද? ඇත්ත නේද? [බාධා කිරීමක්]

අනික් එක තමයි ගරු ඇමතිතුමනි, route permits release කරලා දෙන්න කියන එක. ඔබතුමාට ඒ ගැන හැමදාම කියනවා. ඇමතිතුමාට කොච්චර letters එවලා තිබෙනවාද, phone එකෙන් කථා කරලා තිබෙනවා. දැන් තිබෙන busesවලට route permits release කරන්න ඕනෑ. Route permit එක දුන්නාට පස්සේ බස් එක ගෙනියන්න කියන්න ඕනෑ. පවු නේ, Sir. පාරේ යන කොට පොලීසියෙන් නවත්වනවා. ඒ ගොල්ලෝ Rs. 1,000, Rs. 2000 සල්ලි pay කරලා තමයි බස් දුවවන්නේ. ප්‍රශ්න ගොඩාක් තිබෙනවා ගරු ඇමතිතුමනි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහෙම දුවවන්න බැහැ. නීතියක් තිබෙනවා නේ.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
බස් දුවවනවා නේ. හරි, ඒ විධියට දුවවන්න බැහැ. ඒ විධියට සල්ලි දීලා දුවවනවා නේ. අනිත් එක තමයි වැල්ලවත්තේ bus halt එක තිබෙනවා කියන එක. ඒ තැන්වල අපේ Tamil කට්ටිය ගොඩාක් ඉන්නවා. සෙනඟ ගොඩාක් වැඩියි. නමුත් ඒ ගොල්ලන්ට bus stand එකක් නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමිය, තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
වැල්ලවත්තේ ඉඳලා Jaffna යන අයට permanent bus stand එකක් ඉක්මනට හදලා දෙන්න ඕනෑ. Three-wheeler එකේ

රත්මලානට යන්න රුපියල් 500ක් ඕනෑ. එහෙම නැත්නම් පිටකොටුවට යන්න රුපියල් 500ක් ඕනෑ. Non air-conditioned bus එකක වැල්ලවත්තේ ඉඳලා Jaffna යන්න Rs. 500ක් ගන්නවා. ඒක ඉක්මනට කරලා දෙන්න ඕනෑ. Route permits release කරන්න ඕනෑ. [බාධා කිරීමක්] මට route permits ඕනෑ නැහැ. මම බස් දුවවන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමිය. දැන් කථා කරන්නේ ගරු සී.බී. රත්නායක ඇමතිතුමා.

[අ. භා. 12.11]

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)
ගරු සභාපතිතුමනි, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම පිළිබඳව මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය යටතේ පෞද්ගලික ප්‍රවාහන සේවය ආරම්භ කළාය කියා ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා විශේෂයෙන් කථා කළා. එතැනට එන්න ඉස්සෙල්ලා අපි කථා කරමු, අපි හිතමු 1956 දී බස් ජනසතු කළේ ඇයි කියලා. එදා පෞද්ගලික බස් සේවාවක් තිබුණා. ඒ වෙලාවේ ඇඟේ හයිය තිබුණු අය තමයි හිටියේ. රියැදුරන්, කොන්දොස්තරවරු එතැන හිටියා. ඒ අය එක එක නම්වලින් හැඳින්වූවා. මම කියන්නේ නැහැ "ජෝන්" කියලා. නමුත් එක, එක නම්වලින්-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
බස් ජනසතු කෙරුවේ සිංහල ව්‍යාපාරිකයන්ට-

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
එහෙම හිතන්න පුළුවන්. නමුත් එදා හරියට නිසි ආකාරයේ ප්‍රවාහන සේවයක් දුන්නේ නැහැ. එදා හිටියා චන්ඩි ජෝන්ලා. ඒ ගොල්ලන් තමයි ගියර් පොල්ල අතට අරගෙන අනෙක් අයට ගැහුවේ. අනෙක් අයට බස් දුවවන්න දුන්නේ නැහැ. මෙන්න මේ කාරණා නිසා තමයි බස් ජනසතු කරන්න අවශ්‍ය පසු බිම නිර්මාණය වුණේ. ඊට පස්සේ ලංගමය හැටියට බස් ව්‍යාපාරය ආරම්භ කරලා ඒකට අවශ්‍ය සියලුම දේ ලබා දුන්නා. රියැදුරන් පුරුදු පුහුණු කරන්න කටයුතු යොදලා, engine repair කිරීම පුහුණු වෙන්න කාර්මික විද්‍යාල ඇති කරලා දුන්නා. අවශ්‍යතාව අනුව හැම ආසනයකටම ඩිපෝවක් ලබා දුන්නා. නමුත් ලංගම රාජ්‍ය ආයතනයක් නිසා එක් එක් කාලවලදී හැම ඩිපෝවකටම අතිරික්ත සේවක ප්‍රමාණයක් බඳවා ගැනීමට කටයුතු කළා. සමහර වෙලාවට අපිත් ඒකට වගකියන්න ඕනෑ. ක්‍රමක්‍රමයෙන් මේ විධියට ඇවිල්ලා 1977න් පස්සේ, නිසි ඇගයීමකට ලක් කරන්නේ නැතුව, අනවශ්‍ය ආකාරයට ලංගමයට අමතරව පෞද්ගලික ප්‍රවාහන සේවාවක් ඇති කළා. ඒ නිසා නැවතත් විනයක් නැති, ක්‍රමයක් නැති, ඇඟේ හයිය තිබෙන අයට අවස්ථාව සැලසුණා. මේ ක්‍රමය වෙනස් කරලා ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා කටයුතු කරන්න අද අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාල පරිච්ඡේදය තුළ කටයුතු කරන්න සූදානම් වෙලා තිබෙනවා. ඒ නිසා අහෝසි කරන්න, ඇවර කරන්න තිබුණු ලංගමය අද පෞද්ගලික සේවාව ලබන ආදායම වාගේම, රාජ්‍ය සේවාව තුළ වැඩිම ආදායමක් ලබන සේවා බවට පත් වෙලා තිබෙනවා. අද ලංගමයෙන් සේවාවක් ලබා දෙන කොට, පෞද්ගලික ප්‍රවාහන සේවාවත් ඒ සඳහා එකතු කරගෙන යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ කාරණයේදී අපි බලන්න ඕනෑ, ගුණාත්මක ප්‍රවාහන සේවයක් කොයි ආකාරයටද ලබා දෙන්න පුළුවන් වෙන්නේ කියන එක.

මම එකඟ වෙනවා, අපේ නියෝජ්‍ය සභාපතිතුමාත්, මහේස්වරන් මන්ත්‍රීතුමියත් කිව්ව කාරණයට. යාපනය-කොළඹ පෞද්ගලික බස් ප්‍රවාහනයේදී බලපත්‍ර ලබා නොගෙන, අනවශ්‍ය විධියට බස් ධාවනය කරන උදවිය ඉන්නවා. ඒවා වැටලීමක් කරන්න අපි පසු ගිය සතියේ සූදානම් වුණා. නමුත් ඒකට විවිධ ආකාරයෙන් බලපෑම් කරලා නැවත ධාවනය කරන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා අපි නැවතත් ඒ වැටලීම් ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබෙනවා. අපි පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, ලබන වර්ෂය වෙන කොට ඒ ප්‍රවාහන කටයුතු කරන්න පුළුවන් වන්නේ බලපත්‍රලාභීන්ට පමණයි කියලා. ඇඟේ හයියට, එහෙම නැත්නම් අනවශ්‍ය ආකාරයෙන් ප්‍රවාහන කටයුතු කරන්න සූදානම් වෙනවා නම් අපි එයට ඉඩ තියන්නේ නැහැ කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ගුණාත්මක ප්‍රවාහන පද්ධතියක් ලබා දීම සඳහා ලංගමය ගෙන යන වැඩ පිළිවෙළ වෙනුවෙන් කුමාර වෙල්ගම මැතිතුමාට මගේ ගෞරවණීය ස්තුතිය විශේෂයෙන් පුද කරන්න ඕනෑ. එහිදී පාසල් ප්‍රවාහන සේවාව වාගේම රාත්‍රී ප්‍රවාහන සේවාව, ලාභයට වඩා සේවාවක් හැටියටයි ක්‍රියාත්මක කරගෙන යන්නේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, සේවකයන්ගේ විනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළොත් හොඳයි කියලා. මම එසේ ප්‍රකාශ කරන්නේ පසු ගිය දවසක නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ඩිපෝවේ ඇති වුණු තත්ත්වයක් නිසායි. පෞද්ගලික ප්‍රවාහන සේවයේ අයත්, ලංගමයේ අයත් අතර ගැටුමක් ඇති වෙච්ච වෙලාවේ ලංගමයේ අය බස් එකකින් ගිහිල්ලා පෞද්ගලික ප්‍රවාහන සේවයේ යෙදෙන අයෙකුගේ නිවසට ගහන්න ආවා. ඒ ගැන විනය පරීක්ෂණයක් පැවැත්විය යුතුයි කියන එක මම විශේෂයෙන් සඳහන් කරනවා. ඒක කරලා තිබුණේ නැහැ; කෙරුණේ නැහැ. එහෙම වුණාම ඔවුන්ට තව තවත් උඩ ගෙඩි දීමක් තමයි සිද්ධ වෙන්නේ. ඒ පිළිබඳව ලංගමයේ සභාපතිතුමාට මම දුරකථනයෙන් කථා කරලා කිව්වත් තවමත් ක්‍රියාත්මක නොවීම කනගාටුවට කරුණක් හැටියට විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපි විනයානුකූලව කටයුතු කරන්න අවශ්‍ය පසුබිම සකස් කරන්න ඕනෑ; නීතිය හරියට ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම සකස් කරන්න ඕනෑය කියන එකයි මම විශේෂයෙන් සඳහන් කරන්නේ. එහෙම නැති වුණොත් අපට ගුණාත්මක සේවාවක් ලබා දෙන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ.

පෞද්ගලික ප්‍රවාහන සේවාව දිහා බලපුවාම අපේ නියෝජ්‍ය කාරක සභාපතිතුමා කිව්ව විධියට ඒ වැඩ පිළිවෙළ නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න සූදානම් වෙනවා කියන එකත් මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අද මාධ්‍යයට ලොකු ආරංචියක් දෙනවා බස් ගාස්තුව වැඩි කරන්න ඕනෑ, එහෙම නැත්නම් වර්ජනයකට යනවා කියලා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස් වර්ජනයකට යන්න සූදානම් වෙනවා කියලා ප්‍රකාශ කරනවා නම්, පාසල් දරුවන්ගේ සාමාන්‍ය පෙළ විභාගය ඇපයට තියලා ඒ වර්ජනය කරන්න සූදානම් වෙනවා නම්, ඒකට ඉඩ දෙන්න අපි කිසි සේත්ම සූදානම් නැහැ. ගරු කුමාර වෙල්ගම ඇමතිතුමාත්, මාත් ඉතාම වුවමනාවෙන් සහ වගකීමෙන් යුක්තව ඊට මුහුණ දෙන්න, රටේ ජනතාව වෙනුවෙන් මගී ප්‍රවාහනය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා.

මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා අප ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් මොනවාද කියලා. ජාතික ගමනාගමන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න, ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අදාළ අණපනත් සංශෝධනය කරන්න ඕනෑ. ප්‍රවාහන කටයුතුවලදී කරන වැරදිවලට අධිකරණයෙන් දෙන දඬුවම් ඉතාම ලිහිල් නිසා ඉදිරියේදී පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරමින් ඒ නීතිරීති සංශෝධනය කරලා ඒ දඬුවම් වැඩි කරන්නට අපි සූදානම් වෙනවා. පෞද්ගලික ප්‍රවාහනය සම්බන්ධයෙන් වරදකට හසු වුණාම අධිකරණයෙන් රුපියල් 5000ක විතර දඩයක් තමයි නියම කරන්නේ. ඒ අය ඒ රුපියල් 5000 ගෙවලා ඇවිල්ලා ආපහු වතාවක් ඒ වැරැද්දම කරනවා. එහෙම කළාම අපට අවශ්‍ය විධියට කටයුතු කර ගන්න බැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, එවැනි වැරදි කරන අය සම්බන්ධයෙන් ඒ අන්දමින් ක්‍රියාත්මක වෙනවා වාගේම, ඉදිරි වර්ෂයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළින් බලපත්‍ර ලබා දීමේදී ඔවුන් කළ වැරදි පිළිබඳව පසු විපරමක් කරමින් විශේෂ විමර්ශනයක් කරන්න අපි සූදානම් වෙමු කියලා. එසේ නොකළොත් මේ කටයුතු නිසි ඇගැයීමකට ලක් කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

අපි මේ කටයුතු නව තාක්ෂණයට බද්ධ කළ යුතු වෙනවා. ඇයි අපි මේ කටයුතු නව තාක්ෂණයට බද්ධ කරන්න සූදානම් වෙන්නේ? අද ලෝකය නව තාක්ෂණයත් එක්ක බද්ධ වෙලා දියුණු වෙලා තිබෙනවා. තමුන්ගේ බස් බස් රථය ගමන් කරන්නේ කොතැනද කියලා බස් හිමියාට සොයා ගන්න පුළුවන් අන්දමට GPS තාක්ෂණය මේ කටයුතුවලට සම්බන්ධ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මුදල් පරිහරණය කරන්නේ නැතුව, ගමන් ගාස්තු සඳහා කාඩ් ක්‍රමයක් තුළින් ගෙවීම් කිරීමේ පහසුකම් සැලසීමටත් අපි සූදානම් වෙනවා.

අද රටේ අධිවේගී මාර්ග ඉදි වෙලා, නව මංමාවත් ඉදි වෙලා, කොන්ක්‍රීට් පාරවල් ඇති වෙලා මාර්ග පද්ධතිය සකස් වෙලා තිබෙනවා. ඒ නිසා ඊට අවශ්‍ය ප්‍රවාහන පද්ධතියත් සකස් කර දීම සඳහා අපි ක්‍රියා කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මම හිතනවා පාසල් ප්‍රවාහන පද්ධතියත් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම සකස් කළ යුතුයි කියලා. ඒ සඳහා ලංගමයෙන් ලබා දෙන සහයෝගය, ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ සඳහා පෞද්ගලික ප්‍රවාහන අමාත්‍යාංශය හැටියට අපිත් දායක වෙන්න සූදානම් කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මම විශේෂයෙන් සඳහන් කරනවා ලංගමය ආරක්ෂා කර ගෙන අපි ඉදිරියට යන්න ඕනෑය කියන එක. ලංගමය ශක්තිමත් කරන්න ප්‍රායෝගිකව ක්‍රියා කරන ඇමතිවරයෙක් ඉන්නවා. එතුමාට ශක්තිය දෙන්න අපිත් සූදානම්. ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමා, සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සුබ පතමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 12.21]

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මම හිතන හැටියට අද හොඳ අදහස් පළ වුණා. මම ඒක කියන්න ඕනෑ. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කතා කළ කථික මහත්වරුන්ගෙන් හොඳ අදහස් පළ වුණා. ඒ වාගේම ද්වේෂ සහගත අදහසුත් පළ වුණා. ලංගමය විනාශ කෙරුවේ අපි නොවෙයි. ලංගමයේ බස් ගිනි තිබ්බේ අපි නොවෙයි. 1980 ගණන්වල ඉඳන් ඒ බස් රථ විශාල සංඛ්‍යාවක් ගිනි තිබ්බේ ජනතා විමුක්ති පෙරමුණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම 1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පත් වුණාට පස්සේ ලංගමය නැඟිටුවන්න වැඩ පිළිවෙළක් යෙදුවේ නැහැ. ඒක මම කියන්න ඕනෑ. රවි වෙත්තසිංහ මහත්මයාට ලංගමයේ හුඟක් කොටස් විකුණුවා. වෛරහැර පවා විකුණුවා. එහෙම විකුණන්න තමයි ඒ අය ක්‍රියා කළේ. ලංගමය ජනසතු කළේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා. 1959 දී එතුමා ලංගමය ජනසතු කරලා හොඳට දිව්වෙව්වා. මේ වෙලාවේ මම කියන්න ඕනෑ, අනිල් මුණසිංහ මහත්මයාගේ කාලයේ ලංගමය හොඳට දිව්ව බව. හැබැයි, ඒ කාලයේ පෞද්ගලික බස් රථ තිබුණේ නැහැ. ලංගමය පමණයි දිව්වේ. නමුත් දැන් අපට පෞද්ගලික බස් රථ සහ ලංගමයයි කියන මේ දෙකම සාපේක්ෂව එකට දුවවන්න වෙනවා. ඒ නිසා අපි දැන් සියයට 60යි, සියයට 40යි කියලා අලුත් ක්‍රමයක් හදලා තිබෙනවා. ගරු සී.බී. රත්නායක ඇමතිතුමාත්, පළාත් සභාවල ප්‍රවාහන ඇමතිතුමන්ලාත් කථා කරලා සියයට 60ක් පෞද්ගලික බස් රථ ධාවනය කරන කොට සියයට 40ක් ලංගම බස් රථ ධාවනය කරන්න අපි දැන් එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. මේක ක්‍රියාත්මක කළොත් මේ රටේ තිබෙන ප්‍රවාහන ප්‍රශ්නය හුඟාක් දුරට අවසන් වෙයි කියන එකයි මගේ හැඟීම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා දුම්රිය සේවය ගැන කිව්වා. එතුමා කථා කළේ ද්වේෂ සහගතවයි. මෙතැන හිටපු හැම ඇමතිවරයෙක්ම, හැම මන්ත්‍රීවරයෙක්ම කථා කළේ සුහදවයි. ඒ වාගේම රටේ ඇත්ත තත්ත්වය ගැනයි. නමුත් අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කළේ ද්වේෂසහගතවයි. මොකද, එතුමා කියනවා, දුම්රිය පෙට්ටියක් අපි පෞද්ගලික අංශයට මුදල් එක්ක දීලාලු. මේක අමූලික අසත්‍යයක්. මොකද, මේ අයින් කරලා දාපු දුම්රිය වැසියක් -පරණ පෙට්ටියක් එක්ක දුවන්නේ නැතිව අයින් කරලා දාපු වැසියක්- තමයි අපි ඒ අංශයට දුන්නේ. ඒ ගොල්ලන් රුපියල් ලක්ෂ 100ක් විතර වියදම් කරලා ඒ මැදිරිය ලස්සනට හදලා ඒකට නමකුත් දමලා -"රජදහන" ආදී වශයෙන් එක එක නම් දමලා- අපේ කෝච්චිය මැද්දේ දමලා ඒක දැන් පෞද්ගලික අංශය දුවවනවා. ඒකෙන් ටිකට් එකේ වටිනාකම අපට ලැබෙනවා. ඒ කියන්නේ ටිකට් එකේ -1පන්තියේ-වටිනාකම අපට ලැබෙනවා. ඉතිරි රුපියල් 750 -ඒ balance එක- ඒ ගොල්ලන් ගන්නවා. ඒකේ කිසි වැරැද්දක් නැහැ. මොකද, එතුමන්ලා තමයි මේකට සම්පූර්ණ මුදල් වියදම් කරලා තිබෙන්නේ. මම ඒක විශේෂයෙන්ම කියන්න ඕනෑ.

අනෙක් කරුණ තමයි උතුරු දුම්රිය මාර්ගය. දැන් උතුර ගැන කථා කළා. දැන් අපි උතුරු දුම්රිය මාර්ගය හදන්න පටන් අර ගෙන තිබෙනවා. ඕමන්තේ සිට පලෙයි දක්වා දැන් හදලා ඉවරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ඒක දන්නවා. ඕමන්තේ

සිට පලෙයි දක්වා අපි දැන් වැඩ පටන් අර ගෙන තිබෙනවා. පලෙයි සිට KKS දක්වාත් හදනවා. ඒ හදන්නේ stations එක්කයි. ඒ ගැන කාටවත් මොකුත් කියන්න බැහැ. Station එකක් නැතිව, කෝච්චිය ගිහිල්ලා නවත්වන්නේ කොහේද? ඒ නිසා station එකත් එක්ක තමයි අපි හදන්නේ. යාපනයේ දුම්රිය ස්ථානය හදන්න ලංකා බැංකුව භාර අර ගෙන තිබෙනවා. මම ඒ කාරණය විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. කෝච්චි පාර කැඩුවේ අපි නොවෙයි නේ.ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ඒක දන්නවා නේ. අපි නොවෙයි නේ,කෝච්චි පාර කැඩුවේ. [බාධා කිරීමක්]කෝච්චි පාර කැඩුව නිසා අර මහේස්වරන් නෝනා නම් ගොඩාක් සල්ලි හම්බ කර ගත්තා. මොකද, නැව් ටික දිව්වා. [බාධා කිරීමක්] නැව්, නැව් ගැන මතක් කර ගන්න. නැව් ටික දිව්වා. බස් ටික දිව්වා. මහේස්වරන් නෝනා, ඒවා ඔක්කොම කළා නේ. ඒ නිසා අපි නොවෙයි පාරවල් කැඩුවේ. අපි දැන් ඒවා හදනවා. අනුන් කඩපු ඒවා අපි දැන් හදනවා. ඒ නිසා දැන් ඒවායේ විශාල සංවර්ධනයක් කෙරෙනවා.

අනුර දිසානායක මන්ත්‍රීතුමා අහනවා, අපේ මිනිස්සු ඉන්නවා, ඒ අයට නොදී මේ කෝච්චි පාර හදන්න ඉන්දියාවට දෙන්නේ ඇයි කියලා. අපේ මිනිස්සු ඉන්න බව ඇත්ත. සුනාමියෙන් විනාශ වුණු රේල් පාර දවස් හතලිස් ගණනක් ඇතුළත හදපු එකත් ඇත්ත. ඒ සුනාමියෙන් විනාශ වුණු රේල් පාර හැදුවේ සම්පූර්ණ workforce එකම ගිහිල්ලායි. ඒක හැදුවාට මුළු ලංකාවේම තිබෙන කෝච්චි පාරවල් තවම හදලා නැහැ. කෝච්චි පාරවල අඩු පාඩු තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා පුත්තලමේ ඉඳන් එන කොට කෝච්චි පාරේ අඩු පාඩුකම් තිබෙන බව දකිනවා ඇති. නුවර ඉඳන් එනකොට කෝච්චි පාරේ අඩු පාඩුකම් තිබෙනවා. ඒ අඩු පාඩුකම් හදන්න අපට අපේ සේවකයෝ ඕනෑ. අපේ සේවකයන්ගෙන් තමයි ඒ කෝච්චි පාරවල් හදන්නේ. ඒ එක්කම තමයි අපි ඉන්දියාවේ Ircon International Limited කියන සමාගමට දුන්නා, රේල් පීලි හදන්න. මිනිස්සු නැත්නම් අපට අවශ්‍ය equipment නැත්නම් - අපට අවශ්‍ය equipment නැහැ.

අපි ඕමන්තේ සිට පලෙයි දක්වා කිලෝ මීටර් 9ක් දුර රේල් පාර හැදුවා. ඕමන්තේ සිට පලෙයි දක්වා කිලෝමීටර් 9ක් හදන්න අපට අවුරුදු දෙකක් ගියා. එහෙම නම් අපට කන්කසන්තුරේ දක්වා හදන්න අවුරුදු කීයක් යයිද? අවුරුදු දහයකටත් වැඩි කාලයක් යයි. එතකොට අපි මැරිලා. මිනිස්සු අපට දෙස් තියයි. නමුත් අපි දැන් කරන වැඩ පිළිවෙළ අනුව අවුරුදු දෙකෙන් ඒක ඉවර කරන්න අපි බලනවා. ඒ වාගේම තලෙයිමන්නාරම පැත්තේ බිම් බෝම්බ ඉවත් කරලා දැන් අපි ඒ ප්‍රදේශයේත් වැඩ කර ගෙන යනවා.පළමු වැනි phase එක යන්නේ මඩු පල්ලිය දක්වා. මඩුවල සිට තලෙයිමන්නාරම දක්වා යනවා. අපි pier එකත් හදා ගෙන යන්නේ. දැන් අපි ඒ වැඩ පටන් ගන්න ගිවිසුම් අත්සන් කරලා ඉවරයි. ඒ වාගේම දකුණු පළාත ගත්තොත් ඒ පළාත ගැන කථා කරපු ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඇත්ත කථා කළේ.

අපි දැන් ඒ site එක ශුද්ධ කරලා තිබෙනවා. අපි ඒ සඳහා EXIM Bank එකෙන් ලබා ගන්නා ණය අනුමත වෙලා තිබෙනවා. නමුත් තවම අත්සන් කරලා නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. ඒක නිසා තමයි පොඩ්ඩක් හිර වෙලා තිබෙන්නේ. ඒ වුණත් අපි දැන් ඒ line එක හදන්න සම්පූර්ණ අඩිතාලම දමලා ඉවරයි. ණය අනුමත වුණු ගමන් අපි මේ රේල් පීල්ල හදනවා, බෙලිඅත්ත දක්වා. කතරගම දක්වා යන දුම්රිය මාර්ගයේ ඒ අපේ පළමුවැනි phase එක.

දුම්රිය දෙපාර්තමේන්තුවේ සුළු සුළු අඩු පාඩුකම් තිබෙනවා, නැත්තේ නැහැ. මා පිළිගන්නවා. දුම්රිය වෙලාවටම එන්නේ නැහැ. අද මට complaint එකක් ආවා, උදේ 8.05ට නුවරින් කොළඹට එන්න ඕනෑ දුම්රිය අද ඇවිල්ලා තිබෙන්නේ උදේ 8.20ට. ඒකට හේතුව O/L exam එකට යන පාසල් දරුවෙක් ඒ කෝච්චි පෙට්ටියක ඉඳලා තිබෙනවා. ඒ දරුවාට නියමිත ස්ථානයෙන් බහින්න බැරි වෙලා. ඒ නිසා අපට සිදු වුණා, ඒ දුම්රිය නවත්වන්නේ නැති තැනකින් ඒ දරුවාව බස්සවලා ඉක්මනින් විභාග මධ්‍යස්ථානයට යවන්න. ඒ නිසා දුම්රියේ ප්‍රමාද දෝෂයක් ඇති වුණා. ඒක ඇත්ත. අපි නැහැයි කියලා කියන්නේ නැහැ.

දුම්රියේ අඩු පාඩුකම් තිබෙනවා. නමුත් අපි ඒ අඩු පාඩුකම් හදාගෙන යන්න ඕනෑ. මොකද, දුම්රියේ අඩු පාඩුකම් තිබෙනවාය කියලා කියන්නේ, පීලිවල අඩු පාඩුකම් තිබෙනවා, signalවල අඩු පාඩුකම් තිබෙනවා. Pointsවල අඩු පාඩුකම් තිබෙනවා. ඒ වාගේම අපි ළඟ තිබෙන දුම්රිය engines ඔක්කොම අවුරුදු 25ක්, 30ක් පැරණි ඒවා. මේවා හදා ගෙන යන්න ඕනෑ. ඉතින් ඒ වාගේ අඩු පාඩුකම් තිබෙනවා. නමුත් අපි දැන් චීනයෙන් සහ ඉන්දියාවෙන් දුම්රිය ගෙන්වන්න order කරලා තිබෙනවා. ඒවා ආවාට පසුව අපි ඒ දුම්රිය හරියාකාරව ධාවනය කරවනවා, මඩකළපුව දක්වා යන්න. ගරු මන්ත්‍රීතුමනි, හොඳ engines දමලා, හොඳ මැදිරි දමලා, ඉතාම ඉක්මනින් මඩකළපුව දක්වා දුම්රිය ධාවනය කරවන්න පටන් ගන්නවාය කියන එක මා ඔබතුමාට කියන්න කැමැතියි. ඔබතුමා කියපු කථාව ඇත්ත. පැය 12ක් ගත වනවා, යන්න. ඉතින් පැය 12ක් කියන්නේ ලොකු කාලයක්. අඩු ගණනේ මේ ගමන පැය 8-10 අතරේ සීමා කරන්න ඕනෑ. අනෙක් එක - [බාධා කිරීමක්] මොකක්ද? [බාධා කිරීමක්] ආ, KV line එකේ ඔබතුමියලා ගිහිල්ලා පදිංචි කරවලා නේ, තලතා අතුකෝරල මන්ත්‍රීතුමියනි. ඔබතුමියලාගේ ආණ්ඩුව කාලයේ ගිහිල්ලා KV line එක දෙපැත්තේම පදිංචි කරවලා තිබෙනවා. ඉතින් ඒ පදිංචි කරවපු අයව දැන් අපට යවා ගන්න විධියක් නැතිවයි ඉන්නේ. ඒක තමයි KV line එකට සිදු වෙලා තිබෙන්නේ.

බස් ගැන කථා කරනකොට, අද SLTB එකේ ආදායම වර්ධනය කරලා තිබෙන බව කියන්න ඕනෑ. නමුත් වියදමත් වැඩියි. වියදම වැඩි වන්නට හේතුව, වැඩි පුරම තිබෙන්නේ පරණ බස් වීමයි. අලුත් බස් නොවෙයි තිබෙන්නේ. අවුරුදු හයකට වඩා පැරණි බස් 2,000ක් තිබෙනවා. අවුරුදු 15කට වඩා පැරණි බස් තිබෙනවා, 2,500ක්. ඉතින් මේවායේ enginesවල එක එක ආපදා එනවා. මේ බස් repair කරන්න ගොඩාක් වියදම යනවා. ඒ නිසා අපේ වියදම වැඩි වෙලා තිබෙනවා. නමුත් ඉදිරියේ දී leasing ක්‍රමය යටතේ - අර මහේස්වරන් නෝනයි, මමයි, අපි දෙන්නාම පෞද්ගලික අංශයේ බස් ගන්නවා වාගේ - අපි බස් ගන්නවා. [බාධා කිරීමක්] ඔබතුමියත් ගන්නේ leasing ක්‍රමයට, මමත් ගන්නේ leasing ක්‍රමයට, ඔබතුමියත් බස් මුදලාලි, මමත් බස් මුදලාලි. ඒක නිසා- [බාධා කිරීමක්] මට නැව් නම් නැහැ. ඒක නිසා අපි SLTB එකටත් දැන් leasing ක්‍රමයට බස් ගන්නවා. අපි leasing ක්‍රමයට බස් අරගෙන දැන් ගෙවනවා.

අපේ මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාගේ ආසනයේ පොළොන්නරුව ඩිපෝ එකේ ඉන්න DS මහත්මයා හොඳට ගෙවනවා. දවසකට රුපියල් 5,000ක් ඒ සඳහා වෙන් කරනවා. පෞද්ගලික බස් රථවලින් දවසකට රුපියල් 5,000ක් වෙන් කරනවා නම්, ඇයි SLTB එකට වෙන් කරන්න බැරි? ඒ නිසා අපි ඉදිරියේ දී බස් ගන්නේ lease කරලායි. අපි lease කරලා බස් අරගෙන, ඒවා ගෙවනවා. ඒ නිසා ඉදිරියේ දී- [බාධා කිරීමක්] ආ, Northern Province එකේ? Northern Province එකට අපි දැනට දීලා තිබෙනවා, බස් රථ 29ක්. නිකම් දීලා තිබෙනවා, 15ක්, leasing ක්‍රමයට දීලා තිබෙනවා, 14ක්. ඒ වාගේම නැඟෙනහිරට නිකම් දීලා තිබෙනවා 8ක්, leasing ක්‍රමයට 15ක් දීලා තිබෙනවා. මා හිතන්නේ එතකොට බස් රථ 52ක් විතර අපි දීලා තිබෙනවා කියලායි. [බාධා කිරීමක්] තවත් දෙනවා. නොදී ඉන්නේ නැහැ. ඉදිරියේ දී අපි තවත් දෙනවා. [බාධා කිරීමක්]

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. (Mrs.) Maheswaran, what is your point of Order?

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

අපට Northern Province එකට lease කළාට කමක් නැහැ. දුවන්න බස් තිබෙනවා නේ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

That is not a point of Order. Hon. Minister, you have to wind up now. Your time is over.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු මන්ත්‍රීතුමිය කියන එක මට තේරෙන්නේ නැහැ. මට දෙපැත්තෙන් ඉන්න දෙදෙනා මට කරදර කරනවා. මට දෙපැත්තෙන් ඉන්න දෙදෙනා ඔබතුමියටත්, මටත් කථා කරන්න දෙන්නේ නැහැ. මම බස් දෙන්නම්. ඔබතුමිය භය වන්න එපා. ඔබතුමියට මම route permit දුන්නා වාගේ ඔබතුමියට මම බස් දෙන්නම්. ඔබතුමිය කියන තැනකට ඔබතුමියව එක්ක ගෙනත් යන්නම් කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

"114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 119,910,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 8,800,000

"114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 8,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 3,190,000,000

"114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 3,190,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 6,395,200,000

"114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 6,395,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

114 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**306 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 9,012,790,000

"306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 9,012,790,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 32,847,800,000

"306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 32,847,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

306 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**307 වන ශීර්ෂය.- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,217,300,000

"307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,217,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 748,200,000

"307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 748,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

307 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 119,910,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 8,800,000

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 8,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 3,190,000,000

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 3,190,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 6,395,200,000

"தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 6,395,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 114, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 306.- இலங்கை புகையிரதத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 9,012,790,000

"தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 9,012,790,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 32,847,800,000

"தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 32,847,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 306, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 307.- மோட்டார் போக்குவரத்துத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மீண்டுவருஞ் செலவு ரூபா 1,217,300,000

"தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக் கான ரூபா 1,217,300,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் -
மூலதனச் செலவு ரூபா 748,200,000

"தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 748,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 307, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 119,910,000, for Head 114, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure,
Rs. 8,800,000

Question, "That the sum of Rs. 8,800,000, for Head 114, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure,
Rs. 3,190,000,000

Question, "That the sum of Rs. 3,190,000,000, for Head 114, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 6,395,200,000

Question, "That the sum of Rs. 6,395,200,000, for Head 114, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 114, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 306. - DEPARTMENT OF SRI LANKA RAILWAYS

Programme 02. - Development Activities - Recurrent Expenditure
Rs. 9,012,790,000

Question, "That the sum of Rs. 9,012,790,000, for Head 306, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 306, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 32,847,800,000

Question, "That the sum of Rs. 32,847,800,000, for Head 306, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 306, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 307. - DEPARTMENT OF MOTOR TRAFFIC

Programme 02. - Development Activities - Recurrent Expenditure
Rs. 1,217,300,000

Question, "That the sum of Rs. 1,217,300,000, for Head 307, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 307, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure,
Rs. 748,200,000

Question, "That the sum of Rs. 748,200,000, for Head 307, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 307, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
The Sitting is suspended till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.00 ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணி வரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed,*

**සහකාර මහ ලේකම්**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)
"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தமர்ந்தார்கள்.*
*Whereupon the Hon. Alhaj A.H.M. Azwer took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Now, we will take up the Votes of the Ministry of Power and Energy - Head 119. I call upon the Hon. Kabir Hashim to move the cut.

119 වන ශීර්ෂය.- විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 1,083,340,000

தலைப்பு 119. - மின்வலு, எரிசக்தி அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01 .- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவரும் செலவு ரூபா 1,083,340,000

HEAD 119.- MINISTER OF POWER AND ENERGY

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 1,083,340,000

[අ. භා. 1.02]

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශය හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 119 දරන වැය ශීර්ෂයෙන් එක් එක් වැඩ සටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතු ය"යි මම යෝජනා කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1983 විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදයේ දී, ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා හැටියට එවකට සිටි ගාමිණී දිසානායක මැතිතුමා මේ ගරු සභාවේදී කථාවක් කළා. ඒ වෙලාවේදී එතුමාට ගරු මන්ත්‍රීවරයෙක් බාධා කරලා එතුමාගේ මහවැලි ව්‍යාපෘතිය විවේචනය කරන්නට කටයුතු කළා. ඒ වෙලාවේ ගාමිණී දිසානායක මැතිතුමා ඒ මන්ත්‍රීවරයාට කිව්වා, මහවැලිය විවේචනය කරන්න ඉස්සර කොළඹ-නුවර පාරට වඩා හොඳ පාරක ගමන් කරන්න ඕනෑ නම් කොත්මලේ-වික්ටෝරියා පාරේ ගමන් කරලා බලන්නය කියලා. ඒ පාරේ ගමන් කරලා ඒකේ හැටි බලන්නය කියලා කිව්වා. එදා එක්සත් ජාතික පක්ෂ රජය කරපු කඩිනම් මහවැලි ව්‍යාපෘතිය හරහා අපි ඇත්ත වශයෙන්ම ගමේ සංවර්ධනයේ දොරටුව විවෘත කළා. සමහර අය අද වනකල් මහවැලිය විවේචනය කරනවා. ඒක මුදල් නාස්තියක් කියලාත් කියනවා. ඒ මහවැලි ව්‍යාපෘතිය හරහා අක්කර දහස් ගණනක ඉඩම් මේ රටේ කෙත්බිම් බවට පරිවර්තනය වුණා. ඒ වාගේම විදුලි ඒකක මිලියන ගණනක් ජල විදුලිය හරහා උත්පාදනය කරන්නට මේ රටට හැකියාව, අවස්ථාව ලැබුණා. ගරු පී. දයාරත්න ඇමතිතුමා ඒකට සාක්ෂි දරාවි. මහවැලි ඇමතිවරයා හැටියට එතුමා කාලයක් කටයුතු කළා.

ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා කියලා තිබුණා, මේක ආර්ථික ඝාතකයන් - economic hitmen - හරහා කරපු ව්‍යාපෘතියක් කියලා. අපි ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා තිබුණේ නැත්නම් මේ ආර්ථිකය ඝාතනය වෙනවා. ඇත්ත වශයෙන්ම ඒක හරියට තෝරා ගෙන නියම වෙලාවට කරපු නිසා අද මේ රටේ විදුලි පද්ධතියේ යම් කිසි ශක්තියක් තිබෙනවා කියන එක මා හිතනවා ගරු ඇමතිතුමාත් පිළිගන්න ඕනෑයි කියා. මහවැලිය හරහා මේ රටේ සමාජ සහ ආර්ථික පුනරුත්ථාපනයක් සිදු වුණු බවට කවුරුත් සාක්ෂි දරාවි. මහවැලි ව්‍යාපෘතිය යටතේ කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල පිහිටි විදුලි බලාගාර හා ජලාශ පද්ධතියේ දායකත්වය කිසි කෙනකුට අවතක්සේරු කරන්න බැහැ. ඒකේ වටිනාකම මේ රටේ මහ ජනයා හොඳටම දන්නවා. මහවැලි ව්‍යාපෘතියෙන් බිහි වුණු විදුලි බලාගාර සහ එයට

සම්බන්ධ වුණු විදුලි සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් ව්‍යුහය නිසා තමයි අද ගෙවල්වලට විදුලිය සම්බන්ධ කිරීමේ ප්‍රතිශතය ශීඝ්‍රයෙන් ලංකාව පුරාම වැඩි වුණේ.

අද පැල්පත්වල පවා විදුලි ලාම්පුවක් පත්තු වෙන්නේ එදා ඒ මහවැලි ව්‍යාපෘතිය අපි නියම වෙලාවට ක්‍රියාත්මක කරපු නිසායි. මා හිතන විධියට 1990 දශකයේ මැද හරිය වනකල්ම ලංකාවේ විදුලි ධාරිතාවෙන් සියයට 90ක්ම උත්පාදනය වුණේ ජල විදුලිය හරහායි. ඒ වාගේම ඒ ජල විදුලි ධාරිතාවෙන් සියයට 50ක දායකත්වයක් ලබා දුන්නේ මහවැලි ව්‍යාපෘතිය හරහායි. ඒක තමයි ඒකේ වටිනාකම. ඒත් මා පිළිගන්නවා පසු ගිය දශක දෙක තුළ රටේ විදුලි ඉල්ලුම ශීඝ්‍රයෙන් වැඩි වුණු බව. ඒ විදුලි ඉල්ලුම වැඩි වීමත් එක්ක ඒ හා සාපේක්ෂව සැපයීම වැඩි කරන්න සිද්ධ වුණා. ඒ පසු ගිය දශකය තුළ පමණක් විදුලි ඒකක ඉල්ලුම දිහා බැලුවාම ඒකක මිලියන තුන් දහසේ සිට ඒකක මිලියන දහදහස් ගණනක් දක්වා ඒ ඉල්ලුම වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම peak demand එක ගත්තාම මෙගාවොට් 400 සිට මෙගාවොට් 2000 දක්වා මේ කාල පරිච්ඡේදය තුළ වැඩි වෙලා තිබෙන බව අපට පැහැදිලියි. ඒ එක්කම මා කනගාටු වෙනවා, පවතින රජයට නොරොච්චෝලේ ව්‍යාපෘතිය හැර, මධ්‍යම කාලීන හෝ දිගුකාලීන විදුලි ධාරිතා වැඩි කරන කාර්යක්ෂම ව්‍යාපෘතීන් කිහිපයක් සකස් කරන්නත්, මේ රටේ ඒ විදුලි අවශ්‍යතාවට සරිලන සැලැස්මක් ක්‍රියාත්මක කරන්නටත් තවම බැරි වෙලා තිබීම ගැන. [බාධා කිරීමක්]

Upper Kotmale අපේ එකේ කොටසක්. ඔබතුමන්ලා ඒක විවෘත කළා කිව්වාට ඒක අපි විවෘත කළා. ඒක අපේ සැලැස්මේ තිබුණ එකක්. ඔබතුමන්ලා අලුතෙන් සැලසුම් කරපු එකක් ගැන කියන්න කෝ.

ඇත්ත වශයෙන්ම 1994 ඉඳලා 2011 වන තුරු මේ රට දිගටම පාලනය කරන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව. නමුත් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයෙන් කොයි තරම් ආර්ථිකයකට බලපෑමක් සිද්ධ වෙනවාද කියන එක ගැන ආණ්ඩුව හරියට කල්පනා කරලා නැහැ. අපේ මුළු නිෂ්පාදන පද්ධතියටම විදුලිය සැපයුමෙන් ලොකු බලපෑමක් ඇති වෙනවා. විදුලිය අපට හරියාකාරව අඩු වියදමින් සපයන්න පුළුවන් නම්, මේ ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු විසඳනවා නම් තමයි අපේ රට තරගකාරී තත්ත්වයකට, කාර්මික නිෂ්පාදන ආදී වශයෙන් යම් කිසි තැනකට ගෙනි යන්න පුළුවන් වෙන්නේ කියන එක ගරු ඇමතිතුමා පිළිගනීවි කියලා මම සිතනවා. ඒක හරියට නොකරන නිසා අද ඒකේ ප්‍රතිඵලය මොකක්ද? ලංකා විදුලිබල මණ්ඩලය විශාල පාඩුවක් විඳින ආයතනයක් බවට පත් වෙලා තිබෙන අතර, අපේ පාරිභෝගිකයන් මේ ආසියානු කලාපයේ වැඩිම විදුලි ගාස්තු ගෙවන පාරිභෝගිකයන් බවට පත් වෙලා තිබෙනවා. ඒක තමයි ප්‍රතිඵලය.

1994 ඉඳලා 2011 වන තුරු තමන්ට ඒ වැඩ පිළිවෙළ හරි පැත්තට යොමු කරන්න බැරි වීමේ වගකීම රජය භාර ගන්න සිද්ධ වෙනවා කියලා මම හිතනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයට කුමන අවලාද නැඟුවත් මම හිතනවා 1977 සිට 1994 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය ලාභ ලබන ආයතනයක් හැටියට අපට ගෙනි යන්න පුළුවන්කම ලැබුණා කියා. එදා 1994 වනකල් -යූඑන්පී ආණ්ඩුව තිබෙනකල්- ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු හරියාකාරව කරලා, හරියට පරිපාලනය සහ කළමනාකරණය කරන්නට අපි කටයුතු කළා.

මගේ අතේ තිබෙනවා ගරු ඇමතිතුමා නිකුත් කරපු වාර්තාවක්; පිටු 08ක document එකක්. මම හිතන හැටියට 2011 වර්ෂය ආරම්භයේදී ඇමතිතුමා ඒ වාර්තාව නිකුත් කළේ. ඒකේ ලංකා විදුලිබල මණ්ඩලයේ 2010 ඇති වුණු විස්මිත හැරවුම ගැන ඇමතිතුමා පැහැදිලි කරනවා. එතුමා ඒ document එක නිකුත් කළේ "දීපදෝ හෝති චක්ඛුදෝ" කියන නමෙන්. ඒ කියන්නේ "දීපදෝ හෝති චක්ඛුදෝ" කියන්නේ "Illumination equals gift of sight" යන්නයි. ඒ heading එක යටතේ තමයි ඒ document එක නිකුත් කළේ. ගරු ඇමතිතුමා නිකුත් කරපු ඒ වාර්තාවේ සඳහන් කරනවා, ලංකා විදුලිබල මණ්ඩලය 1996 දක්වාම ලාභ ලබන ආයතනයක් බවට කටයුතු කර ගෙන ගියා කියලා. එහෙම නම් ලංකා විදුලිබල මණ්ඩලය බරපතළ පාඩු ලබන්න පටන් ගත්තේ ඇත්ත වශයෙන්ම 1996න් පසුව; චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ පාලනයෙන් පසුව.

1996 රටේ විදුලිබල අර්බුදයක් නිර්මාණය වුණා. වැසි අඩු වුණා. ඒකත් එක්ක ප්‍රශ්න කිහිපයක් ඇති වුණා. ඒ වාගේම ඒ වෙලාවේදී පෞද්ගලික අංශයට තාප විදුලිය සැපයීම සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවෙන් ඉඩ හදලා දුන්නා. එදා පෞද්ගලික අංශයට ඉඩ දුන්නේත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඉන්න මේ ඇමතිවරුන්මයි. අතිගරු ජනාධිපතිතුමාත් එදා කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් හැටියට ඉඳ ගෙන ඒකට අත එසෙව්වා. ඇග්‍රිකෝ කියන ආයතනයට දුන්නා විදුලිය සපයන්නට. පෞද්ගලික විදුලිය සපයන්නන් අතරින් ඇග්‍රිකෝ ආයතනයට දෙන කොට ඔවුන් අය කරන ගාස්තුව, ඒ අත්සන් කරන කොන්ත්‍රාත්තු අතිවිශාල වියදමක් එක්ක තමයි ඒ විදුලිය ලංකා විදුලිබල මණ්ඩලයට ගන්නට සිද්ධ වුණේ. ඒත් ඒ විදුලිය එම මිල ගණන්වලට ගත්තත් විදුලිය කප්පාදු කිරීම - power cuts - නතර වුණේ නැහැ. දවසකට පැය 8ක් power cuts කිරීම කර ගෙන ගියා. දිගටම විදුලිය කපා හැරීම් සිද්ධ කළා. ඉතින් ඇමතිතුමාගේ ලේඛනය අනුවම ඇමතිතුමාම පිළිගන්නවා ඇති, 1994 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ අවසන් වසර වන කොටත් ලංකා විදුලිබල මණ්ඩලයේ තිබුණු ශුද්ධ ලාභය රුපියල් මිලියන 3,809ක් බව.

1995 හොඳ වර්ෂයක් හැටියට ඒ ලාභය රුපියල් මිලියන 4,997ට වර්ධනය වුණා. ඒ කියන්නේ සන්ධාන ආණ්ඩුවේ පළමුවැනි වසරේ. එවැනි විශාල ලාභයක් තිබුණු ලංකා විදුලිබල මණ්ඩලය 1996 දී, මේ සන්ධාන ආණ්ඩුවේ දෙවැනි වසර වන කොට ඒ ලාභය රුපියල් මිලියන 95ට අඩු වුණා. එකපාරම අඩු වුණා. කවුද වග කියන්න ඕනෑ. මේ පෞද්ගලික තාප විදුලි බලාගාර හරහා අධික මිලට විදුලිය මිලදී ගැනීම තමයි එක හේතුවක් වුණේ. පිළිවෙළක් නැතුව, සැලැස්මක් නැතුව, විනිවිදයක් නැතිව අත්සන් කරපු ඒ කොන්ත්‍රාත් මත ලංකා විදුලිබල මණ්ඩලයට සිද්ධ වුණා, විශාල වියදමකින් පෞද්ගලික තාප විදුලි බලාගාරවලින් විදුලිය මිලදී ගන්න. ඒකෙන් තමයි අපේ විදුලිය මිල වැඩි වුණේ. ඒක තමයි ආරම්භය.

ගරු ඇමතිතුමා දන්නවා ඇති, 2001 දී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බිහි වුණු බව. 2001 දී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව යටතේ අපි බලය ගන්න කොට රටේ ලොකු විදුලිය අර්බුදයක් තිබුණා. විදුලිය කපා හරින කාලයක්; පැය 8ක්, පැය 10ක් විදුලිය විසන්ධි කරන කාලයක් ඒක. ඒ වෙලාවේදී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ කරු ජයසූරිය මැතිතුමාව පත් කළා, විදුලිබල සහ බලශක්ති ඇමතිවරයා හැටියට. කරු ජයසූරිය මැතිතුමා ඒ අමාත්‍යාංශය භාර ගෙන, එතුමා පොරොන්දුවක් දුන්නා, දින 180ක් ඇතුළත මේ විදුලිය කප්පාදුවට, විදුලි අර්බුදයට තිතක් තියලා මේ ප්‍රශ්නය විසඳනවාය කියලා. එතුමා එහෙම කියන කොට සමහර අය එතුමාට විහිළු කළා, "කළුවර ජයසූරිය" කියලා. නමුත් එතුමා කියපු විධියටම දින 180ක් ඇතුළත ඒ විදුලිය කප්පාදුව නතර කරමින් ඒ විදුලිය අර්බුදයට විසඳුමක් දෙන්නට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ එතුමාට හැකියාවක් තිබුණා.

අපි පැලැස්තර දමන්නේ නැතුව, මධ්‍ය කාලීන හා දිගු කාලීන විසඳුම් සඳහා වැඩ ආරම්භ කළා. දැන් බලන්න, අවුරුදු 10කින් පසුව තත්ත්වය මොකක්ද කියලා. එදා 2002 වර්ෂය. අද අපි

[ගරු කබීර් හාෂිම් මහතා]

ඉන්නේ 2011 වර්ෂයේ. එතකොට අවුරුදු 9ක්, අවුරුදු 10ක් ගත වෙලා තිබෙනවා. දැන් මේ වසරේ නැවත load shedding ආරම්භ කරලා තිබෙනවා, ගරු ඇමතිතුමා යටතේ. අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා යටතේ ආපසු load shedding, power cuts යටින් කර ගෙන යනවා. එහෙම නම් 2002න් පස්සේ, අපේ ආණ්ඩුව අයින් කළාට පස්සේ මේ අවුරුදු ගණනාවක් තුළ ආණ්ඩුව මේ ප්‍රශ්නය දිහා හරිහැටි බැලුවාද?

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ 2002 දී කරු ජයසූරිය මැතිතුමා ඇමතිවරයා හැටියට ගත්ත තීරණවලින් එකක් තමයි 100 megawatts විදුලි බලාගාර දෙකක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කිරීම. එකක් තමයි, ඇඹිලිපිටිය ඒස් පවර් තාප විදුලි බලාගාරය. අනික් එක තමයි පුත්තලමේ හෙළදනව් තාප විදුලි බලාගාරය. එහි වැඩ කටයුතු ආරම්භ කරන කොට කරු ජයසූරිය මැතිතුමා ඒක නිකම් කළේ නැහැ. විදුලිබල මණ්ඩලයේ ඉන්න ඉංජිනේරුවරුනුත් එක්ක සාකච්ඡා කරලා, විනිවිදභාවයකින් යුතුව හරියාකාරව තොරතුරු සොයා ගෙන, අපේ ලංකාවේ ඉන්න ඉංජිනේරුවරුන්ගේ උපදෙස් අරගෙන ඒක හරියාකාරව ක්‍රියාත්මක කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මා කියන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂ රජයෙන් පෞද්ගලික තාප විදුලි බලාගාර ව්‍යාපෘති දෙකක් පමණයි ආරම්භ කළේ කියලා. ඒ දෙකෙන් තමයි අර පුත්තලමේ තිබෙන හෙළදනව් තාප විදුලි බලාගාරය. අනික් එක ඇඹිලිපිටියේ ඒස් පවර් තාප විදුලි බලාගාරය. ඒ දෙක පමණයි අපි ආරම්භ කළේ. විදුලිබල මණ්ඩලයෙන් නිකුත් කරපු වාර්තාවක් අනුවම යූඑන්පී ආණ්ඩුව කාලයේ ආරම්භ කරපු තාප විදුලි බලාගාර දෙක වැටෙන්නේ අඩුම වියදමින් විදුලිබල මණ්ඩලයට විදුලිය සපයන බලාගාර දෙකක් හැටියටයි. තමුන්නාන්සේලාගේ වාර්තාවක් අනුවම අඩුම වියදමෙන් විදුලිය සපයන විදුලි බලාගාර දෙකක් හැටියට තමයි අපි ආරම්භ කරපු ඒ විදුලි බලාගාර දෙක සටහන් වන්නේ. විදුලිබල මණ්ඩලයේ System Control Centre එකේ 2011 ජූනි මාසයේ නිකුත් කරපු සංඛ්‍යා ලේඛන අනුවම අපි ආරම්භ කරපු හෙළදනව් විදුලි බලාගාරයේ විදුලි ඒකකයකට යන වියදම රුපියල් 11.78යි. ඇඹිලිපිටිය ඒස් පවර් විදුලි බලාගාරයේ වියදම ඒකකයකට රුපියල් 14.08යි. ඒ වන විට විදුලිබල මණ්ඩලයෙන් නිෂ්පාදනය කරන thermal unit එකේ ඒකකයක වියදම රුපියල් 23.52යි. ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් අත්සන් කරපු ගිවිසුම් අනුව පෞද්ගලික තාප බලාගාරවල සපයන්නන්ගෙන් මිලදී ගන්නා විදුලි ඒකකයක් සඳහා යන වියදම රුපියල් 18.60යි. එතකොට මේකෙන් පැහැදිලිව පෙනෙනවා කාගේ අතේද වරද තිබෙන්නේ කියා. විදුලි ගාස්තු වැඩි වන්න හෝ මේකේ අකාර්යක්ෂමතාවක් ඇති වන්න හෝ ඒ වගකීම් කාගේ අතටද එන්නේ, කාගේ ඔඩොක්කුවටද මේ ගණන් ටික වැටෙන්න ඕනෑ කියා මේකෙන්ම පැහැදිලි වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලය විශාල ණය බරකින් ඇද වැටිලා තිබෙන අවස්ථාවේ විශේෂයෙන්ම දේශපාලනඥයෝ, ජ්‍යෙෂ්ඨ නිලධාරින් සුදුසු පරිදි සුදුසු වෙලාවට තීන්දු තීරණ ගත්තේ නැහැ. මේ ක්ෂේත්‍රයට අදාළ වන ආයෝජනයන් අවශ්‍ය වෙලාවට කළේ නැහැ. ඒ වාගේම සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ නැහැ. ඒක විවිධ ආණ්ඩුවල තිබුණු අඩු පාඩුවක්. අපෙත් අඩු පාඩු තිබුණා. නමුත් පවතින රජය අවුරුදු 17ක් මේ රට පාලනය කළ කාලය තුළ මේ ගැන හරියට බලා සැලසුම්ගතව, මේක රටට කොයි තරම් දුරට බලපානවාද, කොයි තරම් වැදගත් ක්ෂේත්‍රයක්ද කියා හිතන්නේ නැතුව, දුර දිග බලන්නේ නැතුව වැඩ කළ නිසා ලොකු අර්බුදයක් නිර්මාණය වුණා. ඒකට හැම කෙනෙක්ම වග කියන්න ඕනෑ. මේවා දිගටම එන ප්‍රශ්න. ඇත්තටම අද නම් අපට ඇඟිල්ල දික් කරන්න වන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවටයි. මොකද, අද මහින්ද චින්තන ආණ්ඩුවත් වසර හතරක් දිගටම බලයේ ඉන්නවා. වසර හතරක් දිගටම බලයේ ඉඳලා මේ ප්‍රශ්නය දෙස හරියට බැලුවේ නැහැ.

2002 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට ආ වෙලාවේ ලොකු විදුලි අර්බුදයක් තිබුණා. ඒ වෙලාවේදී මධ්‍යම කාලීන සහ දිගු කාලීන විසඳුම් සඳහා අපි Power Sector Reform කියන පනත් කෙටුම්පත සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අවස්ථාවේදී අපිට විවිධ අවලාද නඟලා මේක පෞද්ගලීකරණය කරන්න යන වැඩ පිළිවෙළක් කියලා මේ පනත් කෙටුම්පත අයින් කර දමා අපේ ආණ්ඩුවත් අයින් කළා. මඩ ගහලා ගොඩක් දේවල් කිව්වා. පෞද්ගලීකරණය කිරීම සඳහා ඒ පනත් කෙටුම්පතේ කිසිම යෝජනාවක් තිබුණේ නැහැ. නමුත් අපි දීර්ඝ ගමනක් ගැන කල්පනා කළා. 2003න් පසු මේක හදන්න කිසිම පනතක් ගෙනෙන්නේ නැතුව 2009 වන තුරු මේ ආණ්ඩුව නිකම් ඉඳගෙන ඉඳලා 2009 දී තමයි මේක හදන්න ඕනෑ කියා පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ. එතකොට අවුරුදු ගණනක් ගිහින්.

2009 දී ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගත්තා. මගේ මතය අනුව නම් 2009 පනත යටතේ විදුලිබල ක්ෂේත්‍රයේ පරිපාලනය, ස්වාධීනත්වය සීමා කර තිබෙනවා. මේකෙන් දේශපාලන අත ගැසීම්වලට ඉඩ දී තිබෙනවා. පරිපාලනය කරන, කළමනාකරණය කරන ඉංජිනේරුවරුන්ට හරි තීන්දු තීරණ ගන්න අවස්ථාව අඩු කරලා ඇමතිතුමාට ඕනෑ විධියට මේක හසුරුවා ගන්න, ඇමතිවරයාට හැම වෙලාවේම ඇඟිලි ගසන්නට හැකි ආකාරයට මේ පනතෙන් ඉඩ හදලා තිබෙනවා. ඒ නිසා තමයි අද මේ අර්බුදය විශාල වශයෙන්ම නිර්මාණය වෙලා තිබෙන්නේ කියන එක ඔප්පු කරන්න මා බලාපොරොත්තු වනවා. අද ඒ දේශපාලන ඇඟිලි ගැසීම් නිසා තමයි විදුලිබල මණ්ඩලයේ විවිධ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. 2002 රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව යටතේ කරු ජයසූරිය මැතිතුමා විදුලි කප්පාදුවට තිතක් තියලා හොඳ වැඩ පිළිවෙළක් හැදුවාට වසර 10කට පසු මේ ප්‍රශ්නය ආපහු ඉස්මතු වෙලා තිබෙනවා. මේ වසරේ ජූලි, අගෝස්තු මාසයේ විදුලිබල මණ්ඩලය load shedding නැත්නම් power cut ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ඒක දැන් කර ගෙන යනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒක අසත්‍යයක්.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)
මම කියන්නම්. ඒක අසත්‍යයක් කියලා ඇමතිතුමා කිව්වාට පසු ගිය මාස කිහිපයක් පුරාම රටේ නොයෙකුත් ප්‍රදේශවල ඇති වූ විදුලි සිඳලීම් සියල්ලම විදුලි -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කථාව ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ජූනි මාසයේ 19 වන දා සිට ජූලි මාසයේ 07 වන දා දක්වා යන්ත්‍ර පහක් අඩ පණ වීම නිසා ප්‍රශ්නයක් තිබුණා ඇරෙන්න ඉන් පස්සේ කිසිම load shedding එකක් වෙලා නැහැ. සහාව නොමඟ යවන්න එපා. ඒක වුණේ වෙන ප්‍රශ්නයක් මත නොවෙයි, යන්ත්‍ර පහක් අක්‍රිය වීම නිසායි.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමනි, යන්ත්‍ර පහක් එක පාරම අඩ පණ වුණා නම් ඒකටත් යම් කිසි වගකීමක් ඔබතුමා දරන්න ඕනෑ. මම ඒ මතයේ ඉන්නේ නැහැ. මම කියනවා, අඩු පාඩුවක් වුණා කියලා. මම ඒක පෙන්නලා දෙන්නම්. මම මේ සභාව නොමඟ යවන්නේ නැහැ. මම ඒකට විස්තර කියන්නම්. මොකද, පසු ගිය මාස කීපයක් පුරාම රටේ නොයෙකුත් ප්‍රදේශවල ඇති වූ විදුලි සිඳලීම් සියල්ලම ඇති වුණේ විදුලි ඉල්ලුම් සැපයීමට අවශ්‍ය ප්‍රමාණයට උත්පාදන ධාරිතාව නොමැති වීම නිසායි. ඇමතිතුමා ජනතාව මුළා කරන්න කෙතරම් කතන්දර කිව්වත්, මේකේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කියන එක තමයි මගේ හැඟීම. මොකද, තෝරා ගත් ප්‍රදේශයන්හි පැය එක, දෙක විදුලිය කප්පාදු කළ බව විදුලිබල මණ්ඩලයේ පද්ධති පාලන මධ්‍යස්ථානය විසින් නිකුත් කරන දෛනික වාර්තාවලින් හෝ එක් එක් විදුලි උප පොළවල්වල දිනපතා ලොග් සටහන් මඟින් සනාථ කර ගන්න පුළුවන්. ඒවා හරියට හොයා බැලුවොත් ලෙහෙසියෙන් සනාථ කර ගන්න පුළුවන්. මොකද, ඇමතිතුමා සාමාන්‍යයෙන් දස සිල් රකින ඇමතිතුමා හැටියට ජනතාවට මුසාවක් නොකියයි කියලා මම හිතනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ජූනි 19 වන දායි, ජූලි 07 වන දායි අතර හැර වෙන එක ලොග් සටහනක් ඔබතුමා පෙන්නුවොත් මම මේ ධුරයෙන් ඉවත් වනවා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මම කිව්වේ ඒ උප පොළවල්වල තිබෙන දෛනික වාර්තා ටික බලන්න කියායි. ඒ ලොග් සටහන් ටික බලන්න. ඒවාවල පැය එකක් දෙකක් කප්පාදු කිරීම කර තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. වැදගත් මන්ත්‍රීවරයකු විධියට අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතුව කථා කරන්න.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මේ සිද්ධ වුණ එක ගැන හරියට කරුණු එක්ක මම ඔබතුමාට කියන්නේ. මම නිකම් කියන්නේ නැහැ. ඔබතුමා දස සිල් රකින ඇමතිවරයෙක් හැටියට ජනතාවට මුසාවක් කියන්නේ නැහැයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

දසසිල් මේකට සම්බන්ධයක් නැහැ. ඔබතුමා හොඳ ඉස්ලාම් බැතිමතෙක් වශයෙන් අසත්‍ය කියන්න එපා. මම අසත්‍ය කියන්නේ නැහැ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඔබතුමා ඇත්ත කියනවා නම් හරි. එහෙම මුසාවක් නොකියනවා නම් බොහොම හොඳයි. ඉතින් මේ තත්ත්වය උදා වන්න හේතු කාරණා තිබෙනවා නේ. මම ඒකත් ඔබතුමන්ලාට කියලා දෙන්නම්. මේ තත්ත්වය උදා වුණේ කොහොමද? මම කියන්නේ මේ තත්ත්වය උදා වුණේ මේ විදුලි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, I think you have to accept the denial of the Hon. Minister.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Mr. Presiding Member, he can deny it but I can prove my point. I have a right to prove my point. I am on my feet and that is what I am doing.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

Hon. Member, you have to prove that.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

Sir, let me finish my speech. I am on my feet. I have time to prove that.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන ගෙන සිටියේ නැහැ, මම විවාද කරන්නේ දෙන්නෙක් එක්ක කියලා. කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් ඔතැන ස්වාධීනව ඉන්නවාද මම දන්නේ නැහැ. මේ බලපෑම සිදු වුණේ දේශපාලන මැදිහත් වීමක් එක්කයි කියලා මම කියනවා. ගරු ඇමතිතුමාගේ වාගේ නොවෙයි, මාගේ තාක්ෂණික දැනුම සීමිතයි. ඔබතුමා විදුලි ඉංජිනේරුවෙක්. මට ඒ තරම් තාක්ෂණික දැනුමක් නැහැ. නමුත් දන්නා තරමින් මම මේක විශ්ලේෂණය කරන්න බලාපොරොත්තු වනවා. මේ දේශපාලන බලපෑම මොකක්ද? මේ දේශපාලන බලපෑම කොහොමද සිදු වුණේ? මොකද, පසු ගිය දෙසැම්බර් මාසයේදී ජලාශ ඉතිරී යන තරමට වැස්ස ලැබීමට වාසනාව තිබිලා මාස හයක් ගෙවෙන්න කලින් මේ රටේ විදුලිය කපා හැරීම කොහොම සිදු වනවාද කියලා අපටත් තේරුම් ගන්න බැහැ.

ජලාශවල වතුර මට්ටම හොඳට උපරිමයෙන් තිබුණා. ඒක අපි පිළිගන්නවා. විදුලිබල මණ්ඩලයේ විවිධ විදුලි බලාගාර තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ ජල විදුලි බලාගාර, තාප විදුලි බලාගාර, පෞද්ගලික අංශයෙන් මිල දී ගන්නා විදුලිය ආදී වශයෙන් ක්‍රම තිබෙනවා. එයින් අඩු වියදමට විදුලිය නිෂ්පාදනය වන්නේ ලක්ෂපාන සහ මහවැලි ජලාශවලින්. විදුලිබල මණ්ඩලයෙන් වැඩි වියදම් යන්නේ කැලණිතිස්ස gas turbinesවලට. මම හිතනවා, ඒ සම්බන්ධයෙන් මම හරි කියලා. ඔබතුමන්ලා ගෙනියන වැඩ පිළිවෙළ අනුව merit order dispatch ක්‍රමයක් තිබෙනවා. ඒක සංකීර්ණ වැඩ ක්‍රමයක්. නමුත් merit order dispatch ක්‍රමය අනුගමනය කරමින් විදුලි නිෂ්පාදනයේ වියදම විදුලිබල මණ්ඩලයෙන් පාලනය කරනවා. ඒක හැම දාම සිදු වන දෙයක්. විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවරු අතිදක්ෂ විධියට මේ කාර්ය භාරය සිදු කරනවායි කියලා මම විශ්වාස කරනවා. එහෙම තියෙද්දී යම් කිසි ගැටලුවක් සිද්ධ වුණායි කියන එක තමයි මගේ හැඟීම. ඒකයි මම ඇමතිතුමාගෙන් අහන්නේ.

විදුලිබල මණ්ඩලය ජල විදුලි උත්පාදනය කරන්නේ කෙහෙල්ගමු ඔය, මස්කෙළි ඔය සංකීර්ණයෙන්. කාසල්රී, මාවුස්සාකැලේ ජලාශ පද්ධතියේ තමයි ජලය ගබඩා වෙන්නේ. අනෙක් එක තමයි මහවැලි සංකීර්ණය. එතැනදී කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල ජලාශ පද්ධතියේ තමයි ජලය ගබඩා වන්නේ. මේ ජලාශ පද්ධතියේ ජලය රඳවා ගැනීමේ ප්‍රමාණය මනින්නේ මම දන්නා තරමට උත්පාදනය කරන්න පුළුවන් විදුලි

[ගරු කබීර් හාෂිම් මහතා]

ප්‍රමාණය අනුවයි. ඒ ගබඩා කිරීමේ ධාරිතාව සහ number of units of electricity produced. ජලාශ පද්ධතියේ ගබඩා ධාරිතාව - reservoir water storage- මනින්නේ ගිගාවොට් පැයවලින්- gigawatt hoursවලින්-. එතකොට එක ගිගාවොට් පැයකින් විදුලි units මිලියනයක් නිෂ්පාදනය කරන්න පුළුවන්. එතකොට විදුලිබල මණ්ඩල ජලාශ පද්ධතියේ ගබඩා ධාරිතාව ගිගාවොට් පැය 1,200යි. සාමාන්‍යයෙන් ජලාශ පද්ධතියේ ගිගාවොට් පැය 800ක් වර්ෂය ආරම්භයේදී තිබේ නම් ඒ වර්ෂයට විදුලිය සපයා ගන්න එය ප්‍රමාණවත් වෙනවා කියන එක තමයි සාමාන්‍යයෙන් කවුරුත් දන්නේ. මොකද, තාප විදුලි බලාගාරවල උත්පාදනය කරන විදුලියත් එක්ක සාමාන්‍යයෙන් පාලනය කරන වියදමකට අපට විදුලිය සපයන්න පුළුවන් කියන මතය තිබෙනවා.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් 2011 ජනවාරි මාසයේ 01වෙනි දා නිකුත් කරන මාධ්‍ය ප්‍රකාශය අනුව 2011 ජනවාරි මාසයේ දී ජලාශ පද්ධතියේ ගබඩා ධාරිතාව තිබුණේ ගිගාවොට් පැය 1,100යි. ගිගාවොට් පැය 800ට වඩා ප්‍රමාණයක් තිබුණා. 2011 අවුරුද්දටම විදුලි බිල් වැඩි කරන්නේ නැතිව, ගාස්තු වැඩි කරන්නේ නැතිව, වියදම් වැඩි වෙන්නේ නැතිව, පාඩු විඳින්නේ නැතිව අපට විදුලිය සපයන්න පුළුවන් තරමක ගබඩා ධාරිතාවක් අපේ ජලාශ පද්ධතිය තුළ තිබුණා කියන එක විදුලිබල මණ්ඩලයේ මේ ප්‍රකාශයෙන්ම සනාථ වෙනවා. කිසිම කරදරයක් නැතිව අපට මේක කරන්න තිබුණා. ඒත් වර්ෂය මැද හරියේ, -ඇමතිතුමා කියනවා නැහැ කියලා- යම් කිසි load shedding එකක් නැත්නම් power cuts ක්‍රියාත්මක කළා කියන එක තමයි මගේ හැඟීම. ඒ power cut කරන්න හේතුවක් තිබුණේ නැහැ. මොකද, ජලය ප්‍රමාණවත්ව තිබුණා නම් විදුලිය කපා හැරීමට කිසිම හේතුවක් තිබුණේ නැහැ. එහෙම නම් මම කියනවා, -මම චෝදනා කරනවා- මේක දේශපාලන බලපෑම් මත ජලාශ පද්ධතියේ ජලාශ සීමාව-

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඔබතුමාගේ දැන ගැනීම සඳහා කියන්නේ. ලංකාවේ දවසක විදුලි පරිභෝජනය ගිගාවොට් පැය මිලියන 35යි. ජලාශ සම්පූර්ණයෙන් පිරී ගිහින් ගිගාවොට් පැය 1,200ක් තිබුණත් එය ප්‍රමාණවත් වන්නේ දින 40කට පමණයි.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඒක ඔබතුමා පිළිගන්නවා ඇති. වර්ෂය ආරම්භයේදී ගිගාවොට් පැය 800ක් තිබුණා නම් merit order dispatch එක අනුව වැඩ කරනවා නම්, තාප විදුලි බලයත් එක්ක පාලනය කරනවා නම් අපට අඩු වියදමින්, පාඩු ලැබෙන්නේ නැතිව ඒ අවුරුද්දට විදුලිය සපන්න පුළුවන් කියලා පිළිගන්නවාද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගිගාවොට් පැය 1,200 මුළු අවුරුද්දටම ප්‍රමාණවත් කියලා ඔබතුමා කිව්වා. ඒකටයි මම කිව්වේ. ඒක ප්‍රමාණවත් වන්නේ ඒක මුළුමනින් කළත්-

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
නැහැ, නැහැ. අවුරුද්දක් කියන්නේ merit order dispatch එක අනුව කළමනාකරණය කරන්න ඕනෑ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
දින 40කට විතරයි.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
නැහැ. ඒක කළමනාකරණය කරනවා නම් ඒක ප්‍රමාණවත්. ඒක තමයි උපරිමය. අපේ ජලාශ පද්ධතියේ ගබඩා ධාරිතාවේ උපරිමය ගිගාවොට් පැය 1,200යි නේ. ඒක හරියට පාලනය කිරීම තමයි ඇමතිතුමාගේ දක්ෂකම වෙන්න ඕනෑ. මම කියනවා, -මම චෝදනා කරනවා- දේශපාලන බලපෑමක් මත මාස 4ක් තුළ ජලාශ පද්ධතියේ ගබඩා ධාරිතාව ඉක්මවා පාවිච්චි කරලා, ජල විදුලි ධාරිතාවේ සීමාව ඉක්මවා පාවිච්චි කළ නිසාම වසර මැද හරියේ විදුලිය සැපයුමේ අර්බුදයක් නිර්මාණය වුණා කියලා. ඒක කළමනාකරණයේ ප්‍රශ්නයක් කියලායි මම කියන්නේ. මේ ජලාශ ගබඩා ධාරිතාව කළමනාකරණය කරලා මුළු වසරටම විදුලිය සැපයීම කළ යුතුව තිබූ අතර ඔබලා ඒක නොකළ නිසා තමයි මේ ප්‍රශ්නය සිදු වුණේ කියන එක මගේ මතයයි. අද වන විට විදුලිබල මණ්ඩලය ලොකු පාඩුවකට තල්ලු වෙනවාය කියලා ගරු ඇමතිතුමාම කියනවා. විදුලිබල මණ්ඩලය ලොකු ප්‍රශ්නයකට, අර්බුදයකට තල්ලු වෙනවා කියලා ඇමතිතුමාම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලය 2010 වසරේ ලාභයක් පෙන්වලා තිබෙන බවත් අපි දන්නවා. අපි ඒ ගැන සතුටු වෙනවා. ලාභය පෙන්වූව එක ඉතාම වැදගත්. ඒ අතර මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ගාමිණී දිසානායක මහතාට පින් දෙන්න ඕනෑ කියලා. මොකද, මහවැලිය නිසාම තමයි ඔබතුමන්ලාට ඒ ලාභය පෙන්වන්නට පුළුවන් වුණේ. මොකද, ඉතිහාසය පුරාම විදුලි බලාගාර ආශ්‍රිත ප්‍රදේශයන්ට වැඩිම වර්ෂාපතනයක් ලැබිලා තිබෙන්නේත් 2010 වසරේ. මහවැලිය විවේචනය කරලා, චෝදනා කරලා, මඩ පාරවල් ගැහුවාට ඒ hydropower පද්ධතිය හරියට තිබුණ නිසා තමයි තමුන්නාන්සේලාට 2010දී ඒ ලාභයවත් පෙන්වන්න පුළුවන් වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් වසර 10ක කාල සීමාවක් ගන්න. 2002 වර්ෂය ගන්න. 2002 අපේ ආණ්ඩුව ආපු කාලයේ අපට ලොකු විදුලි අර්බුදයක් තිබුණා. ලංකාවේ අඩුම ජලාශ ධාරිතාව සිදු වුණේ 2002දී. කරූ ජයසූරිය මැතිතුමා විදුලි කප්පාදුව නතර කරන්න පටන් ගත්ත වසරේ. ඒ වන විට ජල විදුලි ධාරිතාව ඒකක මිලියන 2,589කට අඩු වුණා. වැඩිම ධාරිතාව සිදු වුණේ 2010 වසරේ; ලාභ පෙන්වූ වසරේ. ඒක ඇමතිතුමාගේ ක්‍රියාකාරකමක් නිසා නොවෙයි. 2010 ඒකක මිලියන 4,988ක ජල විදුලි ධාරිතාවක් ඇති වුණා. මොකද, අධික වර්ෂාව නිසා. ඒක ලොකු හයියක්. ජල විදුලි ධාරිතාව දෙගුණයක් වීමෙන් තාප විදුලි භාවිතය සීමා කර නිෂ්පාදන වියදම අඩු කර ගන්නට ඔබතුමන්ලාට පුළුවන් වුණා. ඒක වැදගත්. නමුත් මේ වසරේ - දෙසැම්බර් වෙන කොටත් ඒ වාගේම වර්ෂාපතනයක් තිබුණාට- ඇයි අප මේ අර්බුදයට ගිහිල්ලා තිබෙන්නේ? ගාමිණී දිසානායක මැතිතුමාත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් එදා දූරදිග බලලා, හොඳ මධ්‍යකාලීන හා දිගුකාලීන වැඩසටහනක් ක්‍රියාත්මක කරපු නිසා තමයි අද මෙහෙමවත් මේ ප්‍රශ්නය පාලනය වන්නේ.

ලාභ පෙන්වපු එක ගැන මම පැහැදිලි කරන්න කැමැතියි. භාණ්ඩාගාරයෙන් ගිය වසරේ -2010 දී- විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන 7,200ක් සහනාධාර හැටියට දුන්නා. පෞද්ගලික තාප විදුලි බලාගාරවලට පවා තෙල් සහනයක් ලබා දෙන්නට රුපියල් මිලියන 7,200ක් දුන්නා. ඒකත් එක්ක රුපියල් මිලියන 5,200ක ලාභයක් පෙන්වන එක ඒ තරම් ලොකු දෙයක්

නොවෙයි. අප ඒක අගය කරනවා. නමුත් ඇයි ඒ ලාභය මේ අවුරුද්දේත් පවත්වා ගෙන යන්න බැරි වුණේ? ඇයි ඒක එක පාරටම පාඩුවකට පරිවර්තනය වන්නේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒ සහනය හැම දාම දුන්නා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හරි. එහෙනම් මේ අවුරුද්දෙත් ඒ සහනයත් එක්ක තමයි අප පාඩු විඳිනවා කියලා ඔබතුමා කියන්නේ. එතකොට භාණ්ඩාගාරයෙන් සහනයත් දෙනවා, තවත් මේක පාඩු වෙනවා. මේ කළමනාකරණය නැති වීමෙන් මොකක්ද වන්නේ? පුංචි පාරිභෝගිකයන්ට බිල්වලට අධික මිල ගණන් ගෙවන්න වෙනවා. ඒක සාධාරණ නැහැ. ඇයි මිනිසුන්ගේ බිල් වැඩි කරන්නයි, එයාලාගේ විදුලිය කප්පාදු කරන්නයි කටයුතු කරන්නේ? මේක මෙතැන ඇතුළේ තිබෙන ප්‍රශ්නයක්. ඒ කළමනාකරණය විනිවිදභාවයෙන් හරිහැටි කරලා, දේශපාලන අත ගැසීම් නතර කරලා හරියට පාලනය කරනවා නම් මේ ප්‍රශ්නය ඇති වන්නේ නැහැ නේ. 2002 දී එච්චර අර්බුදයක් තියෙද්දි ඒ විදුලි කප්පාදුව නතර කරලා ඒකට විසඳුමක් දෙන්න කරු ජයසූරිය මැතිතුමාට පුළුවන් වුණා නම්, තමුන්නාන්සේලාට -අවුරුදු 17ක් තිස්සේ ඉන්න ආණ්ඩුවකට- මේකට විසඳුමක් හොයා ගන්න බැරි වන්නේ ඇයි? මේ අතරතුර මේ වසරේම පාඩුවක් තිබෙනවා කියලා ඇමතිතුමා කියනවා. ඇත්තෙන්ම අවුරුදු දහයකට පස්සේ විදුලි ප්‍රශ්නය අපට අත් දකින්න සිදු වෙලා තිබෙන්නේ වර්තමාන ඇමතිතුමාගේ සහ රජයේ අදූරදර්ශී වැඩ පිළිවෙළ නිසායි. අප දකින්නේ කෙළින්ම ඒක නිසා කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011නොවැම්බර් මාසයේ 18වැනි දා "ඩේලි මිරර්" පුවත් පතේ ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයක් පළ වුණා. එතුමා කියා තිබෙනවා, මේ වතාවේ විදුලිබල මණ්ඩලයට රුපියල් බිලියන 72ක පාඩුවක් විඳින්න සිද්ධ වෙනවා කියලා. ඒකට විශේෂ හේතුව පෞද්ගලික තාප විදුලි බලාගාරවලින් විදුලිය මිලදී ගැනීම කියලාත් එතුමා කියනවා. එතුමාම කියනවා පෞද්ගලික තාප විදුලි බලාගාරවලින් මේ මිලදී ගන්නා විදුලිය නිසා බිලියන 72ක පාඩුවක් විඳිනවා කියලා. මේ පෞද්ගලික තාප විදුලි බලාගාරත් එක්ක ගිවිසුම් අත්සන් කළේ, ඒ ගණන් හිලවු කථා කර ගත්තේ කවුද? මේ ආණ්ඩුව. මේ ආණ්ඩුවම තමයි මේ අධික මිල ගණන්වලට කොන්ත්‍රාත් අත්සන් කර ගත්තේ. කිසිම විනිවිදභාවයක් නැතිව, වැඩ පිළිවෙළක් නැතිව පෞද්ගලික අංශයට විශාල ගණන් ගෙවලා දැන් ඒවා ඒ මිලට ගන්න වෙනවා. එතකොට මා අහන්නේ මේ වගකීම කාගේද කියලායි. ඒ වගකීමත් ගන්න වෙන්නේ මේ ආණ්ඩුවටයි. ඇමතිතුමා එහෙම කියන කොට, අනික් පැත්තෙන් එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශකයකු වන අශෝක අබේගුණවර්ධන මහතාත් ඊට සතියකට පස්සේ "ඩේලි මිරර්" පුවත් පතට ප්‍රකාශයක් කර තිබෙනවා. ඒ, 2011 නොවැම්බර් මාසයේ 24වැනි දායි. එතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා 2012 දී -ලබන වසරට- පෞද්ගලික තාප විදුලි බලාගාරවලින් විදුලිය ඒකක මිලියන 4,300ක් මිලදී ගන්න විදුලිබල මණ්ඩලයට සිද්ධ වෙනවා කියලා.

ඇමතිතුමා කියනවා ඒ private තැන්වලින් විදුලිය මිලදී ගන්නා නිසා බිලියන 72ක් මේ වසරට පාඩු වෙනවා කියලා. උපදේශකවරයා කියනවා විදුලි ඒකක මිලියන 4,300ක් ගන්න වෙනවා, ඒකට යන වියදම රුපියල් බිලියන 80ක් කියලා. එතකොට මේ අවුරුද්දේ ප්‍රශ්නයක් තිබෙනවා නම් ලබන අවුරුද්දේ ඒක විසඳන්න වැඩ පිළිවෙළක් තිබෙන්නේ කොහේද? එතකොට ඒකෙන් පේන්නේ මොකක්ද? පෞද්ගලික තාප විදුලි බලාගාරවලින් ගන්න විදුලි ඒකකයකට විදුලිබල මණ්ඩලයට යන වියදම රුපියල් 18.60යි. අශෝක අබේගුණවර්ධන මහතා නැවතත් කියා තිබෙනවා තමුන්නාන්සේලාගේ විදුලිබල මණ්ඩලයට අයිති තාප බලාගාරවලින් 2012 දී නිෂ්පාදනය කරන්න ඕනෑ විදුලි ඒකක ප්‍රමාණය මිලියන 1,700ක් කියලා. ඒකට යන වියදම රුපියල් බිලියන 40යි. ඒ රුපියල් බිලියන 40 අනුව විදුලිබල මණ්ඩලයේම තාප විදුලි බලාගාරවලින් ගන්න විදුලියට යන වියදම, ඒකකයකට රුපියල් 23.52යි.

ඔබතුමා ඇඟිල්ල දික් කරලා චෝදනා කරනවා, මේ පාඩුව විඳින්න සිද්ධ වුණේ පෞද්ගලික විදුලි බලාගාරවලින් ගන්න විදුලිය නිසාය කියලා. ඒ වියදම ඒකකයකට රුපියල් 18ක් නම්, ඔබතුමා විදුලිබල මණ්ඩලය හරහා නිෂ්පාදනය කරන විදුලි ඒකකයකට ඊට වඩා ගණනක්, රුපියල් 23.52ක් යනවා. ඒකෙන් කියන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා නිෂ්පාදනය කරන විදුලිය සඳහා පිටතින් මිලදී ගන්න ඒවාට වඩා වියදමක් යනවා කියන එක නේද? ඔබතුමා ඇමතිකම කාලයක් තිස්සේ කරනවා. මේ ආණ්ඩුව අවුරුදු 17ක් තිස්සේ ඉන්නවා. ඉතින් ඔබතුමාට බැරි වුණාද ඒ වියදම අඩු කර ගන්න? මෙතැන අකාර්යක්ෂම වැඩ පිළිවෙළක් තමයි තිබෙන්නේ කියලා ඒකෙන් ඔප්පු වෙන්නේ නැද්ද? එම නිසා මේ ප්‍රශ්නය දිහා හරියට බලලා ඒ ප්‍රශ්නය විසඳන්න ඇමතිතුමා කටයුතු කරනවාද කියන එක අපට තේරෙන්නේ නැහැ. මේකෙන් පැහැදිලිව අපට පෙනෙන්නේ මෙතැන යම් කිසි අඩු පාඩුවක් සිද්ධ වෙන බවයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කාලයේදී, කරු ජයසූරිය මැතිතුමා ආරම්භ කරපු පෞද්ගලික තාප විදුලි බලාගාර දෙකයි තිබුණේ. එකක් පුත්තලමේ තිබෙන "හෙළදනවි" එක. ඒකේ විදුලි ඒකකයකට යන වියදම රුපියල් එකොළහයි ශත අසූ ගණනයි. අනෙක් එක තමයි ඇඹිලිපිටියේ තිබෙන Ace Power තාප විදුලිබලාගාරය. ඒකේ විදුලි ඒකකයකට යන වියදම රුපියල් දහහතරයි ශත අසූ ගණනයි. ඒ අනුව පෞද්ගලික අංශයෙන් ගන්නා විදුලියට අඩුම වියදම දරන්නේ යූඇන්පීයෙන් ආරම්භ කළ විදුලි බලාගාර දෙකෙන් කියන එක ඉතාම පැහැදිලියි. ඒ නිසා මෙතැනදී මේ වරද සිද්ධ වෙලා තිබෙන්නේ කාගේ අතින්ද කියන එක පැහැදිලි වෙනවා.

මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් මේ කාරණය කියන්න කැමතියි. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ ගාමිණී දිසානායක මැතිතුමා, මහවැලිය භාර ඇමතිවරයා හැටියට ඉන්නකොට ලංකාවේ කළ විශාලම වැදගත් ව්‍යාපෘතියක් හැටියට මහවැලි ව්‍යාපෘතිය සඳහා එතුමා පුළුවන් තරම් ලංකාවේ ඉන්න විද්වතුන්ගෙන්, විශේෂඥයන්ගෙන්, ඉංජිනේරුවරුන්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහාය ගත්තා. ඒ අයත් එක්කයි වැඩ කළේ. එතුමා හැම දාම ලංකාවේ ඉන්න ඉංජිනේරුවරුන්ගෙන් උපදෙස් අරගෙන තමයි වැඩ කළේ. එතුමා විශ්වාස කළා, අපට ඒ හැකියාව, දැනුම, ශක්තිය තිබෙනවා කියලා. ඒ වාගේම කරු ජයසූරිය මැතිතුමා 2002 වර්ෂයේදී විදුලිබල ඇමති වුණාට පස්සේ, එතුමාත් විදුලිබල මණ්ඩලයේ ඉන්න ඉංජිනේරුවරුන්ගෙන් උපදෙස් අර ගෙන තමයි යම් පියවරකට ගියේ. නමුත් වත්මන් ඇමතිවරයා සමහර තැන්වලදී කියනවා අපි දකිනවා, අපේ මේ ඉංජිනේරුවරු දූෂිතයි; අපේ අය හොඳ නැහැ කියලා. අපේ අය විවේචනය කරනවා. එහෙම දෙයක් වෙනකොට අපට කනගාටුයි.

දැන් බලන්න, නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාරය ආරම්භ කළා. යම් කිසි හේතුවක් නිසා ඒ ගැන ප්‍රශ්න කිහිපයක් තිබුණා. නමුත් දැන් ඒක පටන් ගත්තා. ඒකේ ධාරිතාව මොකක්ද? දැනට තිබෙන ධාරිතාව මෙගාවොට් 300යි. දැන් අශෝක අබේගුණවර්ධන මහත්මයාම කියනවා, 2012 වර්ෂයේ ඒ බලාගාරයෙන් නිෂ්පාදනය කරන්න පුළුවන් විදුලි ඒකක මිලියන 1,750ක් පමණයි කියලා. එතුමාගේ ප්‍රකාශය අනුව, සම්පූර්ණ

[ගරු කබීර් හාෂීම් මහතා]

ධාරිතාවෙන් නොවෙයි, සියයට 65ක ධාරිතාවකින් තමයි ඒ බලාගාරය ක්‍රියාත්මක කරන්න යන්නේ. ඒ කියන්නේ 65 per cent capacity එකකින්. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු සපයන්න පුළුවන් මාස හයකට පමණයි. ප්‍රශ්නයක් තිබෙන නිසා තව මාස හයකට ගල් අඟුරු බාන්න බැහැ. ඒ බලාගාරයේ සියයට සියයක capacity එකට යන්න බැරිව තියෙද්දී, ඒ මෙගාවොට් 300, මෙගාවොට් 900ට වැඩි කරන්න stages තුනකින් කටයුතු කරන්න ආණ්ඩුව තීරණය කරලා තිබෙනවා.

නොරොච්චෝලේ බලාගාරය හදනකොට ලංකාවේ විශේෂඥයන් ගැන විශ්වාසයක් නැතිව, ඒ සම්පූර්ණ වැඩ කටයුතු කරන්න යෙදෙව්වේ චීනයේ විශේෂඥයෝ, චීනයේ උපදේශකවරු, චීනයේ කොන්ත්‍රාත්කරුවෝ. ඒ ඔක්කෝම ඒ අයට දීලා, ඒ මදිවාට චීනයෙන් කම්කරුවෝත් ගෙනාවා. චීනයෙන් තමයි ඒ හැම දෙයක්ම කළේ. ලංකාවෙන් ඒ ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කළා නම් පාවිච්චි කළේ, ලංකාවේ බල්ලෝ විතරයි. ඒ මොකටද? චීන කම්කරුවන්ට අහාරයක් වශයෙන් ඒ පළාතේ හිටපු බල්ලෝ ටික ගත්තා. අපට කනගාටුයි කියන්න. මේ රටේ තිබෙන ඒ විශේෂ හැකියාව ඇයි පාවිච්චි කළේ නැත්තේ? දැන් වුණත් මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? ඒ නොරොච්චෝලේ ව්‍යාපෘතියට උපදෙස් ගන්න-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
තව විනාඩි දෙකක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

උපදේශක සේවාවක් යොදවා ගන්න චීන සමාගමකට භාර දෙන්න තීරණය කරලා තිබෙනවා. අපේ ඉංජිනේරුවරු දෙසීයක් තුන්සියයක් ඒ බලාගාරය නඩත්තු කර ගෙන යනවා. අපට චීනයෙන් උපදෙස් ඕනෑද ඒක නඩත්තු කරන්න? අපේ අයට ඒ හැකියාව නැද්ද කියලා මා ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. අපි හැම දාම අපේකම, අපේ හැකියාව, අපේ රට, අපේ දැක්ම ගැන කථා කළත්, ඔබතුමන්ලාට අපේ අය ගැන ඒ විශ්වාසය නැත්තේ ඇයි කියන එක මා අහන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මට නියමිත කාලයත් අවසන් වන නිසා අවසාන වශයෙන් මා ඔබතුමාට විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අද ඔබතුමන්ලා ගෙන යන වැඩ පිළිවෙළේ අකාර්යක්ෂමතාව බලපාන්නේ පොඩි මිනිසුන්ටයි; පාරිභෝගිකයන්ටයි. ඒ ප්‍රශ්නයට වග කිව යුත්තේ ඔබතුමායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම කියන්න කැමැතියි මගේ දිස්ත්‍රික්කයේ හෙට්ටිමුල්ල ප්‍රදේශයේ පාරිභෝගිකයකුට වෙච්ච සිද්ධියක්. එතුමා ගියා විදුලිය බිලක් ගෙවන්න. එතුමාගේ බිලේ තිබෙන්නේ රුපියල් හයදහස් ගණනක්. එතුමා ගිහිල්ලා රුපියල් 5,000ක් ගෙව්වා, නොවැම්බර් මාසයේ 25වැනි දා. ඊට පස්සේ එතුමාට විදුලිය විසන්ධි කිරීමේ notice එකක් ගෙනැල්ලා දෙනවා. නොවැම්බර් 25 බිල ගෙව්වා. නමුත් දෙසැම්බර් දෙවැනි දා -සතියක් ඇතුළත- විදුලිය විසන්ධි කරන්න notice එකක් ගෙනැල්ලා දෙනවා. රුපියල් 5,000ක් ගෙවලා ඉවරයි. ඒත් සතියක් ඇතුළත notice එකක් ගෙනැල්ලා විදුලිය විසන්ධි කරන්න කටයුතු කරනවා. ඇයි ඒ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මට විනාඩි දෙකක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතකොට අනෙක් අයගේ කාලයෙන් අඩු වෙනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු ඇමතිතුමනි, විදුලිබල මණ්ඩලයේ කළමනාකරණයේ දුර්වලකමක් තිබෙනවා ඇති. ඔබතුමන්ලාගේ Accounts Division එකේ මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා ඇති. නමුත් විදුලිබල මණ්ඩලයට සල්ලි ප්‍රශ්නයක් තිබුණාය කියලා පාරිභෝගිකයකු බිලක් ගෙවලා සතියක් ඇතුළත, විදුලිය විසන්ධි කිරීමට කටයුතු කරන එක වැරැදියි. මොකද, මහ ජනයාටත් -පාරිභෝගිකයාටත්- ආර්ථික ප්‍රශ්න තිබෙනවා; සල්ලි ප්‍රශ්න තිබෙනවා; ලෙඩ දුක් හැදෙනවා. එක පාරටම කඩා පැනලා විදුලිය කපනවා නම් ඒක වැරැදියි. Finance companiesවලින් වාහන උස්සනවා වාගේ කණ්ඩායමක් යවනවා. ඒ අය ගිහිල්ලා notice එක දීපු ගමන් විදුලිය කපනවා. ඊට පස්සේ රුපියල් 800ක් ගෙවන්න ඕනෑ ආපසු connection එක ගන්න. එහෙම නම් මේක අසාධාරණ වැඩ පිළිවෙළක්. ඔබතුමන්ලාගේ අකාර්යක්ෂමතාව නිසා මහ ජනතාවට මෙහෙම හිරිහැර කරන්න එපා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම පුංචි ගෙවල්වලට තිබෙන රුපියල් 800ක, 900ක බිල් ගෙව්වේ නැත්නම් සතියකින් විදුලිය කපා හරින එක ඔබතුමා නතර කරන්න. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට කියන්න කැමැතියි

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க )
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමනි, සම්පූර්ණ අසත්‍යයක්. ඔබතුමා කියන ඔය සිද්ධිය අප පරීක්ෂා කර බලන්න ඕනෑ. සාමාන්‍යයෙන් අපි මාසයක් කල් දෙනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඇමතිතුමා, මා ගාව ඒ බිල තිබෙනවා. මම copy එකක් දෙන්නම්.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒක අපට දෙන්න. අප ඒක පරීක්ෂා කර බලන්නම්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසන් වෙනවා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මා මේකේ copy එකක් දෙන්නම්.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මේක විශේෂ සිද්ධියක්. ඒක සාමාන්‍යකරණය කරන්න එපා. විදුලිය කපන්න අපි මාසයක් කල් දෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, let him finish. You can reply him during your speech.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් සූත්‍ර පිටකයට අයත් විමාන වත්ථුපාළියෙහි තිබෙන ගාථාවක් හා සම්බන්ධව පොඩි සඳහනක් කරන්න මම කැමැතියි, ගරු ඇමතිතුමනි. මුගලන් මහ රහතන් වහන්සේ සහ දෙව් දූවක අතර ඇති වූ සංවාදයකදී, මුගලන් මහ රහතන් වහන්සේ දෙව් දූවගෙන් ඇහුවා, "ඔබ දෙව් දූවක හැටියට ඉපදුණේ කොහොමද" කියලා. එතකොට ඒ දෙව් දූව උත්තර දුන්නේ කොහොමද? "එක දවසක් ඝන අන්ධකාරය තිබෙන වෙලාවක මම පහනක් පත්තු කළා. මුළු ලෝකයටම ආලෝකය ලබා දුන්නා; එක පහනකින් මුළු ලෝකයටම ආලෝකය ලබා දුන්නා. ඒ පිනෙන් තමයි මම දිව්‍ය ලෝකයේ ඉපදුණේ." එහෙමයි කිව්වේ. එහෙම නම් ගරු ඇමතුමනි, ඔබතුමා අද පුංචි පැල්පත්වල දැල් වෙලා තිබෙන පහන් නිවා ගෙන යන කොට ඔබතුමාට දිව්‍ය ලෝකයේ නොවෙයි යන්න වෙන්නේ. ඔබතුමා යන ලෝකය ඔබතුමාම හිතා ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දිව්‍ය ලෝකයට යන්න ඕනෑ නම් දැන් කථාව අවසාන කරමු.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු ඇමතිතුමනි, ඒ නිසා ඒ වාගේ වැඩ කරන්න එපා කියා ඔබතුමාට කියමින් මම නිහඬ වෙනවා.

[අ. භා. 1.43]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ඉතාම සන්තෝෂ වෙනවා අපේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සංවාදයට පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් සහභාගි වීම ගැන. අද ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයට ඉතාම වැදගත් දවසක්. මොකද, එක්සත් ජාතික පක්ෂයත්, ඒ වාගේම වෙනත් ආණ්ඩුත් කල් දමපු ඉහළ කොත්මලේ ව්‍යාපාරය අතිගරු ජනාධිපතිතුමා ආරම්භ කරලා, එහි කටයුතු අවසන් වෙලා දිය පුරවන දිනය අදයි. මෙගාවොට් 150ක ධාරිතාවක් ලබා ගැනීම වෙනුවෙන් ඒ දිය පුරවන දිනයේ අපේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව වාද කරන්න ලැබීම බොහෝ සතුටට කාරණයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පුරවන්න වතුර තිබෙනවාද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
වතුර තිබෙනවා. ඔබතුමා කලබල වෙන්න එපා. ඔබතුමා නාන්න යන්න එපා. ඔබතුමා වාඩි වෙලා ඉන්න කෝ.

අපි ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා, එදා අතහැර දමපු, පස්සට දමපු විදුලිබල ව්‍යාපෘති අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වුණාට පස්සේ එතුමා විසින් ආරම්භ කරන ලද බව. 1988දීයි මේ රටේ පළමුවැනි ගල් අඟුරු බලාගාරය හදන්න නියමිතව තිබුණේ. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාට ඒක කරන්න බැරි වුණා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියට ඒක කරන්න බැරි වුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඒක කරන්න බැරි වුණා. ඒ අනුව 1988 ඉඳන් වසර 2006 වෙන කල් මේ අර්බුදය ජනනය කරපු අය අද මෙතැනට ඇවිල්ලා කථා කිරීම ගැන අපි ඉතා කනගාටු වෙනවා.

මහවැලියෙන් හැදුවේ මෙගාවොට් 550යි. නමුත් අද අතිගරු ජනාධිපතිතුමා මුල් වෙලා පුත්තලම නොරොච්චෝලේ ව්‍යාපෘතිය මඟින් මෙගාවොට් 1,400ක නිෂ්පාදනයක් හදලා තිබෙනවා. කෙරවලපිටියෙන් මෙගාවොට් 300ක නිෂ්පාදනයක් හදලා තිබෙනවා. [බාධා කිරීම්] හදන්න යනවා, හදන්න යනවා. කලබල නැතුව ඉන්න. 2013 එනවා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්] ඉදිරියේ එනවා. කලබල නැතුව ඉන්න. [බාධා කිරීම්] කලබල නැතුව ඉන්න. මහවැලි ව්‍යාපාරය වාගේ තුන් ගුණයකටත් වඩා වැඩි විදුලිබල ධාරිතාවක් අතිගරු ජනාධිපතිතුමාගේ කාලවකවානුව තුළ -එතුමාගේ ඊ ළඟ ධුර කාලය තුළ- කෙරවලපිටියෙත්, පුත්තලමෙත් ඒ වාගේම සාම්පූර්වලත් ඇති වන බව පැහැදිලියි. ඒ නිසා පැරණි මහවැලිය ගැන කථා පැවැත්වීම ගැන අපි ඉතාම කනගාටු වෙනවා. ඒ වාගේම විදුලිය අද අත්‍යවශ්‍ය කාරණයක්. අපි ඒක පිළිගන්න ඕනෑ. විශේෂයෙන්ම රාත්‍රී 7ත්, 10ත් අතර මිනිසුන්ට ආලෝකය අවශ්‍යයි. ඒ වාගේම රූපවාහිනිය, ජංගම දුරකථන ආදී මිනිසුන්ගේ සන්නිවේදනය සඳහා අවශ්‍ය කාරණාත් අද විදුලියත් එක්ක ගැටගැහිලා තිබෙනවා. ඒක මූලික අවශ්‍යතාවක් හැටියට අපි පිළි අරගන්නවා.

විශේෂයෙන්ම රාත්‍රී 7ත්, 10ත් අතරේ ආලෝකය ලබා ගැනීමේ අයිතියත්, ඒ වාගේම සන්නිවේදනයට තිබෙන අයිතියත් මූලික මිනිස් අයිතියක් හැටියට මේ රජය පිළිගන්නවා. ඒක මූලික මිනිස් අයිතියක්. ඒක තමයි මේකේ පදනම. එතකොට අපේ ප්‍රමුඛතාව මොකක්ද? අපේ ප්‍රමුඛතා අංක එක අඛණ්ඩව විදුලිය සැපයීමයි. අඛණ්ඩව විසිහතර පැයම විදුලිය සැපයීමයි. මෙතැන කයිවාරු ගහනවා, 2002,2003 කාලයේ විදුලිය අඛණ්ඩව සපයන්න මෙගාවොට් 200ක් හැදුවායි කියලා. ඒකෙත් කථාව මම කියන්න ඕනෑ. ගරු කරු ජයසූරිය හිටපු ඇමතිතුමා ඉලක්ක කරගෙන නොවෙයි මම මේ කාරණය කියන්නේ. ඒ අවස්ථාවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා පත් කළා, චරිත රත්වත්තේ මැතිතුමාගේ මූලිකත්වයෙන් Energy Supply Committee එකක්. සියලුම නීති නතර කරලා අලුත් නීතියක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ටෙන්ඩර් පටිපාටියෙන් තොරව මෙගාවොට්100කට

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ටෙන්ඩර් කැඳවලා මෙගාවොට් 200ක් හැදුවා. එහෙම තමයි ඇඹිලිපිටිය බලාගාරය ආවේ. එහෙම තමයි ඒ ක්‍රියාදාමය සිද්ධ වුණේ. හැබැයි ඔය කියන යුගය ඒ විධියට කළුවරට තිත තියපු යුගයක් නොවෙයි. එක දිගටම විදුලි කප්පාදු සිද්ධ වුණා. 2009 මැයි මාසයේත් සිද්ධ වුණා. 2003ත් වුණා. 2004ත් වුණා. ඒ නිසා මේ හය මාසයෙන් මේක නැවැත්වූවාය කියන අසත්‍ය තවදුරටත් ප්‍රකාශ කරන්න එපා. ඒක අපි කවුරුත් පිළිගන්න ඕනෑ, අර්බුදයක්.

ගල් අඟුරු බලාගාරයක් හදන්න පමා කිරීම, මහවැලි ව්‍යාපාරයේ ඉතිරි බලාගාර හදන්න පමා කිරීම, දේශපාලන තීන්දු ගන්න බිය වීම, ඒ වාගේම පෞද්ගලික අංශයට විදුලි බලාගාර හදන්න දීලා ලංකා විදුලිබල මණ්ඩලය ඒ සඳහා මැදිහත් නොවීම කියන මේ කරුණු නිසා තමයි මේ අර්බුදය හට ගත්තේ. ඒ නිස අද අපට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ ඒ සියලුම දේශපාලන පව්වලටයි. ඒකට අනෙක් අයට ඇඟිල්ල දික් කරලා ඒ පව්වලින් ගැලවෙන්න බැහැ. අද අපි විදුලිය අඛණ්ඩව සපයන්න තව හේතුවක් තිබෙනවා. ඒක තමයි විදුලිය ලබා ගන්න ප්‍රමාණය වාගේ දහ ගුණයක ආර්ථික බලපෑමක් තිබෙනවා කියන එක. අද අපි ඉන්දියාව දිහා බැලුවොත් ගල් අඟුරු සැපයුමට බාධා ඇති වෙලා ඉන්දියාවේ අද විදුලිය කප්පාදු වෙනවා. හින්දු පුවත් පතේ සෑම දාම දෙවැනි පිටුවේ විදුලිය කප්පාදු වන ප්‍රදේශ ප්‍රමාණය දාලා තිබෙනවා. පාකිස්තානයේ පැය 16ක් විදුලිය කප්පාදු වෙනවා. බංග්ලාදේශය, නේපාලය වැනි මේ අවට කලාපයේ හැම රටකම වාගේ විදුලිය කප්පාදු වෙනවා. විසිහතර පැයම විදුලිය දෙන එකම රට අපේ රට පමණයි. ඒක අභියෝගයක්. ඒ අභියෝගය අනුව අපි ක්‍රියා කරගෙන යනවා.

ඒ වාගේම ආර්ථිකයට විදුලිය නැති වීමෙන් ඇති වන පාඩුව විදුලියේ ප්‍රමාණය වාගේ දහ ගුණයක්. අන්න ඒක නිසා තමයි විදුලිබල මණ්ඩලය පාඩුව විඳ ගෙන හරි අධික මිලකින් යුතු බලාගාර ක්‍රියාත්මක කරලා අපි විසිහතර පැයම විදුලිය ලබා දෙන්නේ. මොකද ආර්ථිකයට ඒකෙන් වන බලපෑම විදුලිය නැති වීමෙන් එන බලපෑම වාගේ දහ ගුණයක් නිසයි. ඒ වාගේම අපි කල්පනා කරන්න ඕනෑ, අතීතයේ මේ රටේ විදුලිය අඛණ්ඩව සැපයීමේ ප්‍රශ්නයක් තිබුණු බව. 1990 ගණන්වල නොවෙයි අපි ජීවත් වන්නේ. 1995 වෙන කල් සම්පූර්ණ ජල විදුලියෙන් මේ රටේ විදුලිබල අවශ්‍යතාව ඉටු කර ගත්තා. ඒ නිසා එදා ජල විදුලියෙන්ම විදුලිය දෙන්න පුළුවන් වුණා. අද මේ රටේ ජල විදුලි ප්‍රමාණය සියයට 30ක් පමණ ප්‍රමාණයකට සීමා වෙලා තිබෙනවා. 2020 වෙන කොට මේක සියයට 20ක් වාගේ ප්‍රමාණයකට සීමා වේවි. ඒ වාගේම වෙනත් විදුලි ප්‍රභවවලින් විදුලිය ලබා ගන්න අවශ්‍ය වේවි. ඒ නිසා ජලාශ පිරුණයි කියලා ඒකෙන් මුළුමනින්ම මේ රටට විදුලිය ලබා දීම පිළිබඳව තක්සේරුවකට එන්න බැහැ. ජලාශවල සම්පූර්ණ ධාරිතාවෙන් විදුලිය සැපයුවත් ඒක සෑහෙන්නේ දින 40කට පමණයි. ඒ නිසා විධිමත් කළමනාකරණ ව්‍යුහයක් ඇති කරලා තිබෙනවා. විදුලිය නිකුත් කිරීමට කිසිම දේශපාලන ඇඟිලි ගැසීමක් නැහැ. නිලධාරි මණ්ඩලයක් මඟිනුයි ඒක වෙන්නේ. මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කියන මේවා අනුවයි වෙන්නේ. මුලින්ම, ප්‍රමුඛතාව දෙන්නේ බීමට ගන්නා ජලයටයි.

දෙවනුව, වාරි මාර්ගවලටයි ප්‍රමුඛතාව දෙන්නේ. තුන්වනුව විදුලි බලය නිෂ්පාදනයටයි ප්‍රමුඛතාව දෙන්නේ. ඒ අනුව මහවැලියේ ගොවි අවශ්‍යතාවලට, ඒ වාගේම පානීය ජල අවශ්‍යතාවලට ජලය නිකුත් කරන එකට තමයි ප්‍රමුඛතාව දෙන්නේ. තුන්වන ප්‍රමුඛතාව තමයි විදුලි බලය නිෂ්පාදනය. අද අපට පොඩි ආතතිකාරී තත්ත්වයක් තිබෙනවා. මොකද, ඉතිහාසයේ පළමුවැනි වතාවට බරපතළ විධියට නිරිත දිග මෝසම් සුළඟ කඩාගෙන ආවා. ඒ වාගේම ඊසාන දිග මෝසම් සුළඟ ඇවිල්ලා තිබෙනවා. හැබැයි, විදුලිය කප්පාදුවක් නැහැ. ඔය කියන විධියේ අර්බුදයක් නැහැ. අපි කෙසේ හෝ විසිහතර පැයම විදුලිය දෙනවා. හැබැයි, අධික මිලට. නමුත් අපි ඒක අඛණ්ඩව ලබා දෙනවා. ඒ අනුව ඉදිරි කාලයේදී කාලගුණ විපර්යාසවලට මුහුණ දෙන්නට අපේ විදුලිබල පද්ධතිය සූදානම් කළ යුතුයි. අන්න ඒ සඳහා පුනර්ජනනීය බලය වුණත්, ජල බලය වුණත් ඒ ජල බලය මත යැපෙන්නේ නැතුව විදුලි පද්ධතිය පවත්වාගෙන යන්නට අවශ්‍ය කරන ධාරිතාව ගොඩනඟා ගන්න අපි දැන් මධ්‍ය කාලීන සැලසුමකට අනුව ක්‍රියා කරනවා. ඒ අනුව අපි ඉදිරි කාලයේදී, විශේෂයෙන්ම 2014 පමණ වන විට පුත්තලම බලාගාරයේ දෙවැනි අදියරේ ඉතිරි මෙගාවොට් 600ත් අපට එයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි ඊට සමාන්තරව පුනර්ජනනීය බලශක්තියත් ගොඩනඟා ගන්න බලාපොරොත්තු වෙනවා. මේ කියන තත්ත්වය සම්පූර්ණයෙන්ම පාලනය කරලා ඉදිරි දශකය තුළ ලංකාව බලාපොරොත්තු වන ආර්ථික ශක්තිය ඒ තුළින් ලබා ගන්න අපි කටයුතු කරන බව මේ අවස්ථාවේදී කිව යුතුයි. ඒ වාගේම කාලගුණයට යට නොවන විදුලිබල පද්ධතියක් ගොඩනඟා ගැනීම සඳහා මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් අපි දියත් කරන බව මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

අපේ දෙවැනි ප්‍රමුඛතාව වන "සැමට විදුලිය ලබා දීම" අපි ඉලක්කයක් හැටියට ගත්තා. 2016 දී තමයි සැමට විදුලිය ලබා දෙන්න නියමිතව තිබුණේ. 1980 දී මේ රටේ සියයට 9කටයි විදුලිය තිබුණේ. 1990 දී සියයට 30කට විදුලිය තිබුණා. ඒ වාගේම 2000 විට ඒක සියයට 65ක් වුණා. අද ඒක සියයට 92කට ඇවිල්ලා තිබෙනවා. ඉතින් ඒක ඉතාම සතුටුදායක තත්ත්වයක්. අපේ ඉලක්කය ලබන වසර වන විට සෑම ගමකටම විදුලි සැපයුම ළඟා කර දීමයි. ගරු කබීර් හෂීම් මැතිතුමා කිව්වා පහනක් දැල්වීම දිව්‍ය ලෝකයේ යන පිනක් කියලා. ඔව්, ගරු මැතිතුමනි. පසු ගිය 2010 ජුනි මාසයේ ඉඳලා 2011 නොවැම්බර් මාසය දක්වා පවුල් 314,994කට අපි විදුලිය දීලා තිබෙනවා. දිව්‍ය ලෝකයේ යන්න තරම් අපට ඒ පින ලැබිලා තිබෙනවා. ඔබතුමාගේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සෑම ගමකටම -අපි කෑගල්ලට ගියා- විදුලිය ළඟා කර දීමේ වැඩ පිළිවෙළ අපි ගෙනි යනවා. ඔබතුමාගේ ඇස් ඒක දකින්න පින් කරලා නොමැති වීම ගැන අපට පොඩ්ඩක් කනගාටු හිතෙනවා. ඒ වාගේම අපි ඉදිරි අවුරුද්දේ -2012 දී- තවත් පවුල් 300,000කට විදුලිය දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම විදුලිය ලබා ගන්න බැරි, ප්‍රධාන විදුලි ජාලය ගෙනි යන්න බැරි කඳුකර ප්‍රදේශවල, පරිසර සංවේදී ප්‍රදේශවල ජීවත් වන පවුල් 60,000ක් පමණ ජනතාව අපි හඳුනාගෙන තිබෙනවා. "ග්‍රාම ශක්ති" කියන වැඩ පිළිවෙළ යටතේ අපි ඒ පවුල් 60,000ටම ලබන වසරේ සිට සූර්ය බලයෙන්, කුඩා ජල විදුලි බලාගාර මඟින්, ඒ වාගේම සුළං බලයෙන් විදුලිය ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනවා. දැනටමත් පවුල් 120,000ක් පමණ මේ ක්‍රියාදාමයෙන් විදුලිය ලබා ගෙන තිබෙනවා.

නිවස ළඟ විදුලිය තිබුණත්, ආර්ථික තත්ත්වයෙන් බොහොම දුගී නිසා විදුලිය ළඟා කර ගන්න බැරි වුණු අය ඉන්නවා. ඒ අයට අපි සමෘද්ධි බැංකුවත් එක්ක එකතු වෙලා “විදුලි අත්වැල” නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වලා දුන්නා. මේ අවුරුද්දේ එයින් පමණක් පවුල් 24,000ක් සහනය ළඟා කර ගෙන අලුතින් විදුලි පද්ධතියට එකතු වෙලා තිබෙනවා. ඒ වාගේම වතුකරයේ ජනතාවට, වෙනත් ජන කණ්ඩායම් පදිංචි වෙලා ඉන්න ස්ථාන නිසා, ඒවාට ඔප්පු තිරප්පු නැති වීම නිසා විදුලිය ළඟා කර ගන්න බැරි වුණා. ඒ අයට විදුලිය ලබා ගැනීම සඳහා, ඒ තිබිච්ච සියලු නියෝග අපි ලිහිල් කළා. ඒ අනුව තවත් අතිරේක පවුල් ගණනාවකට, දස දහස් ගණනකට අද ඒ සහනය ලැබිලා තිබෙනවා. ඒ වාගේම විදුලිය නිසා අද රට බලාත්මක වෙලා තිබෙනවා. අපි දන්නවා, අද පවුල් -ගෘහස්ත ඒකක- 4,700,000ක් ලංකා විදුලිබල මණ්ඩලයේ ලෙකෝ ආයතනයෙන් විදුලිය ලබා ගන්නවා. ඒ නිසා 2010 දෙසැම්බර් වෙන කොට මේ රටේ පවුල්වලින් සියයට 91කට රූපවාහිනී යන්ත්‍ර තිබෙනවා, සියයට 81කට ගුවන් විදුලි යන්ත්‍ර තිබෙනවා. අද වෙන කොට මේ

තත්ත්වය තවත් වැඩි වෙලා. සියයට 71ක් ජනතාව අතේ ජංගම දුරකථන තිබෙනවා. සියයට 47කට සාමාන්‍ය දුරකථන තිබෙනවා. නිවෙස්වලින් සියයට 77කට විදුලි ඉස්තිරික්ක තිබෙනවා. නිවෙස්වලින් සියයට 41කට විදුලි පංකා තිබෙනවා. සියයට 45කට ශීතකරණ තිබෙනවා. අද ලංකාවේ පවුල් අතරින් සියයට 9කට පරිගණක යන්ත්‍ර තිබෙනවා. ඒ වාගේම සියයට 24කට DVD යන්ත්‍ර තිබෙනවා. අද සියයට 4ක් ජනතාව විද්‍යුත් තැපැල පාවිච්චි කරනවා. සමාජය, ගම් නියම් ගම් විදුලියත් එක්ක බලාත්මක වෙලා තිබෙනවා. ඒ තුළ ආර්ථිකය බලාත්මක වෙලා තිබෙනවා. ඒ බලාත්මක වීම ගැන අපි ඉතාම සතුටු වෙනවා.

කර්මාන්ත, වාණිජ අංශයේ ව්‍යාපාර 468,963ක් විදුලිය නිසා අද ක්‍රියාත්මක වෙනවා. අපි ගත්තොත් ප්‍රධාන ආයතන, -ඉහළ ශ්‍රේණියේ ආයතන- කර්මාන්ත 46,000ක් විදුලියෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා ගෘහස්ත පාරිභෝගිකයෝ විතරක් නොවෙයි, වාණිජ ක්ෂේත්‍රයේ, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ, ඒ වාගේම මහා පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ පාරිභෝගිකයන් පන්ලක්ෂයකට අධික ප්‍රමාණයක් අද විදුලිය නිසා බලාත්මක වෙලා තිබෙනවා.

මේ අනුව, රටේ ජාතික ආර්ථිකයෙන් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් අද සැපයෙන්නේ විදුලිය මඟින් අපි ඇති කර තිබෙන විප්ලවීය පරිවර්තනය නිසයි. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ලබන වසර අවසාන වෙනකොට විදුලියේ බලාත්මකභාවය තවදුරටත් අපේ ගම් නියම් ගම්වලට ගමන් කරාවිය කියා.

අපේ තුන්වන ප්‍රමුඛතාව තමයි විදුලියේ ගුණාත්මකභාවය නැංවීම. ඒ සඳහා කිසිම ආයෝජනයක් කරලා නැහැ; කිසිම වැඩ පිළිවෙළක් නැහැ කියා කිව්වා. ඒ සඳහා ලංකා ඉතිහාසයේ යෝධම ආයෝජනය අපි කරලා තිබෙනවා. මහවැලි ව්‍යාපාරයට බිලියන 50යි වැය වුණේ. අවුරුදු 25ක් තිස්සේ ඒ ණය ගෙවලා අද වනකොට තවත් බිලියන 60ක් ගෙවන්න තිබෙනවා. ඒ ගැන කතා කරනවා නම් වෙනම කතා කරන්න පුළුවන්. ඒ ගැන ඩෙනිස් ප්‍රනාන්දු මහතා ලියපු ලියවිල්ල කියවන්නය කියා මධ්‍යස්ථව කල්පනා කරන හැම දෙනෙකුටම මම කියනවා. මහවැලිය පිළිබඳව ඇත්ත මොකක්ද කියා ඒ තුළින් අවබෝධ කර ගන්න පුළුවන්. කොහොම වුණත් බිලියන 402ක සමස්ත ආයෝජනයක් අපි දැන් කරගෙන යනවා. එය අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ලංකා ඉතිහාසයේ විදුලි බල ක්ෂේත්‍රයේ කරපු යෝධම ආයෝජනයයි. එය මහවැලියට කළ ආයෝජනය වාගේ අට ගුණයක් වෙනවා.

ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ, විදුලි ජනනයේ, විදුලි සම්ප්‍රේෂණයේ, විදුලිය බෙදා හැරීමේදී ගමට විදුලිය දීමට අපි මහවැලිය වාගේ අට ගුණයක වියදමක් කර ගෙන යනවා. සමහර විට ඇතැම් පවුලකට විදුලිය දෙන්න අපි රුපියල් ලක්ෂ 5ක්, 6ක් පාවිච්චි කරනවා වෙන්න පුළුවන්. නමුත් අපි ඒ අයගෙන් අය කර ගන්නේ රුපියල් 12,000ක්, රුපියල් 15,000ක මුදලක් පමණයි. ඒ, සේවා ගාස්තුව වශයෙනුයි. ඉතින් ලාබ උපයන්න කතා කරන්නේ කොහොමද? රුපියල් ලක්ෂ 6ක්, 8ක් වියදම් කරලා රුපියල් 15,000ක් ලබා ගෙන ලාබ උපයන්නේ කොහොමද? අපි විදුලිබල මණ්ඩලයේ කටයුතු කර ගෙන යන්නේ ලාබ ඉපයීම සඳහා නොවෙයි. විදුලිබල මණ්ඩලය කටයුතු කරගෙන යන්නේ සේවාවක් සඳහායි; සේවාව ලබා දීම සඳහායි. වාණිජකරණය ඔළුවේ තියාගෙන, 2002දී පනත් ගෙනල්ලා විදුලිබල මණ්ඩලය වාණිජ පරමාර්ථ මත ගෙන යන්න උත්සාහ කළා වෙනුවට අද අපි මහ ජන සේවාවක් හැටියට විදුලිබල මණ්ඩලය කරගෙන යනවා, මේ තත්ත්වය පුළුල් කිරීම සඳහා. ඒ වාගේම මෙවර අය වැයෙන් රුපියල් බිලියන 34ක් වෙන් කර තිබෙනවා. ඊට අමතරව ලංකා විදුලිබල මණ්ඩලය බිලියන 13ක් තමන්ගේ අභ්‍යන්තර මුදල්වලින් මේ විදුලි පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සඳහා යොදවා තිබෙනවා. ඒ නිසා අපේ සම්ප්‍රේෂණ ජාලය, බෙදා හැරීම් ජාලය ශක්තිමත් කිරීම සඳහා ඉතිහාසයේ ලොකුම ආයෝජනය මේ රජය කර තිබෙනවාය කියන එක අපි ප්‍රකාශ කරන්න ඕනෑ.

අපේ තුන්වන ප්‍රමුඛතාව විදුලි පද්ධතිය කාර්යක්ෂම කිරීමයි. වතුර ආපු හින්දා විදුලිබල මණ්ඩලය ලාබ ලැබුවාය කියා හුඟ දෙනෙක් ප්‍රකාශ කළා. ඔව්, වතුරෙන් ලොකු සහනයක් ආවා. 1990 ගණන්වල සියයට 90ක්ම වතුරෙන් තමයි දිව්වේ. හැබැයි ක්‍රමක්‍රමයෙන් වතුර වෙනුවට තාප විදුලිය ගෙනෙන්න වුණා. දේශපාලන තීන්දු නොගත්තු සියලු දෙනාම ඒකට වග කියන්න ඕනෑ. කරු ජයසූරිය හිටපු ඇමතිතුමා කැබිනට් මණ්ඩලයට ගෙනාපු යෝජනාව අත්සන් කරන එක ප්‍රතික්ෂේප කරපු අගමැතිවරු අද මෙතැන කතා පවත්වනවා, "විදුලිබල මණ්ඩලය අකාර්යක්ෂමයි, අපේ ඒවා කාර්යක්ෂමයි" කියා. ඒ විධියේ දේශපාලන කතා පවත්වන්න එපා. මේ වගකීම කවුරුත් භාර ගත යුතුයි.

ලංකා විදුලිබල මණ්ඩලයේ වර්තමාන වියදම් ජලයේ ප්‍රශ්නයක් නිසා ඇති වුණු එකක් නොවෙයි. භාණ්ඩ මිල දී ගැනීමේදී ඒ වාගේම වෙනත් වියදම් කිරීමේදී , විදුලිය හානිය පාලනය කිරීමේදී අපට පුළුවන් වෙලා තිබෙනවා, 2010 වසරේ මිලියන13,484ක් ඉතුරු කරන්න. මිලියන 5,000ක ලාබයකට ළඟා වෙන්නට අපට පුළුවන් වුණේ, මේ මිලියන 13, 484 ඉතුරු කර ගන්න පුළුවන් වුණේ වර්ෂාව ලැබුණු නිසා නොවෙයි. භාණ්ඩ මිල දී ගැනීමේදී, ඒ වාගේම අනිකුත් කාරණාවලදී, කාර්යක්ෂමව වැඩ පිළිවෙළක් ඇති කරලා ඉතුරු කරපු නිසයි. ඒ වාගේම මේ වසරේ ඔක්තෝබර් මාසය වනකොට අපට පුළුවන් වෙලා තිබෙනවා, මිලියන 8,456ක් ඒ ආකාරයට ඉතුරු කරන්න. ඒ තමයි කාර්යක්ෂම පාලනය කියන්නේ. එහෙම නැතිව වතුර එනකොට ඉබේට ලාබ උපයන ආයතනයක් නොවෙයි, ලංකා විදුලිබල මණ්ඩලය කියන්නේ. සියලු දෙනාගේම සහයෝගයෙන් අපි අද ඒක පරිවර්තනය කරගෙන යනවා. දේශීය ඉංජිනේරුවන් ගැන විශ්වාසයෙන් යුතුව අපි අද ඒක කරගෙන යනවා. ඒ අනුව අපි සාර්ථකව ඒ ඉතුරුම් කර තිබෙන බව ප්‍රකාශ කරන්න ඕනෑ.

විදුලිය හානිය ගැනත් කියන්න ඕනෑ. අපේ රට විදුලි හානිය සියයට 24ක, 25ක් තිබිච්ච රටක්. 2009දී මේක සියයට 14.67ක මට්ටමේයි තිබුණේ. 2010 අග වනකොට අපි ඒක සියයට 13.35කට ගෙනාවා. එතැනින් විතරක් ඉතිරි කරපු ප්‍රමාණය රුපියල් බිලියන 2ක් වුණා. ඒ වාගේම 2015 වනකොට ඒක සියයට 9ක තනි ඉලක්කමක් දක්වා ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා. LECO බල ප්‍රදේශවල දැනටමත් මේ විදුලි හානිය සියයට 6 ක්, 7ක් ප්‍රමාණයක් දක්වා ගෙනල්ලා තිබෙනවා.

විශේෂයෙන්ම අනවසරයෙන් විදුලිය ලබා ගැනීම උතුර, නැඟෙනහිර සහ අනික් පළාත්වල තවමත් කෙරීගෙන යනවා. දැන් අපි ඒ තත්ත්වය පාලනය කරගෙන යනවා. මොකද යුද්ධයෙන් පසුව අපි ඒ සහන කාලය අවසන් කරලා අපි ඒක දැන් පාලනය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ ප්‍රදේශවලත් දැන් අපි ඒ කටයුතු කරගෙන යනවා. ඒ අනුව මෙතැනින් ඉදිරියට යන්න අපි බලාපොරොත්තු වෙනවා.

හදිසි වැටලීම් පිළිබඳව කතා කරනකොට 2009 ජූනි මාසය වනතෙක්, මේ නව පනත එනතෙක් හදිසි වැටලීම් 2492ක් තමයි කෙරුණේ. නමුත් පනත පිළිබඳව පොඩි නීතිමය ප්‍රශ්නයක් ආවා. අපි නීතිපතිතුමාගෙන් ඒ ගැන විමසීමක් කරලා 2010 ජූනි මාසයේ සිට නැවතත් හදිසි වැටලීම් පටන් ගත්තා. 2010 ජූනි වල සිට 2011 නොවැම්බර් දක්වා ප්‍රාදේශීය වශයෙන් නොවෙයි, මූලස්ථානයෙන් පමණක් වැටලීම් 8,452ක් කරලා තිබෙනවා. එමඟින් උපයපු මුදල රුපියල් මිලියන 236ක්. එහෙම නම් අපට පෙනෙනවා විදුලිබල මණ්ඩලය වතුරවලින් -ඉබේ- කාර්යක්ෂම වුණේ නැහැයි

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

කියලා. මෙවැනි තීරණාත්මක ක්‍රියා මාර්ග තුළින් තමයි අපට මේ ආයතනය ගොඩ නඟන්න පුළුවන් වුණේ.

මේ හුඟ දෙනෙක් ලෙකෝ ආයතනය ගැන කථා කළා. ලෙකෝ ආයතනය අපි සහමුලින්ම වෙනස් කළා. 2009 ලෙකෝ ආයතනය ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් වුණා. පාඩු ලබන තත්ත්වයට පත් වෙලා තිබුණු, ඒ වාගේම වැරදි ආයෝජන සඳහා යොමු වී තිබුණු ලෙකෝ ආයතනය ගොඩ ගන්නට අපට හැකි වෙලා තිබෙනවා. ඒක සිදු වෙලා තිබෙන්නේ වතුරවලින්වත්, දේශපාලන ඇඟිලි ගැසීම්වලින්වත් නොවෙයි. පාලනය කාර්යක්ෂම කිරීම නිසායි. ඒ දේශපාලන වියගහෙන් මුදා ගැනීම නිසා ලෙකෝ ආයතනයට පළමු වැනි මාස නවය තුළ රුපියල් බිලියනයක ලාභයක් ළඟා කර ගන්න හැකියාව ලැබුණා. සමහර රාජ්‍ය ආයතන පාඩු ලබන කොට ඒ ගැන පත්තරවල පොල් ගෙඩි අකුරෙන් පළ වනවා. හැබැයි, වැටිච්ච ආයතනය ගොඩ අර ගෙන ලාභ ලබන කොට ඒවා වාර්තා වන්නේත් අඩුවෙන්. කමක් නැහැ, ඇද වැටුණු රාජ්‍ය ආයතනයක්, - විශේෂයෙන්ම වැදගත් ආයතනයක්- නැවත ගොඩ නඟා ගන්නේ කොහොමද කියලා අපි ඒ ආයතනයෙන් ආදර්ශයක් ලබා දී තිබෙනවා.

විදුලි බිල ගැන මේ හුඟ දෙනෙක් කථා කළා. ඇත්තටම ජල විදුලියෙන් විදුලිය දුවන කාලයේ විදුලි ඒකකයක් ඉතාම අඩු මිලටයි අපට ලැබුණේ. 1970 දී විදුලි ඒකකයක් සඳහා වියදම ශත 10යි. විකුණුවේ ශත 15කටයි. 1980 දී විදුලි ඒකකයකට වියදම් වුණේ ශත 42යි. වික්කේ ශත 59කටයි. 1991 දී විදුලි ඒකකයකට වියදම් වුණේ රුපියල් 1.70යි. ඒක වික්කේ රුපියල් 2.10කටයි. ජල විදුලියෙන් නිපදවන යුගයේ අන්න එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. නමුත් තාප විදුලිය ආවාට පස්සේ ඒ තත්ත්වය වෙනස් වුණා. ඒ තත්ත්වය වෙනස් වෙලා තාප බලයෙන් විදුලිය නිපදවන්න ගියාම විශාල වියදමක් දරන්න සිද්ධ වුණා. යම්කිසි සහන තත්ත්වයක් යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් තෙල් ලබා දෙන ගමන්ම තමයි අපට ඒ වියදම දරන්න සිද්ධ වුණේ. එහෙත් අපට මේ පාඩු ළඟා කර ගන්න සිද්ධ වුණා. ඒ තත්ත්වය තිබෙද්දීත් අද විදුලි බිල පිළිබඳව අපේ ප්‍රතිපත්තිය මොකක්ද? ඒකක 30 දක්වා අඩු කරනවා කියලා මම ප්‍රකාශ කර තිබුණාය කියා ඇතැම් පුවත් පත් වාර්තා කර තිබුණා. ඒකක 30 දක්වා සහනය දෙන එක තමයි පැවතුණු ප්‍රතිපත්තිය. අපි ඒ ප්‍රතිපත්තිය වෙනස් කරලා තිබෙනවා.

අපි සෑම පාරිභෝගිකයාටම -ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලෙකෝ ආයතනයේ පාරිභෝගිකයන් 50,00,000ටම- ජල විදුලියේ සහනය ලබා දෙනවා. ඒ වාගේම මහ ජන උපයෝගිතා කොමිසම කොළඹ විශ්වවිද්‍යාලයේ කරපු සමීක්ෂණයකින් පෙනී ගිහින් තිබෙනවා, 2005 දී තමන්ගේ ආදායමින් සියයට 7ක් විදුලියට සහ ඉන්ධනවලට, විශේෂයෙන්ම භූමිතෙල්වලට වියදම් කරපු පවුල් අද ඒ සඳහා වැය කරන්නේ තමන්ගේ ආදායමින් සියයට 4යි කියලා. අද භූමිතෙල් වෙනුවට සෑම ගමකටම විදුලිය ලැබිලා තිබෙනවා. භූමිතෙල්වලින් විදුලි ඒකකයක් හදන්න රුපියල් 40ක් යනවා. නමුත් අද ඒ දුප්පත් ගැමියන්ට විදුලි ඒකකයක් ලැබෙන්නේ රුපියල් 3.00කටයි. එහෙම නම් රුපියල් 40ක් යන විදුලි ඒකකයක් වෙනුවට රුපියල් 3.00කට විදුලි ඒකකය දීම නිසා ජනතාවගේ ආදායමේ ප්‍රතිශතයක් හැටියට සියයට 7ක් වියදම් කරපු එක අද සියයට 4ට අඩු වෙලා තිබෙනවා. මේ 2005-2011 අතර කාලය ඇතුළත ලංකාවේ ඒකපුද්ගල ආදායම සියයට 118කින් වැඩි වෙලා තිබෙනවා. ඒකපුද්ගල ආදායම වැඩිවෙද්දී විදුලියට වියදම් කරපු ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් අඩු වෙලා තිබෙනවා. ඒ ගැනත් අපි සඳහන් කරන්න ඕනෑ.

විදුලි බිල ගැන හුඟ දෙනෙක් කථා කරනවා. හැබැයි, 2008 දී සාමාන්‍යයෙන් ඒකකයක විකුණුම් මිල රුපියල් 13.22යි. 2011දී ඒකකයක සාමාන්‍ය මිල රුපියල් 13.35යි. සියයට 1ක වෙනසක් විතරයි තිබෙන්නේ. නමුත් මේ කාලය ඇතුළත ඒකපුද්ගල ආදායම සියයට 32කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම 2008 සිට 2011 දක්වා ඒකක 90කට අඩුවෙන් පාවිච්චි කරන විදුලි පාරිභෝගිකයන්ගේ විදුලි බිල වැඩි වෙලා නැහැ. 2008 සි 2011 දක්වා අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ගැන බලන කොට වැඩි නොවුණු එකම දේ විදුලිය පමණයි. එතකොට මේ ඒකක 90ට යටින් මේ රටේ කී දෙනෙක් ඉන්නවාද? මේ රටේ විදුලි පාරිභෝගිකයන්ගෙන් සියයට 78ක් ඉන්නේ ඒකක 90ට අඩුවෙන් පාවිච්චි කරන අයයි. 2008 සිට අද දක්වා අන්න ඒ අයට අපි මේ සහනය ළඟා කර දී තිබෙනවා. හෙට දිනයේදීත් ඒ සහනය ඒ අයට ලැබෙන බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ.

අපේ විදුලි බිල් ප්‍රතිපත්තියේ ප්‍රධානතම කාරණය දුප්පත්ම ජන කණ්ඩායම රැක ගැනීමයි. කොළඹ විශ්වවිද්‍යාලය කරපු සමීක්ෂණයෙන් පෙන්වා දී තිබෙනවා, තමන්ගේ ආදායමින් සියයට 10කට වඩා වැඩියෙන් විදුලියට වැය කරනවා නම් ඒ ජනතාවට ඒක දරා ගන්න බැහැයි කියලා. එවැනි ඉතාම දුප්පත් ජන කණ්ඩායමකුත් අපේ රටේ ඉන්නවා. ඒ ජන කණ්ඩායමත් අපි ආරක්ෂා කර ගත යුතුයි. ඒ අයට ඒ සහනය ළඟා කර දිය යුතුයි. ඒ වාගේම රාජ්‍ය ආයතන, පොදු ආයතන, අපනයනය සඳහා කටයුතු කරන කර්මාන්තකරුවෝ ආදී හැම කෙනකුටම ඒ විදුලියේ සහනය ළඟා කර දී තිබෙනවා. සමහර අය නිරන්තරයෙන් කථා කරන්නේ ආසියාවේ ලොකුම විදුලි බිල තිබෙන්නේ අපේ රටේ කියලායි. ඒක සම්පූර්ණ අසත්‍යයක්. මේ කලාපයේ පැය විසි හතරම විදුලිය තිබෙන එකම රට අප රටයි. වාණිජ පරමාර්ථ මත විදුලිය සපයන රටවල් තිබෙනවා. ඉන්දියාවේ විදුලිය සපයන්නේ වාණිජ පරමාර්ථ මතයි. විනාඩි 15න් 15ට විදුලි බිල වෙනස් වෙනවා. විනාඩි 15න් 15ට ගිහිල්ලා විදුලිය මිලදී ගන්න පුළුවන් වාණිජ පරමාර්ථ මතයි ඒක යන්නේ. අනෙක් රටවලත් එහෙමයි. වාණිජ පරමාර්ථ මත නැතිව විදුලිය ගෙන යන මේ කලාපයේ තිබෙන එකම රට අපේ රට පමණයි කියන එකත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ.

අපි විශේෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ, ඉදිරියේ දී මේ විදුලිබල පද්ධතිය නූතන තාක්ෂණයේ ක්‍රමවේදයන්ට අනුකූලව වෙනස් කරන්නට, නවීකරණය කරන්නට බලාපොරොත්තු වනවාය කියා. අපි පිළිගන්නට ඕනෑ, අපේ විදුලිබල පද්ධතිය නවීකරණය වුණේ නැහැ කියන එක. ඒ නිසා අපි මේ විදුලිබල පද්ධතිය නවීකරණය කරන්නට විශේෂයෙන්ම සුහුරු පද්ධතියක් - smart grid එකක්- ඇති කරන්න අවශ්‍ය වටපිටාව දැන් ගොඩ නඟා ගෙන යනවා. විශේෂයෙන්ම ස්වයංක්‍රීය ජාල පද්ධතියක් ඇති කරන්නට අපි ක්‍රියා කරනවා. ස්වයංක්‍රීය ජාල පද්ධතියක් ඇති වුණාම කාටවත් චෝදනා කරන්නට බැහැ. ඉස්සර කිව්වේ විදුලිය නිපදවන්නේ නැතිව වතුර ටික නිකම් යවලා කියලායි. දැන් කියනවා වතුර වැඩියෙන් ගහලා කියලා. ඔය චෝදනා කිසිවක් එන්නේ නැති ආකාරයට ස්වයංක්‍රීය පාලන පද්ධතියක් ඇති කරන්නට අපි කටයුතු කරනවා. අපි හිතනවා, 2014 වන කොට ඒ ස්වයංක්‍රීය පාලන පද්ධතිය අපිට පැලවත්තේ ඇති කරන්නට පුළුවන් වෙයි කියලා.

සෑම කෙනෙකුටම පරිපූර්ණ, ස්වයංක්‍රීය විදුලි මීටරයක් ලබා කර දීමේ වැඩ පිළිවෙළක් දැන් අපි දියත් කර තිබෙනවා. අපි ඒකට කියනවා smart meter කියලා. අපි ඒක මාදිවෙලින් ආරම්භ කරන්නට බලාපොරොත්තු වනවා. ඒ මඟින් විදුලි බලයත් එක්ක තමන්ට පෙර ගෙවුම් සේවාවක් ලබා කර ගන්නට පුළුවන්. ඒ වාගේම තමන්ගේ පරිගණකය තුළින් විදුලි බලය සඳහා කටයුතු කරන්නට පුළුවන්. ජනතාව එක්ක සම්බන්ධ වෙලා විදුලිය සංරක්ෂණයට යොමු කරන්නට පුළුවන් විධියේ ස්වයංක්‍රීය තත්ත්වයක් ඇති කරන්නට අපි බලාපොරොත්තු වනවා.

ලංකා විදුලිබල මණ්ඩලය තුළ, LECO ආයතනය තුළ අපි අද වන කොට කාර්යක්ෂමතා කඩඉම් ක්‍රියා මාර්ග ගණනාවක්

අරගෙන තිබෙනවා. අපේ තිබෙන ඩිපෝවලට අපි 5S සංකල්පය ගෙනැල්ලා, අද ඒ තුළින් මුදල් ඉතිරි කිරීමක් කර ගෙන යනවා. අද අපේ ඩිපෝවලට ගිහිල්ලා බලන්න කියලා අපි සියලු දෙනාටම ආරාධනා කරනවා. අද ඒ ඩිපෝවල වෙනසක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම පාරිභෝගික මධ්‍යස්ථානවල වෙනසක් අපි ඇති කරලා තිබෙනවා. ප්‍රධාන නගරවල e-city කියන සංකල්පය ගෙනැල්ලා ඉතාම විධිමත් මහ ජන සේවයක් ළඟා කර දීමේ ක්‍රියා දාමයක් අපි දියත් කරලා තිබෙනවා. මේ විධියට අපි ජාත්‍යන්තර සම්මතවලට අනුකූල වන ආකාරයේ විදුලිබල පද්ධතියක් ඇති කර ගෙන යනවා.

විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණ අමාත්‍යාංශයෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ආයතනය බවට අද ලංකා විදුලිබල මණ්ඩලයත්, LECO ආයතනයත් පත් වෙලා තිබෙන බව ප්‍රකාශ කරන්නට ඕනෑ. ඒ වාගේම තුලිත කාඩ්පත් ක්‍රමය - balanced scorecard එක - හඳුන්වා දීපු පළමුවැනි රාජ්‍ය ආයතනය බවට විදුලිබල මණ්ඩලය පත් වෙලා තිබෙනවා. මූල්‍යමය තත්ත්වය, පාරිභෝගික අවශ්‍යතාව, සේවක අභ්‍යන්තර දියුණුව සහ මණ්ඩලය තුළ තාක්ෂණික, වාණිජ සැලැස්මට අනුකූලව තිබෙන ඉලක්ක සපුරා ගැනීම කියන මේ කරුණු හතර එකට අරගෙන මණ්ඩලයේ කාර්යක්ෂමතාව මැන බලන විධියේ ක්‍රියා දාමයක් අපි පළමුවැනි වතාවට ලංකා විදුලිබල මණ්ඩලයට හඳුන්වා දුන්නා. එය LECO ආයතනයටත් හඳුන්වා දෙන්නට බලාපොරොත්තු වනවා. ඒ තුළින් මේ ආයතන තුළ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීමට, අභ්‍යන්තර පොහොය කිරීමකට එහි කළමනාකරුවන්ට හැකියාව ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.

අපේ අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන, උදාහරණයක් හැටියට ගත්තොත් පරමාණු බලශක්ති ආයතනය නියාමන කොමිසමක් හැටියට නොවෙයි, අපි අද වන කොට සංවර්ධන ක්‍රියා දාමයකට ගෙනැවිත් තිබෙනවා. කැලණියේ අපි ඇති කරලා තිබෙනවා NDT ආයතනයක්. ඒ කියන්නේ කිසිම දෙයක් විනාශ කරන්නේ නැතිව යම් යම් දේවල් සොයා බැලීමේ තාක්ෂණය අපි හඳුන්වා දීලා තිබෙනවා. ඒ අනුව පාලම්, පාරවල්, ගොඩනැගිලි ආදියෙහි යම් යම් සිදුරු තිබෙනවාද, බිඳවැටීම් තිබෙනවාද කියලා සොයා ගන්න ඒ තාක්ෂණය අපි ගෙනාවා. ඒ නිසාම බොහෝ විනාශයන් සිදු වෙච්ච අර සමනල වැව ව්‍යාපාරය වාගේ ඒවායේ තිබුණු ඒ කාන්දුව අපේ දේශීය විද්‍යාඥයින්ටම සොයා ගන්නට පුළුවන්කම ලැබුණු බව මේ අවස්ථාවේ දී මා ප්‍රකාශ කරන්නට ඕනෑ. මහවැලි ව්‍යාපාරය ඇති කර තිබුණු සෑම දෙයක්ම විදේශික උපදේශකයන්ට දෙන සම්ප්‍රදාය බිඳලා ඒ ක්‍රියාදාමය තුළ දේශීය ශක්තිය පාවිච්චි කරලා ඒ කාන්දුව සොයා ගන්න, බිලියන ගණනක් වියදම් කරලාත් කර ගන්නට බැරි වෙච්ච දේවල් කර ගන්න දේශීය ඉංජිනේරුවන්ට හැකියාව ලැබුණා.

විශේෂයෙන්ම සෞඛ්‍ය ක්‍රමවේද සඳහා විෂබීජහරණයට අපි අලුත් ක්‍රියා මාර්ගයක් දැන් යෝජනා කරලා තිබෙනවා. ඒකත් අපි බියගම ස්ථාපනය කරලා තිබෙනවා, අපේ පරමාණු බලශක්ති අධිකාරිය යටතේ. මේ ආකාරයට න්‍යෂ්ටික විද්‍යාවේ තිබෙන අලුත් අත්හදා බැලීම්, අලුත් ක්‍රියා මාර්ග, විද්‍යාත්මක දැනුම අපි හඳුන්වා දීලා තිබෙනවා.

අපේ අනාගතය තමයි පුනර්ජනනීය බලශක්තිය. පසු ගිය කාලයේ ඩර්බන් සමුළුව පැවැත්වුණා. 2020 ඉඳලා ගල් අඟුරුවලට, තෙල්වලට සම්බාධක පැනවෙනවා, කාබන් නිකුත් කිරීමට එරෙහිව. ඒ නිසා අපි පුනර්ජනනීය බලශක්තිය වන සූර්ය බලය, සුළං බලය, කුඩා ජල විදුලිය, ජීව ඉන්ධන, ඒ වාගේම භූ තාපය, සාගර ජලයෙන් විදුලිය නිපදවීම යන මේවා තමයි අපේ අනාගතය; අපේ දරුවන්ගේ අනාගතය. ඒ සඳහාම අපේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය විධිමත් වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවා. අපිට විශාල සුළං ශක්තියක් තිබෙනවා. ඒවා උකහා ගැනීම සඳහා යෝධ වැඩ පිළිවෙළක් අපි දියත් කරනවා.

ලංකාවේ අපේම ඉංජිනේරුවන්ගේ ශක්තියෙන් අපි සමාගමක් ඇති කළා මේ සුළං බලය උකහා ගන්න. ඒ අනුව පළමුවැනි සුළං බලශක්ති උද්‍යානය මන්නාරමේ ඉදි කරන්න අපි බලාපොරොත්තු වනවා. 2020 වන කොට අපේ මේ බලශක්තියට මෙගාවොට් 650ක් එකතු කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පළමුවැනි සූර්ය බලශක්ති උද්‍යානය අද හම්බන්තොට සූරියවැව ප්‍රදේශයේ ඉදි කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා ඒක මෙගාවොට් 100 දක්වා ගෙන යන්න. මේවා ඉතිහාසයේ කාලයක් තිස්සේ කල්පනා කර කර, කථා කර කර හිටපු දේවල්. අද ඒවා මහ පොළොවේ ක්‍රියාත්මක කරලා තිබෙනවා.

සෑම කෙනකුටම තමන්ගේ නිවසේ සූර්ය බලය නිපදවා විදුලිබල මණ්ඩලයට විකුණන්නත්, තමන්ට අවශ්‍ය වේලාවට විදුලිබල මණ්ඩලයෙන් මිලදී ගන්නත් පුළුවන් net metering ක්‍රමයක් අපි අද හඳුන්වා දී තිබෙනවා. ලෝකයේ නව තාක්ෂණය අනුව පුනර්ජනනීය බලශක්තිය වැඩියෙන් පාවිච්චි කරන්න පුළුවන් සෑම අංගෝපාංගයක් දෙසටම ඒ කියන්නේ හරිත බලශක්තිය ගොඩ නඟන දෙසට, අපේ අනාගතය ගොඩ නඟන දෙසට අපි මේ කටයුතු කර තිබෙන බව ප්‍රකාශ කළ යුතුයි.

මේ අවස්ථාවේදී අපි කියන්න ඕනෑ, ලංකා විදුලිබල මණ්ඩලයේ ලාභ අලාභ පොත දිහා බලලා විදුලිබල මණ්ඩලයේ කාර්යයවත්, ලෙකෝ ආයතනයේ කාර්යයවත් තක්සේරු කරන්න බැහැ කියන එක. මේ විදුලිබල මණ්ඩලය කර්මාන්තකරුවන්ට යෝධ සහනයක් දෙනවා. ඒ වාගේම පාරිභෝගිකයාට යෝධ සහනයක් දෙනවා. සමාජයේ කර්මාන්ත සේවා පන්ලක්ෂයක් අද මේ විදුලිබල මණ්ඩලයෙන් සහනය ලබා ගන්නවා. විදුලිබල මණ්ඩලය යම් පාඩුවක් උපයනවා නම් ඒ පාඩුව දස ගුණයක ලාභයක් බවට පත් වෙලා සමාජයේ මේ විවිධ ආයතන ඒවා පරිභෝජනය කරනවා. ඒ නිසා තමයි මේක අපි සේවාවක් හැටියට ගෙන යන්නේ. හැබැයි අපි සේවාවක් හැටියට මෙය ගෙන යනවා කියලා මේ මණ්ඩලය අකාර්යක්ෂමව පවත්වා ගෙන යන්න අදහසක් නැහැ. කාර්යක්ෂමව පවත්වා ගෙන යන්නයි අපි බලාපොරොත්තු වන්නේ. එතැනදී ඔය දේශපාලන ඇනකොටා ගැනීම්, මඩ ගැසීම් නැතිව සාධාරණ විවේචන භාර අරගෙන ඒ අනුව කටයුතු කරන්නටත් අපි සූදානම් බව ප්‍රකාශ කරන්නට ඕනෑ.

ඉතිහාසයේ පළමුවැනි වතාවට පසු ගිය දිනවල ඉතාම බරපතළ විධියේ වැසි කඩා වැටීමක් ඇති වුණා. නිරිතදිග මෝසම් සුළං කඩා වැටුණත්, ඊසානදිග මෝසම් සුළං කඩා වැටුණත් අඛණ්ඩව විදුලිය සපයන්නට අපට හැකියාව ලැබුණේ අතිගරු ජනාධිපතිතුමා ගත්ත නිර්භීත තීන්දු නිසායි. හුඟ දෙනෙක් නොරොච්චෝලේ බලාගාරය ගැන කථා කළා. ඒක අලුත් බලාගාරයක්, අලුත් අත් දැකීමක්. ඒ අලුත් අත් දැකීමක් සහිත ආයතනය අපේ දේශීය ඉංජිනේරුවන් පසු ගිය සැප්තැම්බර් මාසයේ ඉඳන් භාර අරගෙන කටයුතු කරනවා. එහි තිබෙන ආබාධ ආදිය විසඳා ගැනීම සඳහා අවුරුද්දක් චීනයේ සමාගමකට භාරව තිබෙනවා. ඒ අවුරුද්දෙන් පස්සේ ඒ ගොල්ලන් සම්පූර්ණයෙන් එයින් ඉවත් වෙලා යනවා ඇති. ඒ කාලය ඇතුළත අපේ ඇත්තන් විසින්, අපේ ඉංජිනේරු මහත්වරු විසින් ඒ අත්

[ගරු පායිලී චම්පික රණවක මහතා]

දැකීම අතට අරගෙන ඊට පසු නොරොච්චෝලේ බලාගාරයේ පළමුවැනි පියවරත්, ඊළඟ පියවරවලුත් කර ගෙන යනවා ඇති.

ඒ අනුව ඉදිරියේදී මේ අභියෝග ජය ගනිමින්, අවශ්‍ය විදුලි ප්‍රමාණය ළඟා කර දෙමින්, මේ රටට දූෂණයෙන්, වංචාවෙන්, අගතියෙන් තොර කාර්යක්ෂම පාලනයක් ළඟා කර දීමට අපේ අමාත්‍යාංශයේ සියලුම ආයතන කටයුතු කරන බවත්, විශේෂයෙන්ම මේ රටේ විදුලිය නැතිව දහ දුක් විඳින ඉතිරි පවුල් හාරලක්ෂ පණස්දහසකට ආසන්න පිරිසට විදුලිය ළඟා කර දීම සඳහා ඉදිරි වසර තුළ අප සියලු දෙනාගේම අධිෂ්ඨානය කැප වීම පළ කරන බවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

[අ. භා. 2.13]

**ගරු පී. හැරිසන් මහතා**
**(மாண்புமிகு பீ. ஹரிசன்)**
**(The Hon. P. Harrison)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතුවා අපේ ගරු විදුලිබල ඇමතිතුමා මන්ත්‍රීවරුන්ගේ කථාවලින් පස්සේ කථා කරාවි කියලා. කොහොම වුණත් එතුමාගේ අදහස් ටික එතුමා පළමුවෙන් ප්‍රකාශ කෙරුවා. පසු ගිය වකාවලදී විදුලිබල අමාත්‍යාංශය ලාභ ලබන්න ප්‍රධානම හේතුව වුණේ ජල විදුලි බලය නොවෙයි කියන එක පුන පුනා මතක් කරන්න එතුමා උත්සාහ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ දීර්ඝ කාලයක් විදුලිබල ඇමතිවරයාව සිටි ගරු පී. දයාරත්න ඇමතිතුමා මෙතැන ඉන්නවා. එදා දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා හැටියට මුදල් අමාත්‍යාංශය තියා ගත්තේ නැහැ. එතුමා අතට ගත්තේ විදුලිබල අමාත්‍යාංශය. එහි සම්පූර්ණ කාර්ය භාරය දුන්නේ අපේ ගරු දයාරත්න ඇමතිතුමාට. එතුමා විශාල කැප වීමක් කරලා විශාල උනන්දුවකින්, ලොකු වග කීමකින් ඒ වැඩේ ඉස්සරහට අරගෙන ගියා. ඒ නිසා අපට අද මේ රටේ විදුලියේ ඉතිහාසය ගැන ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විදුලිබල ඇමතිතුමා කිව්වා නොරොච්චෝලේ විදුලි බලාගාරය ආරම්භ කරපුවාම ජල විදුලි බලය මොකක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නොරොච්චෝලේ ගැන හිතන්න කලිනුයි ජල විදුලි බලය ගැන හිතුවේ. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ වික්ටෝරියා ජලාශය, කොත්මලේ, රන්දෙනිගල, රන්ටැඹේ ජලාශ හැදුවේ නැත්නම් අපිට නොරොච්චෝලේ ගැන හිතන්න අමාරුයි තවම. විශේෂයෙන්ම අපේ ගරු පායිලී චම්පික රණවක ඇමතිතුමා දස සිල් රකින කෙනකු හැටියට -අපි නම් පන්සිල්. එතුමා දස සිල්- අසත්‍ය කියන්නේ නැහැයි කියලා මා විශ්වාස කරනවා. එතුමා හැම වෙලාවේම උත්සාහ කළේ, මොකද, මා අලුත් පොතකින් - [බාධා කිරීමක්] මයික් එක නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ මේ "දීපදෝ හෝති චක්ඛුදෝ" කියන පොත එතුමා හැම තැනකටම බෙදා හැරියා. එතුමාගේ පොතේ සඳහන් කර තිබෙන, එතුමා අත් කර ගත්ත ලාභය ගැන මා විශේෂයෙන් මතක් කරන්නම්. එතුමා හැම වෙලාවේම උත්සාහ කරනවා, පායිලී චම්පික රණවක ඇමතිතුමා ආවාට පස්සේ තමයි මේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලොකු පෙරළියක් ඇති කළේ කියලා කියන්න. මා කියන්නේ එතුමාගේ වචනවලින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පොතේ එතුමා සඳහන් කරලා තිබෙනවා, "2010 වර්ෂයේ දස වැදෑරුම් වැඩ පිළිවෙළ හඳුන්වා දීමට පෙර 2010 ජනවාරි මාසයේ 01වන දා සිට මැයි 31වන දා දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව රුපියල් මිලියන 3,043යි." කියලා. මේ, 2010 වර්ෂයේ ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා විදුලිබල හා බලශක්ති ඇමති වශයෙන් හිටපු කාලයේ සිදු වී තිබෙන රුපියල් මිලියන තුන්දහස් ගණනක පාඩුවයි.

පායිලී චම්පික රණවක ඇමතිතුමා ප්‍රාතිහාර්යයක් පාලා තිබෙනවා. මොකද, එතුමා දස සිල් රකින කෙනකු හැටියට ප්‍රාතිහාර්යය පෑවේ කොහොමද? දස වැදෑරුම් වැඩ පිළිවෙළ හඳුන්වා දීමෙන් පසු ජුනි මාසයේ 01වන දා සිට දෙසැම්බර් මාසයේ 31වන දා දක්වා ලාභය රුපියල් මිලියන 8,008යි. කොහොමද වැඩේ? මේ ලාභය 2010 අවුරුද්දේ ඉතිරි මාස හයට ලැබූ ලාභයයි. මේක අපි කියන එකක් නොවෙයි. ගරු ඇමතිතුමාගේ පොතෙන් මා මේ කියන්නේ. එතුමා ලොකු ප්‍රාතිහාර්යයක් පාලා තිබෙනවා. අපි හිතා ගෙන සිටියේ, බුදු හාමුදුරුවන්ට විතරයි ප්‍රාතිහාර්යය පාන්න පුළුවන් කියලා. දස සිල් රකින කෙනකුත් එහෙම කරපු එක අපට ලොකු ආඩම්බරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ පොතේම තිබෙන පරිදි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබෙන කාලයේ 1994 අවුරුද්දේ විදුලිබල මණ්ඩලය ලාභ ලබා තිබෙනවා, රුපියල් මිලියන 3,809ක්. අපි ආණ්ඩුව භාර දීලා ගියාම 1995 වර්ෂයේ ලාභය රුපියල් මිලියන 4,997යි. 1995 වර්ෂයේත් ලාභ ලබා තිබෙනවා, රුපියල් මිලියන හාරදහස් ගණනක්. ලංකා විදුලිබල මණ්ඩලය කඩා වැටෙන්න පටන් ගත්තේ 1996 දීයි. 1996 වර්ෂයේදී ලාභය රුපියල් මිලියන 95ට බැහැලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනින් පස්සේ දිගින් දිගටම ලංකා විදුලිබල මණ්ඩලය කඩා වැටෙන්න පටන් ගත්තා. 1997 වර්ෂයේ පාඩුව රුපියල් මිලියන 1,991යි. 1998 වර්ෂයේ පාඩුව රුපියල් මිලියන දෙදහස් ගණනයි. මේ විධියට දිගටම කඩා වැටෙන්න පටන් ගත්තා. ඒත් එක්කම මා ඔබතුමාට මතක් කරනවා, 2010 වර්ෂයේ පායිලී චම්පික රණවක මැතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් මිලියන පන්දහස් ගණනක ලාභයක් ලැබුවාය කියලා. ශුද්ධ ලාභය රුපියල් මිලියන පන්දහස් ගණනයි. මා ඔබතුමාට මතක් කරන්න කැමැතියි, ලංකා විදුලිබල මණ්ඩලය දිගින් දිගටම පාඩු ලැබුවාය කියලා. 2008 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව රුපියල් මිලියන 33,869යි. ඒ වෙලාවේ ඇමතිතුමා වශයෙන් සිටියේ ජෝන් සෙනෙවිරත්න මැතිතුමායි. හැබැයි ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා තමුන්නාන්සේට වඩා ලාභයක් උපයා තිබෙනවා.

2009 වර්ෂය වන කොට රුපියල් මිලියන තිස්තුන්දහස් ගණනක පාඩුව, රුපියල් මිලියන 11,210 දක්වා අඩු කර ගෙන තිබෙනවා. වෙනස රුපියල් මිලියන 22,659යි. මේ කියන විධියට 2010 වන කොට ඒ පාඩුව රුපියල් මිලියන 11,210 සිට රුපියල් මිලියන 5,062 දක්වා, රුපියල් මිලියන 6,000කින් අඩු කරලා තිබෙනවා. ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා ඉංජිනේරුවෙක් නොවෙයි. ඔබතුමා මේ විෂය පිළිබඳ ඉංජිනේරු මහත්මයෙක්. අපි හිතනවා, ඔබතුමා කියන විධියට ඔබතුමා මීට වඩා කාර්යක්ෂමයි කියලා. හැබැයි ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා ඉංජිනේරුවකු නොවුණාට, එතුමා මේ පාඩුව රුපියල් මිලියන විසිදෙදහස් ගණනකින් අවම කර ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පොතේම එතුමා කියා තිබෙනවා, ජල විදුලි බලය නිසා නොවෙයි මේ පාඩුව අඩු කර ගත්තේ කියලා. ඇමතිතුමා කිව්වා, පාඩුව අඩු වුණේ ජල විදුලිය නිසා නොවෙයි, කාර්යක්ෂමතාව නිසා කියලා. බොහොම හොඳයි. එහෙම වෙන්න ඕනෑ. අපි ඒක අගය කරනවා. හැබැයි 2010 අවුරුද්දේ තමයි 1984න් පස්සේ වැඩිම වර්ෂාව ලැබුණු අවුරුද්ද. 2010 මාර්තු වන කොට සියලුම ජලාශ පිටාර ගැලුවා. අනෙක්

ඇමතිවරුන්ට නොතිබුණු අවස්ථාවක් ඔබතුමාට ස්වභාව ධර්මයෙන් ලැබුණා. ඒ විතරක් නොවෙයි, වර්ෂාපතනය ගණන් බලලා බලන්න වැඩිම වර්ෂාපතනයක් ලැබුණෙත් ඒ අවුරුද්දේ. තමුන්නාන්සේ බොහොම උත්සාහ කෙරුවා ජල විදුලි බලයෙන් නොවෙයි මේ පාඩුව අඩු වුණේ කියා කියන්න. මම කියන්නම් 2010 අවුරුද්දේ තමුන්නාන්සේගේ පොතේ තිබෙන ලංවිම ඉන්ධන සඳහා වියදම් කර තිබෙන ගණන. අය වැය Proposalsවල තිබුණේ ඉන්ධන සඳහා මිලියන 23,542ක් ලබා දෙන්නයි. හැබැයි 2009 අවුරුද්දේ ඉන්ධන සඳහා වියදම් කරලා තිබෙන්නේ මිලියන 25,106යි. ඔබතුමන්ලා 2010 අවුරුද්දේ ඉන්ධන සඳහා වියදම් කරලා තිබෙන්නේ මිලියන 16,350යි. එයින් පෙනෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ඉන්ධන යොදා ගෙන කරපු විදුලිය නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා; ජල විදුලියෙන් විශාල විදුලියක් නිෂ්පාදනය කරලා තිබෙනවා කියා. ඉතින් ඒක තමයි මේකේ ඇත්ත කථාව. නැතුව ඇමතිතුමා ප්‍රාතිහාර්යක් පාපු එක නොවෙයි. මම තමුන්නාන්සේට කියනවා, ඔබතුමාගේ පාලන කාලය තිබුණු අවුරුද්දේ තමයි මේ රටේ power cuts වැඩියෙන්ම තිබුණේ කියා. ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා මේ අමාත්‍යාංශයේ අවුරුදු පහක්, හයක් හිටියා. ඒ කාලයේ එක power cut එකක් තිබුණේ නැහැ. එතුමන්ලා ඉන්ජිනේරුවෝ නොවෙයි. ඔබතුමාගේ කාලයේ තමයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ strikes තිබුණේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ කරු ජයසූරිය මැතිතුමාට මේ අමාත්‍යාංශය භාර දෙන කොට සමහර දවස්වලට පැය හයක්, හතක් විදුලිය කැපුවා. ඒ අභියෝගය අපි භාර ගත්තා. අඩු පාඩුකම් තිබෙන්න ඇති. ගරු පී. දයාරත්න ඇමතිතුමා අපිත් එක්ක එකඟ වෙනවා ඇති, ඉහළ කොත්මලේ ව්‍යාපෘතියට විරුද්ධ වුණේ ඔබතුමන්ලාගේ පැත්තේ අද ඉන්න ඇමතිවරයෙක් කියන එකට. එහෙම නැතුව එක්සත් ජාතික පක්ෂය ඒ ගැන ඕනෑකමක් තිබුණේ නැතුව, උනන්දුවක් ගත්තේ නැතුව, ඒ ගැන සැලකිල්ලක් දැක්වූයේ නැතුව හිටියේ නැහැ. අපිට ලොකු වුවමනාවක් තිබුණා ඒ ව්‍යාපෘතිය කරන්න. ඒත් එදා ඒ අය විරුද්ධ වුණා. ඒ නිසායි ඒක කරන්න බැරි වුණේ. ඒක නිසා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පොතේ හැටියට තමුන්නාන්සේලා කාර්යක්ෂමතාව ගැන කථා කළත් විදුලි බලය ගැන කථා කරන කොට එක්සත් ජාතික පක්ෂය අමතක කරලා, දිවංගත ගාමිණී දිසානායක, ජේ.ආර්. ජයවර්ධන, පී. දයාරත්න යන ඇමතිතුමන්ලා අමතක කරලා කථා කරන්න බැහැයි කියන එක.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ පුවත් පතකට කියලා තිබුණා, "විදුලි හොරුන් වැටලීමෙන් මණ්ඩලයට දශලක්ෂ විසිතුනක ලාභයක්" කියලා. ඉස්සර හිටපු ඇමතිවරුත් මේක කෙරුවා. හැබැයි ඒ ගොල්ලෝ පුවත් පත්වලට ප්‍රකාශ කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇමතිතුමා කියන විධියට විදුලි හොරුන් වැටලීමෙන් දශලක්ෂ විසිතුනක ආදායමක් හොයලා තිබෙනවා. විදුලි හොරුන් අල්ලන්න ඕනෑ. ඒ වාගේම මේ විදුලිය හොරකම් කරන්න උපදෙස් දෙන්නේ කවුද කියලා බලන්න. 2011.09.10වැනි දා "දිනමිණ" පත්තරයට ඇමතිතුමා කියලා තිබෙනවා, අපි මෙච්චර ගණනක ආදායමක් හෙව්වා කියලා. ඒ පත්තරයේම එතුමා කියලා තිබෙනවා, විදුලි කොකු දාලා හොරෙන් විදුලිය අරගෙන තිබෙන්නේ 19 දෙනායි කියලා. අනෙක් 180 ගණනම අරගෙන තිබෙන්නේ විදුලි මීටර් වෙනස් කරලා, හොර වැඩ කරලා කියලා.

මේ හොර වැඩ කරන්නේ කවුද? මොකද, අපි දන්නවාද විදුලි මීටරය වෙනස් කරන්න? ගමේ ඉන්න මිනිස්සු දන්නවාද විදුලි මීටරය වෙනස් කරන්න? මේක කරන්නේ විදුලිබල මණ්ඩලයේ නිලධාරින්. මම තමුන්නාන්සේට යෝජනා කරන්නේ විදුලිය හොරකම් කරන මිනිහා අල්ලලා හරි යන්නේ නැහැ. කවුද මේ හොරකම් කරන්න උපදෙස් දෙන මිනිස්සු කියා සොයා බලා ඒ අය අල්ලන්න. මේ සම්බන්ධයෙන් සීල් කරන අඩු තිබෙන්නේ කවුරු ළඟද? ඒ විදුලි මීටර වෙනස් කරන්න දක්ෂතාව, හැකියාව තිබෙන්නේ කාටද? එහෙම නම් ඒ නිලධාරිත් මේකට ගෙන්වන්න. මොකද, මම පෞද්ගලිකව දන්නවා සමහර වී මෝල්වලට මේ නිලධාරින් සති අන්තයට ඇවිල්ලා ගනුදෙනු එකතු කර ගෙන යනවා කියන එක. මේක තමයි ඇත්ත කථාව. විදුලිය හොරු ඇල්ලුවාම උසාවියේ දඩයක් ගහනවා. දඩය ගෙව්වාම ආපහු විදුලිය දෙනවා. ආයේත් හොරකම් කරනවා. ආයේත් ගනුදෙනුව දෙනවා. මේක දිගට පවත්වා ගෙන යනවා. මම කියන්නේ ඔබතුමාට, මේ විදුලිය හොරකම් කරපු පුද්ගලයා විතරක් අල්ලන්න එපා. මේ හොරකමට උදව් කරන නිලධාරියා කවුද කියලා හොයලා බලන්න. එතැනින් පටන් ගන්න. එහෙම වුණොත් පුළුවන් මේ කටයුතු තවදුරටත් සාර්ථක කර ගන්න. එහෙම නැත්නම් අපට හැම දාම සිද්ධ වන්නේ හොරුන් වටලා වටලා ඉන්න විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇමතිතුමා කිව්වා ලෙකෝ ආයතනය ගැන. ලෙකෝ ආයතනය ලාභ ලැබුවා. ඒක බොහොම හොඳයි. ලෙකෝ ආයතනය ලාභ ලබා ගත් ආකාරය ගැන ඇමතිතුමා පුවත් පත්වලට වාර්තා කීපයක් දීලා තිබුණා. ලෙකෝ ආයතනය අද ඊයේ පටන් ගත් ආයතනයක් නොවෙයි. එවකට ප්‍රාදේශීය සභාවලට පැවරිලා තිබුණ එහෙම නැත්නම් නගර සභාවලට පැවරී තිබුණ විදුලි බලය බෙදා හැරීමේ සහ නඩත්තු කිරීමේ කටයුතු ක්‍රමානුකූල කරන්න විදුලිබල මණ්ඩලයත්, මහා භාණ්ඩාගාරයත්, ඒ ප්‍රාදේශීය සභාත්, UDA එකත් සම්බන්ධ කර ගෙන 1984 දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ලෙකෝ ආයතනය හැදුවා.

විදුලිබල මණ්ඩලය පාඩු ලබද්දී මාස 09ක් තුළ ලෙකෝ ආයතනය රුපියල් කෝටි 1,200ක ලාභයක් ලබයි කියලා මේ වාර්තාවේ තිබෙනවා. "සියයට 100ක්ම රජය සතු සමාගමක් වන ලෙකෝ සමාගම ලාභ ලැබුවේ විදුලිබල හා බලශක්ති ඇමති පාඨලී චම්පික රණවක මහතාගේ උපදෙස් මත, කළමනාකාරිත්වයේ හා ආයතනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම නිසා යැයි සභාපතිවරයා කීය." ඒක බොහොම හොඳයි. ඔබතුමාගේ උපදෙස් හා කළමනාකාරිත්වය නිසා ලාභ ලබා තිබෙනවා. ඒක හොඳ දෙයක්. හැබැයි, ගරු ඇමතිතුමනි, මේ ලෙකෝ ආයතනය 1984 දී පටන් ගත්තාට පස්සේ දිගින් දිගටම ලාභ ලබපු ආයතනයක්. 2007 වන විට බැංකුවේ රුපියල් මිලියන 2,700ක ස්ථාවර තැන්පතුවක් ලෙකෝ ආයතනයට තිබුණා. ඉතින් ලෙකෝ ආයතනය කියන්නේ අලුත් ආයතනයක් නොවෙයි. විදුලිබල මණ්ඩලයෙන් විදුලිය අරගෙන, ගණනක් තියා ගෙන පාරිභෝගිකයාට විකුණන ආයතනයක්. ඒක අලුතින් ලොකු වැඩක් කරන ආයතනයක් නොවෙයි.

Buying and selling තමයි ලෙකෝ ආයතනයේ job එක. හැබැයි, ඒ ආයතනය 2007 වන තුරු දිගටම ලාභ ලැබුවා. 2007 දී මේ ආයතනයේ ලාභයෙන් රුපියල් මිලියන 2,000ක් කෙරවලපිටිය විදුලි බලාගාරයේ ඉදි කිරීම් කටයුතු සඳහා ආයෝජනය කළා. මේ ගොල්ලන් වෙනත් ආයතනවල මේ මුදල් තැන්පත් කළේ නැහැ. බැංකුවේ තැන්පත් කරලා, ඒ පොලියත් එක්ක තමයි මේ ආයතනය හැම දාම ලාභ ලැබුවේ. නමුත් විදුලිබල මණ්ඩලය කිව්වා, ලෙකෝ ආයතනයට රුපියල් 2.50ක ලාභයක් ඇතුව විදුලිය දුන්නත්, විදුලිබල මණ්ඩලය පාඩු ලබනවා, ලෙකෝ ආයතනය ලාභ ලබනවා කියලා. ඒ නිසා දෙන ලාභය කෙරුවා. එහෙම අඩු කෙරුවාට පස්සේ ලෙකෝ ආයතනය 2007දී පාඩු ලැබුවා. තැන්පතු මුදල්වලින් මිලියන 2,000ක් ආයෝජනය කළාට පස්සේ ඒ ගොල්ලන්ට ලැබෙන පොලී ප්‍රමාණය අඩු වූ නිසාත් ඒ ගොල්ලෝ පාඩුවක් ලැබුවා. නමුත් මහ ජන උපයෝගිතා කොමිසමෙන් විදුලි මිල නියම කිරීම නිසා, නැවත වතාවක් ලෙකෝ ආයතනයට රුපියල් 2.50ක ලාභයක් ඇතුව විදුලිය ලබා දුන් නිසා ලෙකෝ ආයතනය නැවත ලාභ ලබන ආයතනයක් බවට පත් වුණා. එහෙම වුණේ ඇමතිතුමාගේ ප්‍රාතිහාර්යයක් නිසා නොවෙයි. ඒක සාමාන්‍ය කොම්පැනියක්.

[ගරු පී. හැරිසන් මහතා]

ඇමතිතුමාගේ ප්‍රාතිහාර්යය තිබෙනවා නම් විදුලිබල මණ්ඩලයත් ලාභ ලබන්න එපායැ.

අපේ COPE එකේ සභාපතිතුමාත් මෙතැන ඉන්න නිසා මම කාරණයක් කියන්නම්. මේ වතාවේ COPE එකේ වාර්තාවේ, දූෂිතම ආයතනයක් හැටියට විදුලිබල මණ්ඩලය නම් කරලා තිබෙනවා. COPE එකේ වාර්තාවත් එක්ක මා කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකේ ඉහළම තැන ලංකා විදුලිබල මණ්ඩලයට. ගරු ඩිව් ගුණසේකර ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් මේ වතාවේ නිකුත් වුණු COPE එකේ වාර්තාවේ 69 වන පිටුවේ තිබෙනවා, දූෂිතම ආයතනය ලංකා විදුලිබල මණ්ඩලය කියලා. ඉතින් අපේ ඇමතිතුමා කියනවා, දක්ෂ කළමනාකාරිත්වයක් තිබෙනවා කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් කාලය තිබෙනවා. මට විනාඩි 20ක් තිබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්. විනාඩි විස්ස විදුලි වේගයෙන් ගියා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමා කිව්වා, මේක තමයි කාර්යක්ෂම ආයතනය කියලා. මම කියන්නේ, ඇමතිතුමා මොනවා කිව්වත්, මේ ආයතනය දූෂිතයි කියලා මේ COPE වාර්තාවෙන් කියලා තිබෙන බවයි. එහෙම නම් අපි බලාපොරොත්තු වනවා, ඉදිරි කාලයේදී මේ දූෂිත තත්ත්වය වෙනස් කර ගන්න කටයුතු කරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇමතිතුමා දස සිල් රකින කෙනකු නිසා මම එතුමාට කියන්න ඕනෑ,- [බාධා කිරීමක්] මේ වාර්තාවේ තිබෙනවා. දස සිල් රකින අය මේවා කරන්නේ නැහැ. තමුන්නාන්සේගේ පොතේ තිබෙනවා, යාපනයට විදුලිය දෙන ඇග්‍රිකෝ සමාගම 2012 වර්ෂයේදී එතැනින් අයින් කරනවා කියලා. හැබැයි, 2010දී අවසන් කරන්න තිබුණු මේ ගිවිසුමේ කාලය කැබිනට් අනුමැතියක් නැතුව, ඔබතුමාගේ අමාත්‍යාංශයේ හිටපු සභාපතිවරයාගේ හිතුමතේට දීර්ඝ කෙරුවා. මේක රුපියල් මිලියන 3,000කට අධික කොන්ත්‍රාත්තුවක්. මේ සභාපතිවරයා ගිහිල්ලා -

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
සම්පූර්ණ වැරදියි. කැබිනට් අනුමැතිය තිබෙනවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මම කියන්නම් අනුමැතිය ගත්ත හැටි. ඔබතුමා Cabinet Paper එක දැම්මේ සභාපතිතුමා ගිවිසුම අත්සන් කළාට පස්සේ. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒකට නිදහසට කරුණු ඇහුවා, සභාපතිගෙන්. මාර්තු මාසයේ මේ ගිවිසුම අත්සන් කළාට පස්සේ, ඒ සභාපතිගෙන් නිදහසට කරුණු ඇහුවාට පස්සේ, අප්‍රේල් මාසයේ තමුන්නාන්සේ කැබිනට් එකට ගිහිල්ලා ආවරණ අනුමැතිය ගත්තා. එහෙමයි තමුන්නාන්සේ කැබිනට් අනුමැතිය ගත්තේ. එහෙම නැතුව මේ කැබිනට් අනුමැතිය කලින් ගත්තේ නැහැ. අන්තිමේදී වෘත්තීය සමිති, ඉංජිනේරු සේවා සංගම් ඇතුළු ඒ සියලු දෙනාම එක හඬින් කිව්වා, මේ සභාපතිවරයායි, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයායි අස් කරන්න කියලා. අන්තිමේදී මේ නිලධාරින් දෙන්නා තුන් දෙනාම අස් කරන්න තමුන්නාන්සේට සිද්ධ වුණා. ඒකයි ඇත්ත තත්ත්වය. ඒක නිසා ඇමතිතුමා මේ සභාවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. Facts ඇතිවයි මම තමුන්නාන්සේට මේවා කිව්වේ. අපි එහෙම අසත්‍ය කියන්නේ නැහැ. අපි අතින් වැරදිලා අසත්‍යයක් ප්‍රකාශ වුණත්, ඇමතිතුමා දස සිල් රකින කෙනකු හැටියට මේ කරන අපරාධය-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කථාව අවසන් කරන්න මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේ වාගේ බොරු වැඩ කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. ඇමතිතුමා නොරොච්චෝලේ විදුලි බලාගාරය ගැන කිව්වා. නොරොච්චෝලේ විදුලි බලාගාරයේ අද ඇත්ත තත්ත්වය මොකක්ද? ඇමතිතුමනි, ඔබතුමා කියනවා එහි management එකට රුපියල් කෝටි 30ක් වෙන් කරන්න කියලා. මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයට ඒ පේපර් එක ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නොරොච්චෝලේ විදුලි බලාගාරය පටන් අරගෙන තවම අවුරුද්දක් නැහැ. නමුත් ඒ සමාගමේ පරිපාලන කටයුතු කරන්න රුපියල් කෝටි 30ක් දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඉතින් මේකද තත්ත්වය? ඒක නිසා ඇමතිතුමනි, මම තමුන්නාන්සේට කියන්නේ මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කරලා මේ සභාව නොමඟ යවන්න එපා කියලායි. ඔබතුමා දක්ෂ ඉංජිනේරුවෙක් බව ඇත්ත. හැබැයි, කාර්යක්ෂම පරිපාලකයෙක් නොවෙයි කියන එකත් මතක් කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

[අ.භා. 2.33]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරන කාරක සභා අවස්ථාවේ ගරු ඇමතිතුමා මේ සභාවේ ඉන්න නිසා මම මුලින්ම එතුමාගෙන් දැන ගන්න කැමැතියි එක කාරණාවක්. ආසියාවේ ආශ්චර්යයේ තව කටයුත්තක් හැටියට හෙට ඉඳලා ලංකාවේ කොළඹ නගරයේ කාර් රේස් යන්න පටන් ගන්නවා. ඉතින් අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා, ඒ කාර් රේස් කටයුත්තට විදුලිබල මණ්ඩලයෙන් විදුලිය සැපයීමේ ව්‍යාපෘතියක් තිබෙනවා කියලා. ඒ වැය බර දරන්නේ විදුලිබල මණ්ඩලයේ වැය ශීර්ෂයෙන්ද, එහෙමත් නැත්නම් ආශ්චර්යයේ වැය ශීර්ෂයකින්ද කියන එක තමයි ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගන්න ඕනෑ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

විදුලිබල මණ්ඩලයේ වැය ශීර්ෂවලින් කිසිම වැය බරක් දරන්නේ නැහැ. ඕනෑ කෙනකුට විදුලිබල මණ්ඩලයේ සේවාව, පහසුකම ලබා ගන්න පුළුවන්, මුදල් ගෙවලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එතකොට කොළඹ නගරයේ කාර් රේස්වලට විදුලිය සපයන්නේ නැද්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඕනෑ දෙයකට. ජනතා විමුක්ති පෙරමුණේ විරෝධතා ව්‍යාපාර වුණත් ආලෝක කරලා දෙන්නම්, සල්ලි ගෙවනවා නම්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

අපට එහෙම අවශ්‍යතාවක් නැහැ. නමුත් අපට දැන ගන්නට ලැබී තිබෙන අන්දමට ඒවා කරන්නේ විදුලිබල මණ්ඩලය පාඩු ලබන තත්ත්වයක් ඇතුළේ. ඔබතුමන්ලාගේ මේ නාස්තිකාර වියදම් ඔබතුමාගේ කැමැත්තෙන් නොවෙන්න පුළුවන්. නමුත් අකැමැත්තෙන් දරන්න වෙච්ච වැය බර හැටියට තමයි ඒවා තිබෙන්නේ. සමහර විට ඒවා ඇමති ධුරයේ පැවැත්ම වෙනුවෙන් දරන්න වෙන ඒවා වෙන්නත් පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පෞද්ගලිකව විශ්වාස කරනවා, ගරු ඇමතිතුමා ඍජුව වග කියන තත්ත්වයන් යටතේ සිදු නොවෙන දේවල් තිබෙන බව. ඇමතිතුමාගේ අත්සනින්, ඇමතිතුමාගේ අනුදැනුමෙන්ම සිද්ධ නොවන දේවල් තිබෙනවා.

(11th Start)

මොකද, ලංකාවේ සමහර ආයතන සුරබි දෙනුන් බවට පත් වෙලා තිබෙන්නේ. ඒවා විනාශ කරන, ගසා කන, හොරකම් කරන, මාෆියාවක් හැටියට පවත්වා ගෙන යන අයට විදුලිබල මණ්ඩලයත් සුරබි දෙනක් බවට පත් වෙලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත දේ. මොකද, මේවා ධනය උපදවන උල්පත්. ලංකාවේ විදුලිබල මණ්ඩල ඒකාධිකාරයක් තිබෙන්නේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගත්තත් එහෙම තමයි. ඒවා පාඩු කරන්න සැලසුම් කරන අය ඉන්නවා. මම උදාහරණයකුත් ඇතුව ඔබතුමාට කියන්නම්. ඔබතුමාත් දන්නවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවෙනි චෝදනාව තමයි විදුලිබල මණ්ඩලය ණය වීම. අපි ඒක විමර්ශනය කළා. නමුත් අද වන තුරු ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. විදුලිබල මණ්ඩලයට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් එන්න තිබෙන ණය රුපියල් බිලියන 52ක් තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු මන්ත්‍රීතුමා, පැහැදිලි කිරීමක් තිබෙනවා. ඒකේ අනික් පැත්ත තිබෙන්නේ. ඇත්තටම විදුලිබල මණ්ඩලය 2009 දෙසැම්බර් 31 දක්වා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවන්න තිබෙනවා, රුපියල් බිලියන 52ක්. ඒ ගැන අපි ගිය අවුරුද්දේ සාකච්ඡා කළා. ඒ මුදල් ගෙවන්න මහා භාණ්ඩාගාරය බාර ගත්තා. මහා භාණ්ඩාගාරයේ කොටස්වලට අවශ්‍ය කරන ගෙවීම් කටයුතු, - ආයෝජනය කිරීමේ ගෙවීම් කටයුතු- විදුලිබල මණ්ඩලය මඟින් කෙරෙනවා. දැන් එහෙම ණයක් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එහෙම නම් මම ඔබතුමාගෙන් පැහැදිලි කර ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. දැන් ඔබතුමා දන්නවා, ඔය ආයතනයේ දැනට උසස්වීම් දීලා තිබෙන කල්දේරා කියලා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙක් ඉන්නවා, Commercial and Corporate Affairs පිළිබඳව. ඒ කල්දේරා මැදිහත් වෙලා -මේක පාර්ලිමේන්තුවේ සාකච්ඡා වුණු ප්‍රශ්නයක්- ඇලුමිනියම් cables මෙට්‍රික් ටොන් 956ක් ලබා ගන්න කටයුතු කළ ගිවිසුමක පාඩුව සම්බන්ධයෙන් Universal Cables කියන කොම්පැනිය ජාත්‍යන්තර අධිකරණයට ගියා. ජාත්‍යන්තර අධිකරණය ඒකමතිකව තීන්දුවක් දුන්නා, ලංකා විදුලිබල මණ්ඩලය මේ වැරදි ගනුදෙනුව නිසා, මේ දූෂිත ගනුදෙනුව නිසා පාඩු විඳින්න ඕනෑ කියලා. දැන් ඒකේ පාඩුව හැටියට ලංකා විදුලිබල මණ්ඩලය Universal Cables කියන සමාගමට ඇමෙරිකන් ඩොලර් මිලියනයක් -හරියට ගත්තොත් ඇමෙරිකන් ඩොලර් 1,070,787.12ක් සහ ඊට පොලිය සියයට 7.5ක්- ගෙවන්න තීන්දු වෙලා තිබෙනවා. මේ ජාත්‍යන්තර අධිකරණයේ තීන්දුව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය ඊට ළඟට අභියාචනාධිකරණයට ගියා. අභියාචනාධිකරණයේදීත් ඒ තීන්දුවම දුන්නා. දැන් ගිහින් තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට. අපි දන්නේ නැහැ, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මොන තීරණයක් දෙයිද කියලා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ජාත්‍යන්තර අධිකරණයේ තීන්දුව අනුව පවා මේ වැරදි ගනුදෙනු නිසා රුපියල් බිලියනයකටත් වඩා -ඩොලර් මිලියනයක්- විදුලිබල මණ්ඩලයට පාඩු කරලා තිබෙනවා. දැන් කවුද මේවාට වග කියන්නේ? අදත් ඒ නිලධාරින් මේකේ ඉන්නවා. ඉන්නවා විතරක් නොවෙයි ඒ අය උසස්වීම් ලබනවා. ඒ අයට අදාළව සාමාන්‍ය නීතියක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ තිබෙන වංචා, දූෂණ සොයන කමිටුවලට මේවා ගේනවා, කථා කරනවා, වාර්තාවල නම් සඳහන් කරනවා. වැඩක් වෙන්නේ නැහැ. මම කියන්නේ ඒකයි. අපට දැන ගන්න ඕනෑ මේ අය ඇමතිතුමාට වඩා ඉහළින් ඉන්න අයද කියලායි. කෙනෙකුට ඩොලර් මිලියනයක් විදුලිබල මණ්ඩලයට පාඩු කරලා ඉන්න පුළුවන් නම්-

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු මන්ත්‍රීතුමා, ඒක මගේ කාලයේ සිදු වුණු දෙයක් නොවෙයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමාගේ කාලයේත් ඉන්නවා

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

නමුත් රටේ පවතින නීත්‍යානුකූල වාතාවරණය තුළ ඒ සම්බන්ධව අපි ක්‍රියා කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුකූලවත්, ලංකා විදුලිබල මණ්ඩලයේ පනත අනුව සහ COPE වාර්තාවට අනුකූලව අපි ඒ සම්බන්ධයෙන් පියවර ගන්නවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මට ඔබතුමා සාමාන්‍ය දැනුමෙන් කියන්න, විදුලිබල මණ්ඩලයේ සාමාන්‍ය නිලධාරියෙක්, peon කෙනෙක් -පියුන් මහත්තයෙක්- පුංචි දෙයක් කරලා අඩුවක්, පාඩුවක් වුණොත් මොකද කරන්නේ කියලා?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඒ අය සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ විදුලිබල මණ්ඩලයේ විනය පටිපාටියට අනුකූලවයි. ඒක තරාතිරම නොබලා අපි ක්‍රියාත්මක කරනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ අය සම්බන්ධයෙන් වෙනම නීතියක්. ඒක තමයි ප්‍රශ්නය. අපි අනන්ත දන්නවා, මේ රටේ නීතිය අනුව පුංචි මිනිහෙක්ගෙන් අඩු පාඩුවක් වුණොත් dismiss කරලා ගෙදර යවනවාය කියලා. ඒ වාගේ අය මේ පාර්ලිමේන්තුවේ තිබෙන මහ ජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අනන්ත එනවා. Appeal කරනවා, තමන්ගේ රක්ෂාව අරන් දෙන්නය කියලා. මොකක්ද හේතුව? එක්කෝ රුපියල් 100ක් වංචා කරලා. අප කියන්නේ රුපියල් සියයද, රුපියල් කෝටියද කියන ප්‍රශ්නය නොවෙයි. වංචාව නම් වංචාව. නමුත් රුපියල් සියයකින් අත් වැරැද්දක් සිදු වන මිනිස්සු ඉන්නවා. ඔවුන් ගෙදර යවනවා. හැබැයි ඩොලර් මිලියනයක් වංචා කරනවා, පාඩු කරනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඔවුන් නිදහසේ ඉන්නවා. මේක තමයි ඇත්ත තත්ත්වය. ගරු ඇමතිතුමනි, මට තිබෙන්නේ කෙටි වෙලාවක් නිසා මේ ඔක්කොම කාරණා ගොනු කරන්න අමාරුයි. නමුත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්නයි මම මේ කාරණා කියන්නේ.

ගරු ඇමතිතුමනි, විදුලිබල මණ්ඩලයේ සිද්ධ වන තව දෙයක් තිබෙනවා. මම හිතන හැටියට ඔබතුමා ඒක කරන්නේ නැහැ. ඔබතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හදා ගෙන, ඒකෙන් නියෝජ්‍ය ඇමතිතුමා අමාත්‍යාංශයේ "ඒ" කොටස කියලා, "බී" කොටස කියලා, නැත්නම් විදුලිබල අමාත්‍යාංශයේ දෙවැනි Project එක කියලා තව අමාත්‍යාංශ හදන්නේ නැහැ නේ. නියෝජ්‍ය ඇමතිතුමාත් එහෙම නැහැ. දෙවැනි එක කියලා එකක් නැහැ. හැබැයි විදුලිබල මණ්ඩලය යටතේ විදුලිබල මණ්ඩලයේ අයිතිය තිබෙන සමාගම් හදනවා. ඒ සමාගම් හැදෙනවා. පැටවු ගහන සමාගම් තිබෙනවා. ඒ සමහර සමාගම් මේ පාර්ලිමේන්තුවට වග කියන්නේ නැහැ. සමහර සමාගම් පාර්ලිමේන්තුවට ගේන්නත් බැහැ. මා හිතන හැටියට ඒ සමහර සමාගම් ගැන ඇමතිතුමා දන්නෙත් නැතිව ඇති.

1986 කාලයේම විදුලිබල මණ්ඩලය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ කරපු දේවල් ගැන මම එක උදාහරණයක් කියන්නම්. ඒවාත් ඇත්ත. ABB AS of Norway සමාගම එක්ක එකතු වෙලා Lanka Transformers Limited එක හැදුවා. එතකොට ඒකෙන් විදුලිබල මණ්ඩලයට සියයට හැත්තෑවයි. ඒ කියන්නේ කොටස් නවලක්ෂ දහදාහක්. අනික් සියයට තිහ නැෂනල් ඉන්ඩස්ට්‍රි ඒඑස් සමාගම හිමි කර ගත්තා. පස්සේ මේ නැෂනල් ඉන්ඩස්ට්‍රි ඒඑස් සමාගමේ කොටස් ටික ABB AS of Norway එක ගත්තා. ඒ ගොල්ලෝ ඒක විකුණුවා. විදුලිබල මණ්ඩලයේ ගිවිසුමේ තිබෙනවා, ඒ සියයට තිහේ කොටස් විකුණනවා නම් ඒවා මුලින් විදුලිබල මණ්ඩලයට දෙන්න ඕනෑ කියලා. නමුත් ඒ කාලයේ තිබුණු නීතිය අනුව විදුලිබල මණ්ඩලය මේක ගන්න කැමැති වුණේ නැහැ. ඒක නිසා Lanka Transformers Limited ESOT කියලා සමාගමක් හැදුවා. ඒ Lanka Transformers Limited ESOT කියන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නේ හත් දෙනායි, ගරු ඇමතිතුමනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න ඒ හත් දෙනාම විදුලිබල මණ්ඩලයේත් ඉන්නවා. අපි පාර්ලිමේන්තුවේ COPE ඒකේදීත් මේ පිළිබඳව ප්‍රශ්න කළා. දැනට විදුලිබල මණ්ඩලයේ ඉන්න උප සභාපතිතුමාත් මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නවා. එහි හත් දෙනායි ඉන්නේ. එතකොට මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න හත් දෙනාට අයිති කොටස් ප්‍රමාණය 51,42,755යි. ඒ කියන්නේ සියයට තිහයි. ඕනෑ නම් ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛනය මම ඔබතුමාට දෙන්නම්. ප්‍රශ්නය මේකයි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඔබතුමා ලංකා විදුලිබල මණ්ඩලයේ උප සභාපතිතුමා ගැන කරපු ප්‍රකාශය ගැන මා යමක් කියන්න ඕනෑ. එතුමා මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයෙන් පිට වුණාට පස්සේ, කලින් LTL සමාගමේ කටයුතු කළා. දැන් එතුමා මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ කථිකාචාර්යවරයෙක්. ESOT කියන්නේ ඒ සේවක මහත්වරුන් හදපු ආයතනයක්. දැන් එතුමා ඒකෙන් ඉවත් වෙලා තමයි ලංකා විදුලිබල මණ්ඩලයේ උප සභාපති ධුරය උසුලන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ඔය සේවකයන්ගේ කොටස් ගැන කිව්වොත්, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයෝ ඉන්නවා නේ වෙනම. ඒ සේවකයන්ට වෙනම Employee Share Ownership Trust කියලා අරමුදලක් තිබෙනවා. ඒකේ තිබෙනවා වෙනම එකක්. ඒකටත් කොටස් සියයට හතක් තිබෙනවා. LTL සමාගමේ සියයට හතක් ඒකට තිබෙනවා. මම කියන්නේ ඒ සියයට හත ගැන නොවෙයි ගරු ඇමතිතුමනි. LTL සමාගමේ අයිතියෙන් සියයට හැටතුනක් විදුලිබල මණ්ඩලයට තිබෙනවා. ඔබතුමා කියන සේවකයින් අරමුදලට සියයට හතක් තිබෙනවා. ඊට අමතරව මෙන්න මේ ESOT කියන එකට සියයට තිහක් තිබෙනවා. අපි හිතමු දැන් ඔබතුමා ඔය කියන විජේපාල මහත්තයා අයින් වෙලා කියලා. මට ඔබතුමා මෙන්න මේක විතරක් කියන්න.

Lanka Transformers Limited ESOT කියන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කී දෙනෙක් ඉන්නවාද? සාමාන්‍යයෙන් සමාගමක් වුණාට පස්සේ. අපේ තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා එහෙම ඔය සමාගම් ගැන හොඳට දන්නවා. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ ඉන්නවා; share issue කරපු සාමාජිකයෝ ඉන්නවා. එතකොට සාමාජිකයෝයි, අධ්‍යක්ෂ මණ්ඩලයේ අයයි කී දෙනෙක් ඉන්නවාද? මේ සමාගමේ කොටස්කරුවෝ කී දෙනෙක් ඉන්නවාද? මම කියන්නේ හත්දෙනායි කියලා. අයිතිකාරයෝත් හත්දෙනායි ඉන්නේ. කොටස්කරුවෝත් හත් දෙනායි ඉන්නේ. අධ්‍යක්ෂ මණ්ඩලයේත් හත්දෙනායි ඉන්නේ. එතකොට ප්‍රශ්නය තිබෙන්නේ මේ හත්දෙනා මේ කොටස් මිලදී ගෙන තිබෙන්නේ කොහොමද කියන එකයි. තමන්ගේ පෞද්ගලික වත්කම්වලින් කොටස් මිලදී ගෙන තිබෙනවා නම් කමක් නැහැ කියමුකෝ. ඒ අයගේ පෞද්ගලික ධනයෙන්, දෙමව්පියන්ගේ පෞද්ගලික ආදායමින්, අපේ තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා වාගේ ඒ කාලයේ ඉඳලා කරපු ව්‍යාපාරික කටයුතුවලින් කොටස් මිලදී ගත්තා නම් කමක් නැහැ. මම කියන්නේ මේ හත්දෙනා කොටස් මිලදී ගෙන තිබෙන්නේ විදුලිබල මණ්ඩලයේම වත්කම්වලින් බවයි. ඒක තමයි බරපතළ කාරණය. අපි මෙහෙම හිතමු. මේ අය මේ සමාගම් ක්‍රියාවලිය ඇතුළේ කොටස් මිලදී ගත්තා නම් කමක් නැහැ.

ගරු ඇමතිතුමා මට මේ කාරණය විතරක් කියන්න. මෙන්න මෙච්චරයි අහන්නේ. මේ ESOT කියන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කී දෙනාද? කොටස් හිමියෝ කීදෙනාද? ඒ අය කොටස් මිලදී ගෙන තිබෙන්නේ ඒ අයගේ පුද්ගලික වත්කම්වලින් ද, නැත්නම් විදුලිබල මණ්ඩලයේ වත්කම්වලින් ද? විදුලිබල මණ්ඩලයේ වත්කම්වලින් ගත්තා නම් ඒ කොටස් ඒ අයට නැවත සාමාන්‍ය වෙළෙඳ පොළේ විකුණන්න, මිල දී ගන්න බැරිද?

මොකද අප දන්නවා, කවුරු හෝ කෙනෙක් සාමාන්‍ය කොටස්කරුවෙක් වුණොත් ඒ කොටස් හිමියාට අයිතියක් තිබෙනවා, තමන්ගේ කොටස්, කොටස් වෙළෙඳ පොළේ විකුණන්න. එතකොට අදාළ නැහැ ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා, ඒ කොටස් කාගෙන් ද මිලදී ගත්තේ කියන එක. මා කොටස් හිමියෙක් නම් මට අයිතිය තිබෙනවා. මා මේ අතේ තියා ගෙන ඉන්නේ ඒ අයගේ කොටස් ලේඛන; annual returns . ඒ අයට පුළුවන් ඒවා විකුණන්න. ප්‍රශ්නය තිබෙන්නේ ඒකයි. මම දන්නේ නැහැ, විකුණුවා ද, නැද්ද කියා. ගරු ඇමතිතුමා කියන්න, විකුණුවේ නැත්නම් විකුණුවේ නැහැ කියා. ලාභාංශ කවුද අර ගත්තේ? ලාභාංශ යන්නේ විදුලිබල මණ්ඩලයටම ද? එහෙමත් තියෙන්න පුළුවන් නේ. ආයතනයක් හදලා තිබෙනවා. ඒ ආයතනයේ සියයට 63ක් තිබෙනවා විදුලිබල මණ්ඩලයට. සියයට 30ක් තිබෙනවා, තව කොටස් කරුවෝ හත් දෙනෙකු අතේ. ඉතිරි ටිකට-

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒ සියයට 63 ට විදුලිබල මණ්ඩලයට ලාභාංශ ලැබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
සියයට 63ට ලාභාංශ ලැබෙන්නට පුළුවන්. මම අහන්නේ මෙයයි. මේ හදා ගත්තු සියයට 30ට කොහොමද ලාභාංශ බෙදෙන්නේ? මේවා game. මේවා game නොවෙයි නම් වෙන මොනවා ද කියා කියන්න. මම පෞද්ගලිකව පිළිගන්නවා, අර දස සිල් කෙසේ වෙතත් ඔබතුමාට මේකෙන් ගණනක් එන්නේ නැහැ කියා. ඒක හරි. නමුත් එතකොට බලන්න වෙන දේ.

අප මේ පාර්ලිමේන්තුවේ කථා කරනවා, ජනතා පරමාධිපත්‍යය නියෝජනය වන නිසා විදුලිබල මණ්ඩලයට වැය ශීර්ෂයක් හදා ගෙන. මේකට භාණ්ඩාගාරයෙන් මුදල් දෙනවා. හැබැයි භාණ්ඩාගාරය මුදල් දෙන ගමන් වෙනම කොම්පැනි පැටව් ගහනවා. කොම්පැනි පැටව් ගහලා ඒවායේ ඉන්න නිලධාරි මහත්වරුම තනතුරු හදා ගන්නවා ඒකෙන්. තනතුරු හදා ගත්තත් කමක් නැහැ. කොටස් මිලදී ගන්නවා. කොටස් මිලදී ගන්නේ ඒ අයගේ පෞද්ගලික මුදල්වලින් නොවෙයි නම් මොකද වෙන්නේ? ඒක බරපතළ තත්ත්වයක්. එම නිසා, ඉතාම පැහැදිලිව අප කියනවා, මෙන්න මෙවැනි ගනුදෙනු තිබෙනවාය කියන එක. එතකොට විදුලිබල මණ්ඩලය කියන්නේ රජය සතු දේපළක් නම්, ඒක අමාත්‍යාංශයේ දේපළක් නම් ඒ රජය සතු දේපළ මේ විධියට ගනුදෙනු කරන්න කවුද අවසර දුන්නේ? එතැනදී තමයි ඔබතුමාගේ වගකීම එන්නේ. එතැනදී තමයි විදුලිබල මණ්ඩලය අයත් අමාත්‍යවරයා හැටියට ඔබතුමාගේ වගකීම එන්නේ. මේ කොටස් ක්‍රියාවලියේදී රාජ්‍ය දේපළක් හැටියට, රාජ්‍ය ආයතනයක් හැටියට නම් ඒකේ අයිතිය තිබෙන්නේ, ඔබතුමා ඒකට වග කියන්නට ඕනෑ.

ඊළඟට මේ සේවකයන් බඳවා ගැනීමේදී අප දන්නවා, ගරු ඇමතිතුමන්ලා අමාත්‍යාංශවලට එන නාමලේඛනවලටත් ප්‍රමුඛතාවයක් දෙන බව. [බාධා කිරීමක්] ඒක හරි. එතකොට විදුලිබල මණ්ඩලයේ තිබෙන ප්‍රශ්නය තමයි එක එක පළාත්වලින් මේක හැම දාම පිරෙන එක.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා විනාඩියක් තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියලා අවසන් කරනවා. රත්නපුරය පැත්තෙන් ඇමතිතුමා, එනකොට රත්නපුර පැත්තෙන් මේ ආයතනයේ කාර්ය මණ්ඩලය පිරෙනවා. කාලයක් නුවර පැත්තෙන් පිරෙන්න ගත්තා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, ඔබතුමා ජාතික මට්ටමේ නායකයෙක් නේ. ඔබතුමාගෙන් මේක ජාතික මට්ටමෙන් පිරෙන්නට ගත්තොත් එහෙම ලොකු ලෙඩක් වෙනවා. එහෙම වෙච්ච අත් දැකීමක් මම මේ කියන්නේ. අමාත්‍යාංශ ලේකම්තුමාම අත්සන් කරලා, අතිරේක ලේකම් (පාලන-ප්‍රසම්පාදන) රපික් මහත්මයා අත්සන් කරලා, විදුලිබල මණ්ඩලයේ සභාපතිතුමාට 2010.08.05 ලේඛනයක් එවනවා. "ලංකා විදුලිබල මණ්ඩලයේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු පිරවීම. ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගේ නිර්දේශ සහිතව මා වෙත එවා ඇති හතළිහකගෙන් යුත් නාම ලේඛනය මේ සමඟ එවමි. මෙම අයදුම්කරුවන් ගේ සුදුසුකම් පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු වහා කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. " මෙහි තිබෙන අවසාන වාක්‍යය සුපුරුදු පරිදි යොදන එකක්. මේක මම හිතන හැටියට ඕනෑම අමාත්‍යතුමෙකුට අදාළව හදා තිබෙන "ෆෝමැට්" එක.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමා, ලංකා විදුලිබල මණ්ඩලයේ කම්කරුවකු හැටියට හෝ සේවය කරන්න ගණිතය, භාෂාව ඇතුළුව සාමාන්‍ය පෙළ වැඩ හය සමත් වෙලා, අවුරුදු 35ට අඩු වෙලා, ඔහු භෞතික පරීක්ෂණයකට පෙනී ඉඳලා යන්නේ. ඔහුගේ දේශපාලන පක්ෂය මොකක්ද කියන එක එච්චර වැදගත් නැහැ. අප ඒ සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය කරන අධ්‍යාපන සුදුසුකම් අනිවාර්යයෙන්ම බලා අර ගෙන තිබෙන්නේ. ඒ හැරෙන්නට වෙනත් කිසිම කෙනෙක් ලංකා විදුලිබල මණ්ඩලයට හෝ වෙනත් ආයතනයකට බඳවා ගන්නේ නැහැ. අප ලබන අවුරුද්දේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙන කාර්මික විද්‍යාලත් එක්ක එකතු වෙලා ලංකා විදුලිබල මණ්ඩලයට සේවකයන් බඳවා ගැනීමේ අලුත් පටිපාටියක් සකස් කරන බව කියන්නට ඕනෑ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, දැන් අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ කාලය ගත් නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්න ගිය කාරණය අවසන් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට චක්‍රලේඛන තිබෙනවා; රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන තිබෙනවා. ඒ අනුව තමයි මේක කෙරෙන්නේ. එහෙම නම් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේකයි. විවෘත තරග විභාගයකින් එන අපේක්ෂක අපේක්ෂිකාවන්ටත් මේ සුදුසුකම් ක්‍රියාවලිය නිසා ලැබෙන ප්‍රමුඛතාවක් තිබෙනවාද? ඔබතුමා 40කගේ ලැයිස්තුවක් යැව්වාට පස්සේ, ඒ ලැයිස්තුවයි මේකයි කොහොමද සන්සන්දනය වන්නේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඇයි 40ක් යවන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් සංවාදයක් ඇති කර ගන්නට බැහැ. දැන් වේලාව හරස් වෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එවන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, නැහැ. මම එවන්නේ නැහැ. එහෙම නම් පත්තරයේ දමන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරමු.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම නම් අපරාදේ වියදම් කරලා පත්තරවල දැන්වීම් දමන්න එපා, බඳවා ගන්න කියලා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලික සුදුසුකම් නැති කිසිකෙනකු අර ගන්නේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමන්ලාගේ ආසනවල තිබෙන මොනවා හරි කමිටුවකින් එවන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[අ.භා. 2.50]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා, ගරු පාඨලී චම්පික රණවක මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ කථා කරන්න ලැබීම ගැන. ඒ අමාත්‍යාංශය ගැන මන්ත්‍රීවරු ගණනාවක් කාරණා ගණනාවක් කිව්වා. ගරු ඇමතිතුමනි, ඔබතුමා හැම දාම එක්සත් ජාතික පක්ෂයට චෝදනා මුඛයෙන් තමයි කථා කරන්නේ, අපේ ආණ්ඩුව කාලයේ මේ අදාළ වැඩ පටන් ගත්තේ නැහැ කියලා. ඉස්සර වෙලාම ඒකට උත්තරයක් දීලා හිටියොත් හොඳයි කියලා මම හිතනවා. මම මේක කලිනුත් කියලා තිබුණා.

1970 දී මෙගාවොට් 300ක් වෙලා තිබුණු ලංකාවේ විදුලිබල ධාරිතාව මෙගාවොට් 1,000ක් වෙන කල් වැඩි කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේයි. ඊට පස්සේ 1981 ඉඳලා 1987 දක්වා -තමුන්නාන්සේ දැන් කියනවා වාගේම- ඉන්දියාවට විදුලිය දෙන්න අපිත් කල්පනා කළා ගරු ඇමතිතුමනි. 1987 ඉඳලා 1994 වන කල් විදුලි බලය පිළිබඳ ඉල්ලුම සහ සැපයුම සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් අපට තිබුණේ නැහැ. ඒ වාගේම 1994 වන තුරු අනාගතය පිළිබඳ ලොකු අවදානමක් ආවේ නැහැ. ප්‍රශ්නය ආවේ, 1994 ඉඳලා 1998 වන කල් අවුරුදු හතරක් ඇතුළත කිසිම දෙයක් පටන් ගත්තේ නැති නිසයි. එතැනින් තමයි ප්‍රශ්නය පටන් ගන්නේ. ගරු ඇමතිතුමනි, ඒ ඔබතුමාගේ කාලය නොවෙයි. ඔබතුමා ඒ කාලයේ චන්ද්‍රිකා මැතිනියට විරුද්ධව හිටපු පාර්ශ්වයේයි හිටියේ. දැන් ඔබතුමා ඒකත් අල්ලා ගෙන කියවන්න හදන්න එපා. කරුණාකර 2005 ඉඳලා කථාව කියන්න පටන් ගන්න. මොකද, 1977 ඉඳලා කථාව පටන් ගත්තාම අපට සිදු වෙනවා, අනෙක් පැත්තට කථා කරන්න. 1994 ඉඳලා 1998 දක්වා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ කිසිම දෙයක් සිද්ධ වුණේ නැති එකේ ප්‍රතිඵලය තමයි ඊට පසුව විදුලිය පිළිබඳ අර්බුදයකට යෑම. ඒක තමයි එතැනින් පස්සේ 2001වෙන කොට විදුලිය කප්පාදුවක තත්ත්වයට එන්නේ. පැය අටක විදුලිය කප්පාදුවකට යන්න රටට සිද්ධ වන්නේ අන්න ඒ කාරණය නිසයි. ගරු ඇමතිතුමනි, ඒ නිසා මං පළමුවෙන්ම කියන්න කැමැතියි, ඔබතුමා කාරණා විග්‍රහ කිරීමේදී කරුණාකර ඒ ගැන කල්පනා කරන්න කියලා.

ඊළඟට තවත් කාරණයක් ගැන මා කියන්න කැමැතියි. ඒ සම්බන්ධයෙන් ගරු හැරිසන් මැතිතුමාත් කියපු නිසා මා ඒ සඳහා වැඩි කාල වේලාවක් ගන්නේ නැහැ. ඒ තමයි විදුලිබල මණ්ඩලය ලාභ ලැබීමේ කථා වස්තුව. ගරු ඇමතිතුමනි, ඔබතුමා ජාතක කථාවලට බොහොම කැමැති නිසයි මා මෙය කියන්නේ. ඒක කථා වස්තුවක් වාගෙයි. ඒ තමයි විදුලිබල මණ්ඩලය ලාභ ලැබීමේ කථා වස්තුව. 2010 මැයි මාසයේ ඔබතුමා භාර ගත්තේ, රුපියල් කෝටි 4,000ක් විතර හෙවත් මිලියන 40,000ක් විතර පාඩු ලබනවා කියපු ආයතනයක්. 2009 විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාව පිළිබඳව මා කියන්නම්. ජල විදුලිය මඟින් නිපදවූ ප්‍රමාණය මෙගාවොට් 1,207යි. තෙල් මඟින් නිපදවූ ප්‍රමාණය මෙගාවොට් 1,290යි. කුඩා ජලවිදුලි බලාගාර මඟින් නිපදවූ ප්‍රමාණය මෙගාවොට් 187යි. මේ ඔක්කෝම එකතු කළාම ආසන්න වශයෙන් මෙගාවොට් 2,700ක් වෙනවා. වර්ෂාපතනය වෙනස් වීම මත, 2002 දී මිලියන ඒකක 2,589ක් විදුලිය නිෂ්පාදනය වුණා. 2010 දී මිලියන ඒකක 4,988ක් දක්වා එය වර්ධනය වෙලා තිබුණා. විදුලිබල මණ්ඩලයේ තෙල් බිල ගත්තාම, 2009 දී මිලියන 25,106යි. 2010 දී එය මිලියන 16,350 දක්වා අඩු වෙලා තිබුණා. ඒ වාගේම ඔබතුමා මිලියන 8,756ක් කපා දැම්මා යම් යම් cost cuttings වලට. ඒ නිසා තමයි ලාභ ලැබුණා කියලා ඔබතුමා කියන කථාව එන්නේ. ඒ ගැන කියන්න තමයි මා මේ හදන්නේ. මා අර කියපු ගණන අඩු කරමින් තමයි ඔබතුමා ඒ ආයතනය මේ තත්ත්වයට ගෙන ආවේ.

2009.12.31 දිනට රුපියල් කෝටි 5, 200ක් -රුපියල් මිලියන 52,000ක්- ගෙවන්න තිබුණු එක මහා භාණ්ඩාගාරයට පැවරුවා කියලා ඔබතුමා කිව්වා. මා ඒකටත් උත්තරයක් දෙන්නයි මේ හදන්නේ. මහා භාණ්ඩාගාරයට පැවරුවත් අප තමයි ගෙවන්න ඕනෑ. වෙන කවුරුවත් නොවෙයි. ඒක විදුලිබල මණ්ඩලය ගෙවන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලා ඒක විදුලිබල මණ්ඩලයෙන් පොඩ්ඩක් එහාට කරලා තිබෙනවා. එහාට කරලා තැබුවාම ආයෙත් ඒක වැටෙන්නේ කාගේ ඔළුවටද? ආයෙත්

වැටෙන්නේ මිනිසුන්ගේ -ජනතාවගේ- ඔළුවලටම තමයි. ඒක කොහෙන්වත් අඩු වන්නේ නැහැ.

නොරොච්චෝලේ, ඉහළ කොත්මලේ, කෙරවලපිටිය වෙනුවෙන් ගත් විදේශ ණය, පොලිය ආදි ඔක්කෝම මහා භාණ්ඩාගාරයට පැවරුවා. එතකොට මහා භාණ්ඩාගාරයෙන් ආපහු ගෙවන්න ඕනෑ. විදුලිබල මණ්ඩලය මේකෙන් අයින් වෙලා නිකම් ඉන්නවා. හැබැයි, ණය වාරික සහ පොලිය ගෙවන වැඩ පිළිවෙළත් ආපසු තිබෙන්නේ මහා භාණ්ඩාගාරයට. අවසානයේදී කොහෙන් හරි තැනකින් ඒක පත්තු වෙන්නේ මිනිස්සුන්ගේ ඔළුව උඩට. ඒ වාගේම තමයි 2010 දී රුපියල් 40 ගණනේ තෙල් ලීටර් මිලියන 580ක් ඔබතුමාට දුන්නේ ලීටරය රුපියල් 81ට තිබියදියි. එතකොට රුපියල් මිලියන 23,200ක සහනයක් දුන්නා. එහෙම සහනයක් දීලාත් ඔබතුමන්ලා ආපහු භාණ්ඩාගාරයට කථා කරනවා. එතකොට ඒකත් භාණ්ඩාගාරයෙන් ගෙවන්න ඕනෑ. ඉතින් ප්‍රශ්නයක් නැහැ. ඒවා ඔක්කෝම එකට එකතු කළාම ලාභ ලබනවාය කියන එක කාරණයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම අපි කියන්න කැමැතියි, ඒ විධියට ඔබතුමාට දුන් වැඩ පිළිවෙළ නැත්නම් රුපියල් මිලියන 40,000ක් පාඩු ලබමින් හිටපු ආයතනයක් එක පාරට රුපියල් මිලියන 4,447ක් ලාභ ලබන්න විධියක් නැහැ කියා. හැබැයි, ආපහු රුපියල් මිලියන 4,680ක පාඩු ලබන තැනකට තල්ලු වෙලා තිබෙන්නේ ඇයි කියන එක තමයි දැන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. ඒකට හේතු වුණේ මොකක්ද?

අපට ලැබුණු වර්ෂාවත් එක්ක ඔබතුමා ජලයෙන් විදුලි බලය නිෂ්පාදනය කරන්න යම් තීන්දුවක් ගත්තා. මේක තමයි ඇත්ත කථාව. එතකොට අනිත් සියලු දේවල් පැත්තකට දාලා ඔබතුමා ලැබිච්ච ලාභය යම් කිසි විධියකට පාවිච්චි කර ගෙන ඔබතුමා ජලය මඟින් වැඩි වැඩියෙන් විදුලිය නිෂ්පාදනය කරන්න පටන් ගත්තා. එතකොට අනිත් ක්‍රම මඟින් නිෂ්පාදනය කළ විදුලිය ප්‍රමාණය අඩු වීම නිසා විශාල ලාභයක් ලැබුවා. ඒ වාගේම තිබුණු අලාභ ටිකත් අයින් කර ගත්තා. ඒක හොඳයි. ඔබතුමා ලාභ ලබන්න කටයුතු කරපු එක ගැන මට කිසි ගැටලුවක් නැහැ. හැබැයි, ඒ ලාභය විදුලිබල මණ්ඩලයේ ලාභ ලැබීමේ කථා වස්තුවකට සීමා කරලා, "දීපදෝ හෝති චක්ඛුදෝ" කියලා 2010 දී මම කිව්වේ, ආලෝකය ලබා දීම දෙනෙත් ලබා දීම හා සමාන නිසායි. හැබැයි, 2011 වන විට දෙනෙත් අන්ධ කරන තැනකට තමයි ඔබතුමන්ලා ගේන්න හදන්නේ.

ඔබතුමන්ලා පසු ගිය අය වැයෙන් විදුලි බිලට සියයට 8ක වැඩි කිරීමක් ඉල්ලා සිටියා. සියයට 8ක් වැඩි කර ගත්තා. මෙහෙන් ලාභ ලබන කොට ජනතාවගේ ඔඩොක්කුවට තිබුණු බර අඩු වෙන්න ඕනෑ කියන එක පැත්තකින් තියලා ආපහු ජනතාවගේ ඔඩොක්කුවට තව සියයට 8ක විදුලි බිලක් ඔබතුමන්ලා පැටෙව්වා. විදුලිබල මණ්ඩලයෙන් දෙන සහනය විදුලිය ඒකක 90 ඉඳලා ඒකක 120 දක්වා වැඩි කරන්න කියලා ජනාධිපතිතුමා ඒ කාලයේ නියෝග කළා. 'දිනමිණ' පත්තරේ මහා ලොකුවට පොල් ගෙඩි අකුරෙන් ඒක දාලා තිබුණා. මෙතැන ඉන්නවා මාධ්‍යවේදියෝ. අපි බලා ගෙන ඉන්න කොට තමයි මේවා දිගටම පළ වුණේ. මම අහනවා ඔබතුමාගෙන් ඒකක 120 දක්වා වැඩි කළාද කියලා. ඒකක 120 දක්වා වැඩි කරන්න කියලා තිබුණා. ඔබතුමාට ඒකට උත්තරයක් දෙන්න පුළුවන්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලොකු කථාවක් කරන්න බැහැ. ඔව්ද, නැද්ද කියලා කිව්වොත් ඇති.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඇත්තටම මහජන උපයෝගිතා කොමිසම මඟින් සියයට 8කින් වැඩි කරනවා කියලා අතිගරු ජනාධිපතිතුමා අය වැය කථාවෙන් ප්‍රකාශ කළාට, ඇත්ත වශයෙන්ම වැඩි වුණේ සියයට 3කින් පමණයි. ඒකක 120 දක්වා ඒ සහනය දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, හම්බ වෙලා නැහැ. ඒක තමයි මම කියන්නේ. මේ වන තුරු හම්බ වෙලා නැහැ. ඔබතුමන්ලා දැන් මොකක්ද කරන්න හදන්නේ? ඊ ළඟට කරන්න හදන්නේ මොකක්ද කියලා මම කියන්නම්. "විදුලි ගාස්තු වැඩි නොකර මණ්ඩලයේ පාඩු පියවන්න බැහැ" කියා මහජන උපයෝගිතා කොමිසමේ සභාපති කියා තිබෙනවා. සහනය ලබා දෙන ඒකක සංඛ්‍යාව වැඩි කරලා ජනතාවට වැඩි සහනයක් දෙන්න කියලා ජනාධිපතිතුමා ඉල්ලනවා. ඒකත් දෙන්නේ නැතුව ලාභ ලබන බවත් පෙන්වලා දැන් පාඩු ලබන තැනකට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනිවාර්යයෙන් ලබන අවුරුද්දේ ඉඳලා මේ රටේ විදුලි බලයට ගෙවන්න තිබෙන ප්‍රමාණය නැවත වැඩි කරන එක තමයි ඊ ළඟට කරන්න හදන්නේ. දැන් තිබෙන කාරණාත් එක්ක අරගෙන මම ඔබතුමාට ගෞරවයෙන් කියන්න කැමැතියි, මේ වාතාවරණය ඉස්සරහට ගෙනිච්චොත් ලබන ජනවාරි මාසයේ මුල් සතිය, ඊ ළඟ සතිය වන කොට අනිවාර්යයෙන් නැවතත් විදුලි ගාස්තු වැඩි කරන්න වන තැනකට තමයි මේක තල්ලු වන්නේ කියා. එහෙම නැහැයි කියලා ඔබතුමාට පොරොන්දු වෙන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි. එහෙම වෙන්නේ නැහැ. ඒක තමයි අද සිද්ධ වෙමින් තිබෙන දේ.

මම මේ කාරණයත් විශේෂයෙන් කියන්න කැමැතියි. ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළවල් තිබෙනවා, ව්‍යාපෘති තිබෙනවා, ඒවා හොඳයි. ඔබතුමා කිව්වා, දැවැන්තම ව්‍යාපෘති සංඛ්‍යාවක් පටන් ගත්තා, ඒවායින් විදුලිය දෙනවා කියලා. ඔබතුමා කියලා තිබුණු කරුණු අනුව මෙගාවොට් 2,800ක විතර විදුලිය ධාරිතාවක් නිෂ්පාදනය වෙන්න තිබෙනවා. මෙගා වොට් 2,000යි අපට අවශ්‍ය වෙන්නේ. ඒ නිසා අපට කිසි ගැටලුවක් නැහැ. ලංකාවට විතරක් නොවෙයි ඉන්දියාවටත් විදුලිය දෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න පුළුවන් කියලා ඔබතුමා කිව්වා. එහෙම නේ කියන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම දැන් සිද්ධ වෙමින් තිබෙන්නේ මොකක්ද? මම ඔබතුමාට කියන්නම්. මේක ඔබතුමාට අදාළ කාරණයක් නොවෙයි.

කෙරවලපිටිය බලාගාරයට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා බලන්න. ඔබතුමා දන්නවා, කෙරවලපිටිය බලාගාරය පටන් ගත්තේ ඇමරිකානු ඩොලර් මිලියන 225.5කින්. ඒ කියන්නේ සාමාන්‍යයෙන් රුපියල් මිලියන 24,400ක්. ඇත්ත වශයෙන්ම අපි තවමත් දන්නේ නැහැ ගණන කියද කියලා. මම ඒක ඔබතුමාගෙන් අහනවා. ඔබතුමාවත් දන්නේ නැහැ. කෙරවලපිටිය බලාගාරයේ කටයුතු අවසන් වන විට වියදම් වන ඇත්ත ගණන කරුණාකරලා මේ පාර්ලිමේන්තුවට කියන්න. මොකද, ඔබතුමා නොවෙයි මේකට වග කියන්න ඕනෑ, මීට කලින් හිටපු විදුලිබල ඇමතිවරු. [බාධා කිරීමක්] මම දන්නා විධියට ඒකට රුපියල් මිලියන 35,000ක් වැය වුණා. මොකක්ද ඒකෙන් කියන කාරණය? අපට ලොකු ව්‍යාපෘති හදලා වැඩක් නැහැ කියන එකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට තිබෙන ප්‍රශ්නය තමයි මේවා හැදුවාම ඒවාට යන වියදම ගෙවන්න ඕනෑත් අපේ අහිංසක ජනතාව. ඒකයි තිබෙන ප්‍රශ්නය. දැන් බලන්න, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගරු ඇමතිතුමනි, මේකට ගිය වියදම රුපියල් මිලියන 35,000යි. මේ කාරණා ටික ඔක්කෝම එකට එකතු කරලා ගණන් හදලා බලපුවාම අවුරුදු 25ක් ගියාට පස්සේ ගෙවලා ඉවර වන කොට මිලියනවලින් 3,13,000ක් අපි ගෙවන්න ඕනෑ. 2025 වන කොට තවත් වැඩි වෙනවා. දවස ගණනේ මේකේ unit එකත් වැඩි වන තත්ත්වයකට වැටිලා තිබෙනවා. ඉතින් මෙහෙම ඒවා කරනවාට වඩා හොඳයි විදුලිය නැතිව ලාම්පුවක් දල්වා ගෙන ඉන්න එක. තව අවුරුදු 25කින් මේ කෙරවලපිටිය ව්‍යාපෘතිය භාර දෙන කොට අපි ගෙවන්න ඕනෑ මිලියන 3,13,000ක්. අපට මේක හදන්න ගිහිල්ලා තිබෙන්නේ, මිලියන 35,000යි. අපි කොච්චර කාලයක් ගෙවනවාද? කාටද මේ ගෙවන්නේ? මේක තමයි අපි අහන්නේ. කවුරු හරි කියනවා නම් මේක රටට විදුලිය දෙන්න ගෙනාපු ඉතාම වැදගත් යෝජනාවක් කියලා, අපට හිනා වෙන්න වෙන්නේ පිටිපස්සෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊ ළඟට කෙරවලපිටියේ fuel cost එක ගැන බලන්න. රුපියල් 82කට ගේන්න තිබෙන එක රුපියල් 40ටයි ඔබතුමන්ලා දෙන්නේ. එතකොට රුපියල් මිලියන 180ක තෙල් ලීටර් ප්‍රමාණයක් සාමාන්‍යයෙන් අවුරුද්දකට යනවා. රුපියල් 42 ගණනේ බැලුවොත් රුපියල් මිලියන 7,200ක් අවුරුද්ද ගණනේ අපි ජනතාවට මේකට සහනයක් දෙනවා. අවුරුද්දකට රුපියල් මිලියන 7,200ක සහනයකුත් දීලා, ඊට පස්සේ මිලියන 35,000ක වියදමකුත් කරලා, ආපහු තව මිලියන 3,13,000ක් අපි ගෙවන්නත් ඕනෑ. ඉතින් මේ විධියට කෙරවලපිටිය වාගේ ඒවා හදනවාට වැඩිය හොඳයි නිකම් ඉන්න එක. [බාධා කිරීමක්] ඒක තමයි මම මේ කියන්නේ. මේවා පටන් ගන්නේ නැතුව ඉන්න. මහ ලොකුවට කයිය ගැහුවාට වැඩක් නැහැ.

ඊ ළඟට බලන්න, අනෙක් ඒවා ගැන. සාමාන්‍යයෙන් විදුලිබල මණ්ඩලයෙන් ජලවිදුලි unit එකට රුපියල් 1.25කුයි ගෙවන්නේ. පෞද්ගලික ආයතනවලින් විදුලිය මිලදී ගන්න කොට ඔබතුමන්ලා ජලවිදුලි ඒකකයක් ගන්නේ කීයටද? ජලවිදුලිය පෞද්ගලික ආයතනවලින් රුපියල් 10ත්, 15ත් අතර ගණනකට තමයි අද ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
පුනර්ජනනීය විදුලිය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පුනර්ජනනීය විදුලිය. ඒක තමයි මම කියන්නේ. අපේ රටේ ස්වාභාවිකව ගලා ගෙන යන ජලය. අපි මේවා කුඩා ව්‍යාපාරික ආයතනවලට දීලා ජලවිදුලි ඒකකයක් ඔබතුමන්ලා රුපියල් 1.25 ගණනේ ගන්නවා. අඩු තරමින් ඔබතුමන්ලා ඒක රුපියල් 10 ගණනේ ගත්තා නම් කමක් නැහැ. ඔබතුමන්ලාට පෞද්ගලික අංශයෙන් රුපියල් 10ට, 15ට තමයි මේ unit එකක් ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඉතින් මෙහෙම මුළු රටටම විදුලිය දෙනවාය කියලා, සියයට 80කට තිබෙන විදුලිය සියයට 100ටම දෙනවාය කියලා වැඩක් නැහැ, අපේ මිනිසුන්ට දවස ගණනේ විදුලි වියදම වැඩි වෙනවා නම්. මේ තුළින් වියදම වැඩි වනවා. මේක නිකම් එකක් නොවෙයි. මේ වැඩි වෙන්නේ මොන හේතුවක් නිසාද? ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ නිසා නොවෙයි. මේ ප්‍රශ්නය තිබෙන්නේ මේවායේ සිදු වන අතිවිශාල හොරකම, දූෂණය සහ මං කොල්ලකෑම නිසායි. නිලධාරින් විසින් හෝ ඇමතිවරුන් විසින් හෝ මේ ව්‍යාපෘති පටන් ගන්න කොට ගහන ගැහිල්ලේ ප්‍රතිඵලය තමයි අහිංසක දුප්පත් මිනිසුන්ට අද ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. කෙරවලපිටිය ඒකට උදාහරණයක්. මිලියන 35,000ක් ගෙවන කොට, අවුරුදු 25කින් 3,13,000ක් අපට ගෙවන්න සිද්ධ වනවාය කියන්නේ මොන ගැහිල්ලක් ගහන්න ඕනෑද, ගරු ඇමතිතුමනි? මම අහන්නේ ඒකයි. මම ඔබතුමාට මේ කාරණය ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි.

අපි මේ කාරණය ගැන පාර්ලිමේන්තුවේ කථා කරන නිසා කරුණාකරලා කෙරවලපිටිය ව්‍යාපෘතිය ගැන නැවත අධ්‍යයනයක් කරන්න. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳව අධ්‍යයනයක් කරලා ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියලා. කෙරවලපිටිය ගැන අධ්‍යයනය කරලා, මෙන්න මේ වගේ තත්ත්වයක් ඇති වෙලා තිබුණා, ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියා මාර්ග මේවාය කියලා කරුණාකරලා වාර්තාවක් ඉදිරිපත් කරන්න. මම එතකොට පිළිගන්නම් ඔබතුමා නිවැරැදි විධියට වැඩ කරන කෙනෙක් කියලා. හැබැයි, ඔබතුමා ඒ විධියට වැඩ කරන්න පටන් ගත්තොත් ඔබතුමාට වැඩි කල් ඔතැන ඉන්න බැරි වෙයි. මම කියනවා, කෙරවලපිටිය කියන්නේ ඉතාම දූෂිත ගනුදෙනුවක්ය; දූෂිත ගනුදෙනුවක් මගින් විදුලි බලය නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළක්ය කියලා. මම ඔබතුමාගෙන් කරුණාකරලා ඉල්ලනවා, මේක පිටුපස්සේ ඉන්න අය කවුද, මෙහෙම වියදම් කරන්න සිද්ධ වුණේ ඇයි කියලා කරුණාකර හොයලා බලන්න කියලා.

ඔබතුමා කිව්වා, අලුත් විදුලිබල නිෂ්පාදනයන්ට යනවාය කියලා. දැන් බලන්න, ඔබතුමන්ලා කල්පිටියේ පටන් අරන් තිබෙනවා, සුළං බලෙන් විදුලිය ජනනය කරන ව්‍යාපෘතියක්. දැන් සුළං බලෙන් විදුලිය ජනනය කරනවා.

මෙම ව්‍යාපෘතිය නොයෙල් සෙල්වනායගම් මහතාට අයිති පුත්තලම, කල්පිටියේ Senok Trade Combine (Pvt.) Limited කියන ආයතනයට දීලායි තිබෙන්නේ. මේ ව්‍යාපෘතියෙන් දැනට ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 60ක් සම්බන්ධ කර තිබෙනවා. පළමු අවුරුද්දේ ඒකකයක් රුපියල් 27යි. නිකම් තිබෙන හුළං පාරෙන් මේ විදුලි බලය ජනනය කරන්නේ. කවුද මේවාට වග කියන්නේ? ගරු ඇමතිතුමනි, රුපියල් 13ට තමයි තමුන්නාන්සේ විදුලි බලය විකුණන්න ඕනෑ. එහෙම විකුණුවේ නැති වුණොත් තමුන්නාන්සේගේ ඔළුවට එනවා, විදුලිය මිල වැඩියි කියලා. එහෙම නම් තමුන්නාන්සේලා මොකටද මේවා හදන්නේ? ඔබතුමන්ලා මෙතැනට ඇවිල්ලා පුනර්ජනනීය විදුලි බලය කිය කියා කතා කරනවා. කොච්චර දේවල් කතා කෙරුවත් වැඩක් නැහැ. නිකම් තිබෙන සුළං බලයෙන් ලැබෙන විදුලිය කරකවලා එනකොට ඒකකයක් රුපියල් 27ක් වෙනවා. සාමාන්‍යයෙන් මේ ව්‍යාපෘති කරන්නේ විදුලි බල මණ්ඩලයෙනුයි. ටෙන්ඩර් කැඳවලා ටෙන්ඩර්වලින් ආපු කට්ටියට තමයි මේ ව්‍යාපෘති දෙන්නේ. එහෙම නැත්නම් විදුලිබල මණ්ඩලයෙන් ක්‍රියාත්මක කරනවා. සුළං බලයෙන් ක්‍රියා කරන, විදුලිබල මණ්ඩලයත් එක්ක සෘජුව ක්‍රියාත්මක වන එක විදුලිබල ව්‍යාපෘතියක්වත් තිබෙනවාද කියා මම අහනවා. [බාධා කිරීමක්] මගේ වෙලාව යනවා. ඔබතුමා ඊළඟට කතා කරනකොට කියන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒක ඒ සඳහා ගත්තු ප්‍රතිපත්තිමය තීරණයක්. ඒක අපට අලුත් අත් දැකීමක් නිසා ඒකට ඒ අවස්ථාව දුන්නා. ඉදිරියේදී අපි ඒ අවස්ථාව ලබා දෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ඔය රුපියල් 23 ගණන අවුරුදු අටකට පසුව රුපියල් 12 දක්වා අඩු වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, අඩු වෙන්නේ නැහැ. මම ඔබතුමාට ගණන කියන්නම්. ඔබතුමාව රවටා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. අවුරුදු අටක් ගියාමත් රුපියල් 21ක් දක්වා තමයි අඩු වෙන්නේ. රුපියල්

12 දක්වා අඩු වෙන්නේ නැහැ. මා ළඟ මේ ගණන් තිබෙන නිසායි කියන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා නොවෙයි ඒකත් දුන්නේ. ඒක හිටපු එක්කෙනෙක් කාගේ හරි නෑදෑයකුට, පුතෙකුට උදව් කරපු නිසා, campaign manager වුණු නිසා නොයෙල් සෙල්වනායගම් මහත්මයාට දුන්නා. කෙළින්ම Senok එකට අරගෙන දුන්නා. Senok එකෙන් තමුන්නාන්සේලා ඒකකයක් රුපියල් 27 ගණනේ ගන්නවා. කරුණාකරලා මේ ගැන සොයා බලන්නනය කියා මම කියනවා. නොමිලේ ලැබෙන හුළං ටිකෙනුත් තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට විදුලිය කවන්න තමයි දැන් කටයුතු කරගෙන යන්නේ. ඒ වාගේම අවසාන වෙනකොට මේකේ ගණන අඩු වෙන්නේ රුපියල් 15 දක්වායි. අවුරුදු අටක් වෙනකොට ඒකකයක් රුපියල් 21යි. ඉන් පසුව නැවතත් අවුරුදු නවයකට අත්සන් කරලා තිබෙනවා. ඔක්කොම අවසානයේදී ඒකකයක් රුපියල් 15ක් වෙනවා. තවත් රුපියල් 2ක් පාඩු පිට තමයි තමුන්නාන්සේලාට අවසානයේ මේවා ගන්න වෙන්නේ.

ඊළඟට, උතුරේ ක්‍රියාත්මක කරන්න යන විදුලිබල ව්‍යාපෘතිය කොහේද දමන්නේ? ඒකත් මේ විදියටම යාවිද දන්නේ නැහැ. ඒකයි මම කියන්නේ, අලුත් විදුලිබල වැඩ පිළිවෙළවල් හැදුවාට වැඩක් නැහැ, මේවායින් දවසින් දවසම සිදු වෙන්නේ රටේ හොරකම සහ වංචාව වැඩි වෙන එක විතරයි කියලා.

දැන් බලන්න, තමුන්නාන්සේලා නොරොච්චෝලේ coal power plant එකක් පටන් ගත්තා. දැන් ඒකට මොකද වෙලා තිබෙන්නේ? සාමාන්‍යයෙන් ඒකෙන් මෙගාවොට් 300ක විදුලිබල ධාරිතාවක් දෙන්න ඕනෑ. මොකක්ද වෙලා තිබෙන්නේ? ලක්විජය එකෙන් මෙගාවොට් 700ක් දෙන්න ඕනෑ. දැන් කොච්චරද දීලා තිබෙන්නේ? 2011 පළමුවන කාර්තුවේදී මෙගා වොට් 265යි හම්බ වෙලා තිබෙන්නේ. ඉතින් මේකෙන් target එකට යන්න පුළුවන්ද? දැන් දවස ගානේ මේක කැඩෙනවා. මේක හරියට ඇමෙරිකන් එකක්ය කියා හිතා ගෙන චීන භාණ්ඩයක් දැම්මා වාගෙයි. හරියටම සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි. යුරෝපීය භාණ්ඩයක්ය කියා හිතා ගෙන චීන භාණ්ඩයක් දමනවා. එහෙම දමලා දැන් ඒක දවස ගානේ කැඩිලායි තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මේකේ ඇවිල්ලා තිබෙන ගණන බලන්න. මෙගාවොට් 700ක් දෙන්න ඕනෑ නමුත් ජූනි අග වනකොට ලැබී තිබෙන්නේ මෙගා වොට් 265යි. කෙරවලපිටියෙන් මෙගා වොට් 670ක් ලැබෙන්න නියමිතව තිබුණත් මෙගා වොට් 275යි ඇවිල්ලා තිබෙන්නේ.

විදුලිබල අර්බුදය ගැන කතා කරලා ගරු ඇමතිතුමා පුවත් පත්වලට කියා තිබුණා, කිසි දෙයකට සැලෙන්න එපා; ලක් විජයයි, කෙරවලපිටියයි හදලා ඉවරයි; රටේ විදුලි බලය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ කියා. හැබැයි ඉතින් මේවායින් අපට එන්න ඕනෑ ධාරිතාව එන්නෙත් නැහැ. මෙගාවොට් 700ක් එන්න තිබෙනවා. හැබැයි එන්නේ මෙගාවොට් 275යි. ගරු ඇමතිතුමනි, ඉතින් රටේ අඛණ්ඩ විදුලිබල සැපයුමක් තිබෙනවාය කියා තමුන්නාන්සේ කියන්නේ කොහොමද? ඒක තමයි තමුන්නාන්සේ කිව්වේ, "හදිසියේ විදුලිය විසන්ධි වෙනවා" කියා. පසු ගිය කාලයේදී තැන් තැන්වල හදිසියෙන් විදුලිය විසන්ධි කරලා බැලුවා, මොකද වෙන්නේ කියලා. තැන් තැන්වලින් විදුලිය විසන්ධි කළා. Call කරලා අහලා බැලුවාම විදුලිය විසන්ධි වෙලා. ඇහුවාම කවුරුවත් දන්නේ නැහැ, මොකද වෙලා තිබෙන්නේ කියලා. ඒක ඇතුළෙන්ම කෙරුණු හොර වැඩක්. පැයක්, පැය එකහමාරක් රටටම විදුලිය නැතිව යනවා. බැලුවාම ඒකෙන් මොකක්ද කරලා තිබෙන්නේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේ කළාය කියා මම විශ්වාස කරන්නේ නැහැ. තමුන්නාන්සේම ඉංජිනේරුවෙක් වශයෙන් වැඩ කළ නිසා පෞද්ගලිකවම ගිහින් විදුලි බලය සඳහා යන වියදම් අඩු කර ගැනීම සඳහා එහෙම කළාද කියා මම දන්නේ නැහැ.

නමුත් අන්න ඒකයි සිද්ධ වුණු කාරණය. හදිසියේ තැන් තැන්වල විදුලිය කප්පාදු කරනවා. ටක්, ටක් ගාලා කපලා දමනවා. මේක තමයි තමුන්නාන්සේලාගේ කාල වකවානුව තුළ සිද්ධ වෙමින් තිබෙන්නේ.

එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ විදුලිය ව්‍යාපෘති එක එක පෞද්ගලික කොම්පැනිවලට දුන්නා කියලා ඔබතුමන්ලා කිව්වා. මම කියනවා ඔව්, අපි පෞද්ගලික කොම්පැනිවලට දුන්නා. පුත්තලමේ "හෙළ දනව්" බලාගාරය එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේ අපි හැදුවේ. විදුලිය ඒකකයක මිල රුපියල් 8.90යි. Ace Power Embilipitiya (Pvt.) Limited අපි යූඑන්පී එකෙන් හැදුවේ. ඒකකයක මිල රුපියල් 9.50යි. Ace Power Matara (Pvt.) Limited ඒකකයක මිල රුපියල් 10.40යි. Ace Power Generation Horana (Pvt.) Limited ඒකකයක මිල රුපියල් 10.40යි. ඔබතුමන්ලාගේ West Coast Power (Pvt.) Limited එකේ ඒකකයක මිල කීයද? රුපියල් 24.60යි. Combined Cycle Power Plant කියලා එන්න තිබෙන එකේ - තමුන්නාසේලා හිතා ගෙන ඉන්න එකේ -ඒකකයක මිල රුපියල් 16.25යි. මෙන්න මෙතැනට තමයි මේ ආයතනය තල්ලු වෙලා තිබෙන්නේ.

විදුලි අර්බුදය ගැන තමුන්නාන්සේලා කථා කරනවා. දැන් බලන්න, අපේ ජනාධිපතිතුමා කිව්වා නොරොච්චෝලේ "ලක්විජය" බලාගාරය ගැන. ඒක විවෘත කරන්න තිබුණේ 2012 ජනවාරි මාසයේ. ඔබතුමන්ලා හදිසියේ ඡන්ද අල්ලලා -ප්‍රාදේශීය සභා මැතිවරණය අල්ලලා- ඒක විවෘත කළා. මම බොහොම වග කීමක් ඇතිව කියනවා, ඇත්ත වශයෙන්ම ඒක විවෘත කරන්නේ නැතිව test run එකකට ගිය එකක් තමයි ඔබතුමන්ලා ටීවී එකට දැම්මේ කියලා. ජනාධිපතිතුමාට පෙනෙන්න ලොකු තිරයක් දමලා ඊට කලින් දවසේ කරපු test run එක තමයි ගෙනැල්ලා දැම්මේ.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අමූලික අසත්‍යයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අමූලික අසත්‍ය නොවෙයි, සම්පූර්ණ ඇත්ත. ඊට කලින් record කරපු එක ගෙනැල්ලා දැම්මා. ගෙනැල්ලා දමලා ජනාධිපතිතුමාට පෙන්වුවා අන්න වැඩේ පටන් ගත්තා කියලා. එහෙම පටන් ගත්ත නිසා තමයි අද කැඩිලා තිබෙන්නේ. ඇයි, මේ චීන කොම්පැනිය කිව්වා මේක භාර දෙන්න, 2012 ජනවාරි මාසය දක්වා කාලය දෙන්න කියලා. හැබැයි, කලින් භාර ගැනීම නිසා එක පැත්තකින් චීන කොන්ත්‍රාත්කරුවාට ලොකු වාසියක් ලැබුණා. ඇයි, ඒ අයට තව කාලයක් ඉඳ ගෙන මේක කරන්න වුවමනාවක් නැහැ.

ඒ වාගේම ඔබතුමන්ලා taking-over certificate එක ගන්න කලින් සියලු මුදල් ටික දීලා ඉවරයි. දැන් මොකුත් කථා කරන්න දෙයක් නැහැ. ඇයි, මේක භාර දීලා ඔබතුමන්ලා වැඩේ භාර ගත්තා. භාර අර ගෙන වැඩේ කර ගෙන යන කොට තමයි දැන් රුපියල් මිලියන 300ක් ගෙවලා උපදේශන සේවයක් දෙන්න ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ. ඒකෙන් ඔබතුමා කල්පනා කළේ වෙනත් දෙයක් නොවෙයි. මේක දිගින් දිගටම කැඩෙනවා. කිසිම control එකක් නැහැ. පහු වෙලා තමයි මේක ඇතුළට අපේ ඉංජිනේරුවරු ගියේ. ඒ අයට ඇතුළට යන්න දුන්නේ නැහැ. චීන කොන්ත්‍රාත්කරුවෝ මේකේ වැඩ කර ගෙන ගියා. අපේ අය පහු වෙලා ගිහිල්ලා දැන් අපේ අය system එක හෙමිහිට අල්ලා ගෙන යනවා. එහෙම කරන කොට දවස ගානේ ඒක කැඩෙනවා. ඒ නිසා "ඒ ගොල්ලන්වත් ගෙනැල්ලා මාස 6ක් දීලා මොකද වන්නේ කියලා බලමු" කියලා රුපියල් මිලියන 300ක් ගෙවලා උපදේශන සේවයක් ලබා ගන්න ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් දුන්නා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඊට පස්සේ ආණ්ඩුවෙන් මොකද කළේ? "ඉබ්බා දියේ දානකොට ඇන්නෑවේ කිව්වාලු" ඒ වාගේ ඔබතුමා දාපු Cabinet Paper එකට ආණ්ඩුවේ කට්ටිය කිව්වේ මොකක්ද? ආණ්ඩුවේ ප්‍රධානින්ගෙන් යෝජනාව ආවා නැහැ, අපි මේක කෙළින්ම දීලාම ඉවර කරමු කියලා. ඔබතුමා කැමැති වුණේ නැහැ. ඔබතුමා ඉල්ලුවේ උපදේශන සේවයක් දෙන්න කියලායි. "ඉබ්බා දියේ දානකොට ඇන්නෑවේ කිව්වාලු" ඒ වාගේ අර ගොල්ලන් මොකක්ද කිව්වේ? ඒ ගොල්ලන් කිව්වා මේක දීලාම ඉවර කරමු කියලා. ගණනක් අර ගෙන ඉවර කරන්න පුළුවන්. මෙගාවොට් 300ක ධාරිතාවක් තිබෙන නොරොච්චෝලේ වැනි ඔබතුමන්ලා කියන මහා ලොකු ව්‍යාපෘති මේ රටේ හදනවා. කෙරවලපිටිය හැදුවා. බලන කෙට අපට පෙනෙන්නේ මුළු ලංකාවම ලයිට් කණු උඩ තිබෙනවා වාගෙයි. හැබැයි බැලුවාම ඔක්කොටම current එක වැදිලායි තිබෙන්නේ. හැම තැනකම විදුලි බලාගාර ගහලා. හැම තැනකම ජල විදුලිය එනවා. ලංකාවම ස්වයංපෝෂිතයි. ඊළඟට ලංකාවෙන් ඉන්දියාවට පොහොර දෙනවා. බලා ගෙන යන කොට මහා විශාල වෙනසක් තමයි රට ඇතුළේ තිබෙන්නේ. නමුත් මෙන්න මේකයි ඇති වෙලා තිබෙන තත්ත්වය. දැන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේ මෙගාවොට් 300 බලාගාරය දුවන්න බැරිව තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා ඔබතුමා දන්නවා. නැවෙන් ගෙනැල්ලා, නැවෙන් tugsවලට දමා ගෙන එතැනින් ගෙනැල්ලා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට තව විනාඩියක් දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්. මම අවසන් කරනවා. මට විනාඩි කීයක් තිබෙනවාද? තව විනාඩි දෙකක් දෙන්න බැරිද? අපි දෙන්නා රණ්ඩු වන්නේ නැතිව, මට තව විනාඩි දෙකක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අනෙක් කථිකයාත් ඉන්නවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් මේ ප්‍රශ්නය තිබෙද්දී මෙගාවොට් 300 කරන්නත් තමුන්නාන්සේට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා ඒ කාලයේ කිව්වා ගල් අඟුරු මෙහෙම යන්නේ කියලා. තමුන්නාන්සේ මෙතැන ඉන්න කොට එක දවසක් මම කථා කරන කොට කිව්වා ලෝකයේ ගල් අඟුරු මෙන්න මේ විධියටයි යන්නේ කියලා. අනෙක් ඒවා මෙහෙම යන්නේ කියලා. දැන් ගල් අඟුරු මෙහෙම යන්න පටන් අර ගෙන තිබෙනවා. දැන් ගල් අඟුරු නැඟ ගෙන යනවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ඔබතුමන්ලාට නිකම් ඉන්න බැහැ. ගල් අඟුරු ගෙනැල්ලා තියා ගන්න පුළුවන් විධියට ගබඩා සංකීර්ණයක් හදා ගන්න ඕනෑ. ගල් අඟුරු ගෙනැල්ලා පුරවා ගන්න අක්කර හාරපන්දහසක් වුවමනා වනවා.

ඒ විතරක් නොවෙයි. ඒ විධියට ගල් අඟුරු පුරවා තියා ගන්න යන වියදම, ඒවායේ මිල උච්චාවචනය වෙන ඒවා කවුද ගණන් ගණන් හදලා තිබෙන්නේ? හැබැයි, මේකේ අසාර්ථකභාවය දැන දැන තවත් වැඩවලට තමුන්නාන්සේලා දැන් අත්සන් කර තිබෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා නොවෙයි, මා දන්නේ නැහැ කවුරු අත්සන් කළාද කියලා. තමුන්නාන්සේලා මේ කථා කිව්වාට, "කථාව දෝලාවෙන්, ගමන පයින්" වාගේ වැඩක් තමයි දැන් සිදු වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ විදුලිය අවශ්‍යතාව පරිපූර්ණ කරන්නට ආණ්ඩුව ගත්ත ක්‍රියා මාර්ග හැම එකක්ම, මේ රට විකුණන, අනාගතයේ මේ රටේ මිනිසුන්ට විදුලිය වද්දන වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබෙනවාය කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[பி.ப. 3.15]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இந்தச் சபையிலே மின்வலு சம்பந்தமாகக் கருத்துத் தெரிவிக்கப் படுகின்ற இந்த வேளையிலே எங்களுடைய மீள்குடியேற்றக் கிராம மக்கள் எந்தளவுக்கு மின்சார வசதிகளைப் பெறுகின்றார்கள் என்பது பற்றி நான் எடுத்துக்கூற விரும்புகின்றேன். 'வடக்கின் வசந்தம்' என்று சொல்லப்படுகின்ற திட்டத்தினூடாக எங்களுடைய மீள்குடியேற்றக் கிராமங்களுக்கு மின்சார வசதி செய்து கொடுக்கப்படுகின்றபோதிலும், இப்பொழுது 'வடக்கின் வசந்தம்' என்பது, வடக்கின் சூறாவளியாக மாறியிருக்கின்றது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஏனென்றால், தங்களுடைய கிராமத்துக்கு அல்லது வீட்டுக்கு அந்தத் திட்டத்தின் ஊடாக மின்சாரம் கிடைக்கும் என்ற ஆவலோடு, மின் இணைப்புக்காகத் தங்கள் வீதியோரங்களிலுள்ள மரங்களை எல்லாம் வெட்டித் துப்புரவு செய்து காத்துக்கொண்டிருந்த எங்களுடைய மக்கள், இன்று அந்த வேலைத்திட்டங்கள் நிறுத்தப்பட்டுவிடுமோ என்ற ஐயப்பாட்டுடன் இருக்கின்றார்கள். அதாவது, யுத்தத்தின் பின்னரான வடக்கு மாகாணத் துரித அபிவிருத்தித் திட்டத்தின்கீழ், பொருளாதார அபிவிருத்தி அமைச்சின் 'வடக்கின் வசந்தம்' திட்டத்தின் ஊடாக வடக்கில் மின்சாரம் வழங்கும் செயற்பாடுகள் உரிய காலத்துக்குள் நிறைவேற்றப்படாமைக்குக் காரணம், குறித்த மின் உபகரணங்களின் கொள்வனவுக்காகச் சீன நிறுவனத்துக்கும் இலங்கைக்கும் இடையில் இடம்பெற்ற ஒப்பந்தப்படி அந்நிறுவனத்திற்குப் பணம் செலுத்தப்படாமையே ஆகும் எனத் தெரிய வருகின்றது. அந்தவகையில் இன்றைக்கு வடக்கைப் பொறுத்த மட்டிலே மின்சாரம் வழங்குவதற்கான வேலைகள் இடைநிறுத்தப்பட்டிருக்கின்றன என்பதை நான் இங்கு கூறிக் கொள்ள விரும்புகின்றேன்.

இக்காலப் பகுதியில் இதுவரை வடக்கில் 900 கிலோமீற்றர் தூரம் வரையில் மட்டுமே வீதியோரக் குறைவழுத்த மின் கம்பங்கள் புதிதாக நிறுவப்பட்டுள்ளன. அதேநேரம், ஏற்கெனவே உள்ள திட்டப்படி மேலும் 1,100 கிலோமீற்றர் தூரம் மின் கம்பங்கள் இடுகின்ற வேலை இடைநடுவே நிறுத்தப்பட்டுள்ளது. அத்துடன், தூண்கள் நிறுவப்பட்டுள்ள 250 கிலோமீற்றர் தூரத்திற்குரிய இணைப்பு வேலைகளும் குறைவழுத்த மின்கம்பிகள் இதுவரை கிடைக்காததால் இலங்கை மின்சார சபையினால் பாதியிலே நிறுத்தி வைக்கப்பட்டுள்ளன. இதனைவிட, மீள்குடியேற்றக் கிராமங் களில் மேலதிகமாக 1,500 கிலோமீற்றர் தூரம்வரை மின் கம்பிகள் பொருத்தப்பட வேண்டியிருக்கின்றபோதிலும் அவ்வேலைகளும் நிறுத்தப்பட்டிருக்கின்றன. அதேவேளை, இந்த மின் இணைப்புக்கான கம்பங்கள், மின்சாரக் கம்பிகள், சட்டங்கள் மற்றும் மின் இணைப்புக்கான பொருட்கள் அத்தனையும் சீன நிறுவனத்தால் வழங்கப்பட்டுள்ளன. ஆனால், இவை காலங்காலமாக இந்தியாவிடமிருந்தே கொள்வனவு செய்யப்பட்டுவந்தன. அரசு இப்பொழுது இப்பொருட்களைக் கடன் அடிப்படையில்

கொள்வனவு செய்யவே சீன நிறுவனம் ஒன்றுடன் ஒப்பந்தம் செய்துள்ளது. இதற்கு ஒரு குறிப்பிட்ட தொகையை அரசு அந்நிறுவனத்திற்குச் செலுத்தியாக வேண்டும். இந்த ஒப்பந்தத்தின் அடிப்படையில் அந்நிறுவனத்திற்கு சீன அரசும் கட்டங் கட்டமாக நிதியினை வழங்கும். அதேநேரம் இந்தியாவில் இருந்து aerial bundled cableகளையும் மலேசியாவில் இருந்து ஏனைய சில மின் உபகரணங்களையும் மற்றும் பொருட்களையும் இலங்கையில் இருந்து தூண்கள், மின்சாரக் கம்பிகள் மற்றும் அதனுடன் சம்பந்தப்பட்ட பொருட்களையும் கொள்வனவு செய்து விநியோகிப்பதும் இந்த உடன்படிக்கையின் ஒரு விடயமாகும். எனினும், சீன அரசாங்கம் அந்நிறுவனத்துக்குப் பணத்தைச் செலுத்தாததனால் அந்நிறுவனம் இந்த மின் உபகரணங்களை வழங்குவதை நிறுத்தியுள்ளது. இந்தப் பொருட்கள் அனைத்தும் இங்கிலாந்து நாட்டுப் பொருட்களின் தரத்திற்கு நிகராகத் தயாரிக்கப்பட்டதாக இருக்க வேண்டும் என்றும் இந்த ஒப்பந்தத்தின் ஒரு சரத்திலே குறிப்பிடப்பட்டுள்ளது. இந்த ஒப்பந்த அடிப்படையிலே 2009 யூன் மாதத்திலிருந்து 2010 நடுப்பகுதி வரை குறித்த மின் உபகரணங்கள் இந்தியாவிடமிருந்து பெற்று விநியோகிக்கப்படவிருந்தன. இதனைவிட, இலங்கையிலுள்ள ACL என்னும் நிறுவனம் இங்கிலாந்து நாட்டின் தரத்தில் மேற்குறிப்பிட்ட பொருட்களைத் தரவல்ல நிலைமையில் இல்லையென்பது குறிப்பிடத்தக்கது. இந்த நிலையிலே இப்படிக் கைச்சாத்திடப்பட்ட பல ஒப்பந்தங்கள்மூலம் இந்தத் திட்டம் பல பின்னடைவுகளைச் சந்தித்துக்கொண்டிருக்கின்றது. 'வடக்கின் வசந்தம்' திட்டத்தின்மூலமாக வடக்குக்கு மின்சாரம் வழங்குவதற்கென மின்னிணைப்புகளைச் செய்வதற்காக 667 மில்லியன் ரூபாய் பெறுமதியான மின் உபகரணங்கள், அவற்றுக்கான கூலி உட்பட 5,297 மில்லியன் ரூபாய் தேவையாகவுள்ளது. அதற்கான பொருட்கள் வழங்கப்படாததால் அங்கே மின்னிணைப்பு வேலைகள் நிறுத்தப்பட்டுள்ளன. எனவே, இந்த ஒப்பந்தத்தில் ஏற்படுகின்ற பிரச்சினைகள் காரணமாக வடக்கிலுள்ள மீள்குடியேற்றக் கிராமங்களுக்கு இன்று 'வடக்கின் வசந்தம்' இல்லாமற்போகின்ற நிலை இருப்பதாகத்தான் எங்களுடைய மக்கள் உணர்கின்றார்கள்.

"2013ஆம் ஆண்டிலே இந்த நாட்டில் அனைத்து மக்களுக்கும் மின்சாரம் வழங்கப்படும்" என்று 'மகிந்த சிந்தனை'யிலே சொல்லப்பட்டுள்ளது. ஆனால், இந்த இழுபறிகள் முடிவுக்குக் கொண்டுவரப்பட்டு, 2013ஆம் ஆண்டுக்குள் எந்தளவுக்கு அது நிறைவேற்றப்படும் என்பதில் எங்களுக்குச் சந்தேகம் எழுகிறது. இதனால், இந்த மீள்குடியேற்றக் கிராமங்களிலே இருக்கின்ற எங்களுடைய மக்கள் இருட்டு வாழ்க்கையைத் தொடர்ந்தும் அனுபவிக்க நேரிடுவதுடன், அதனூடாகப் பல இன்னல்களையும் சந்தித்துக்கொண்டிருக்கும் நிலை தொடரும். ஏற்கெனவே நொந்துபோன அந்த மக்கள், தங்களுடைய நிலைமை சீராகும் என்ற சிந்தனையோடு இருந்துகொண்டிருக்கின்ற சூழலிலே, ஒப்பந்தத்திலே நடந்த குளறுபடிகள் காரணத்தினால் இந்த மின்சார விநியோக நடவடிக்கைகள் மிகக்குறைவான அளவில் மேற்கொள்ளப்படுவதை அல்லது நிறுத்தப்பட்டிருப்பதையிட்டு அரசாங்கம் மிகவும் வெட்கப்படவேண்டியுள்ளது. "மீள்குடியேற்றம் செய்துவிட்டோம்; அந்த மக்களுக்கு எல்லாவிதத்திலும் சலுகைகள் செய்து வருகின்றோம்" என்றெல்லாம் அரசாங்கம் வெளியுலகுக்குச் சொல்லிக்கொண்டிருக்கின்ற வேளையிலே, இன்றைக்கு இந்த 'வடக்கின் வசந்தம்' திட்டம் ஏன் நிறுத்தப்பட்டிருக்கின்றது? என்ற செய்தியை எங்களுடைய மக்களுக்குச் சொல்லமுடியாமல் திண்டாடிக்கொண்டிருக்கிறது. தொடர்ந்தும் எங்களுடைய மக்களுக்கு மட்டும்தான் இந்த நாட்டில் ஓரவஞ்சனை காட்டப்படுகின்றது என்று நாங்கள் நினைக்கக்கூடிய வகையில் இந்த விடயங்கள் தொடர்பான நடவடிக்கைகள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. எங்களுடைய கிராமங்களிலே வீடு வாசல்கள் இல்லாத, மின்சாரம் இல்லாத, மற்றும் அடிப்படை வசதிகள் இல்லாத சூழ்நிலையிலே கொண்டுபோய் அந்த மக்களை இறக்கிவிட்டிருக்கின்ற நிலையில், அவர்கள் மிக இருட்டான சூழலிலே குப்பிவிளக்கோடு வாழ்க்கை நடத்திக்கொண்டிருக்கின்ற அளவுக்குத்தான் மீள்குடியேற்றம் என்று சொல்லப்படுகின்ற நடவடிக்கை காணப்படுகின்றது. இந்த நிலைமையை உலக நாடுகளுக்கு நாங்கள் சொன்னால், இந்த அரசுக்குக் கோபம் வருகின்றது. எங்களுடைய மக்களின் பிரச்சினைகளை நாங்கள் சர்வதேச ரீதியாகவும் சொல்லக் கடமைப்பட்டவர்கள். ஏனென்றால், அந்த மக்கள் எங்களைத் தமது பிரதிநிதிகளாகத் தெரிவுசெய்து அனுப்பியிருக்கிறார்கள். ஆகவே, நாங்கள் அவர்கள் சார்பான அனைத்து உரிமைப் பிரச்சினைகளையும் அடிப்படைப் பிரச்சினைகளையும் பற்றிக் குரல் கொடுக்கவேண்டிய கடமைப்பாடுடையவர்களாக இருக்கிறோம்.

இந்த மின்சாரம் என்பது எங்களுக்குக் கடந்த காலங்களிலிருந்து தொடர்ந்தும் மறுதலிக்கப்பட்டு வருகின்ற ஒரு நிலைதான் காணப்படுகின்றது. மன்னாரைப் பொறுத்த மட்டிலே, மற்றைய இடங்களைவிட ஒரு நாளைக்குக் கிட்டத்தட்ட ஐந்து தரம் மின்சாரம் தடைப்படுகிறது. சிலவேளைகளிலே ஐந்து தரத்துக்குமேலாகவும், தொடர்ச்சி யாகவும் தடைப்படுகின்றது. அதற்கான காரணத்தைக் கேட்டால், "கடற்காற்று வீசுகின்றபோது இந்த நிலை ஏற்படுகின்றது; யாழ்ப்பாணத்திலும் அந்த நிலை இருக்கிறது" என்று சொல்கிறார்கள். நான் நினைக்கிறேன், கடந்த பத்து வருடங்களுக்கு மேலாக மன்னார், யாழ்ப்பாணம் போன்ற பகுதிகளிலே இந்த மின்சாரத் தடை இருக்கின்றதென்று. இப்பொழுதும் மன்னாரில் நகரப் புறங்களிலே மின்சாரத் தடை மிகவும் கூடுதலாக இருக்கின்றது. அங்குள்ள ஏனைய இடங்களுக்கு மின்சார விநியோகம் கொடுக்கப்படவில்லை. இதனால், படிக்கின்ற மாணவர்களும் குழந்தைகள் உள்ள குடும்பங்களும் மிகவும் சிரமப்படுகின்றார்கள். மின்சார விநியோகம் தடைப்படுகின்ற உண்மையான காரணத்தை நீங்கள் சொல்ல வேண்டும்; அதைச் சீர்செய்வதற்கான நடவடிக்கையை எடுக்க வேண்டும். நான்ஏற்கெனவே குறிப்பிட்டதுபோல, ஒரு நாளைக்கு 5-6 மணித்தியாலங்கள் - சிலவேளைகளில் முழுநாளும் - மின்சாரம் தடைப்படுகின்ற ஒரு பரிதாப நிலையிலே எங்களுடைய மாவட்டம் காணப்படுகின்றது. குறிப்பாக வவுனியா, மன்னார், யாழ்ப்பாணம் போன்ற வடக்குப் பிரதேசங்களிலே தடையின்றி மின்சாரம் வழங்கக்கூடிய ஒரு நிலை இருந்தாலும்கூட எங்களுடைய மக்கள் மிக மோசமான முறையில் மின்சாரத் தடையை சந்தித்துக் கொண்டிருக்கின்றார்கள். மின்சாரம் தடைப்படுகின்றபோது மின்சார சபையிடருடன் தொடர்புகொள்ள முடியாது. ஏனென்றால், அந்த நிர்வாகத்தினர் தொலைபேசியின் ஒலிவாங்கியை விலக்கி வைத்துவிடுகிறார்கள். இதற்கு என்ன காரணமென்று விளங்கவில்லை. இதுதான் எங்களுடைய பிரதேசத்திலே காணப்படுகின்ற மின்சாரம் வழங்குகின்ற நிலைமை! எனவே, அமைச்சர் அவர்கள் இந்த விடயத்திலே கவனம் செலுத்தி, ஒரு நாளைக்கு 5-6 மணித்தியாலங்கள் மின்சாரம் தடைப்படுவது ஏன் என்பதைக் கண்டறிய வேண்டும். அத்தோடு, தடையின்றி மின்சாரம் வழங்கும் நிலைமையையும் எங்களுடைய பிரதேசத்திலே ஏற்படுத்த வேண்டும். அப்பொழுதுதான் இந்த மின்சாரத்தினூடாக எங்களுடைய மக்கள் நற்பயனடைவார்களென்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, எங்களுடைய வடக்குப் பிரதேசத்திலே உங்களுடைய 'வடக்கின் வசந்தம்' வேலைத்திட்டத்தின் செயற்பாடுகள் எந்தளவுக்கு இருக்கப்போகின்றதென்பதை நீங்கள் விளங்கப்படுத்த வேண்டும். 'வடக்கின் வசந்தம்' தொடர்பாக எங்களுடைய மக்கள் பாரிய எதிர்பார்ப்புக்களோடு இருக்கிறார்கள்;

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

அதனூடாகத் தங்களால் பிரகாசிக்க முடியுமென்ற நம்பிக்கை யோடு இருக்கின்றார்கள். இந்த நிலையிலே 'வடக்கின் வசந்தம்' நிறுத்தப்படப்போகின்றதென்ற சந்தேகமும் நிலவி வருகின்றது. இதன்காரணமாகத் தங்களுக்கு மின்சாரம் கிடைக்குமா? என்ற சந்தேகத்தில்தான் எங்களுடைய மக்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். இவர்களிடம் காணப்படும் சந்தேகத்தை நீக்குவதாயின், நீங்கள் இது தொடர்பில் அவர்களுக்கு உரிய விளக்கங்களைக் கொடுக்க வேண்டும். "2013ஆம் ஆண்டில் நாடு பூராவும் மின்சாரம் வழங்கப்படும்" என 'மஹிந்த சிந்தனை'யில் குறிப்பிடப் பட்டுள்ளவாறு, குறித்த ஆண்டில் இது நிறைவேற்றப்படுமா? என நான் இச்சந்தர்ப்பத்திலே கேட்க விரும்புகின்றேன்.

இன்று வடக்கு, கிழக்கு மாகாணங்களில் மின்சாரத் தேவையானது மிக அதிகமாக காணப்படுகின்றது. அங்குள்ள பெற்றோர்கள் தமது பிள்ளைகளைப் வளர்ப்பதற்குத் திண்டாடிக்கொண்டிருக்கின்றார்கள். அரசாங்கத்தைச் சார்ந்த சிலர் அங்குள்ள மீள்குடியேற்றக் கிராமங்களுக்குச் சென்று, கூட்டங்களை நடத்தி, "உங்களுக்கு உடனே மின்சாரம் பெற்றுத்தரப்படும்" என்று அந்த மக்களுக்கு உறுதிமொழிகளை வழங்குகிறார்கள். இதனைவிட, தேர்தல் காலங்களில் பல கிராமங்களில் மின்சாரக் கம்பங்களை கொண்டுவந்து போட்டு விட்டு, "நீங்கள் எங்களுக்கு வாக்களியுங்கள்! உங்களுக்கு வெகுவிரைவில் மின்சாரம் பெற்றுத்தரப்படும்! அதற்காகத்தான் நாங்கள் தூண்களைக் கொண்டுவந்து போடுகின்றோம்" என்று சொல்லியிருக்கின்றார்கள். தற்பொழுது, அந்தத் தூண்கள் மழையில் நனைந்து, துருப்பிடித்து உக்கிய நிலையில் காணப்படுகின்றன. தயவுசெய்து எங்களுடைய மக்களை ஏமாற்றவேண்டாம்! எங்களுடைய மக்களைப் பொறுத்த வரையில், இன்று அவர்கள் தேவைகளுக்காக ஏங்கிக் கொண்டிருக்கின்றவர்களாகத்தான் வாழ்ந்துகொண்டு இருக் கின்றார்கள். எனவே, அவர்களுடைய தேவைகளைப் பூர்த்தி செய்து தருவதாக தேர்தல் காலங்களில் பொய்யான வாக்குறுதி களை அளித்து, அம்மக்களை ஏமாற்றவேண்டாம் என்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அம்மக்களிடமிருந்து வாக்குகளைப் பெறுவதற்கான யுத்தியாக "நாங்கள் மின்சார வசதி செய்து தருகிறோம்; கட்டிடம் கட்டித் தருகிறோம்; ground உருவாக்கித் தருகிறோம்" என்று வாக் குறுதிகளை அளித்து, வெற்றி பெற்ற பின்னர், அவர்களைக் கண்டுகொள்ளாது ஏனோதானோ என்று நடந்து கொள்ளக்கூடாது. இவ்வாறாக, ஏமாற்றத்துக்குள் தள்ளப் பட்டுள்ள எமது மக்களை நீங்கள் தொடர்ந்தும் தேர்தல் காலங்களில் ஏமாற்ற வேண்டாம். உண்மையாகவே நீங்கள் என்ன செய்ய எண்ணுகிறீர்கள் என்பதையும் அங்கு அம்மக்களுக்கான வசதிகள் எந்தெந்தக் காலங்களிலே செய்து கொடுக்கப்படும் என்பதையும் எமது மக்களுக்குத் தெரிவித்து, அவர்களுடைய தேவையைப் பூர்த்தி செய்ய வேண்டும் என்பதே எங்களுடைய கோரிக்கையாகும். ஆகவே, என்னைப் பொறுத்தமட்டில், 'வடக்கின் வசந்தம்' என்று சொல்வதைவிட அதனை 'வடக்கின் துன்பம்' என்று குறிப்பிடலாமென நான் நினைக்கின்றேன். ஆகவே, உங்களுடைய 'வடக்கின் வசந்தம்' எங்களுடைய மக்கள் மத்தியிலே தென்றல் காற்றாக வீச வேண்டுமாகவிருந்தால், நீங்கள் எமது மக்களுடைய தேவைகளை உணர்ந்து எமது மக்களுக்கு என்ன செய்ய வேண்டும் என்பதைக் கவனத்திற்கொண்டு உங்களுடைய சேவையைச் செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்ளு கின்றேன்.

வடக்கு, கிழக்கிலுள்ள எமது மக்களைப் பொறுத்தவரை யில், இன்று அம்மக்கள் பல்வேறு தேவைகளைப் பெற வேண்டியவர்களாக இருக்கின்றார்கள். அவற்றில் மின்சாரம் என்பது மிகவும் இன்றியமையாத தேவையொன்றாக இருந்து கொண்டிருக்கிறது. எனவே, நீங்கள் தொடர்ந்தும் எமது மக்களுக்கு மின்சாரம் தருவதாகச் சொல்லிச்சொல்லி ஏமாற்றா மல், அம்மக்களுக்கு மின்சார வசதிகளை அளிப்பதற்காக உடனடியாக 'வடக்கின் வசந்தம்' திட்டத்தை முறையாக நடைமுறைப்படுத்த வேண்டும் எனக் கேட்டு, உரையாற்று வதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி தெரிவித்து, விடைபெறு கின்றேன். வணக்கம்.

[අ. භා. 3.33]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරණයක් කියන්න මට විනාඩියක් දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් නම් විනාඩියක්වත් දෙන්න බැහැ, වෙන කොහෙන් හෝ දුන්නොත් මිසක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහෙන්ද ඒ විනාඩිය දෙන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
දැනට ඒ ක්‍රියාවලිය කිසිසේත් නතර වෙලා නැහැ. අපි ඒ ක්‍රියාදාමය කරගෙන යනවා. දැනට අපි යාපනයේ සියයට 79කට විදුලිය ලබා දීලා තිබෙනවා. වව්නියාවේ සියයට 74කට විදුලිය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මන්නාරමේ සියයට 48කට විදුලිය ලබා දීලා තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, ලබන වසර තුළ ඒක තවත් ශීඝ්‍රවත් කරලා ලබා දෙන්න. ඒ වාගේම මා පිළිගන්නවා එතුමා කියාපු කාරණය. යාපනයේ විදුලිය විසන්ධිවීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට හේතුව වව්නියාවේ ඉඳන් යාපනයට විදුලි ජාලය තවම සම්බන්ධ වෙලා නොමැතිකමයි. ඉතින් අපි බලාපොරොත්තු වනවා, ලබන අගෝස්තු මාසයේ කිලිනොච්චියට එය සම්බන්ධ කරන්න. ඒ වාගේම 2013 දෙසැම්බර් මාසයේ තමයි යාපනයට සම්බන්ධ කරන්නේ. ඊට පස්සේ තමයි විධිමත් ජාලයක් බවට ඒක පරිවර්තනය වෙන්නේ. ඒකට මේ රජය වග කියන්න ඕනෑ නැහැ. ඔය වෙල්ලමුල්ලි වයික්කාල් වීරයෝ කියලා හඳුන්වන පිරිස විසින් කරපු හානිය නිසා තමයි ඒ ජනතාවට ඒ හානිය සිද්ධ වුණේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, දැන් කථාව ආරම්භ කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රමාද වෙලා හෝ මට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ගරු ඇමතිතුමා ගොඩක් දේවල් සඳහන් කළා, එතුමාගේ අමාත්‍යාංශය සම්බන්ධයෙන්.එතුමාගේකථාවේදී එතුමා සඳහන් කළා, විශේෂයෙන්ම ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය සම්බන්ධයෙන්. එහිදී එතුමා සඳහන් කළා, එහි සියලු වැඩ කටයුතු අවසන් කරලා අද දවසේද කොහෙද වතුරත් පිරෙව්වා කියලා. මට ලැබිලා තිබෙන වාර්තා අනුව ගරු ඇමතිතුමනි, ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය සියයට 72යි. නැවත පදිංචි කිරීමේ කටයුතු සහ අනෙකුත් පහසුකම් ප්‍රගතිය සියයට 94යි. වේලි සහ භූගත ඉදි කිරීම් ප්‍රගතිය සියයට 74යි. සොරොව් සහ penstock සවි කිරීම් ප්‍රගතිය සියයට 52යි. Turbine, transformer සහ switchyard අංගනයේ ප්‍රගතිය සියයට 52යි. සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 45යි. එහෙම තමයි මට තොරතුරු ලැබිලා තිබෙන්නේ. එහෙම නම් ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේයි මේ ආණ්ඩුවේ ප්‍රායෝගික තත්ත්වයයි ගොඩක් වෙලාවට වෙනස් බවක් තමයි අපට පැහෙන්නේ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමන්ලා කලින් නම් හිටියේ විවෘත ආර්ථිකයට තනිකරම විරුද්ධවයි. දැන් ඔබතුමන්ලා විවෘත ආර්ථිකය, විශේෂයෙන්ම ණය ලබා ගැනීම් සහ විදේශ ආයෝජන සම්බන්ධයෙන් ඉතා දැඩි ආදරයෙන් යුතුව කථා කරනවා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ වකවානුවේ මහවැලි යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඔබතුමා අදහස් ප්‍රකාශ කළා. මහවැලි යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස් ඉදිරිපත් කරන අවස්ථාවේදී ගරු ඇමතිතුමනි, [බාධා කිරීමක්] මහවැලිය සම්බන්ධයෙන් කථා කරද්දී, මුළු ආසියාවම අඳුරු යුගයකයි එක්සත් ජාතික පක්ෂයට ඒ කාර්යය කිරීමට හැකියාව ලැබුණේ කියන එක අපි කියන්න ඕනෑ. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ඒ ක්‍රියාදාමය තුළ මහවැලි ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියන 720ක් වාගේ ප්‍රමාණයක් තමයි අපට වියදම් කරන්න සිදු වුණේ. ඒත් එක්කම මෙගාවොට් 750කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න එක්සත් ජාතික පක්ෂයට ඒ කාලයේ හැකියාව ලැබුණා. ඒත් එක්කම මේ මුදල් ලැබුණේ බොහෝ විට ආධාර වශයෙනුයි. වික්ටෝරියා, කොත්මලේ, රන්දෙනිගල යන ව්‍යාපෘතිවලට අපට සමහර විට සියයට 80ක් මුදල් ලැබුණේ ප්‍රදාන වශයෙන්. ණය ගත්තේ ඉතා සුළු ප්‍රමාණයයි. ඒ වාගේම ඒවා දිගු කාලීන ණය. සියයට 1.2ක, සියයට 1.8ක පොලියකට අවුරුදු 30ක්, අවුරුදු 40ක් තිස්සේ ගෙවන ක්‍රමයකට, රටට පහසු වන ආකාරයකට ණය අරගෙන තිබුණා. ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් හිතන්න, ඒ කාලයේ මේ ව්‍යාපෘතීන් කළේ නැත්නම්, අපිට නිකම් ලැබෙන මේ hydropower සම්පත එක්සත් ජාතික පක්ෂ රජය වකවානුවේ අපි නිර්මාණය කළේ නැත්නම් ඔබතුන්ලා මේ සංවර්ධනය කරන්නේ මොන රටක්ද? ඔබතුමන්ලා අද මේ කථා කරන සියලු සංවර්ධනය සිදු වුණේ එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සංවර්ධනය තුළිනුයි. Hydropower සම්බන්ධයෙන් මෙහි සඳහන් වනවා, "Currently Exploited" ලංකාවේ සියයට 60යි කියලා. ඒ, එක්සත් ජාතික පක්ෂයට පින්සිද්ධ වෙන්නට. ඉන්දියාවේ තවම සියයට 25යි. පාකිස්ථානයේ සියයට 12යි. භූටානයේ සියයට 1.5යි. බංග්ලාදේශය සියයට 28යි. විශේෂයෙන් ගාමිණී දිසානායක මැතිතුමන්ලා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන්ලා වැනි අයගේ ඥානය, එතුමන්ලාගේ දක්ෂතාව තුළින් එක්සත් ජාතික පක්ෂයට ඒ හැකියාව ලැබුණා. අද අපි ජීවත් වන සමාජයේ සියලුම ව්‍යාපාර කටයුතු, ඒ වාගේම සංවර්ධනයන් සිදු වන්නේ එම මහවැලි ව්‍යාපෘතියට පින්සිදු වන්නයි. අස්වැන්න වේවා, විදුලිය වේවා, ඕනෑම කටයුත්තක් අද සිදු වන්නේ ඒ ආකාරයෙන් අපි දියුණුවක් ඇති කළ නිසායි.

අද ඔබතුමන්ලා කථා කරන තාප විදුලි බලාගාර, ගල් අඟුරු බලාගාර හා අනෙකුත් විදුලි බලාගාර මේ සියලු දේවල්, විශාල වියදමක් දරලා විදුලිය නිෂ්පාදනය කරන්නට අවශ්‍ය ක්‍රමෝපායංගයි. ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් හිතලා බලන්න, මොරගහකන්ද ජලාශයට විදුලිය නිපදවීම එක අභියෝගයක් කියලා මෙහිත් සඳහන් වනවා. දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ඔබතුමන්ලා මේක කරගෙන යනවා. මුළු මහවැලි ව්‍යාපාරයට ගිය වියදමට සමානයි මොරගහකන්ද ජලාශයට වැය වන වියදම. ඔබතුමන්ලා මොනවාද කරලා තිබෙන්නේ? මෙහි මුල් ගල තැබීමේ සංදර්ශනයට පමණක් වියදම රුපියල් මිලියන 30යි. තවම කරගෙන යනවා. ඉතින් එක්සත් ජාතික පක්ෂය කරපු කාර්ය භාරය ගැන හිතන්න. අපි ඒ සුළු කාලය තුළ විශාල කාර්ය භාරයක් මේ රටේ ඉදිරි අනාගතය සඳහා කරලා තිබෙනවා, ඇමතිතුමනි. ඒ වාගේම මෙම ආණ්ඩුවේ උඩ සිටම කරන්නේ විජ්ජාව. ඔබතුමා 2010 ගැන කථා කළා. ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වැඩියෙන් ජලය ආපු නිසා නොවෙයි ඒ ලාභය ලබන්න සාධක වුණේ කියලා. ඔබතුමා කිව්වා ඔබතුමාගේ කාර්යක්ෂමතාව නිසා තමයි මේ ලාභය ලැබුණේ කියලා. හැබැයි, මහ බැංකු වාර්තාවේ එය එසේ නොවේය කියලා සඳහන් කරනවා, ඇමතිතුමනි. ඔබතුමාට මේක කියවන්නවත් බැරි වුණාද? 2010 මහ බැංකු වාර්ෂික වාර්තාවේ 65වැනි පිටුවේ "ආර්ථික හා සමාජ යටිතල පහසුකම් "යටතේ මෙසේ සඳහන් වනවා:

"2010 වසරේ දී විදුලිය උත්පාදනය ගි.වො. පැය 10,714ක් දක්වා සියයට 8.4කින් වැඩි විය. වසර පුරා අඛණ්ඩව ජල පෝෂක ප්‍රදේශවලට ලැබුණු වර්ෂාව හේතුවෙන් පසුගිය වසරේ සියයට39.3ක් වූ ජල විදුලි උත්පාදනය 2010 වසරේ දී සියයට 52.6ක් දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තාප විදුලිබල උත්පාදනය ගි.වො පැය 4,995ක් දක්වා සියයට 16.4 කින් අඩු විය. 2010 වසර තුළ දී, සමස්ත පද්ධති අලාභය සියයට 14.6 සිට සියයට 13.5 දක්වා අඩු විය. සමස්ත විදුලිබල උත්පාදනයට ලංකා විදුලිබල මණ්ඩලයේ (ලං.වි.ම.) දායකත්වය සියයට 55 සිට සියයට 60 දක්වා ඉහළ ගිය අතර, පෞද්ගලික අංශයේ දායකත්වය සියයට 40 දක්වා පහත වැටුණි. "

මෙන්න මේක තමයි හේතුව ඇමතිතුමනි. ඒ විතරක් නොවෙයි, එම පිටුවේම මෙසේ සඳහන් වනවා:

"අධික පිරිවැයක් සහිත තාප බලශක්ති උත්පාදනය මත පැවැති රැඳියාව අඩු වීම ලං.වි.ම. යේ මූල්‍ය ප්‍රවාහය කෙරෙහි යහපත් ලෙස බලපෑවේය. මේ අතර, සහනාධාර මිලක් යටතේ දැවි තෙල් ලබාදීම ලං.ඛ.නී.සං. මූල්‍ය තත්ත්වය කෙරෙහි අයහපත් ලෙස බලපෑව ද, එය ලං.වි.ම.යේ මූල්‍ය තත්ත්වය කෙරෙහි යහපත් ලෙස බලපෑවේය."

ඔබතුමා සඳහන් කළ දේත් මෙහි තිබෙනවා, ගරු ඇමතිතුමනි. අපි ඒකත් අත් හරින්නේ නැහැ. පිරිවැය අඩු කිරීම සඳහා අනුගමනය කරන ලද විවිධ උපක්‍රම එක කාරණයක් පමණයි. හැබැයි, ඔබතුමා ඒ දේ සඳහන් කළේ ප්‍රධාන කාර්ය භාරය වශයෙන්. අනෙක් දේවල් ඔක්කොම සඳහන් කළේ නැහැ. තමන්ගේ කාර්ය භාරය ලෙස පෙන්නුවා; වැස්සටත් කොකා පෙන්නුවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2010 වාර්ෂික වාර්තාවේ 66 වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"2010 වසරේ දී ලං.වි.ම.ය ඉන්ධන සඳහා දැරූ වියදම රුපියල් බිලියන 16.4 ක් දක්වා සියයට 34.9 කින් අඩු විය. 2010 දී ලං.වි.ම.ට සාමාන්‍යයෙන් විදුලිබල ඒකකයක් නිෂ්පාදනය සඳහා රුපියල් 4.33 ක පිරිවැයක් දැරීමට සිදුවිය. 2010 වසරේ දී පෞද්ගලික අංශයෙන් විදුලි ඒකකයක් මිලදී ගැනීමේ දී දැරීමට සිදු වූ සාමාන්‍ය පිරිවැය රුපියල් 15.25 ක් විය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ලාභය ආවේ කොහොමද කියලා පෙන්වන්න මේ ආණ්ඩුවට හැකියාව නැහැ. මේ ආණ්ඩුවේ කිසිම ආයතනයක්, කිසිම අමාත්‍යාංශයක් තමන්ගේ ක්‍රියා කලාපය නිසා, තමන්ගේ හැකියාව නිසා කරපු දෙයක් නැහැ, ගත්ත ලාභයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අතරින් මේ අමාත්‍යාංශය විශේෂයි.

[ගරු සුජීව සේනසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිය කැපීම ගැන ඇමතිතුමා සඳහන් කළා. Table 1: Data on Capacity and Shortfall of Electricity in South Asian Countries යටතේ, Electricity Shortfall/Load Shedding (MW) ඉන්දියාවේ සියයට 14ක්; පාකිස්තානයේ සියයට 30ක්; බංගලාදේශයේ සියයට 25ක්; ලංකාවේ සියයට 37ක් වශයෙන් සඳහන් වනවා. හැබැයි ඇමතිතුමනි, ආසියාවත් එක්ක බලන කොට ලංකාවේ තමයි ඒක වැඩි වශයෙන් පවත්වන්නේ කියන එක ඉතාමත් පැහැදිලියි. ඒ වාගේම ඇමතිතුමනි, Per Capita Electricity Generation (KWh) ප්‍රමාණයත් මෙහි සඳහන් වනවා. දියුණුවත් එක්ක තමයි ඒක වැඩි වන්නේ. ඕනෑම රටක දියුණුව වැඩි වන කොට, ඒ රටේ ජනගහනය පාවිච්චි කරන විදුලිය ප්‍රමාණය වැඩි වනවා. Per Capita Electricity Generation (KWh) ඉන්දියාවේ 640යි; පාකිස්තානයේ 560යි; බංගලාදේශයේ 210යි; ලංකාවේ 180යි. මෙමෙහ තමයි වාර්තා වන්නේ ඇමතිතුමනි. ඒ වාගේම Table 4: Summary of Electricity Tariff Rates across South Asian Countries යටතේ domestic සඳහා ඉන්දියාවේ 10.4ක්; පාකිස්තානයේ 15.4ක්; බංගලාදේශයේ 7.0ක්; නේපාලයේ 13.9ක්; ලංකාවේ 32.8ක් පාවිච්චි කරන බව සඳහන් වනවා. ඒ වාගේම කෘෂි කර්මය සඳහා ඉන්දියාවේ 3.5ක්; පාකිස්තානයේ 6.2ක්; බංගලාදේශයේ 2.6ක්; නේපාලයේ 5.0ක්; ලංකාවේ 13.6ක් -තුන් ගුණයකටත් වැඩියි.- පාවිච්චි කරන බව සඳහන් වනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇමතිතුමා සඳහන් කළා, 2001 දී කරු ජයසූරිය මැතිතුමා විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාවේ වුණු සිදු වීම් සම්බන්ධයෙන්. ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කර ගන්න ඕනෑ, ඔබතුමා මේ අමාත්‍යාංශයේ යම් කාර්ය භාරයක් කළා නම් ඔබතුමා කරපු ඒ දේවල් සම්බන්ධයෙන්, ලබන අවුරුද්දේ, එහෙම නැත්නම් ඊට පස්සේ අවුරුද්දේ එන වෙන අමාත්‍යවරයකුට හෝ ආණ්ඩුවකට අනිවාර්යයෙන්ම වග කියන්න බැහැයි කියලා. මොකද, 2001 අපට හම්බ වුණේ බංකොලොත් රටක්. එදා විශේෂයෙන්ම තිබුණේ සෘණ 1.5ක ආර්ථිකයක්, ඇමතිතුමනි. ඒත් එක්කම ඉතුරු සියලු දේවල් ඔබතුමන්ලා අපට දායාද කළා. අපි අමාරුවෙන් ඒක ගොඩ ගත්තා. දවසකට පැය 10ක්, පැය 11ක් විදුලිය කැපුවා. අන්න එහෙම අමාත්‍යාංශයක් අපට හම්බ වුණේ. ඒ කාලයේ අපි ඒ ප්‍රශ්නය කොයි ආකාරයෙන් විසඳුවාද කියන එක අපේ කථිකයෝ සඳහන් කළා. ඒක ඔබතුමාත් දන්නවා.

ඇමතිතුමනි, 1994 දී CEB එකේ supply එක වශයෙන් මෙගාවොට් 1,359ක් සඳහන් වනවා. හැබැයි ඇමතිතුමනි, 2001 වන කොට, අපට ආණ්ඩුව ලැබෙන කොට මේ supply එක මෙගාවොට් 1,200යි. ඒ වාගේම 2001 වර්ෂයේ demand එක මෙගොවොට් 1,400යි. 1994 demand එක මෙගොවොට් 848යි. මෙහි පැහැදිලි වෙනසක් පෙනෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මොන ආකාරයේ පහත බැසීමක් සිදු වෙලා තිබෙනවාද, මේවා කඩාකප්පල් වනවාද, මේවා බංකොලොත් වනවාද කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 1994 cumulative surplus වශයෙන් රුපියල් බිලියන 5.688ක් සඳහන් වනවා. 2001 වන කොට එය සෘණ 16.54කට බැහැලා තිබෙනවා, ඇමතිතුමනි. ඒ වාගේම CPC එක සම්බන්ධයෙනුත් එහෙමයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ surplus එක 0.38යි . ඊට පස්සේ 2001 දී අපට ආණ්ඩුව භාර දෙන කොට ඒක සෘණ 16ට බහිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවල නොහැකියාව මෙන්න මේ ආකාරයෙන් ඉතා පැහැදිලිව පෙන්නුම් කරනවා. ඔබතුමන්ලා ආණ්ඩු බංකොලොත් කරලා, රට බංකොලොත් කරලා අපට භාර දෙනවා. අපේ ආණ්ඩුව විශාල පරිශ්‍රමයක් යොදා, හැකියාව, දක්ෂතාව යොදා සංවර්ධනය අත් පත් කරලා දුන්නාට පස්සේ ඔබතුමන්ලා ආපසු අවුරුදු 5ක්, 6ක්, 10ක් දැන් නම් ඊටත් වැඩි කාලයක් ආණ්ඩු කරනවා. අපේ දක්ෂ මන්ත්‍රීවරු සිටියා, ආණ්ඩු පක්ෂයේ. 2001 සිට 2004 දක්වා කාලය තුළ ඒ අය රට ගොඩ ගත්තා. ඊට පස්සේ ඔබතුමන්ලා අපට ඇති කරලා තිබෙන්නේ, විශාල පාඩුවක්; ඒ වාගේම පහතට ඇද ගෙන යෑමක්. හැබැයි අපි සන්තෝෂ වනවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඔය පැත්තේ ඉන්න එක ගැන. එක්සත් ජාතික පක්ෂයට පිං සිද්ධ වෙන්න දක්ෂයෝ ප්‍රමාණයක් ඔය පැත්තේ ඉන්න නිසා මේ ආණ්ඩුවට යම් තරමින් හුස්ම ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට ඇමතිතුමා සඳහන් කළා විදුලිය මිල ගණන් සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ලෝකයේ රටවල් කිහිපයක විදුලිය මිල ගණන් කියන්නම්. මම හිතන්නේ අපේ රටේ විදුලිය ඒකකයකට රුපියල් 13.35ක වාගේ මුදලක් සාමාන්‍යයෙන් වැටෙනවා. ආර්ජන්ටිනාවේ රුපියල් 6යි. කැනඩාවේ රුපියල් 7යි. පින්ලන්තයේ රුපියල් 7යි. අයිස්ලන්තයේ රුපියල් 9යි. මැලේසියාවේ රුපියල් 8යි. පාකිස්තානයේ රුපියල් 6යි. රුසියාවේ රුපියල් 10යි. ඉරානයේ ශත 90යි. යුක්රේනයේ රුපියල් 4යි. ඇමෙරිකාවේ රුපියල් 12යි. උස්බෙකිස්තානයේ රුපියල් 5යි. ගරු ඇමතිතුමනි, අපි අනිවාර්යයෙන්ම විශාල මුදලක් ගෙවනවා ඔබතුමන්ලාගේ අකාර්යක්ෂමතාව, ඒ වාගේම දූෂණය නිසා. විශේෂයෙන්ම මේවා කිසිම තේරුම්-බේරුම් කිරීමකින් තොරව පෞද්ගලික අංශයෙන් මිලදී ගැනීම නිසා කළු කඩකාරයින්ගේ පාරාදීසයක් බවට අද මෙය පත් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, වුවමනාව තිබෙනවා නම් ඔබතුමා දන්නවා අපට renewable energy, ජලවිදුලි බලාගාර, සුළං හා කුඩා පරිමාණ විකල්ප බලාගාර මඟින් විශාල විදුලිය ප්‍රමාණයක් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව තිබෙනවා කියා. ඔබතුමා ඒ සඳහා වග බලා ගන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ අපට ඒ වුවමනාව තිබුණා; ඒ හැකියාව තිබුණා. අපි ඒ දේ නොකළා නම් අද ඔබතුමන්ලාට කිසිම ක්ෂේත්‍රයක කිසිම සංවර්ධනයක් කර ගන්න ලැබෙන්නේ නැහැ. ඒ ලබා දුන්නු ශක්තියෙන් තමයි, ඒ ලබා දුන්නු එළියෙන් තමයි ඇමතිතුමනි, අද ලංකාවේ ඕනෑම පාරක් හදන්න, නැත්නම් වෙනත් කර්මාන්තයක් පටන් ගන්න හැකියාව ලැබී තිබෙන්නේ. ඒ විදුලිබල ශක්තිය surplus එකක් සමඟ ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. ඒක අගය කරන්න. ඒ සම්පත අපි පාවිච්චි කළා. වෙනත් කිසිම රටක ජලයෙන් විදුලිය නිෂ්පාදනය කරන්නේ නැහැ. හැබැයි එක්සත් ජාතික පක්ෂයට හැකියාව ලැබුණා ජලයෙන් උපරිම විදුලිය මේ රටේ නිෂ්පාදනය කරන්න. ඉන්දියාව, පාකිස්තානය, බංගලාදේශය වැනි කිසිම රටක් මේ සම්පත දිහා බලලා නැහැ ඇමතිතුමනි. ඒ දෙස බලන්න. එක්සත් ජාතික පක්ෂයේ අපට ඒ හැකියාව, දුර දිග පෙනෙන ඥානය තිබුණා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම 1984 දී සුළං බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම, ඒ වාගේම කුඩා පරිමාණ ජල විදුලි බලාගාර සහ විකල්ප බලාගාර සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ අපි සැලැස්මක් හැදුවා. අපට කරන්න අවස්ථාවක් තිබුණේ නැහැ. මොකද, අපි මේ රට දියුණු කළේ ආසියාව නොදියුණු තත්ත්වයේ තිබෙද්දීයි; ඉන්දියාව, චීනය බඩගාද්දීයි. ඉතා අමාරුවෙන් එක්සත් ජාතික පක්ෂයට හැකියාව ලැබුණා ආසියාව අඳුරු යුගයේ තිබෙද්දී මේ රට ඉදිරි ලෝකයට අරගෙන යන්න. එහෙම නම් ඇමතිතුමනි, ඔබතුමාට අකැමැත්තෙන් හෝ පිළිගන්න වෙනවා එක්සත් ජාතික පක්ෂයේ ඒ කාර්ය භාරය තුළින් තමයි අද ඔබතුමන්ලාට යම් කිසි දෙයක් කර ගන්න හැකියාව ලැබී තිබෙන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම mini-hydropower projects සම්බන්ධයෙන් ඔබතුමන්ලා මීට වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. එයින් විශාල ආදායමක් ලැබෙනවා වාගේම අපිට වියදම අඩු

කර ගන්නත් පුළුවන්. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මීට වඩා වැඩි ආයෝජනයක් කරන්න. අපි mini-hydropower projects සම්බන්ධයෙන්, විශාල ජලවිදුලි බලාගාර සම්බන්ධයෙන් අපේ උපරිමය සම්පූර්ණ කරලා ඉවරයි. හැබැයි කුඩා ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් තවමත් අවකාශ තිබෙනවා. ඒ සඳහා රටේ සම්පත් තිබෙනවා.

ඊ ළඟ කාරණය ගරු ඇමතිතුමනි, ණයගැතියන්. ඔබතුමන්ලා විශාල ප්‍රමාණයක් ණය නොගෙවා ඉන්නවා. මම හිතන්නේ මේක විශාල ප්‍රශ්නයක්. ඔබතුමා කිව්වා තෙල් සඳහා ගෙවීමට තිබෙන ඔබතුමන්ලාගේ ණය ප්‍රමාණයක් මහ භාණ්ඩාගාරයට පැවරුවා කියලා. ඉතින් ඒක අනිවාර්යයෙන්ම රටේ ජනතාව දරන්න ඕනෑ බරක්. ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ ණයක් කොයි ආකාරයෙන් මහ භාණ්ඩාගාරයට පැවරුවත් එය අනිවාර්යයෙන්ම ජනතාව ගෙවන්න ඕනෑ. මහ භාණ්ඩාගාරයට පැවරුවා කියලා ඒක නැති වෙන්නේ නැහැ. ඒ වාගේම විශේෂයෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාව, ජාතික කඩදාසි සංස්ථාව, ශ්‍රී ලංකා සීනි සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය, මහ රෝහල, හමුදා මූලස්ථානය, මැණික්හාමි කඳවුර යන මේ ආයතනවලින් ලැබිය යුතු විශාල මුදල් ප්‍රමාණයක් තිබෙනවා ඇමතිතුමනි. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අනිවාර්යයෙන් මේවා අය කර ගන්න ඕනෑ. නැත්නම් මහ ජනතාවට තමයි මේ සියලු බර දරන්න වන්නේ.

ඒ විතරක් නොවෙයි ඇමතිතුමනි. විශේෂයෙන්ම ඔබතුමන්ලා ඉදිරි අනාගතයේ කරන්න බලාපොරොත්තු වන දේවල් පිළිබඳ මගේ ළඟ ලැයිස්තු දෙකක් තිබෙනවා. ගොඩාක් බලාපොරොත්තු වන දේවල් තමයි මේ ආණ්ඩුවෙන් අපට දකින්න ලැබෙන්නේ. විදේශ ආයෝජන ඇස්තමේන්තු ඔබතුමන්ලා එහි සඳහන් කර තිබෙනවා. ලැබිලා තිබෙන ප්‍රමාණය බැලුවොත් ඉතා අඩු ප්‍රමාණයක් තමයි තියෙන්නේ. එකම විදේශ ආයෝජනය හැටියට චීන ආණ්ඩුවෙන් නොවෙයි, චීන පෞද්ගලික බැංකුවකින් සියයට 6.8ක, සියයට 7.2ක පොලියට ගන්නා ණයවලින් තමයි ඔබතුමන්ලා මේ කාර්ය භාරය ඉටු කරන්නේ. කවුද, මේ ණය ගෙවන්නේ? කවුද, මේ පොලී ගෙවන්නේ? ඒක විශාල ප්‍රමාණයක්. ඒකේ grace period එක අවුරුද්දයි. අවුරුද්ද ඉවර වන විට විශාල ප්‍රමාණයක් ණය ගෙවන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ව්‍යාපාරිකයෝ ඉන්නවා. ඒ ව්‍යාපාරිකයෝ දන්නවා, ඩොලර් එකකට සියයට 1ක් 2ක් කියන්නේ කොච්චර ප්‍රමාණයක්ද කියා.

ඇමතිතුමනි, ලෝකයේ අනෙකුත් රටවල් සංවර්ධන ණය ගන්නේ සියයට 3.5ට, 3.4ටයි. අපේ රට සියයට 7.2 පොලියට ණය ගත්තාම ඔබතුමන්ලා නොවෙයි ගෙවන්නේ, රටේ ජනතාවයි ගෙවන්නේ. අහිංසක දුප්පත් ජනතාව තමයි මේ ණය බර උහුලන්නේ. හැබැයි, කිසිම ගණනක් නැතුව ගන්නවා. මොකද, මේවායේ විශාල කොමිස් මුදල් තිබෙනවා. WikiLeaks වෙබ් අඩවියේ සඳහන් කර තිබෙනවා, රටේ ආර්ථික වර්ධනයෙන් සියයට 2ක් විනාශ වන්නේ විශේෂයෙන් චීනයෙන් ලැබෙන ණය ආධාරවලටයි කියා. එහෙම නම් ඇමතිතුමනි, ණය ගනිද්දි දෙවතාවක් හිතන්න. ආධාර ලැබී තිබෙන ව්‍යාපෘති පිළිබඳ ලැයිස්තුවේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය, මොරගොල්ල විදුලි ව්‍යාපෘතිය, පැරණි ලක්ෂපාන විදුලි බලාගාරය, Broadland විදුලි බලාගාරය, ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය, උකුවෙල විදුලි බලාගාරය, ත්‍රිකුණාමල තාප විදුලි බලාගාරය, ගිංගඟ විදුලි බලාගාර ව්‍යාපෘතිය ආදී වශයෙන් විශාල වගුවක් තිබෙනවා. විදේශීය වශයෙන් ආයෝජන දීලා තිබෙනවා. ප්‍රතිපාදන සඳහන් කර තිබෙනවා. හැබැයි, ලැබුණු තීරුව හිස්ව තිබෙනවා, ඇමතිතුමනි.

ඔබතුමන්ලාගේ විදේශ ප්‍රතිපත්තිය හරි නැහැ. මුදලක් ලබා ගන්න බැහැ. ආධාරයක් ලබා ගන්න බැහැ. අද ලංකාව ලෝකයෙන් කොන් වෙලා. ඔබතුමන්ලාට තිබෙන එකම පිහිට තමයි චීනය. චීනය විතරයි ඉන්නේ. චීනයත් ඉන්නේ අපව බිලි ගන්න. සියයට 7.2ක පොලියට නොවෙයි, සියයට 6.5කට වැඩි පොලියකට ණය ගන්න කැමැති නම් ඕනෑම පෞද්ගලික බැංකුවක් ණය දෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපිට සල්ලි තිබුණොත් අපිත් දෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපිටත් ඕනෑම වාණිජ බැංකුවකින් හම්බ වන්නේ සියයට 3.5 නැත්නම් 3.6යි.

ගරු ඇමතිතුමනි, මගේ කථාව අවසාන කිරීමට පෙර ඔබතුමාගේ අවධානයට මේ කාරණයත් ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම විදුලිබල මණ්ඩලය සහ චීන ආධාර මඟින් ඌව උදාන වැඩසටහන යටතේ ඉදි කළ කතරගම ගෙස්ටුපාන විදුලි යෝජනා ක්‍රමයේ වැඩ ඉවර කර මාස දෙකයි. ඔබතුමා මේ සිද්ධිය දන්නවා ඇති. නිල වශයෙන් 2011.11.24 මේක නිම වුණා. කතරගම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයාගේ එකඟතාවය අනුව වැල්ලවාය ආසනයේදී ඇමතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් 12 වන දින සවස 4ට මේ යෝජනා ක්‍රමය විවෘත කරන්න නියමිතව තිබුණා. මා දන්නා තරමට ඇමතිතුමනි, විදුලිබල අමාත්‍යාංශයේ අනුමැතිය මේකට තිබුණා. ඒ වාගේම ඒලකය ඔබතුමාගේ අනුමැතියෙන් හදලා තිබුණා. හැබැයි, මේක විවෘත කළාට පසු අද වන තුරු විදුලිය ලබා දී නැහැ.

විශේෂයෙන්ම ඇමතිතුමනි, මා මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. මේ අහිංසක ජනතාව විදුලිය බලාපොරොත්තුවෙන් - ඔබතුමා කිව්වා රුපියල් දහතුන්දහස් ගණනක් ගෙවනවා කියා- මේ මුදල් ලබා දෙන්නේ **කන** කර උකස් කරලා. ඒ වාගේම සියයට 20 මාසික පොලියට ණය අරගෙන මේ අය විදුලිය ලබා ගන්න අවුරුදු ගණනක් තිස්සේ බලා ගෙන ඉන්නවා, චමින්ද ලක්මාල්, ඒ. සිරිපාල, ඒ.බී. සිරියාවතී, සෝමලතා නැමැති අය මුදල් ගෙවා තිබෙනවා. නීතිය ගරු කරන ඇමති කෙනෙක් වශයෙන් ඔබතුමා මේකට උත්තරයක් දෙන්න. මොන හේතුවක් නිසා හෝ මේක විවෘත කළාට පසු අද වන තුරු විදුලිය ලබා දී නැහැ.

ගරු ඇමතිතුමනි, මේ ආකාරයෙන් ජනතාවගෙන් සල්ලි ගන්නවා. සල්ලි ගන්නේ විවෘත කරන දවසේ විදුලිය ලබා දෙන්න. නැත්නම් විදුලිය ලබා දෙන පුවරුව විවෘත කරලා මේ කාර්ය භාරය කරන්නේ ජනතාවට බලා ඉන්න නොවෙයි. මේ සම්බන්ධයෙන් ඔබතුමා උත්තරයක් දෙන්න. මොන හේතුවක් මත මේ සිදුවීම වුණාද? මේ පුද්ගලයන්ට මේ ආකාරයෙන් සලකන්නේ කුමන හේතුවක් නිසාද? මේ අය ඉතා දුප්පත් ජනතාව. දවසක් දෙකක් බලා හිටියත් ඒ අයට පාඩුයි. ඒ මුදල ඉතා අමාරුවෙන් ලබා දෙන්නේ. එක්සත් ජාතික පක්ෂය 80 දශකයේ ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් දරපු ප්‍රතිපත්තිය යම්කිසි ආකාරයකට අනුගමනය කරලා ඉදිරි අනාගතයේදී ආපහු පාවිච්චි කරන්න පුළුවන් විදුලිබලය - renewable energy - ලබා ගෙන -විශාල මුදලක් උපයෝගී කර නොගෙන, ඒ වාගේම විශාල මුදලක් පෞද්ගලික ආයතනවලට පූජා නොකර- රටේ ජනතාවට විදුලිය ලබා දෙන්න.

ඇමතිතුමා පිළිගන්නවා, ආසියාවේ වැඩිම ගාස්තුවක් තිබෙන විදුලි බිල්පත් තිබෙන්නේ ලංකාවේ බව. ඔබතුමන්ලා බලාපොරොත්තු වන, අපි බලාපොරොත්තු වන ආසියාවේ ආශ්චර්යය මේ ආකාරයෙන් අපට ඇති කරන්න බැහැ ඇමතිතුමනි. ඔබතුමාගේ හැකියාවක් තිබෙනවා. ඔබතුමා හොරකම් කරනවා කියලා අපි කොහේවත් දැකලා නැහැ. හැබැයි, ඔබතුමාට මේ ආණ්ඩුවේ සහයෝගය කොතරම්ද කියලා අපට හිතා ගන්න බැහැ. මොකද, එක්සත් ජාතික පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන් කීප දෙනකු ඇරෙන්න අනෙක් මන්ත්‍රීවරුන් කවුරුවත් මේ අවස්ථාවේදී ගරු සභා ගර්භයේ නැහැ. හැබැයි අද මේ හැන්දෑවේ විතරක් නොවෙයි, මුළු දවස පුරාම. ඇමතිතුමනි,

[ගරු සුජීව සේනසිංහ මහතා]

ඔබතුමා කියන්න පුළුවන් හැන්දෑවේ අර නෙළුම් පොකුණ විවෘත කරන නිසා ගියා කියලා. එහෙම නොවෙයි, මේ විවාදය පටන් ගත්ත වෙලාවේ සිට ඔබතුමාට මේ ආණ්ඩුවෙන් සහයෝගයක් නැහැ. අපේ මන්ත්‍රීවරුන් ටික හරි ඔබතුමාට ඒ සහයෝගය ලබා දෙන්න කැමැතියි. මොකද, අපේ මන්ත්‍රීවරුන් ටික ඕනෑම අවස්ථාවක එහෙම සහයෝගය ලබා දෙන මන්ත්‍රීවරුන්. එහෙම නම් ආණ්ඩුව මේ කැපිල්ල නවත්වලා, ඔබතුමාගේ යම් කිසි ඉගෙනීමක් ඒ වාගේම හැකියාවක් තිබෙනවා නම් ඒ හැකියාවෙන් ප්‍රයෝජන ගන්න කියා අප කියා සිටිනවා. හැබැයි, ඔබතුමා මේ ආණ්ඩුවට අහු වෙන්න එපා. එක්සත් ජාතික පක්ෂයෙන් මොනවා හෝ ඉගෙන ගන්න පුළුවන් නම් ඉගෙන ගන්න. අපේ ඉදිරි අනාගතය සම්බන්ධයෙන් ඔබතුමා හොඳ කාර්ය භාරයක් කරන්න කියා ඉල්ලා සිටිමින්, ඔබතුමාට ප්‍රශංසා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, බොහොම ස්තුතියි.

[අ. භා. 3.56]

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා (විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர - மின்வலு, எரிசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Premalal Jayasekara - Deputy Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය කාරක සභා අවස්ථාවේ විදුලිබල අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන විවාද වන මොහොතේ අදහස් කීපයක් හෝ ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා.

ගරු අමාත්‍යතුමාට මම විශේෂයෙන් කියා සිටිනවා, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ඒ වාගේම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාගේ අය අපේ අමාත්‍යාංශයේ උපදේශකයන් හැටියට පත් කරනවා නම් අපට විශාල සේවයක් ලබා ගන්නට පුළුවන්කම ලැබෙයි කියලා. මොකද, එතුමන්ලාගේ කථාවේදී පැහැදිලි වුණා, මේ අමාත්‍යාංශය දියුණු කරන්න විටින් විට එතුමන්ලා අදහස් ලබා දුන්න බව. මේ අදහස් අපට ගොඩක් වටිනවා. හැබැයි මම හිතනවා, ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ නැතුව අපේ පැත්තේ හිටපු හින්දා එතුමන්ලාට හරියට අපට උත්තර සපයන්න එහෙමත් නැත්නම් උපදෙස් ලබා දෙන්න බැරි වුණාය කියලා. හැබැයි, දැන් මේ වන කොට එක්සත් ජාතික පක්ෂයේ ඉඳ ගෙන අපට උපදෙස් ලබා දීම පිළිබඳව අප කනගාටු වනවා.

එතුමන්ලාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, මේ රටේ විදුලිය නැති සෑම කෙනකුටම විදුලිය ලබා දෙන්න, සෑම ගමකටම විදුලිය ලබා දෙන්න අද වන කොට අතිගරු ජනාධිපතිතුමා අපේ ගරු අමාත්‍යතුමාටත්, අපටත්, අපේ අමාත්‍යාංශයටත් උපදෙස් ලබා දීලා තිබෙන බව. ඒ වාගේම එතුමා විටින් විට අපේ අමාත්‍යාංශයේ නිලධාරින් කැඳවලා, මේ වන කොට මේ රටේ විදුලිය ලබා දීලා තිබෙන ප්‍රමාණය කොපමණද කියා සොයා බලනවා; ඒ වාගේම ඉදිරි කාලය තුළදී විදුලිය ලබා දීම සඳහා ඉලක්කගත වැඩසටහනට යන්න අවශ්‍යයි කියන එක පිළිබඳව අපට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ අනුව අප බලාපොරොත්තු වනවා, නැවත වතාවක් එක්සත් ජාතික පක්ෂයට එහෙමත් නැත්නම් විපක්ෂයට "විදුලිය ලබා දෙනවා"යි කියන බොරු පොරොන්දුව මහජනතාවට දෙන්න ඉඩ නොදී 2012 අවසන් වන විට විදුලිය නැති සෑම කෙනෙකුටම විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. ඒ නිසා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට යෝජනා තිබෙනවා නම් දැන්ම අපට ලබා දෙන්න. කුරුණෑගල දිස්ත්‍රික්කය කිව්වාම විදුලිය නැති ප්‍රදේශ තව තිබෙනවා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා නම් ඉතින් කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ ප්‍රදේශයේ විදුලිය ලබා දීම අපි සියයට 100ක් අවසන් කර තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මම තමුන්නාන්සේලා වෙනුවෙන්- [බාධා කිරීමක්] ඉදිරි කාලයේදී අපේ මන්ත්‍රීතුමන්ලාට විදුලි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරනවා කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඉහළ කොත්මලේ ආරම්භ කළේ එක්සත් ජාතික පක්ෂයයි කියලා ආරම්භක කථාවේදී කියැවුණා. මෙතැනදී මම පැහැදිලිවම මතක් කරන්න ඕනෑ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ මේ ව්‍යාපෘතිය ආරම්භ කරනවායි කියලා ඒ අවශ්‍ය කටයුතු කරලා අවසානයේදී ආරාධනා පත්‍ර පවා සකස් කරලා, ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේම අමාත්‍යවරයකුගේ ඕනෑකමට -යම් කිසි බලපෑමක් තුළ- එවකට හිටපු රජයේ නායකතුමා ඒ ව්‍යාපෘතිය අවලංගු කළා කියන එක. ඒ නිසා අද අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, එය ක්‍රියාත්මක කරලා ඉහළ කොත්මලේ බලාගාරය 2012 දෙවන මාසයේ අග වන කොට මේ රටේ ජාතික පද්ධතියට එකතු කරලා ඒ විදුලි බලාගාරයෙන් විදුලිය නිකුත් කරන්න.

අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කාර් රේස් ගැන කිව්වා. කාර් රේස්වලට විදුලිය සපයන්නේ කොහොමද කියලා ඇහැව්වා. මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, "කාර් රේස්වලට නොවෙයි, ඔබතුමන්ලාගේ විරෝධතා ව්‍යාපාරයක් තිබෙනවා නම් ඒකටත් අවශ්‍ය විදුලිය සපයනවා" කියලා අපේ ගරු අමාත්‍යතුමා කිව්ව බව. අපට මුදල් ගෙවනවා නම් විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දෙනවා. කාර් රේස් එකට විදුලිය සපයන්නේ අපි නොවෙයි, generators මඟින්. මේවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ කෙරුණේ නැහැ කියලා, තමුන්නාන්සේලාගේ කාලයට වඩා වෙනස් විදියට කඩිනමින් අපි විදුලිය සපයනවා කියලා, ඒ වාගේම විදුලිය නොකපා, නොකඩවා ලබා දෙනවා කියලා ගොඩක් හිතේ අමාරුවක් අද එක්සත් ජාතික පක්ෂය ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඇති වෙලා තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

කාර් රේස්වලට විදුලිය දෙන්න කියලා ඉල්ලලා තිබෙන්නේ කවුද? [බාධා කිරීම්]

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

එක් කෙනෙක් කථා කරන්න කෝ. [බාධා කිරීමක්] ඔබතුමා නේ ඇහුවේ කාර් රේස් එකට විදුලිය සපයනවා නේද කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා කිව්වානේ දැන්, අපි විදුලිය ඉල්ලුවොත්, application එකක් දුන්නාට පස්සේ දෙනවා කියලා.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ඔව්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම අහන්නේ, කාර් රේස් සඳහා විදුලිය ඉල්ලුම් කරලා තිබෙන්නේ කවුද කියලා දැන ගන්න ඕනෑ කියලායි.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)

ඔබතුමා නේ කිව්වේ ඉල්ලුම් කළා කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමානේ කියන්නේ දෙනවා කියලා.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
නැහැ. [බාධා කිරීමක්] අපි කිව්වේ ඉල්ලීමක් කළොත් දෙනවා කියලායි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
වෙන කවුරුත් ඉල්ලලා නැහැ. [බාධා කිරීමක්]

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
විදුලිබල මණ්ඩලයේ generatorsවලින් ලබා දෙන්නේ. විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලීමක් කළොත් විදුලිය ලබා දෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කවුද ඉල්ලා තිබෙන්නේ?

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
අපට අදාළ මුදල් විතරයි අප බලාපොරොත්තු වන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි අහන්නේ කවුද ඉල්ලුවේ කියලායි.

**ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு பிரேமலால் ஜயசேகர)
(The Hon. Premalal Jayasekara)
තමුන්නාන්සේලාට හරි හිතේ අමාරුවක් තිබෙනවා අතිගරු ජනාධිපතිතුමා මේ වන විට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විශාල වෙනසක් ඇති කරලා ඒ තුළින් ජනතාවට විශාල ලෙස විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබීම ගැන. ඒ වාගේම අපේ මන්ත්‍රීතුමෙක් ඇහුවා උතුරු-නැඟෙනහිර ප්‍රදේශයේ උතුරු වසන්තයෙන් මොනවාද කරන්නේ කියලා. මම පැහැදිලිව මතක් කරන්න ඕනෑ අද වන විට වව්නියාවේ සිට කිලිනොච්චිය දක්වාත්, ඒ වාගේම කිලිනොච්චියේ සිට චුන්නාකම් දක්වාත් අපේ ජාතික පද්ධතිය හරහා විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා අද විවිධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් යනවාය කියන එක.

ඒ විතරක් නොවෙයි උතුරු වසන්තය යටතේ, -අපි පසු ගිය කාලයේ ගිහිල්ලා සොයා බලලා, අවශ්‍ය කටයුතු කරලා- මේ වන විට විදුලිය ලබා දෙමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් යම් ගැටලු තිබෙනවා. අවශ්‍ය කම්බි, අවශ්‍ය උපකරණ එහෙම නැත්නම් අවශ්‍ය ද්‍රව්‍ය අපට ක්ෂණිකව ලබා ගැනීමට නොහැකි වෙනවා. ඒවා විදේශ රටවලින් ආනයනය කරන්නට සිදු වෙනවා. එතැනදී යම් යම් ප්‍රමාදයන් සිදු වෙනවා. ඒ වාගේ විවිධ වැඩ පිළිවෙළවල් විශාල වශයෙන් රට පුරාම ක්‍රියාත්මක කරන්න ගියාම එවැනි දේවලට මුහුණ දෙන්නට සිදු වෙනවා කියන එක මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උදවිය ඉලක්කම්වලින් කිව්වා මේ රටේ විදුලිය උත්පාදනය කිරීමේදී නොයෙකුත් අක්‍රමිකතාවන් සිදු වුණා කියලා. ඒ වාගේම මහවැලි ව්‍යාපාරය ගැන කථා කළා. අද අපට මහවැලි ව්‍යාපාරය තුළින් ජල විදුලිය ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ කාලයේ තමුන්නාන්සේලා මහවැලි ව්‍යාපාරය තුළින් ගඟා කාපු ඒවා ගැන කථා කරනවා නම් ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්. ඒවා නොතිබුණා නම් අද අපේ රට මීට වඩා ඉහළ මට්ටමකට ගේන්න පුළුවන්කම තිබුණා කියලා මම හිතනවා. මම ඒ ගැන දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය විදුලිය ගැන මේ උදවිය කියපු නිසා මම මතක් කරන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. අද ග්‍රාමීය විදුලිය සඳහා RE-8 ව්‍යාපෘතිය අපි ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 12,194ක් වෙන් කරලා තිබෙනවා. කොළඹ, කළුතර, රත්නපුර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මහනුවර, මාතලේ, නුවරඑළිය සහ වව්නියාව වාගේ දිස්ත්‍රික්කවල ඉරාන ආධාර යටතේ විදුලි යෝජනා ක්‍රම 1000ක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඌව උදානය ව්‍යාපෘතිය යටතේ චීන Exim Bank එක යටතේ රුපියල් මිලියන 3,346ක වියදමින් බදුල්ල, මොනරාගල සඳහා විදුලි ව්‍යාපෘති 250කට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ග්‍රාමීය විදුලිය (iv) ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල විදුලි ව්‍යාපෘති 550ක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මේවා අහ ගන්න. වෙන මොකක්වත් නිසා නොවෙයි, අපේ රජය යටතේ 2005 සිට මේ දක්වා ක්‍රියාත්මක කරලා තිබෙන ඒවා සහ ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න බලාපෙරොත්තු වන ඒවා දිහා බලන විට පසු ගිය වසර 17ක එක්සත් ජාතික පක්ෂ කාලයේ ලබා නොදුන්න ඒවා පසු ගිය අවුරුද්ද, දෙක තුළ අපට ලබා දෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා කියන කාරණය පැහැදිලි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කිව්වාම කඩිනම් සේවයක් ජනතාවට ඉෂ්ට කරන අමාත්‍යාංශයක්. ඒ නිසා මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම හිතන්නේ තමුන්නාන්සේලා ඉතාමත්ම දුක් වෙනවා කියලායි. මොකද, පසු ගිය කාලයේ විදුලිය කප්පාදු කරන්න වෙයි කියලා, වර්ෂාව නැති වෙයි කියලා තමුන්නාන්සේලා ගොඩාක් සතුටින් හිටියා. නමුත් වර්ෂාව ආයෙත් ආරම්භ වුණා. අපි ඒ ගැන සතුටු වෙනවා. මේ රටේ ජනතාව වෙනුවෙන් නොකඩවා විදුලිය ලබා දීලා, ඉදිරි කාලය තුළදී මේ රට පුරාම විදුලි බලය ව්‍යාප්ත කරන්න අපි බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්] කැමැති නැහැ.

අද රුපියල් කෝටි ගණනක් වැය කරලා මේ රටේ සංස්කෘතික අංශය දියුණු කිරීම සඳහා "නෙළුම් පොකුණ" ඉදි කරලා අතිගරු ජනාධිපතිතුමා මේ රටේ කලාකරුවන්ට විශාල දායාදයක් ලබා දෙනවා. ඒ අවස්ථාවට යන්න තිබෙන නිසා මගේ කථාව අවසන් කරනවා. සියලු දෙනාටම සුබ

"119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 1,083,340,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 733,650,000

"119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 733,650,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 31,766,350,000

"119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 31,766,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

119 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,083,340,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் -மூலதனச் செலவு ரூபா 733,650,000

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 733,650,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 31,766,350,000

"தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 31,766,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 119, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,083,340,000, for Head 119, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 733,650,000

Question, "That the sum of Rs. 733,650,000, for Head 119, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 31,766,350,000

Question, "That the sum of Rs. 31,766,350,000, for Head 119, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 119, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු නිමල් සිරිපාලද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය"යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ. භා. 4.01 ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.***
***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2011 දෙසැම්බර් 16 වන සිකුරාදා.***
*பி. ப. 4.01 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2011 டிசம்பர் 16, வெள்ளிக்கிழமை.*
*At 4.01 p.m., Mr. Presiding Member left the Chair to report Progress.*
*Committee report Progress; to sit again on Friday, 16th December, 2011.*

## මෝටර් වාහන පනත : නියෝග
## மோட்டார் வாகனச் சட்டம் : ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT : REGULATIONS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Minister of Transport, I move:

"That the Regulations made by the Minister of Transport under Section 237 read with Sections 8, 14, 18, 30, 42, 139C, 139H and 231 of the Motor Traffic Act (Chapter 203) and published in the Gazette Extraordinary

No. 1722/27 of September 09th, 2011, which were presented on 08.12.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත : නියෝග
## இலங்கை நிலைபெறுதகு வலு அதிகாரசபைச் சட்டம் : ஒழுங்குவிதிகள்
## SRI LANKA SUSTAINABLE ENERGY AUTHORITY ACT : REGULATIONS

### I

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Minister of Power and Energy, I move:

"That the Regulations made by the Minister of Power and Energy under subsection (2) of Section 16, paragraph (a) of subsection (2) of Section 17 and paragraph (a) of subsection (2) of Section 18 of the Sri Lanka Sustainable Energy

Authority Act, No. 35 of 2007, read with Section 67 of the said Act and published in the Gazette Extraordinary No. 1705/22 of May 10th, 2011, which were presented on 09.11.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Minister of Power and Energy, I move:

"That the Regulations made by the Minister of Power and Energy under Section 67 the Sri Lanka Sustainable Energy Authority Act, No. 35 of 2007, read with Sections 36 and 38 of the said Act and published in the Gazette Extraordinary

No. 1715/12 of July 20th, 2011, which were presented on 09.11.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරමාණුක ශක්ති අධිකාරිය : වාර්ෂික වාර්තාව (2008)
## அணுசக்தி அதிகாரசபை : வருடாந்த அறிக்கை (2008)
## ATOMIC ENERGY AUTHORITY : ANNUAL REPORT (2008)

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Sir, on behalf of the Minister of Power and Energy, I move:

"That the Annual Report of the Atomic Energy Authority with the Auditor-General's observations for the year ended 31.12.2008 and presented on 30.06.2010 under the Section 34 of the Atomic Energy Authority Act, No. 19 of 1969 and Section 14(3) of the Finance Act, No. 38 of 1971, be approved.

(Considered by the Consultative Committee on Power and Energy.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Adjournment Motion is to be moved by the Hon. Sujeewa Senasinghe.

## එළවලු ප්‍රවාහනයේදී ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය
## மரக்கறிகளை ஏற்றிச்செல்வதற்கு பிளாஸ்டிக் கூடைகளின் பயன்பாடு
## USE OF PLASTIC CONTAINERS IN TRANSPORTATION OF VEGETABLES

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2011 දෙසැම්බර් මස 11 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට එළවලු ප්‍රවාහනය කරන ලොරි හිමියන් ප්ලාස්ටික් ඇසුරුම්හි එළවලු බහා ප්‍රවාහනය කළයුතු බව අනිවාර්ය කිරීමෙන් මෙතෙක් ගෝනිවල අසුරා එළවලු ප්‍රවාහනය කළ වෙළඳුන් බරපතළ අර්බුදයකට ලක්වීමෙන් එළවලු ප්‍රවාහනය සම්පූර්ණයෙන් ඇණහිටින තත්ත්වයක් උද්ගතවී ඇත.

විශේෂයෙන් නුවරඑළිය සහ වැලිමඩ ප්‍රදේශවලින් කොළඹ වෙළෙඳපොළ සහ දිවයිනේ වෙනත් ආර්ථික මධ්‍යස්ථානවලට ප්‍රවාහනය කරනු ලබන එළවලු නව ක්‍රමය යටතේ ප්‍රවාහනය කිරීමට විරෝධය දක්වමින් ලොරි හිමියන් පමණක් නොව එළවලු පාරම්පරික ක්‍රම යටතේ අසුරා ලොරිවලට පටවන ගොවීන්ද මෙම නියෝගයෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලංකා ඉතිහාසයේ පළමු වරට මහ මඟ එළවලු ගෝනි දහස් ගණනින් පුලුස්සා දමා තම විරෝධය ලොරි හිමියන්, ගොවීන් සහ වෙළඳුන් විසින් දක්වා ඇත. මෙයින් එක් දිනකට සිදුවූ පාඩුව රුපියල් කෝටි ගණනකි. මෙම තත්ත්වයට වහාම පිළියම් යෙදීමට ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වුවහොත් දැනටත් ඉහළ ගොස් ඇති එළවලු මිල ගණන්වලින් හෙම්බත්ව සිටින ජනතාවට එළවලු හිඟයක් ඇතිවී කබලෙන් ලිපට වැටෙනු ඇත.

එබැවින් මතුව ඇති මෙම අර්බුදකාරී සහ භයානක තත්ත්වය කෙරෙහි අවධානය යොමු කර එම තත්ත්වය සමථයකට පත් කිරීම සඳහා වහාම පියවර ගත යුතු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය අද විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ආදරණීය ගොවීන්, ඒ වාගේම වෙළෙඳුන් මේ සිදුවීම තුළින් මේ වෙන කොට කෝටි 14ක පාඩුවක් ලබා තිබෙනවා. විශේෂයෙන්ම මෙහි ප්‍රායෝගික තත්ත්වය සම්බන්ධයෙන් අපට ප්‍රශ්න තිබෙනවා. ගෝනිවල ඇසිරීමෙන් එළවලු යම් කිසි ආකාරයකින් විනාශ වීම සිදු වෙනවා වෙන්න පුළුවන්. හැබැයි අපට ලැබිලා තිබෙන තොරතුරු අනුව මේ කියන ආකාරයට සියයට 30ක ප්‍රමාණයක් විනාශ වීමක් සිදු වන්නේ නැහැ.

[ගරු සුජීව සේනසිංහ මහතා]

විශේෂයෙන්ම ලංකාව වැනි තුන්වැනි ලෝකයේ රටක එළවලු මෙසේ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මැලේසියාව, සිංගප්පූරුව වැනි දියුණු රටකට නම් මේ ක්‍රමය ගැළපෙනවා. හැබැයි ලංකාවට එක වරම, දිනකින්, දින දෙකකින්, දින තුනකින් මේ වාගේ නීතියක් හඳුන්වලා දුන්නාම විශාල විනාශයක් සිදු වෙනවා. විශේෂයෙන්ම වෙළෙඳුන් සඳහන් කරනවා ප්‍රායෝගික වශයෙන් තුනෙන් එකක ප්‍රමාණයක් තමයි මේ ක්‍රමයට ලොරියක ප්‍රවාහනය කරන්න පුළුවන් කියලා. ඒ වාගේම මේ ඇසුරුම්වල තිබෙන එළවලු වෙළෙඳ පොළට බෑමෙන් පස්සේ, ආපහු බඩු පටවා ගෙන යන වෙළෙඳුන්ට මෙහිදී විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. මේ ඇසුරුම් ටික ආපහු හැතැප්ම ගණනක් දුර ගෙන යන්න ඕනෑ. ඒ වාගේම ප්‍රවාහනය සම්බන්ධයෙන් ලංකාවේ තිබෙන අඩු පහසුකම් නිසා කිලෝමීටර් 100ක්, කිලෝමීටර් 150ක් දුර යන්න පැය හතරක්, පැය පහක් පමණ ගත වෙනවා. මේ ප්‍රායෝගික අපහසුතාව නිසා වෙළෙඳුන්, ගොවීන් අද විශාල අර්බුදයකට මුහුණ දීලා ඉන්නවා. අඩුම ගණනේ සිලි සිලි බෑග් එකක් ගන්න, පොහොර බෑග් එකක් ගන්න සල්ලි නැති මේ ගොවීන්ට මේ වාගේ ඇසුරුමකට විශාල මුදලක් වියදම් කරන්න හැකියාවක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දුප්පත් ජනතාවට ආදරය කරන රජයක් නම් අඩුම ගණනේ ඔවුන්ට මේ ඇසුරුම් නිකම් ලබා දීලා -ඒත් ප්‍රායෝගික අපහසුතා තිබෙනවා- ඔවුන්ට කියන්න තිබුණා ප්‍රවාහනය කරන්න කියලා.

අද බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිසා අද රටේ සියලු තැනකම එක පවුලක් පමණක් නොවෙයි, විශාල පිරිසක් දවසේ වේල හොයා ගන්න බැරිව ඉතා අපහසුතාවකට පත් වෙලා ඉන්නවා. දැනටමත් මෙහි පාඩුව රුපියල් කෝටි 14ක් කියලා සඳහන් වෙනවා. එය සුළුපටු පාඩුවක් නොවෙයි. මේ එළවලුවලින් සියයට 10ක ප්‍රමාණයක් විනාශ වුණත්, අවුරුදු ගණනක් ඒ පාඩුව ලැබුවත්, මේ විධියට රුපියල් කෝටි 14ක පාඩුවක් සිදු වන්නේ නැහැ. එහෙනම් මේ වාගේ අත්තනෝමතික තීරණ ආණ්ඩුව විසින් නොගත යුතුයි. ජනතාව තළන පෙළන මේ වාගේ දැඩි නීති නොපැනවිය යුතුයි. අනිවාර්යයෙන්ම දුප්පත් ජනතාවගේ - විශේෂයෙන්ම ගොවියාගේ- ඒ අසරණභාවය ගැන ආණ්ඩුව කල්පනා කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ගොවි ජනතාවගේ ප්‍රමාණය දැනටත් සියයට 12ට බැහැලා තිබෙන්නේ. මීට අවුරුදු 5කට, අවුරුදු 6කට කලින් මේ රටේ ගොවි ජනතාව සියයට 20ක් හිටියා. නමුත් දැන් එය සියයට 12ට බැහැලා තිබෙනවා. තවදුරටත් මේ ගොවි ජනතාව විනාශ කිරීමේ ක්‍රියාවලියක් තමයි මෙමඟින් සිදු වන්නේ.

අපට දැනට ලැබී තිබෙන තොරතුරු අනුව මේ නීතිය මාසයකට කල් දමලා තිබෙනවා කියනවා. මෙහි ප්‍රයෝගික තත්ත්වය සම්බන්ධයෙන් සැලකිලිමත් වෙලා, ගොවි ජනතාවට සහන සලසනවා නම් ඒ සහනය ඔවුන්ට ලබා දීලා, ඒ ගොවි ජනතාව කැමැති නම් පමණක් ක්‍රම ක්‍රමයෙන් පුරුදු කරවිය යුතු ක්‍රමයක් මේක. ඒ මිස, හිටි හැටියේ ගොවි ජනතාව තළා පෙළා අසරණ කළ යුතු ක්‍රියාදාමයක් නොවන බව මා සඳහන් කරනවා.

මෙම යෝජනාව ස්ථිර කිරීම මගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට පවරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ගෙනාපු සභාව කල්තැබීමේ යෝජනාව මා සථිර කරනවා. අද මේ රටේ ජීවත් වන දුප්පත් ගොවි ජනතාව ගැන හිතන්නේ නැතිව, අපේ වෙළඳ ඇමතිතුමා නිකුත් කර තිබෙන චක්‍රලේඛය නිසා අපේ රටේ ගොවි ජනතාව අමාරුවේ වැටිලා ඉන්නවා. මා හිතන විධියට අද පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් දවල්ට කන්න ලැබුණේ කොස් ඇට. එහෙම නේද? අද පාර්ලිමේන්තුවේත් එළවලු නැහැ. අපි කෑම කන්න ගියාට පස්සේ, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා මුල් වෙලා පාර්ලිමේන්තු බිමේ වවපු ගෝවා ටිකක් අපට ලැබුණා. ඊට අමතරව කොස් ඇට ටිකක් තිබුණා.

අද කඩයකට ගියාම මුදලාලිලා කියනවා, රුපියල් පණහක්වත් කෑම වේලකට වැඩි කරන්න ඕනෑ කියලා. අද බෝංචි කිලෝ එක රුපියල් 300යි. අමු මිරිස් කිලෝ එක රුපියල් 600යි. කැරට් ගන්න නැහැ. මේ වාගේ නීතියක් ගෙන එන කොට ඒක ප්‍රායෝගිකද කියලා ඇමතිතුමාට කල්පනා කරන්න තිබුණා. රජයේ කිසිම උදව්වක් නැතිව තමයි මේ අහිංසක ගොවීන් මේ එළවලු වගා කරන්නේ. තියෙන කණ කර උගස් තියලා මාස තුන හතරක් මහන්සි වෙලා එළවලු වගා කරලා කොළඹට ගෙනැල්ලා විකුණලා තමයි -නගරයකට ගෙනැල්ලා විකුණලා තමයි- ඒවා මුදල් කර ගන්නේ. මේ එළවලු එච්චර කාලයක් තියෙන්නේ නැහැ. සමහරවිට ලීක්ස් වැවුවොත් සුමාන දෙකයි තියෙන්නේ. ඒ සුමාන දෙකේ ලීක්ස් ටික විකුණා ගන්න බැරි වුණොත් මාස හය හතක් බඩගින්නේ ඉන්න වෙනවා.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමනි, 1970-1977 ආණ්ඩුවේ අපේ ගරු ජනාධිපතිතුමාත් හිටියා. ඒ කාලයේ මිරිස් පොලු, හාල් පොලු තිබුණා. මේවා ආපසු මතක් වෙලාද දන්නේ නැහැ, එළවලුවලටත් මේ කූඩ පොල්ලක් දැම්මේ. අද ලොරි නවත්වලා චෙක් කරනවා, එළවලු කූඩයේ එනවාද ගෝනියේ එනවාද කියලා. එළවලු ගෝනියේ ආවොත් ලොරිය නවත්වනවා; දඩ ගහනවා. ඒ විධියට දඩ ගහලා තිබුණා, ලක්ෂ ගණනක.

ඇමතිතුමනි, සාමාන්‍යයෙන් ලොරියක එළවලු කිලෝ දහදාහක් පටවනවා නම්, මේ පෙට්ටිවල දැම්මාම පටවන්නට පුළුවන් කිලෝ පන්දාහයි. මේ පෙට්ටිවල පරිමාව වැඩියි. ගරු ඇමතිතුමනි, මේ කූඩ නීතිය ගෙන එනවා නම්, මාස ගණනකට ඉස්සෙල්ලා කියන්න වෙනවා, ඒවාට හරියන්න ලොරිත් හදා ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ එළවලු අපතේ යන නිසා මේ නීතිය දානවා නම්, ගොවියාට ඒ වෙනුවෙන් සහනාධාරයක් දෙන්න.පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල මේ රටට ගේන්න මිලියන 800ක් වියදම් කරන්න තමුන්නාන්සේලාට පුළුවන් නම්, ඇයි මේ පෙට්ටි ටික ගොවියාට නිකම් දෙන්න බැරි? ඇයි මේ පෙට්ටි ටික නිකම් දෙන්න බැරි? මා දන්නා විධියට අද ගොවියාගෙන් රුපියල් 1200ක් ඉල්ලනවා පෙට්ටියකට. රුපියල් 1200ක්! මේ රටේ දුප්පත්ම කොටස තමයි ගොවි ජනතාව. තමුන්නාන්සේලා මේ කරන දුර නොබලන වැඩෙන්, සැලසුමක් නැති වැඩෙන් දැනටමත් ගොවීන් ලක්ෂ ගණනක් අනාථ වෙලා ඉවරයි. මේ කන්නයේ වගා කරපු එළවලු ටික විකුණා ගන්න බරි වුණා නම්, මාස ගණනක් ඒ ගොල්ලන්ට බඩගින්නේ ඉන්න වෙනවා. නීති ක්‍රියාත්මක කරන්නට පුළුවන්; නීති දමන්න පුළුවන්. නමුත් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නට පුළුවන්ද කියලා කල්පනා කරන්න ඕනෑ. අද කොළඹ මැනිං මාර්කට් එකේ එළවලු නැහැ. ගාල්ලට ගියාම, තවත් නගරවලට ගියාම එළවලු නැහැ. මේ නිසා ගොවියාත් අසරණ වෙලා තිබෙනවා; පාරිභෝගිකයාත් අසරණ වෙලා තිබෙනවා. මා ඉස්සෙල්ලා කිව්වා වාගේ අර හැත්තෑවේ හත්තෑ හතේ මිරිස් පොලු, හාල් පොලු යුගය නැවත සිහිපත් කරමින් එළවලු ගොවියාත් නවත්වලා, එළවලු ගෙන එන්නට බැරි විධියට අද පොලු දමලා තිබෙනවා. මේ නීති දමද්දී ගොවියාත්, පාරිභෝගිකයාත් අපහසුතාවට පත් නොවන විධියට කටයුතු කරන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අද වම්බටු, එළවලු පොළොවේ ගහන යුගයකට තමුන්නාන්සේලා රට ගෙනැල්ලා තිබෙනවා. ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිතුමා අපේ හිත මිත්‍රයෙක්; යහළුවෙක්. එතුමා අපත් එක්ක එකටයි හිටියේ, ආණ්ඩුව පැත්තට ගියාට. ගරු ඇමතිතුමනි, අපිත් ඉල්ලීමක් කරනවා, කරුණාකර ගොවියාට අපහසුවක් නොවන විධියට මේ නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. අද ගොවියා අමාරුවේ වැටිලා ඉවරයි. බොහොම ස්තුතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, ආණ්ඩුව හඳුන්වා දීපු මේ අලුත් බකට් ක්‍රියාවලිය නිසා රටේම ආර්ථිකයත්, විශේෂයෙන්ම පාරිභෝගික ජනතාවත්, ගොවි ජනතාවත්, ව්‍යාපාරිකයනුත් බරපතළ අපහසුතාවකට පත් වුණා කියන එක. ඇත්තටම විය යුතුව තිබුණු දේ මොකක්ද? හොඳ දේවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ හොඳ විධියටයි. හොඳ දේවල් වැරැදි විධියට ක්‍රියාත්මක කළොත්, එහි ප්‍රතිචාරය හොඳ වන්නේ නැහැ. අපි දන්නවා, ජොන්ස්ටන් ඇමතිතුමා බිත්තර ගෙනාවා; කේරළයෙන් බිත්තර ගෙනාවා. පසුව ඒක ලොකු අර්බුදයක් බවට පත් වුණා. අන්තිමේදී, සීල් ගහපු බිත්තර මේ රටේ ජනතාව පිළිගත්තේ නැහැ. ඊළඟට, ජෝන්ස්ටන් ඇමතිතුමාම ගෙනාවා පොල්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

කේරළයෙන් ගෙනාවේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔව්,කේරළයෙන් පොල් ගෙනාවේ. ඉන්දියාවෙන්ම තමයි බිත්තර ගෙනාවේත්. කේරළයෙන් පොල් ගෙනාවා. පසුව ඔබතුමාම පාර්ලිමේන්තුවේදී කිව්වා, පොල් ගෙඩි 75,000ක් විතර නරක් වෙලා මුහුදට දමන්න සිද්ධ වුණා කියලා. ඊළඟට ඔබතුමා සිමෙන්ති ගෙනාවා. ජොන්ස්ටන්ගේ පොලුයි, ජොන්ස්ටන්ගේ සිමෙන්තියි, ජොන්ස්ටන්ගේ බිත්තරයි ප්‍රශ්නයක් වුණා. දැන් අලුතින්ම එකතු වෙලා තිබෙන්නේ ජොන්ස්ටන්ගේ බකට් එක. ගරු ඇමතිතුමනි, ඇත්තටම එක වෙලාවකට හිතෙනවා, මේවා ඔබතුමා හිතලා මතලා ආණ්ඩුවටම බකට් එකක් දමන්න ගෙනාපු ඒවාද කියලා. මොකද, මේ රටේ මෙහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මේ වෙලාවේ ගොවීන් පාරට බැහැලා එළවලු පොළොවේ ගහන්න හරි, නැත්නම් වාහනවල රියැදුරන් පාරට බහින්න හරි, මැනිං මාර්කට් එකේ, තඹුත්තේගම, දඹුල්ලේ ව්‍යාපාරිකයන් පාරට බහින්න හරි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් කොස් ඇට කන තත්ත්වයට පත් වෙන්න හරි අර්බුදයක් තිබුණේ නැහැ. ඇත්තටම ඔබතුමා තමයි මේ අර්බුදය හැදුවේ. ඔබතුමා එක වෙලාවක ජනමාධ්‍යයට කියනවා මම දැක්කා ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ අය කුලප්පු කරනවා කියලා. නැහැ. ඔබතුමා තමයි කුලප්පු කළේ. ඔබතුමා කුලප්පු කරපු එකට ඉතින් අපි මොනවා කරන්නද? අප මැනිං මාර්කට් එකට ගෙන ගියේ ඔබතුමායි. අපව මහ පාරට එක් කර ගෙන ගියේ ඔබතුමායි. එහෙම නැතිව අපි කැමැත්තෙන් ගියේ නැහැ. ඔබතුමා ඊට පස්සේ කිව්වාට වැඩක් නැහැ, අපි මේකේ පිටි පස්සෙන් ඉන්නවා කියලා. අපි පිටි පස්සේ නොවෙයි ඉන්නේ. මේ වාගේ දේවලදී අපි ඉස්සරහින් ඉන්නේ. මා ඒක අවධාරණයෙන් කියන්න ඕනෑ. අප මහ ජන නියෝජිතයෝ; විපක්ෂයේ මන්ත්‍රීවරු. අපට මෙහි හැංගිලා කරන්න දෙයක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, තවත් කථිකයෙක් ඉන්නවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරනවා. ඔබතුමන්ලා තේරුම් ගන්න ඇත්තටම මේකෙන් දැවැන්ත වියවුලක් වුණා කියන එක. සිගරට්, අරක්කු මිල වැඩි කරනවා වාගේ මධ්‍යම රාත්‍රි 12.00 ඉඳලා රුපියල් 10,000 ඉඳලා රුපියල් 1,00,000 දක්වා දඩ ගහනවා කිව්වොත් එහෙම, ඒක මේ රටේ ජනතාවට දරා ගන්න බැහැ. ඒ හින්දා මම නැවතත් කාරුණිකව ඉල්ලීමක් කර සිටිනවා. මේක මාසයකින් කල් දාපු එක ආණ්ඩුවේ ජයග්‍රහණයක් නොවෙයි. අද පත්තරවල පොල් ගෙඩි අකුරෙන්තිබුණා, මේක ආණ්ඩුවේ ජයග්‍රහණයක්ය කියලා. මේක ආණ්ඩුවේ පරාජයක්. ජනතාවගේ ජයග්‍රහණයක්. මේ වාගේ තීන්දු තීරණවලින් ආණ්ඩුවටත් බකට් දමන්නේ ඔබතුමන්ලායි; ජනතාවටත් බකට් දමන්නේ ඔබතුමන්ලායි. කරුණාකර මේවා වහාම නතර කරන්න කියා ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු දෙකක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම ඇමතිතුමාට කියන්න කැමැතියි එතුමා කරන්න හදපු වැඩේ හොඳයි කියලා. ඒක නරකයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. නමුත් රටේ එළවලුවලින් සියයට 40ක් විතර කුණු වෙනවා; අහක දමනවා. නමුත් මේක කරන්න ක්‍රමවේදයක් තිබුණා. මම දන්නේ නැහැ, ඔබතුමාට කවුරු මේ උපදෙස දුන්නාද කියා, හදිසියේ නීතියක් දාලා මේක දඩබඩ ගාලා ගෙනැල්ලා කරන්න. එක පාරට මේ නීතිය ගෙනැල්ලා පැය 24න් කූඩවලට පරිවර්තනය කරනවා කියන්නේ හරි අමාරු වැඩක්. Spitalfields.co.uk කියන website එකට මම දැන් ගියා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, එහි සඳහන් ප්‍රදේශයේත් තවම පාවිච්චි කරන්නේ ගෝනි. මේ තිබෙන්නේ, "ඇති දා ගෝනි - නැති දා සීනි" කියලා. මෙහි දාලා තිබෙනවා. එහේ තවම ගෝනිවලිනුයි ඒ කටයුතු කරන්නේ. මේ එංගලන්තයේ. "Spitalfields.co.uk" කියලා ගහලා බැලුවාම පෙනෙනවා, ඔක්කෝම ටික. එතැනත් ඒ තත්ත්වයයි තිබෙන්නේ. මම ඔබතුමාට ආරාධනා කරනවා ඒක බලන්නය කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ගෙනාපු සමහර දේවල් රටේ වෙළඳ පොළ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් වුණාට ඒවා අතර හොඳ ඒවා තිබුණා. ඊයේ මම දැක්කා, අර මැනිං මාර්කට් එකේ ඔබතුමාට මොනවාද කිව්වේ කියලා. "කූඩ ජොනී අපිට එපා" කියලායි කිව්වේ. ඉතින් බලන්න. ඔබතුමා ඒ තරම් පහළ මට්ටමට වැටීම ගැන මම විශාල ලෙස කනගාටුවට පත් වෙනවා. මොකද, අපේ දිස්ත්‍රික්කයේ නායකයෙක් විධියට, අපේ යාළුවෙක් විධියට වැඩ කරපු කෙනෙක්. මේ සම්බන්ධයෙන් නිවැරදි ක්‍රියා මාර්ගයක් ගන්න කියලා මම විශේෂයෙන් කියන්න කැමැතියි. ඔබතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියලා පැය භාගයක් යන කොට ජනාධිපතිතුමා කියනවා, "නැහැ, ඒක සම්පූර්ණයෙන් අහෝසියි, ලබන මාසයේ ඉඳලා ඒක කරන්න, මාසයක් කල් දෙන්න" කියලා. වෙන කට්ටිය මේවා ඔබතුමා ළඟට ඇවිල්ලා කිව්වාම ඔබතුමා තීන්දුවක් ගන්නවා, ඊට පස්සේ ජනාධිපතිතුමා වෙනම

[ගරු දයාසිරි ජයසේකර මහතා]

රුස්වීමක් තියලා කථා කරලා එතැනදී වෙන තීන්දුවක් ගන්නවා. ඒකෙන් ඔබතුමා අසරණභාවයට පත් වෙනවා. සුබ පතලා පෝස්ටර් ගහන්නේ ඔබතුමාට නොවෙයි, ජනාධිපතිතුමාට. කුඩෙන් වැඩේ කරන්න හදපු මිනිහා ඉවරයි. ජනාධිපතිතුමාට සුබ පතලා පෝස්ටර් ගහනවා. කමක් නැහැ, ඔබතුමාගේ නායකයා හින්දා ඔබතුමා ඒක පිළිගනීවි. ඔබතුමා කියයි "මගේ පක්ෂය රාජපක්ෂය, ඒක නිසා ප්‍රශ්නයක් නැහැ" කියලා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. අහිංසක, දුප්පත් ගොවීන් වෙනුවෙන් කථා කරන්න අද අපට සිද්ධ වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඔබතුමාත් දන්නවා, ඊයේ මේ පාර්ලිමේන්තුවේ අපි අල තම්බලා කෑවා, අල බැදලා කෑවා, අල තෙල් දාලා කෑවා. වෙන කන්න දෙයක් නැහැ. ඊට පස්සේ අද පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට පින් සිද්ධ වෙන්න පාර්ලිමේන්තුවේ වගා කරපු කොළ ගෝවා ටික තමයි කෑවේ. අපට ප්‍රශ්නයක් නැහැ. අපට කන්න නැති වුණා කියලා ප්‍රශ්නයක් නැහැ. නමුත්, ගමේ ඉන්න අහිංසක දුප්පත් මිනිස්සුන්ට, එළවලු වවන්නේ නැති කොළඹ ඉන්න අහිංසක දුප්පත් මිනිස්සුන්ට මේ ප්‍රශ්නය බලපානවා. ඒ නිසා කරුණාකරලා යම් කිසි ක්‍රමවේදයක් හදන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඉස්සෙල්ලාම ලොරියක උඩ කෑල්ලේ කුඩ ටික ගෙන යන්න ඉඩ දුන්නා නම්, ඒ කියන්නේ අපට තිබෙන ලොරි, කුඩ ගෙන යන්න තරම් ප්‍රමාණවත් නොවන නිසා ඉස්සෙල්ලා ලොරියේ උඩින් සකස් කරන තට්ටුවේ කුඩ අරගෙන යන්න පුරුදු කළා නම් හොඳයි. පසුව මැදින් අරගෙන යන්න, ඊ ළඟට ලොරියේ තට්ටුව ටිකක් ලොකු කරන්න, ඒ විධියේ වැඩ පිළිවෙළක් සකස් කළා නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා විශේෂයෙන් මේ රටේ අහිංසක දුප්පත් ගොවීන්ට නැවත පාරට බහින්න ඉඩ තියන්න එපාය කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Before I call upon the Hon. Johnston Fernando to reply, I have a pleasant task to perform. I recognize the presence of the Hon. Namal Rajapaksa who has taken oath as an Attorney-at-Law today. He now joins the fraternity of distinguished lawyers who are already Members of this House. I wish him well.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ සිටියදී එතුමා නීතිඥයෙක් හැටියට දිවුරුම් දීම ගැන ඔබතුමාත් සමඟම මමත් එතුමාට සුබ පතන්න කැමැතියි. එතුමාගේ අනාගතය සම්බන්ධව හිතන කොට එතුමාගේ පියා වාගේමයි. නීතිඥයෙක් හැටියට එදා වැඩ කටයුතු ආරම්භ කරපු අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අද ජනාධිපතිතුමා වෙලා ඉන්නවා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට අග්‍රවිනිශ්චයකාරතුමියත්, ඒ වාගේම ජනාධිපතිවරයෙකුත් සහභාගී වන අවස්ථාවක තමයි අද එතුමා දිවුරුම් දුන්නේ. ඇත්ත වශයෙන්ම අපි එතුමාටත් සුබ පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම කියන්න කැමැතියි, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා -අපේ පැරණි මිත්‍රයා, අපි එදත් මිත්‍රයි, අදත් මිත්‍රයි, ඒකේ ගැටලුවක් නැහැ- කල් තැබීමේ යෝජනාවක් හැටියට මේ යෝජනාව ඉදිරිපත් කළා. මම විශේෂයෙන් කියන්න කැමැතියි, මේ නීතිය හදිසියේ ගෙනාපු එකක් නොවෙයි. මම පුදුම වෙනවා. මොකද, මේ මන්ත්‍රීවරු පත්තර කියවනවා, උපදේශක කාරක සභාවල මොනවාද වෙන්නේ කියලා දන්නවා, ගැසට් නිවේදන දකිනවා. මේ නීතිය සම්බන්ධයෙන් ප්‍රථම වතාවට ගැසට් නිවේදනයක් නිකුත් කළේ 2011 ජනවාරි මාසයේ 10වැනිදා. මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා අවුරුදු තුනහමාරක් වෙනවා. මේ ව්‍යාපෘතිය සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් නොවෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කුඩ ලක්ෂ 2ක්, වට්ටිනාකමින් සියයට 50ක් වන සහන මුදලකට ලංකාවේ ගොවීන්ට බෙදලා තිබෙනවා. දීර්ඝ කාලයක් කරපු පරීක්ෂණවලින් පස්සේ තමයි රජයක් හැටියට මේ තීරණය ගත්තේ. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා මේ රටේ පාරිභෝගිකයා දිහා සහ ගොවීන් දිහා බලලා ගත්තු තීන්දුවක්.

ජනවාරි මාසයේ 10වැනිදා මේ ගැසට් නිවේදනය නිකුත් කළාට පස්සේ නොයෙක් සංගම්, වෙළෙඳ ව්‍යාපාරික ප්‍රජාව, ඒ වාගේම ගොවීන් අතිගරු ජනාධිපතිතුමාත් එක්ක කරපු සාකච්ඡාවලදී මේ සම්බන්ධයෙන් සංශෝධන ගණනාවක් ඉල්ලුවා. අතිගරු ජනාධිපතිතුමා හැම වෙලාවේම ජනතාවට ඇහුම් කන් දෙන නායකයෙක්. ඒ නිසා, එතුමා ඒ සංශෝධනවලට ඉඩ දුන්නා. මැනිං මාර්කට් එකේ අය ඉල්ලුවේ මාස 6ක කාලයක්. නමුත්, අවුරුද්දක් කල් දුන්නා. ඒ වාගේම ලංකාවේ හැම තැනම, අස්සක් මුල්ලක් නෑර වැඩ මුළු 97ක් පවත්වලා, පත්තරවල මුළු පිටුවක්ම ප්‍රචාරක දැන්වීම් හැටියට ඉදිරිපත් කරමින් ප්‍රචාරය කරලා, ඒ විතරක් නොවෙයි රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය කරලා නැවත වාරයක් නොවැම්බර් මාසයේ 01වැනිදා මේ ගැසට් නිවේදනය නිකුත් කළා. ඒ වාගේම පෞද්ගලික අංශයේ කර්මාන්තවලට කුඩ ලක්ෂ 10ක් වහාම හදන්න කියලා අතිගරු ජනාධිපතිතුමා නියෝග කළා. හේතුව තමයි, වෙළෙඳ පොළට එන නිෂ්පාදනයයි, දවසේ පරිභෝජනයයි දිහා බලපුවාම ලක්ෂ තුනක්, හතරක් වන කුඩ ප්‍රමාණය මදි කියලා එතුමා දැක්කා.

තමුන්නාන්සේලා දකින විධියට, මේක හදිසියේ කරපු දෙයක් නොවෙයි. ඒක වෙලා තිබෙන්නේ, තමුන්නාන්සේලාට පක්ෂයේ තිබෙන ප්‍රශ්නත් එක්ක මේවා ගැන හොයන්න, බලන්න වෙලාවක් නැති එකයි. ඊට වැඩිය අර්බුදයක් තමයි තමුන්නාන්සේලාගේ පක්ෂයේ තිබෙන්නේ. මගේ පරණ පක්ෂය.

පාර්ලිමේන්තුවේදී රනිල් වික්‍රමසිංහ මහත්මයා මොනවාද කිව්වේ? දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු දේම තමයි. මේක ඉතාමත් හොඳ දෙයක් කියලා කිව්වා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ හැම දේම පිළිගන්න මම සූදානම් නැහැ. හැබැයි එතුමා සමහර වෙලාවට හොඳ දේවල්, හරි දේවල් කියනවා. හැම දේම නොවෙයි. එතුමාත් දැන් සුබවාදී දෙයක් කිව්වා. එතුමා කිව්වා, මේක ඉතාමත්ම හොඳ දෙයක් කියලා. ඒකට මම ගරු කරනවා. සුනිල් හඳුන්නෙත්ති මහත්මයාත් එහෙමයි. මගේ මිත්‍රයා. එතුමා පෑලියගොඩට ගිහිල්ලා ඇවිල්ලා කිව්වේ, මේක ඉතාමත්ම හොඳ දෙයක් කියලායි. එතුමා ඉස්සෙල්ලා උද්ඝෝෂණයකට ගිහිල්ලා එකතු වුණා. ඇත්ත වශයෙන්ම මේක ජනතා විමුක්ති පෙරමුණවත්, එක්සත් ජාතික පක්ෂයවත් එකතු වෙලා හදපු උද්ඝෝෂණ නොවෙයි. මේවා මැනිං මාර්කට් එකේ පිරිසක් -සමහර ව්‍යාපාරිකයන් පිරිසක්- එකතු වෙලා කරපු දේවල්. අබ්බගාත වෙලා, බංකොලොත් වෙලා ඉන්න මේ දේශපාලන පක්ෂ දෙකම කැලිවලට කැඩිලා. උද්ඝෝෂණයක් තිබ්බොත් මන්ත්‍රීවරුන් එහේ ඉඳන් මෙහාට එනවා. ඉතින් මේ වාගේ එකකට ලකුණු දා ගන්න ගියා. හඳුන්නෙත්ති මහත්මයාත් එහෙම ගියා. ඒකේ වරදක් නැහැ. ඒවා කාලයකදී අපිත් කෙරුවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට වාසුදේව නානායක්කාර මහත්තයා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
වාසුදේව නානායක්කාර මහත්මයා හැම වෙලාවේම ඉන්නවා. වාසුදේව නානායක්කාර මහත්මයා ප්‍රශ්නයක් තිබෙන්නේ කොහේද,-

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
මම ගියේ එතුමාගේ නියෝජිතයා හැටියටයි.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
දැන් අහ ගත්තා නේද? වාසුදේව නානායක්කාර මහත්මයා-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, එතුමාත් බංකොලොත් දේශපාලනඥයෙක්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ, නැහැ. එතුමා කවදාවත් බංකොලොත් වෙන්නේ නැහැ. එහෙම නම් කොහොමද එතුමා දිනන්නේ? එතුමා දේශපාලන පක්ෂයකින් මැතිවරණයකට ඉදිරිපත් වෙලා දිනලායි ඇවිල්ලා ඉන්නේ. වාසුදේව නානායක්කාර මහත්මයා තමයි, හැම වෙලාවේම සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳව, සතොස පිළිබඳව කැබිනට් එකේ වේවා, උපදේශක කාරක සභාවේ වේවා, පාර්ලිමේන්තුවේ වේවා, මේ හැම තැනකදීම අපි වෙනුවෙන් නැඟිටලා කථා කරන නායකයා වන්නේ. එතුමා ඇවිල්ලා මාව මුණ ගැහිලා, මෙහෙම උද්සෝෂණයක් තිබෙනවාය කියලා කිව්වා. මම කිව්වා, ඔබතුමා ගිහිල්ලා කථා කරලා බලන්න කියලා. එතුමා ගිහිල්ලා කථා කරලත් නැවත වාරයක් ඇවිත් මාව හමු වෙලායි ගියේ. ඒ නිසා අපට එහෙම ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැලියගොඩ ගිහිල්ල ඇවිල්ලා සුනිල් හඳුන්නෙත්ති මහත්මයාත් මොනවාද කිව්වේ? එතුමා කිව්වේ, "මේක ඉතාමත් හොඳ දෙයක්, මේක කරන ක්‍රමයයි වැරැදි." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අවුරුදු තුනහමාරක ව්‍යාපෘතියක්. මේ රජය තීන්දු තීරණ ගන්නේ මේ රටේ ජනතාව දිහා බලලායි. ඒ නිසා අපි ඇති වෙන්න කල් දීලා තිබුණා. මේක හදිසියේ ගෙනාපු එකක් නොවෙයි. ඒ වාගේම ජොනී ඉන්න පුළුවන්; ජොනී යන්න පුළුවන්; කුඩ නැති වෙන්නේ නැහැ. ඒ හින්දා මට ප්‍රශ්නයක් නැහැ. මතක තියා ගන්න, මේ කුඩ ව්‍යාපෘතිය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, කැබිනට් මණ්ඩලය ඒකමතිකව ගත්ත යෝජනාවක්ය කියන එක. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මහත්මයා කිව්වා, -එතුමා ඉන්නවා. එතුමා මගේ පැරණි මිත්‍රයා- ගොවීන් දිහා බලන්නේ නැති ආණ්ඩුවක්, ගොවීන්ට කිසිම උපකාරයක් කරන්නේ නැති ආණ්ඩුවක්ය කියලා. ඔහොම හිතන කොට හැම දාම පරාදයි. යාන්තම් නායකයත් කපලා, එහෙන් මෙහෙන් erase කරලා මන්ත්‍රී වෙලා ආවා.

අපි දන්නවා, තමුන්නාන්සේලාගේ ප්‍රශ්නය මොකක්ද කියලා. අපි දන්නවා, මෙතැනත් ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද කියලා. ඕක ගැන මම කථා කරන්නේ නැහැ. මොකද මම හිටපු පැරණි පක්ෂය නිසා. තමුන්නාන්සේලාට මතක ඇති එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය හදද්දී රනිල් වික්‍රමසිංහ මහත්මයා සමඟ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමන්ලා, අපි මොන තරම් සටනක් කෙරුවාද රුපියල් 550කට පොහොර මිටිය ලබා දෙන්න කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ වෙලාවේ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරලා ඉවරයි, රුපියල් 350ට පොහොර දෙනවාය කියලා. කෑ ගහලා, කෑ ගහලා තමයි අපි කිව්වේ, රුපියල් 550ට දෙනවා කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දමන්න කියලා. ඒත් රනිල් වික්‍රමසිංහ මහත්මයා මොනවාද කිව්වේ? "රුපියල් 550 කියලා දමන්නම්, හැබැයි මම බලයට ආවත් රුපියල් 550ට දෙන්නේ නැහැ, දෙන්න බැහැ" කියලායි. රනිල් වික්‍රමසිංහ මහත්මයා රුපියල් 550ට දෙන්න බැහැ කියපු පොහොර මිටිය යුද්ධයක් තිබෙද්දී, මුළු ලෝකයේම ආර්ථිකය කඩාගෙන වැටෙද්දි අතිගරු ජනාධිපතිතුමා ලබා දුන්නා. යුද්ධය විතරක් නොවෙයි, මුළු යුරෝපා ආර්ථිකයේම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙද්දීත් වීවලට විතරක් නොවෙයි, එළවළු ප්‍රශ්නය ආවාම එළවළු වගා කරන ගොවීන්ටත් එදා ඉඳන් රුපියල් 350ට පොහොර සහනාධාරය ලබා දෙන්නේ අතිගරු ජනාධිපතිතුමායි, මේ රජයයි කියලා තමුන්නාසේලාට මතක් කරන්න කැමැතියි. තමුන්නාන්සේලා අද ගොවියාව සලකන්නේ, බොහොම පල්ලෙහා තත්ත්වයක ඉන්න, ආර්ථික අතින් වැටිච්ච, හරිම අසරණ, දුප්පතුන් කොටසක්ය කියලායි.

ගොවීන්ගේ දුප්පත්කමට තිත තිබ්බේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා කියන එක මම තමුන්නාන්සේට කියන්න කැමැතියි. අදටත් පොහොර දෙනවා. අද ගොවියෙකු ළඟ "බට්ටා" පොඩි ලොරියක් හෝ මෝටර් සයිකලයක් තිබෙනවා. අද ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙන්නේ මේ පොහොර සහනාධාරය දීමෙන් විතරක් නොවෙයි ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කරපු නිසාය කියලා මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. ඩී.එස්. සේනානායක මහත්මයාගේ කාලයේ, ඩඩ්ලි සේනානායක මහත්මයාගේ කාලයේ මේ ගොවි ප්‍රදේශවල ගොවීන් සම්පූර්ණයෙන්ම හිටියේ එක්සත් ජාතික පක්ෂය සමඟයි. රනිල් වික්‍රමසිංහ මහත්තයට පින් සිද්ධ වෙන්න වුයිමගම් කවන්න ගිහිල්ලා, අද ගොවීන් ඉන්නේ ජනාධිපතිතුමත් එක්ක කියලා මම බොහොම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි. ඒ නිසා තමුන්නාන්සේලා දැන ගෙන මේවාට අත ගහන්න ඕනෑ. ඔහොම නිකම් චූන් වුණාය කියලා, උද්සෝෂණයක් දැක්කාම, උද්සෝෂණයට ගිහිල්ලා - [බාධා කිරීමක්]

අද තමුන්නාන්සේලාට උද්සෝෂණයකට 100ක්, 200ක්, 300ක්, 400ක් සොයා ගන්න බැහැ. ඒක තමයි යථාර්ථය. 400ක්, 500ක් සොයා ගන්න බැහැ. ඊයේ මැනිං මාකට් එකේ උද්සෝෂණය තිබෙද්දි මම දැක්කා, අනාගතය බාර ගන්න ඉන්න නායකයෙකුත් ගිහිල්ලා මැනිං මාකට් එකේ නාට්ටාමි මහත්වරුත් එක්ක හිටගෙන ඉන්නවා. අද තමුන්නාන්සේලා එතැනට වැටිලා ඉවරයි. අද පක්ෂය දෙකට, තුනට කැඩිලා ඉවරයි. අද තමුන්නාන්සේලාට නායකයෙක් තෝරා ගන්න බැහැ. ඒක තමයි යථාර්ථය. කථා කරන මන්ත්‍රීවරුන්ට පක්ෂය තහනම් කරනවා. ඒක තමයි යථාර්ථය.

මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේක ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක් බව. ඉතිහාසයේ දීර්ඝ කාලයක් විනාශ වෙච්ච එළවලුවල වටිනාකම ගෙවන්න වුණේ මේ රටේ පාරිභෝගික ජනතාවටයි. රජයක් හැටියට අපි අනිවාර්යයෙන්ම ඒකට අවසන් තිත තියලයි පස්ස බලන්නේ කියන එක මම බොහොම ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි. ඊයේ ජනාධිපතිතුමා සාකච්ඡාවක් කැඳෙව්වා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, ජනාධිපතිතුමා සාකච්ඡාවක් තියලා, මාව

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

අපහසුතාවයට පත් කළාය කියා. නැහැ. ජනාධිපතිතුමා අපි සාකච්ඡා කරලා තමයි ගොවීන් සහ ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡා කළේ. ඒ නිසා ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමැතියි, ජනාධිපතිතුමා සමඟ පැවැත්වූ ඒ සාකච්ඡාව අපි ඔක්කොම එකතු වෙලා පැවැත්වූ සාකච්ඡාවක් බව. ගොවීන්, ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, එළවළු වර්ග හයක් නැවත වතාවක් සංශෝධනයකට ලක් කරන්නය කියා. එතුමා ඒකට ඇහුම්කන් දුන්නා. එතුමා ඇහුම්කන් දෙන නායකයෙක්. රනිල් වික්‍රමසිංහ මහත්මයා වාගේ නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇහුම්කන් දෙන්නේ නැහැ. එතැන තමයි ඒකාධිපතිකම තිබෙන්නේ. ඒක තමයි යථාර්ථය. මේක තමයි වෙනස. විපක්ෂයට මොන නායකයෙක් ආවත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාවත්, රාජපක්ෂලාවත් කවදාවත් පරද්දන්න හම්බ වෙන්නේ නැහැ කියන එක මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. හැමදාම ඔහොම කෑ ගහමින් ඉන්න වෙනවා. කොහේ හරි ගිහිල්ලා එල්ලිලා ඉන්න තමයි වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Let the Hon. Minister wind up.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා, කිලෝ මීටර් 100ක් යන්න පැය 4ක් යනවාය කියා. අද අපි සතුටු වෙන්න ඕනෑ, හැම පාරක්ම කාපට් දමා තිබෙනවා. අධිවේගී මාර්ග ඉදි වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය නොහිතන තරම් ප්‍රමාණයකින් මේ රට සංවර්ධනය කර මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට විශාල දියුණුවක් කරා ගෙනැවිත් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, කුඩ පාවිච්චිය ලබන වසරේ ඉඳලා ක්‍රියාත්මක වෙනවාද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

තමුන්නාන්සේ පත්තර කියෙව්වාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Let him wind up. - [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම මතක් කරන්න ඕනෑ, අපි මේ යථාර්ථයට මුහුණ දෙන්න ඕනෑය කියන එක. හරි දේ රටට කියන්න ඕනෑ. යුද්ධය සම්බන්ධයෙනුත් ඔය ටිකම තමයි කළේ. අපිත් හිටියේ එක්සත් ජාතික පක්ෂයේ නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇවිත් කියනවා, කවදාවත් යුද්ධය දිනන්න බැහැ; යුද්ධය පරදිනවාය කියා. [බාධා කිරීමක්] ඔව්. අපි කිව්වා. එදත් යුද්ධය ආපස්සට අදින්නයි හැදුවේ. ඒක තමයි යථාර්ථය. මේ රටට හොඳ දෙයක් කරද්දී අදත් තමුන්නාන්සේලා ආපස්සට අදින්න හදනවා. අපි කවදාවත් මේ රට ආපස්සට හරවන්න දෙන්නේ නැහැ; අපි මේ රට ඉදිරියට ගෙන යනවාය කියන එක බොහොම ගෞරවයෙන් මතක් කරමින් මගේ කතාව මෙයින් අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.35 ට, 2011 නොවැම්බර් 29 දින සභා සම්මුතිය අනුව, 2011 දෙසැම්බර් 16වන සිකුරාදා අ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.35 மணிக்கு பாராளுமன்றம், அதனது 2011 நவம்பர் 29 ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2011 டிசம்பர் 16, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 4.35 p.m. until 9.30 a.m on Friday, 16th December, 2011, pursuant to the Resolution of Parliament of 29th November, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.